# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2013 ජූලි 23 වන අඟහරුවාදා**
2013 ஜூலை 23 செவ்வாய்க்கிழமை
Tuesday 23rd July 2013

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාත් සභා නව ගොඩනැගිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවති සභා රැස්වීම**

பத்தரமுல்ல, ஸ்ரீ ஜயவர்த்தனபுர, டென்சில் கொப்பேகடுவ மாவத்தை, இல.204 இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்.

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.45 පළාත් සභාව රැස් විය.**
*மு.ப.09.45 க்கு சபை கூடியது*
*The Provincial Council met at 09.45 a.m.*

**ගරු සභාපතිතුමා [ සුනිල් විජේරත්න මහතා ] මූලාසනාරූඪ විය.**
*திரு. தவிசாளர்[ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

## කාරක සභා වාර්තා
## COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2013.07.09 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව මම පිළිගන්වනවා.

***අදාළ වාර්තාවේ පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*Hon. Chairman declared that a copy of the relevant report is placed on the tables of the Hon. Members.*

## පෙත්සම්
## PETITIONS

**ගරු සුනිල් ජයමිණි –** සභානායකතුමා
Hon. Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි, බොරලැස්ගමුව, වේරහැර, අංක 418 හි පදිංචි ජී.ඩී.එස්. රංජිත් යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ගරු සභාපතිතුමනි, මහරගම, නාවින්න, දුම්රියපොල ඉදිරිපිට, අංක 27 හි පදිංචි අයි.එම්. සොයියා යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***[ සභා මේසය මත තබන ලද පෙත්සම්]***
*[Tabled petitions]*

ආනන්ද රංජිත් රූපසිංහ ගරු මන්ත්‍රීතුමාගේ අත්සනින් යුත්,

ඌරාපොල, දිනා පමුණුව, අංක 172/ඩී හි පදිංචි එස්.ටී. ජයසිංහ යන අයගේ පෙත්සම සහ,

ගම්පහ, බණ්ඩාරවත්ත, යක්කල පාර, අංක 71/2/ඒ හි පදිංචි සී.එම්. සරත්චන්ද්‍ර යන අයගේ පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***
*Petitions Presented,were ordered by Hon. Chairman to refer to the Petitions committee.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## ORAL ANSWERS TO QUESTIONS

***න්‍යාය පත්‍රයේ අංක 01 යටතේ උදේන විජේරත්න ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නය ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ඉදිරිපත් කරන ලදුව, ඊට සති දෙකක කාලයක් කල් ඉල්ලූ බැවින් ප්‍රශ්නය ඉදිරි සභාවට යොමු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***
*The question in the name of the Hon. Udana Wijerathna, Member, under item No. 01 of the agenda, was presented to the Hon. Chief Minister and as two weeks time was asked for, Hon. Chairman ordered the question to be referred to the next Council sitting.*

***න්‍යාය පත්‍රයේ අංක 02 යටතේ යූ. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාගේ නමින් යුත් ප්‍රශ්න ගරු සමුපකාර අමාත්‍යතුමාට ඉදිරිපත් කරන ලදුව, එතුමා වෙනුවෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඊට සති දෙකක කාලයක් කල් ඉල්ලූ බැවින් ප්‍රශ්න ඉදිරි සභාවට යොමු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***
*The question in the name of Hon.Chief Opposition Whip U.George Perera under item No. 02 in the agenda was presented to the Hon. Minister of Cooperatives and as two weeks' time was requested for it by the Hon. Chief Minister on his behalf , Hon. Chairman ordered the question to be referred to the next Council sitting.*

## අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ
## MINISTRIES ‘ ANNOUCEMENTS/ MINISTERS ‘ STATEMENTS

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** (කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත සහ පරිසර කටයුතු අමාත්‍යතුමා)
Hon. Udaya Prabhath Gammanpila (Minister of Agriculture, Agrarian Development, Minor Irrigation, Industries and Environmental Affairs.)

ගරු සභාපතිතුමනි, පසුගිය සභාවේදී සරත් සුමනසේකර ගරු මන්ත්‍රීතුමන් තලංගම එම්.ඩී.එච්. ජයවර්ධන විදුහලේ පැවැති සොබා කැකුළු ප්‍රදර්ශනය සඳහා භාවිතා කළ බැනර්වල

[ ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල අමාත්‍යතුමා ]

එතුමාගේ ඡායාරූපය නොතිබීම පිළිබඳව මගෙන් ප්‍රශ්න කළ බවත්, මට එරෙහිව ගෙන එන ලද විශ්වාසභංගයේදී එතුමන් මට සහයෝගය නොදීම නිසා ඡායාරූපය ඉවත් කළ බව මා පැවසූ බවත් එතුමා මේ සභාවට දැනුම් දුන්නා. එය ද්වේශ සහගතව කළ පළි ගැනීමක් බව පවසා එවැනි පළිගැනීම් බෞද්ධ නායකයින්ට ගැළපෙන්නේ නොමැති බවත් එතුමා පැවසුවා. ගරු සභාපතිතුමනි, මේක බොරුවක් නොවෙයි, පට්ට පල් බොරුවක්. ඇයි මා එහෙම කියන්නේ? මට එරෙහිව විශ්වාසභංග යෝජනාවක් ගෙන ආවේ, 2009 දෙසැම්බර් මාසයේදී. ඒකට ඡන්දය දෙන්න ආවේ නැත්තේ කවුද කියලා මම අවංකවම දන්නේ නැහැ. සරත් සුමනසේකර ගරු මන්ත්‍රීතුමා ආවාද නැද්ද කියලා මම දන්නේ නැහැ. මට මතකයි මගේ පිටුපස වාඩි වෙලා ඉන්න මාගේ හිතමිත්‍ර කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා එදා ආවේ නැහැ. එතුමා ආවේ නැත්තේ ඇයි කියලා මම අද වනතුරු එතුමාගෙන් ප්‍රශ්න කරලා නැහැ. එතුමාට ලබා දෙන ප්‍රතිපාදන කප්පාදු කරලත් නැහැ. එතුමාත් එක්ක ඒ ගැන අමනාප වෙලත් නැහැ. මගේ මිත්‍රයා තවම ඇවිල්ලා නැහැ. නැත්නම් එතුමා සාක්ෂි දරාවි. ඒ වාගේම ගරු සභාපතිතුමනි, මට එරෙහිව ගෙනාපු විශ්වාසභංග යෝජනාවට ඡන්දය දුන් සහ නොදුන් - ආපු නැති අය විතරක් නොවෙයි. විරුද්ධව ඡන්දය දීපු අයගෙන්වත් මම කවදාවත් පළි ගැනීමක් කරලා නැහැ. මේ විපක්ෂ මන්ත්‍රීතුමන්ලාගේ පෞද්ගලික ප්‍රශ්නවලදී මම මැදිහත් වෙලා උදව් කරලා තිබෙනවා. ඒ අය එදා මට විරුද්ධව ඡන්දය දුන්නාය කියන කාරණය මම කවදාවත් හේතුවක් කර ගත්තේ නැහැ, එතුමන්ලාත් එක්ක තරහා වෙන්න. ද්වේශ සහගතව පළිගන්න. ඒ විතරක් නොවෙයි. මා පළි ගන්නවා නම් පළි ගන්න ඕනෑ, මට එරෙහිව විවාදයේදී කථා කළ අයගෙන්. ගරු සභාපතිතුමනි, මම සෑම අයවැය විවාදයකදීම මගේ වැය ශීර්ෂයන් යටතේ කථා කරන මන්ත්‍රීතුමන්ලාට මොකක් හරි විශේෂ ප්‍රතිපාදනයක් ලබා දෙනවා. පළතුරු පැළ වෙන්න පුළුවන්. සුදු රෙදි කොඩි කට්ටල වෙන්න පුළුවන්. මොකක් හරි විශේෂයක් කරනවා. ඒ විශේෂය කරන්නේ, පක්ෂ විපක්ෂ දෙකේම අයට. අමාත්‍යාංශයේ කටයුතු වර්ණනා කරන පක්ෂයේ මන්ත්‍රීවරුන්ට ලබා දෙන දෙයම මගේ අමාත්‍යාංශය නිර්දය ලෙස විවේචනය කරන විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාටත් මම ලබා දීලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි ගරු සභාපතිතුමනි, මම පත් වුණු 2009 වසරේ දවසේ ඉඳලා, මගේ වැය ශීර්ෂයට ඡන්දය දෙන්න එන මන්ත්‍රීතුමන්ලාට අඛණ්ඩව තිළිණයක් ලබා දීලා තිබෙනවා. ඒ තිළිණය දෙද්දිත් පක්ෂව ඡන්දය දෙන මන්ත්‍රීතුමන්ලාටත්, විපක්ෂව ඡන්දය දෙන මන්ත්‍රීතුමන්ලාටත් එකම තිළිණය ලබා දෙන්න මම කටයුතු කරලා තිබෙනවා. මා හිතන්නේ, මේ පැහැදිලි කිරීම ප්‍රමාණවත්, මම පළි ගැනීමක යෙදුණේ නැතැයි කියන දේ සනාථ කරන්න.

එහෙම නම් සරත් සුමනසේකර ගරු මන්ත්‍රීතුමාට මොකද වුණේ? ගරු සභාපතිතුමනි, මම ඇමැතිවරයෙක් වූ දවසේ පටන්ම ආණ්ඩු පක්ෂ රැස්වීමේදී මන්ත්‍රීතුමන්ලා නඟන පොදු දුක් ගැනවිල්ලක් තිබෙනවා. ඒ තමයි ක්‍රියාකාරී මන්ත්‍රීවරුන්ටත්, ක්‍රියාකාරී නැති මන්ත්‍රීවරුන්ටත් අපි බෙදන්නේ එකම හැන්දෙන් කියන චෝදනාවා. සමහර මන්ත්‍රීවරු අඛණ්ඩව මේ පළාත් සභාවට පැමිණෙනවා. අඛණ්ඩව ආණ්ඩු පක්ෂ කණ්ඩායම් රැස්වීමට පැමිණෙනවා. කාරක සභාවලට සහභාගී වෙනවා. අයවැය විවාදවලට සහභාගී වෙනවා. තවත් සමහර මන්ත්‍රීවරු මේ කිසිම දෙයක් කරන්නේ නැහැ. හැබැයි, ප්‍රතිපාදන ලැබෙන්නේ දෙගොල්ලන්ට එක හා සමානව. විදේශ සංචාරයන්ගේ අවස්ථාව ලැබෙන්නේ, එක හා සමානව. මේක වැරැදියි. මේ නිසා සභාවට ආවත් නාවත් දෙකම එකයි. ඒ අනුව අපි එන එක වැරැදිද කියන කාරණය වරින් වර ආණ්ඩු පක්ෂ කණ්ඩායම් රැස්වීමේදී මන්ත්‍රීතුමන්ලා මතු කරලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, මේ කාරණය උඩ මම හිතුවා මගේ මට්ටමින් මේකට විසඳුමක් ගෙන එන්න. ඒ අනුව 2011 වර්ෂයේ ඉඳලා මගේ අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේ පැමිණීම 50% ට වැඩි, සෑම පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන්ටම, පක්ෂ විපක්ෂ භේදයකින් තොරව මම විශේෂ ප්‍රතිපාදනයක් ඊළඟ අවුරුද්දේ දෙනවා. ඒ වාගේම පසුගිය වර්ෂයේ 50% ට වඩා පැමිණීම තිබුණු විපක්ෂයේ මන්ත්‍රීවරු තුන්දෙනෙක් හිටියා. අපේ ඒ.එම්. යුසුෆ් හිටපු ගරු ඇමැතිතුමා. හර්ෂණ රාජකරුණා ගරු මන්ත්‍රීතුමා. ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා. ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට දුන්නු විශේෂ ප්‍රතිපාදනයම ඒ තුන්දෙනාටත් ලබා දුන්නා.

ගරු සභාපතිතුමනි, මේ සභාවේදී වාගේම මගේ උපදේශක කාරක සභාවේත් ආණ්ඩු පක්ෂයේ අපට තිබෙන ලොකුම කරදරය ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා. සභාව ඇතුළේ නම් එතුමාව පාලනය කර ගන්න රීති තිබෙනවා. මගේ උපදේශක කාරක සභාවේ එහෙමත් නැහැ. නමුත්, එතුමා පළාත් සභාවට ඇවිල්ලා, උපදේශක කාරක සභාවට ඇවිල්ලා විපක්ෂයේ කාර්ය භාරය කරනවා. මීට මාසයකට කලින්, මම පළාත් සභා විරෝධී ප්‍රකාශ කරලා එතුමාගේ වරප්‍රසාද කඩ කළාය කියලා මේ ප්‍රශ්නය සභාවට ගෙනාවේ එතුමා. හැබැයි, එතුමා විපක්ෂයේ කාර්ය භාරය කරන්න හරි පැමිණීම 50% ට වඩා වැඩි නිසා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට දුන්නු දෙයම අපි එතුමන්ටත් ලබා දුන්නා. ඒ විතරක් නොවෙයි. අපේ උපදේශක කාරක සභාවේ මන්ත්‍රීවරුන්ගේ පැමිණීම ප්‍රතිශත වශයෙන් දක්වලා මගේ වාර්ෂික වාර්තාවටත් ඇතුළත් කළා. එහෙම මම නොකළා නම්, කකුල් දෙකම නැතුව පැමිණීම සියයට සියයක් වාර්තා කළ විකුම් ගුණසේකර ගරු මන්ත්‍රීතුමාට මම කරන්නේ, අසාධාරණයක් ගරු සභාපතිතුමනි. මට මතකයි. පැමිණීම 50% ක් නොතිබුණු අජිත් මාන්නප්පෙරුම ගරු මන්ත්‍රීතුමා අද මේ සභාවේ නැහැ. එතුමා මා ළඟට ඇවිල්ලා කිව්වා, ඇමැතිතුමා ඔහොම පැමිණීම බලලා ප්‍රතිපාදන දෙනවා කියලා දන්නවා නම්, මමත් ඔය උපදේශක කාරක සභාවට එනවා නේ කියලා. මම එතුමාට උත්තරයක් දුන්නා. මම එදා එතුමාට කිව්වා, මට කිසිම උවමනාවක් නැහැ ප්‍රතිපාදන පෙන්නලා මන්ත්‍රීවරු කාරක සභාවට ගෙන්න ගන්න. මට උවමනා, කාරක සභාවට පැමිණෙන මන්ත්‍රීවරුන්ට විශේෂයක් කරන්න පමණයි කියලා.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, 2013 වර්ෂයේ ඉඳලා මම තවත් තීන්දුවක් ගත්තා. ඒ තමයි සාධාරණ හේතුවකින් තොරව මගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට ඡන්දය විමසන අවස්ථාවේ නොපැමිණෙන මන්ත්‍රීවරුන්ට ඒ වර්ෂය තුළ කිසිම ප්‍රතිපාදනයක් නොදෙන්න. ඇමැතිවරු විදියට අපි සතියේ දවස් හතේම, අවුරුද්ද පුරාම අමාත්‍යාංශයේ වැඩ කරනවා. චක්‍රලේඛ පෙන්වන නිලධාරීන් එක්ක හැප්පිලා ව්‍යාපෘති අනුමත කර ගන්නවා. ප්‍රගති සමාලෝචන පවත්වමින්, ඒ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න නිලධාරීන් එක්ක උත්සාහ කරනවා. විපක්ෂයෙන් නඟන ප්‍රශ්නවලට උත්තර දෙන්නේ, ඇමැතිවරුන් වන අපි. විගණන විමසුම්වලට උත්තර දෙන්නේ ඇමැතිවරුන් වන අපි. මාධ්‍ය නඟන ප්‍රශ්නවලට උත්තර දෙන්නේ ඇමැතිවරුන් වන අපි. අපි මෙපමණ දේවල් කරලා මන්ත්‍රීවරුන්ට ප්‍රතිපාදන අරගෙන ආවාම එතුමන්ලාට තිබෙන්නේ, අවුරුද්දට විනාඩි 10 යි. ඒ ගරු සභාපතිතුමනි, සමස්ත අවුරුද්දටම විනාඩි 10 ක් ඇවිල්ලා වැය ශීර්ෂයේදී අත උස්සන්න. මේකවත් කරන්න බැරි නම්, මම ඇයි මෙතැනට එන මන්ත්‍රීවරුන්ටයි, නොපැමිණි මන්ත්‍රීවරුන්ටයි එක වාගේ සලකන්නේ. ගරු සභාපතිතුමනි, මම මේ තීන්දුව ගත්තාට පස්සේ, එදා සරත් සුමනසේකර ගරු මන්ත්‍රීතුමා ආවේ නැහැ වාගේම අනෙක් මන්ත්‍රීවරුත් ආවේ නැත්නම් වැය ශීර්ෂය අනුමත වෙන්නේ නැහැ. එහෙම නම්, කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් මේ වසරේ ප්‍රතිපාදන ලබා දෙන්න මට හැකියාව ලැබෙන්නෙත් නැහැ. මම අලුත් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්න කලින් ආණ්ඩු පක්ෂයේ ඉන්න සෑම මන්ත්‍රීවරයෙකුටම, පෞද්ගලිකව කථා කරලා වැය ශීර්ෂයට ඡන්දය විමසන දිනය සිහිපත් කළා. සෑම මන්ත්‍රීවරයෙක්ම මගේ වැය ශීර්ෂයට ඡන්දය දෙන දවසේ පැමිණෙන බවට මට පොරොන්දු වුණා.

හැබැයි, ඊට කලින් දවසේ සුනිල් ජයමිණි ගරු සභානායකතුමා මට කථා කරලා කිව්වා. ඇමැතිතුමා, මගේ මල්ලිගේ ආදාහනය තියෙන්නේ හෙට. මට ඔබතුමාගේ වැය ශීර්ෂයට ඡන්දය දෙන්න එන්න වෙන්නේ නැහැයි කියලා. ඒ වාගේම රොජර් සෙනෙවිරත්න ගරු මන්ත්‍රීතුමා ඡන්දය දීලා ඉවර වුණා විතරයි හති දාගෙන ඇවිල්ලා කිව්වා, ඇමැතිතුමා අද මගේ මහජන දිනය. මම ඒ මහජන දිනයට පොඩ්ඩක් දුවලා එන්න ගියා. වාහන තදබදයක් ඇති වුණා. මට වෙලාවට ඒගන්න බැරි වුණාය කියලා. ඉතා සාධාරණ හේතු. එහෙම හේතුවක් නොදක්වපු එකම මන්ත්‍රීතුමා සරත් සුමනසේකර ගරු මන්ත්‍රීතුමා පමණමයි. ගරු සභාපතිතුමනි, මම ඒත් නිකම් හිටියේ නැහැ. පක්ෂ විපක්ෂ දෙපැත්තේම මන්ත්‍රීරුවන් යොදවලා, අහලා බැලුවා ආවේ නැත්තේ ඇයි කියලා. ඒ මන්ත්‍රීවරුන් මට වාර්තා කළ ආකාරයට එතුමා දීලා තිබුණු ප්‍රතිඵලය තමයි, ආවයි කියලා මොනවාද අපට ලැබෙන්නේ? ආවා නම් ලැබෙන දේ තමයි අද එතුමාට නොලැබිලා තිබෙන්නේ. දැන් එතුමා අත්දැකීම වටහා ගත්තා. ආවා නම්, මොනවාද ලැබෙන්නේ කියන කාරණය.

ගරු සභාපතිතුමනි, එදා ඒ වැය ශීර්ෂයට ඡන්දය දෙන්න දැඩි සත්කාර ඒකකයේ ප්‍රතිකාර ලබමින් හිටපු නිහාල් ජයවර්ධන ගරු මන්ත්‍රීතුමා ආවා. එතුමා එදා දවසේම මේ සීතලේ රැඳිලා හිටියා. එතුමා මේ සභාවෙන් ගියේ තමන්ගේ අසනීපය හොඳට උත්සන්න වෙලා. එතුමා මාස දෙකක් ජීවිතයයි, මරණයයි අතර සටන් කළා. එදා මේ සභාවට පැමිණීම නිසා. මම නිහාල් ජයවර්ධන ගරු මන්ත්‍රීතුමාට බෙදපු හැන්දෙන්ම සරත් සුමනසේකර ගරු මන්ත්‍රීතුමාට බෙදනවා නම්, තමන්ගේ ජීවිතය පරදුවට තියලා වැය ශීර්ෂයට ඡන්දය දෙන්න ආපු නිහාල් ජයවර්ධන ගරු මන්ත්‍රීතුමාට මම කරන්නේ අසාධාරණයක්. ඒ අසාධාරණය මම කරන්න කැමැති නැහැ ගරු සභාපතිතුමනි.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, ගාන්ධිතුමන් ප්‍රකාශ කරලා තිබෙනවා, ප්‍රතිපත්තියකින් තොරව පරමායුෂ විඳිනවාට වඩා ප්‍රතිපත්ති ගරුකව එක් මොහොතක් ජීවත් වීම වැදගත්ය කියලා. ඒ නිසා ලබන මැතිවරණයේදී මට මන්ත්‍රී ධූරය අහිමි වෙන්න පුළුවන්. මන්ත්‍රී ධූරය ලැබුණත් ඇමැති ධූරය අහිමි වෙන්න පුළුවන්. මේවා ඔක්කෝම අනියත දේවල්. නමුත් මා කෙතරම් ජනප්‍රිය නොවුණත්, කෙතරම් අපහසුතාවයන්ට ලක් වුණත්, මා නිවැරදියි කියලා විශ්වාස කරන මගේ ප්‍රතිපත්ති මම ක්‍රියාත්මක කරනවා. ගරු සභාපතිතුමනි, ආණ්ඩුවේ ඇමැතිවරයෙක්ව සිටිමින් සමහර අවස්ථාවල ප්‍රසිද්ධියේ ජනමාධ්‍ය ඉදිරියේ මා ආණ්ඩුව විවේචනය කරලා තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමාව විවේචනය කරලා තිබෙනවා. එතුමාව පෞද්ගලිකව හම්බ වෙලා ආණ්ඩුව ගැන විවේචනය කරලා තිබෙනවා. මගේ ප්‍රතිපත්තිය රැකගෙන මිය යන එක මට වටිනවා. ප්‍රතිපත්ති පාවා දීලා සිටිනවාට වඩා. ඒ නිසා ගරු සභාපතිතුමනි, කෙතරම් ජනප්‍රියතාවය හීන වුණත්, කෙතරම් මන්ත්‍රීවරු තරහ වුණත් මම වැඩ කරන ක්‍රියාකාරී මන්ත්‍රීවරුන්ටයි, ක්‍රියාකාරී නොවන මන්ත්‍රීවරුන්ටයි එකම හැන්දෙන් බෙදීමේ ප්‍රතිපත්තිය නම් ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. ගරු සභාපතිතුමනි, අපි දන්නවා –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා කථාව පොඩ්ඩක් කෙටි කළොත් හොඳයි.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** – අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

මම හිතන්නේ, නිශ්චිත කාලයක් නැතුව ඇති. මම එදා ඉතා නිහඬව අහගෙන හිටියා. ඔබතුමාට ගෞරවයෙන් මතක් කරන්න ඕනැ, අපේ කාර්ය පටිපාටි රීති අනුව පෞද්ගලික පැහැදිලි කිරීම්වලදී මන්ත්‍රීවරයෙකුගේ නම සඳහන් කරන්න බැහැ. එහෙම තිබියදී සරත් සුමනසේකර ගරු මන්ත්‍රීතුමාට ඒ ප්‍රකාශය කරන්න ඔබතුමා අවස්ථාව ලබා දුන්නා. අපි බාධා කළේ නැහැ. ඒ වාගේම මේකට නිශ්චිත කාලයක් වෙන් කරලා නැහැ. ඒ නිසා මා හිතනවා මගේ ප්‍රකාශය සම්පූර්ණයෙන්ම කරන්න අවස්ථාව දෙන්න තරම් ඔබතුමා නිහතමානී වෙයි කියලා.

[ ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල අමාත්‍යතුමා ]

ගරු සභාපතිතුමනි, සරත් සුමනසේකර ගරු මන්ත්‍රීතුමා වැය ශීර්ෂයට ඡන්දය දෙන්න එන්නේ නැතුව මුළු අවුරුද්දටම කරන්න තිබෙන විනාඩි 10 වැඩේ කරන්නේ නැතුව, එතුමා අපහාස කළේ මට නොවෙයි. එතුමාව මේ සභාවට පත් කරලා එවපු ජනතාවට. මට ඕනෑ වුණේ නැහැ මේ කාරණය ප්‍රසිද්ධ කරලා, මේ මැතිවරණයක් ආසන්නයේ මහජනතාව ඉදිරියේ එතුමාව අසීරුතාවයට පත් කරන්න. ඒ නිසා මම ඒ කාරණය ඉතාම පෞද්ගලිකව එතුමාට කිව්වේ. තමන් කරලා තිබෙන වැඩේ පිළිබඳව එතුමාට ලජ්ජා හිතෙන්න ඕනෑ. තමන් යුතුකම් පැහැර හැරීම ගැන, තමන්ව පත් කරලා එවපු ජනතාව වෙනුවෙන් වගකීම් ඉටු කරන්න බැරි වීම ගැන එතුමා ලජ්ජා වෙන්න ඕනෑ. හැබැයි, එතුමා හිතුවේ නැහැ තමන් වැරැද්දක් කළාය කියලා. එතුමාට ඒ ගැන ලජ්ජාවක් ඇති වුණේ නැහැ. ඒ නිසා තමයි මේ සභාවේ මේ ගැන ප්‍රසිද්ධ ප්‍රකාශයක් කළේ. ලජ්ජ නැතිකම මහමුදලිකමටත් වඩා ලොකුයි කියලයි පැරණි කියමනක තිබෙන්නේ. ඒ නිසා මටත් අද සිද්ධ වුණා, එතුමාගේ අපහසුතාවය ගැන නොසිතා මේ කාරණයට උත්තර බඳින්න. ගරු සභාපතිතුමනි, සරත් සුමනසේකර ගරු මන්ත්‍රීතුමන් සමග මට කිසිම පෞද්ගලික අමනාපයක් නැහැ. මම ක්‍රියාත්මක කරන්නේ, කෙතරම් දැඩි වුණත් මා හරියි කියලා විශ්වාස කරන ප්‍රතිපත්තිය. මට එවැනි තද ප්‍රතිපත්තියක ඉන්න සදාචාරාත්මක අයිතියක් තිබෙනවා. ගරු ප්‍රධාන ඇමැතිතුමා සාක්ෂි දරාවි. අමාත්‍ය මණ්ඩල රැස්වීමට වැඩියෙන්ම පැමිණෙන ඇමැතිවරයා මම. මතවාදීව මොන ගැටුම් තිබුණත්, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා සාක්ෂි දරාවි ආණ්ඩු පක්ෂ කණ්ඩායම් රැස්වීමට වැඩියෙන්ම පැමිණි ඇමැතිවරයා මම. මේ සභාවේ වැඩිම කාලයක් රැඳී සිටින ඇමැතිවරයා මම. මට කරන්න බැරි දෙයක් මම වෙනත් මන්ත්‍රීවරුවන්ගෙන් බලාපොරොත්තු වෙන්නේ නැහැ. මට ආදර්ශයෙන් පෙන්වන්න බැරි දෙයක් ගැන මම වෙන අයට අවවාද දෙන්නේ නැහැ. ඒ නිසා ගරු සභාපතිතුමනි, මා ඇමැති ධුරයේ රැඳෙන තුරා මම මේ ප්‍රතිපත්තිය ඉදිරියට ක්‍රියාත්මක කරනවාය කියන එක මේ සභාවට දැනුම් දෙමින් මම නිහඬ වෙනවා.

**ගරු සරත් සුමනසේකර**
Hon. Sarath Sumanasekara

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මම මේ සභාවේ බොරුවක් කිව්වයි, ලොකු බේගලක් ඇද බෑවයි කියන තර්කය තමයි ගරු ඇමැතිතුමා ඉදිරිපත් කළේ. මට පුද්ගලිකව එතුමාත් එක්ක කවදාවත් තරහක් තිබුණේ නැහැ. හැබැයි, මම සාධාරණව හැමදේම ඇත්ත කිව්වේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කෙටියෙන් වරප්‍රසාද කඩවීම කියන්න.

**ගරු සරත් සුමනසේකර**
Hon. Sarath Sumanasekara

ඒක තමයි ගරු සභාපතිතුමනි. එතුමා කථා කරපු දේවල්වල සාරාංශය කෙටි කරලා ගත්තොත් මම හිතන්නේ හැමෝටම පේනවා කොයිතරම් දුරට මගෙන් පළි ගන්න හැදුවාද කියලා. ඒ ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ. මීට පස්සේ ඔය අමාත්‍යාංශයෙන් ශත පහක්වත් මගේ වැඩවලට ඕනෑ නැහැ. මම බලාපොරොත්තු වෙන්නෙත් නැහැ. ඒත් එක්කම අමාත්‍ය මණ්ඩලයෙන් දැනගන්න -

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

සන්ධානයේ Group Meeting එක වගේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් සහ ඇමැතිවරයෙක් අතර මේ සංවාදය යන්නේ. ආණ්ඩු පක්ෂයේ කණ්ඩායම් රැස්වීම -

**ගරු සරත් සුමනසේකර**
Hon. Sarath Sumanasekara

ගරු සභාපතිතුමනි, මට අවසර දෙන්න. මගේ වරප්‍රසාද ප්‍රශ්නය ගැන මම කථා කරන්නේ.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

එතුමාගේ වරප්‍රසාද -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඉන්න. ඔබතුමාට ප්‍රශ්නයක් නැහැ. ඒක ඔබතුමාට අදාළ වෙන්නේ නැහැ. ඔබතුමා විපක්ෂ නායකතුමා නේ?

**ගරු සරත් සුමනසේකර**
Hon. Sarath Sumanasekara

ගරු සභාපතිතුමනි, මට දැන ගන්න ඕනෑ. කැබිනට් ඇමැතිවරු අතරේ, අමාත්‍ය මණ්ඩලයෙන් එහෙම තීරණයක් අරගෙන තිබෙනවාද, ඡන්දය නොදෙන්න ආවාම විමධ්‍යගත දේවල් ලබා නොදෙන්න. මොකද, මම උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමාගේ වැය ශීර්ෂයේ ඡන්දයටවත් සහභාගී වුණේ නැහැ. හැබැයි, මට එතුමා හැම දේම ලබා දුන්නා. එතුමා මගෙන් පළි ගත්තේ නැහැ. මේක පළි ගැනීමක් කියන බව මම මේ සභාවේදී කියන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු සරත් සුමනසේකර**
Hon. Sarath Sumanasekara

ගරු සභාපතිතුමනි, -

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, මේක දිග්ගස්සා ගන්න ඕනෑ නැහැ. වරප්‍රසාද කමිටුවට යොමු කරලා විසඳ ගනිමු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි ඒක එහෙම කරමු.

**ගරු සරත් සුමනසේකර**
Hon. Sarath Sumanasekara

ඒක මහා අසාධාරණ කථාවක්. මොකද, මම කඩුවෙලට අවුරුද්දකට ලක්ෂ 50 ක් 60 ක් වියදම් කරනවා. මට මෙතුමාගේ ලක්ෂ 2, 3 නැති වුණාට ප්‍රශ්නයක් වෙන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ ප්‍රශ්නය අපි සභා කටයුතු කාරක සභාවට යොමු කරනවා. ඒ වාගේම මේ ප්‍රශ්නය ආණ්ඩු පක්ෂ කණ්ඩායම් රැස්වීමේදී කථා කළොත් වඩාත් හොඳයි.

**ගරු මංජු ශ්‍රී අරංගල –** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. ගරු අමාත්‍යතුමා විසින් මෙතැන ප්‍රකාශයක් කළා, අයවැයට ඡන්දය දෙන්න නාවොත්, උපදේශක කාරක සභාවල පැමිණීම 50% ඉක්ම වූයේ නැත්නම්, මම මේ ප්‍රතිපාදන ඒ අදාළ මන්ත්‍රීවරුන්ට කිසිසේත්ම ලබා දෙන්නේ නැහැයි කියලා. ඒක කමක් නැහැ. එතුමා ඒ අමාත්‍යාංශය ක්‍රියාත්මක කර ගන්න ඕනෑකමට ඒක කළාට කමක් නැහැ. නමුත් මේ තීන්දුව අනෙක් ඇමැතිවරුත් අමාත්‍ය මණ්ඩලයක් විධියට ගත්තොත් - යම් හේතුවකින් යම් කෙනෙකුට ඡන්දයක් දෙන්න බැරි වුණොත් මේ තත්ත්වය බරපතළ කාරණයක් බවට පත් වෙනවා. එතුමා මේ කරපු ප්‍රකාශය මට තේරෙන විධියට එක්තරා තර්ජනාත්මක ස්වරූපයක්.

**ගරු සරත් සුමනසේකර**
Hon. Sarath Sumanasekara

අනිවාර්යයෙන්ම.

**ගරු මංජු ශ්‍රී අරංගල –** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඔබලා මගේ ඡන්දයට නාවොත් මම බලාගන්නම්. මම කිසි දෙයක් දෙන්නේ නැහැ. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට එතුමා එක්තරා තර්ජනයක් මේ කළේ. අනික් ඇමැතිවරු කවදාවත් එහෙම කරන්නේ නැහැ. මම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු විපක්ෂ නායකතුමා, ඔබතුමාගේ වරප්‍රසාද කඩවීමක් තිබෙනවා නම් ඒක ප්‍රකාශ කරන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල –** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඉන්න කෝ? එතුමා පළි ගන්නේ නැහැයි කිව්වාට මම පසුගිය කාලේ දිගින් දිගටම එතුමාගෙන් ප්‍රශ්න ඇහුව එකේ ප්‍රතිඵලය තමයි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු විපක්ෂ නායකතුමා, කරුණාකරලා නිශ්ශබ්ද වෙන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල –** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කෙටියෙන් ප්‍රශ්නය ඉවර කරන්න. ඔබතුමා වෙනත් ප්‍රකාශ කරන්න යන්න එපා.

**ගරු මංජු ශ්‍රී අරංගල –** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මම එතුමාට ලිපියක් දුන්නා. මම විපක්ෂ නායකවරයා විධියට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු විපක්ෂ නායකතුමා -

**ගරු මංජු ශ්‍රී අරංගල –** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

රුපියල් 5000/- ක පුළුවන් නම් උදව් ගන්න - මම ප්‍රශ්න අහපු නිසා එතුමා මේ සභාව ඉවර වෙලා මට කිව්වා, තමුන්නාන්සේට කිසි දෙයක් දෙන්නේ නැහැයි කියලා. එහෙම කියන්න තරම් ඇමැතිතුමා වෛරයෙන් පිරිලා ඉන්නේ. යම් ප්‍රශ්නයක් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු විපක්ෂ නායකතුමා ඔබතුමාගේ වරප්‍රසාද කඩවීමක් තිබෙනවා නම්, අපි ඒකත් වරප්‍රසාද කමිටුවට යොමු කරනවා. කරුණාකරලා ඔබතුමා වාඩි වෙන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්‍ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒ නිසා මම මේ කියන්නේ, එතුමා ඇත්තටම ශ්‍රේෂ්ට බෞද්ධ නායකයෙක්. බෞද්ධ නායකයෙක් විධියට එතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වාඩි වෙන්න. ඒක මෙතැනට අදාළ වෙන්නේ නැහැ.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්‍ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මේ පළාත් සභා එපා කිය කියා ශ්‍රී ලංකා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩි වෙන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්‍ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

එතුමාත් අර මන්ත්‍රීතුමා වගේ තමයි. මේක එපැයි කිය කියා, මේක හොඳ නැහැයි කිය කියා මේකේ ඉඳගෙන සබ්බ සකලමනාවම ගන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු විපක්‍ෂ නායකතුමා ඔබතුමාගේ වරප්‍රසාද කඩවීමක් වෙලා තිබෙනවා නම්, අපි ඒකත් වරප්‍රසාද කමිටුවට යොමු කරනවා. කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්‍ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒ නිසා මම කියන්නේ, මේ ආණ්ඩුවේ මන්ත්‍රීවරුන්ට තර්ජනාත්මක ගුලි යවන්න එපා. මිනිස්සුන්ට කැමැත්තෙන් ඒ කටයුතු -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා ඔබතුමා වාඩි වෙන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්‍ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

එතුමා ගත්තු තීන්දුව පිළිබඳව අපේ ප්‍රශ්නයක් නැහැ. එතුමා යම් කාර්යක්‍ෂම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට අදහස් ප්‍රකාශ කරන්න දෙන්න බැහැ.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්‍ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

නමුත් ඒක තර්ජනාත්මක ස්වරූපයකට ගෙනියන්න එපාය කියන්න ඕනෑ.

**ගරු උපාලි කොඩිකාර** (ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමුපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Upali Kodikara (Minister of Transport, Sports and Youth Affairs, Cultural and Arts Affairs, Cooperative Development, Food Supplies and Distribution and Rural Development)

ගරු සභාපතිතුමනි, 2013.07.11 වන දින බස්නාහිර පළාත් සභාවේ බස් ගාස්තු වැඩි කරන්න කියලා ගැමුණු විජේරත්න මහතා වර්ජනයක් ප්‍රකාශ කරලා තිබුණා. නමුත් බස් රථ හිමි මහත්ම මහත්මීන් එම වර්ජනයට සහාය නොදක්වා අපි කියපු විධියට බස් ධාවනය කරලා සහයෝගය ලබා දීම සම්බන්ධව බස් රථ හිමි සියලුම මහත්ම මහත්මීන්ටත්, කොන්දොස්තර සහ රියදුරු මහත්වරුන්ටත් මගේ ගෞරවනීය ස්තුතිය මේ අවස්ථාවේ පුද කර සිටිනවා.

# පෞද්ගලික පැහැදිලි කිරීම්
# PERSONAL EXPLANATIONS

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ගරු සභාපතිතුමනි, ස්තුතියි. මම මේ කාරණය කියන්න පෙර මම මගේ කනගාටුව ප්‍රකාශ කරනවා, මෙවැනි ප්‍රකාශයක් කරන්න සිදුවීම ගැන. ගරු සභාපතිතුමනි, පසුගිය මාස ගණනක් තිස්සේම මේ රටේ ජීවත් වන මුස්ලිම් ජනතාවට නොයෙකුත් ආගමික අවස්ථාවලදී සංස්කෘතික කටයුතුවලදී කනගාටුදායක සිදුවීම් ගණනාවක් සිද්ධ වෙලා තිබුණා. අනුරාධපුරයෙන් පටන් ගත්තු මුස්ලිම් දේවස්ථානය බිඳීම තුළින්, අවසාන වශයෙන් මෑතකදී සිදුවුණු සිදුවීම තමයි මහියංගණ මුස්ලිම් දේවස්ථානය. මහියංගණ මුස්ලිම් දේවස්ථානයට ගල්වලින් පහර දීලා විතරක් නොවෙයි, ඉතාමත් කනගාටුදාක විධියට, ඉතාමත් අශික්ෂිත විධියට මුස්ලිම් ජනතාව පරිහරණය නොකරන විධියට ඌරෝ තලලා මරලා, ඒ කැලි මුස්ලිම් දේවස්ථානවලට දාලා තිබුණා. ඉතින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහ නිදහසින් පසු මේ රටේ පාරම්පරික ජීවත් වන මුස්ලිම් ජනතාවක් හැටියට ආගමික අවස්ථාවලට තිබුණු නිදහසට අද ලොකුම ගැටළුවක් ඇති වෙලා තිබෙනවා. අභියෝගවලට මුහුණ දෙන්න වෙලා තිබෙනවා. එදා ඒ සිදුවීම තුළ මුස්ලිම් ජනතාව කුපිත වුණා නම්, අපට වෙන්නේ මේ රටේ නැවත වරක් 1915 තත්ත්වයට යන්න සිදුවීමයි. මේ පසුගිය සිදුවීම් සියල්ලම ගත්තාට පස්සේ මුස්ලිම් ජනතාව ඉතාමත් ඉවසිලිවන්තව, බුද්ධිමත්ව මේ රටේ කටයුතු කරගෙන යනවා. මේ රටේ පාලකයෝ ඉන්නවා. මේ පාලකයන්ට මේවා පේනවාද නැද්ද කියන එක අද අපට ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. සමහර උදවිය වගකීමෙන් තොරව කටයුතු කරනවා. මේවාට මූලික වෙලා තිබෙන්නේ, ආගමික වශයෙන් බිහි වුණු දේශපාලන පක්ෂ.

ආගමික වශයෙන් යම් යම් උදවියගේ ක්‍රියා පිළිවෙළ. ඒ මූලධර්මවාදීන් නිසා බව අපි මතක් කරන්න ඕනෑ. ඒ නිසාම අද මේ රටේ නිදහසේ ජීවත් වුණු සහෝදර පවුලක්, අපි ශ්‍රී ලාංකිකයෝ. මේ රටේ මුස්ලිම් ජනතාව ශ්‍රී ලාංකිකයෝ. එදත් මේ සභාවේ මම ප්‍රකාශ කළේ, මේ ලංකාවේ මුස්ලිම් ජනතාවගේ මව සිංහල කාන්තාවක්. බේරුවල පිංහේනෙන් බිහි වුණු. ඒක ඉතිහාසයේ වංශ පොතේ කියැවෙනවා. අපි වෙනම ප්‍රජාවක් නොවෙයි. මේ රටේ එකට ජීවත් වන - ජාතික කොඩියේ පවා සුළු ජාතීන්ගේ අයිතිවාසිකම් පෙන්නුම් කරලා තිබෙනවා. එහෙම තියෙද්දීත් අපේ කාන්තාවන්ගේ ඇඳුම සම්බන්ධව, අබායා සම්බන්ධව - ඒක ගලවන්න කොටසක් කථා කරනවා. තවත් කොටසක් තවත් මොනවා හරි වැඩකට බහිනවා. තවත් කොටසක් දේවස්ථානවලට හානි කරනවා. විශේෂයෙන්ම මේ රටේ නීතිය හා සාමය ආරක්ෂා කරන බස්නාහිර පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙත මෙය යොමු කරන ගමන්ම, මේ රටේ ජනාධිපතිතුමා අද වනතුරු මේ පිළිබඳව කිසිම ප්‍රකාශයක් කරලා නැහැ. පසුගිය සතියේ පවා බේරුවල මුස්ලිම් ජනතාව ඔහු ගැන තියපු විශ්වාසය උඩ පිංවත්තේ මුස්ලිම් දේවස්ථානය විවෘත කිරීමේ අවස්ථාවට පවා සහභාගී කෙරෙව්වා. නමුත් මෙවන් තත්ත්වයකට ගියාම මේ රටේ ජීවත් වන මුස්ලිම් ජනතාවට අනවශ්‍ය ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිදු වෙනවා. ඉදිරියේදී ඒක අපට ලොකු ගැටළුවක් වෙනවා ගරු සභාපතිතුමනි.

ඒ වාගේ සුළු සුළු සිද්ධීන් නිසා ආගමික අවස්ථාවන් අහිමි වෙලා තියෙනවා. මේ රටේ සාමකාමීව එකට ජීවත් වුණු ලාංකික ජනතාවගේ සහෝදරයෝ හැටියට ඉන්න අපට මෙවන් තත්ත්වයක් උදාවීම ගැන ඉතාම කනගාටු වෙන්න ඕනෑ. මේක කවුරුත් දන්නවා. මේ සභාවේ කවුරුත් ඒක අනුමත කරන්නේ නැහැ. මුස්ලිම් ජනතාව පිළිකුල් කරපු, ආහාරයක් හැටියට විරුද්ධ වුණු ඒ ඌරාව මරලා මුස්ලිම් පල්ලියේ මිදුලේ දාන්න තරම් ශක්තියක් කොහෙන්ද ලැබුණේ? එහෙම නම් රජය පියවරක් ගන්න ඕනෑ. මේ පිළිබඳව ජනාධිපතිතුමාගේ අවධානය යොමු වෙන්න ඕනෑ. මේ රටේ සුළු ජාතීන් ආරක්ෂා කරන්න වචන පමණක් කථා කිරීම නොව, මෙවැනි සිදුවීම් සිද්ධ වන මාර්ග අහුරන්න වෙනවා. ඒ මාර්ගය වහන්න වෙනවා. සමහර උදවිය නිර්භීතව ප්‍රකාශ කරනවා අපි අරක කරනවා. මේක කරනවා කියලා. නමුත් යම්කිසි විධියකින් මුස්ලිම් ජාතිකයෙක් කථා කළා නම්, ඒ කථාවට ඔහුව සිර අඩස්සියකට පවා යන්න සිද්ධ වුණු අවස්ථා තිබෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම මේ රටේ ජීවත් වන මුස්ලිම් ජනතාව කෙරෙහි අතිගරු ජනාධිපතිතුමාගේ අවධානය යොමු කරන්න කියන ගමන්ම, මුස්ලිම් ජනතාව වෙනුවෙන් මේ රටේ පාර්ලිමේන්තුව නියෝජනය වෙනවා. ජනතාවගේ අයිතිවාසිකම් පිළිබඳව කථා කළ යුතු උදවිය අද පාර්ලිමේන්තුව තුළ මේ පිළිබඳව කථා නොකර හිඳීම ගැනත් අපේ කනගාටුව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මම ප්‍රථමයෙන් මතක් කරලා දෙන්න ඕනෑ, මේ සභාව තුළ පසුගිය වසර හතර පුරාම මීගමුවේ කුඩු ජාවාරම, ඒ වාගේම ගණිකා නිවාස සහ වෙනත් කප්පම් ගැනීම් පිළිබඳව කථා කරද්දී, මේ සභාවේ සමහර මන්ත්‍රීවරු මට බල්ලා, ඌරා, හරකා කියලා නොයෙකුත් ආකාරයේ (බාධා කිරීමක්) නොයෙකුත් ආකාරයේ වචනවලින් මට ආමන්ත්‍රණය කළා. ඒත් -

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

ඒ භාෂාවම පාවිච්චි කරමින් මට නොයෙකුත් වෙලාවලදී දෝෂාරෝපණය කළා. අද ඔබ අපි කවුරුත් දකින්න ඇති පසුගිය දවස් තුන පුරාම දෙරණ නාලිකාව තුළින් මීගමුවේ කුඩු ජාවාරම සම්බන්ධයෙන් -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඔබතුමා නේ දෙරණට කිව්වේ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කවුද ඒ ඇමැතිවරයා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මීගමුවේ කුඩු ජාවාරම සම්බන්ධයෙන් නොයකුත් කාරණා අද -

**ගරු ජගත් අංගගේ** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා)
Hon. Jagath Angage (Minister of Health, Indigenous Medicine, Social Welfare and Women's Affairs , Probation and Child Care Services and Council Affairs)

ගරු සභාපතිතුමනි, ඇමැතිවරයෙක් කිව්වාම අපටත් ප්‍රශ්නයක් ඇති වෙනවා. අපිත් ඇමැතිවරු.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා ගරු සභාපතිතුමනි,

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා නම කියන්න. මොකද, ප්‍රධාන ඇමැතිතුමා ඉන්නවා.

**ගරු නිමල් ලාන්සා** (මාර්ග සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, නිවාස හා ඉදි කිරීම්, ධීවර හා සංචාරක අමාත්‍යතුමා)
Hon. Nimal Lansa - (Minister of Road Development, Animal Production and Development, Housing and Construction, Fisheries and Tourism)

ඇමැතිතුමාගේ නම කිව්වා නම් හරි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තවත් ඇමැතිවරු තුන් දෙනෙක් සභා ගර්භයේ ඉන්නවා.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

නම කිව්වා නම් හරි.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ සභාවේ එක්තරා ඇමැතිවරයෙක් කියලා ඔබතුමා කිව්වා නම්, ඒ ඇමැතිවරයා කවුද කියලා කරුණාකරලා කියන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම කිව්වේ එක්තරා ඇමැතිවරයෙක් කියලා. මේ සභාවේ එවැනි භාෂා පාවිච්චි කරන්නේ එක ඇමැතිවරයයි. අනෙක් ඇමැතිවරු ඒ භාෂාව පාවිච්චි කරන්නේ නැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂයය භාර අමාත්‍යතුමා)
Hon. Prasanna Ranathunga (Chief Minister and the Minister of Finance and Planning, Law and Order, Land, Education, Local Government, Provincial Administration, Manpower and Employment, Economic Promotion, Power and Energy and Trade Affairs)

ගරු සභාපතිතුමනි, කවුද කියලා ප්‍රකාශ කරන්න කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා නම කියන්න ප්‍රශ්නයක් නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම නම කියන්නම්. අන්තිමට නම කියනවා. ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා නම කියලාම පටන් ගන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

නිමල් ලාන්සා ගරු ඇමැතිතුමා. එතුමා මීගමුව මහ නගර සභාවට ආවේ -

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

නගර සභාවට ගිහිල්ලා, නගරාධිපති වෙලා අවුරුදු 05 ක් තුළදී බස්නාහිර පළාත් සභාවට ඇවිල්ලා බස්නාහිර පළාත් සභාවේ ඇමැතිවරයෙක් වෙලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා පෞද්ගලික දේවල්වලට යන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම පෞද්ගලික නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මගෙන් ඉල්ලීම් කරලා තිබෙන්නේ මත් කුඩු සම්බන්ධව නේ?

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම පෞද්ගලික දෙයක් කියන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා පුටු සයිකලයෙන් ආපු එක ගැන -

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

ගරු සභාපතිතුමනි, ඉතාමත් කැතයි, නින්දිතයි, අශෝභනයි.

[සභාවේ ඝෝෂා]

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

එවැනි පහත් තත්ත්වයකට පත් වෙන්න එපා. මෙතුමාගේ කථාව නවත්වත්වන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා, එතුමා පුටු සයිකලයෙන් ආපු ප්‍රශ්න මෙතැන කථා කරන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේක දෙරණ නාලිකාවේ පෙන්නුවා.

**ගරු වික්‍රම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

ගරු සභාපතිතුමනි, මම ආවේ ත්‍රීවීල් එකේ. අද තමයි මම වාහනෙකින් ආවේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම කියන්නේ දෙරණ නාලිකාවේ -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට ඔබතුමාට කාලය දෙන්න බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම කියන්නේ දෙරණ නාලිකාවේ පෙන්නපු දේ.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. ගරු සභාපතිතුමනි, එතුමා මගේ නම කිව්වා. මා ගැන කියලා එතුමා කියනවා මම පුෂ් බයිසිකලයෙන් නගර සභාවට ගියා කියන එක. මම අදත් පුෂ් බයිසිකලයෙන් - මම ජොගින් කරන්නේ පුෂ් බයිසිකලයෙන්. මගේ පුතා ඉස්කෝලේ යන්නෙත් පුෂ් බයිසිකලෙන්. අවුරුදු 16 කට පල්ලෙහා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේකද වරප්‍රසාද ප්‍රශ්නය?

[සභාවේ ඝෝෂා]

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඒක තමයි. 36 (1) යටතේ මගේ වරප්‍රසාද ප්‍රශ්නයක්. තමුන්නාන්සේ කියනවා, මම පුෂ් බයිසිකලයෙන් නගර සභාවට ගියා කියන එක. ගරු සභාපතිතුමනි, -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඉතින් ඇත්ත නේ? මම බොරුවක් කිව්වේ නැහැ නේ?

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, මගේ ඥාති සහෝදරිය මන්ත්‍රීතුමියක් මම පාසල් යන කාලේ අවුරුදු 16 ට පල්ලෙහාදී පුෂ් බයිසිකලයෙන් එතුමිය බස්සන්න නගර සභාවට ගියා. අවුරුදු 16 දී. දැන් මගේ පුතාට අවුරුදු 14 යි. ඔහු පන්ති යන්නෙත් පුෂ් බයිසිකලයෙන් තමයි. මට කොපමණ වාහන තිබුණත්. ඉතින් මේක තේරෙන්නේ නැති තමුන්නාන්සේ මට අපහාස කරන්න හදන්න එපා. මගේ ක්‍රියාදාමය පිළිබඳව මීගමුව ජනතාව ඉතාමත් හොඳට දන්නවා. මම එක අභියෝගයක් කරනවා. මෙතුමාට පුළුවන් නම් මාත් එක්ක මීගමුව මැතිවරණයට ඇවිල්ලා මම ගන්න ඡන්දවලින් 50% ක් ගන්න කියන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මේ වරප්‍රසාද ප්‍රශ්නයක්ද? මොකක්ද කඩ වුණු වරප්‍රසාදය.

[සභාවේ ඝෝෂා]

**ගරු වික්‍රම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

බස්නාහිර පළාත් සභාවම දන්නවා එතුමා කරන සේවය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය මට පොඩ්ඩක් කෙටියෙන් කියන්න.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

වරප්‍රසාදය තමයි මෙතුමා මට අපහාස කිරීමේ ලකුණින් පුෂ් බයිසිකලයකින් -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම කිසිම අපහාසයක් කළේ නැහැ. එතුමාම කියනවා නේ පුෂ් සයිකලයෙන් ගියා කියලා.

[සභාවේ ඝෝෂා]

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

මම කියනවා. මම දැනුත් කියනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මොකක්ද අපහාස කිරීම?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා ඔබතුමා වාඩි වෙන්න. එතුමාට අවස්ථාව දෙන්න.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, එතුමාගේ ප්‍රකාශයේදී එතුමා කිව්වා, මම එතුමාට බල්ලා, බූරුවා, කිව්වා කියලා. එහෙම කිව්වා නම් ඒ කාලේ හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න තමුන්නාන්සේ නියෝග දුන්නා. කවදාවත් මම කියපු එක විතරක් හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න කියලා කිව්වේ නැහැ. කිව්වා නම් කිව්වේ, දෙන්නාටම ඉවත් කර ගන්න කියලා. ඒක අද එතුමා නැවත වතාවක් ප්‍රකාශ කරනවා. එතකොට මගේ වරප්‍රසාදයක් කඩ වෙලා තිබෙනවා. ඒ නිසා එය ඔබතුමා මාර්ගයෙන් ගරු මන්ත්‍රීතුමාට දැනුම් දෙන්න කියලා ඉතාමත් ගෞරවයෙන් සහ කාරුණිකව ඉල්ලා සිටිනවා.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, මේකත් හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න ඕනෑ. මොකද, 36 (1) යටතේ විශේෂයෙන් අපේ ඇමැතිවරුන්ට තිබෙන වරප්‍රසාද අනුවත් නිමල් ලාන්සා ගරු ඇමැතිතුමාගේ නම මෙතුමා විවෘතව රීති විරෝධී ලෙස මේ සභාවේදී කිව්වා. එතකොට මේ නිමල් ලාන්සා ගරු ඇමැතිතුමාට එහෙම කියන්න -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි, හරි ඇමැතිතුමා පැහැදිලියි.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

පොඩ්ඩක් ඉන්න. උසාවියේ නියෝගයකින් වැරැදිකරුවෙක් වෙලා, එහෙම නැත්නම් අපේ පක්ෂයේ විනය මණ්ඩලයෙන් වැරැදිකරුවෙක් වෙලා නැත්නම් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, ඔබතුමාට අදහස් ප්‍රකාශ කරන්න දෙන්න බැහැ.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

එතකොට එහෙම ප්‍රකාශයක් කරන්න බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මගේ විශේෂ ප්‍රකාශය කරන්න -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් ඉන්න. විනාඩියක් ඉන්න. දැන් මේ සභාවේදී වරප්‍රසාද ප්‍රශ්න කිහිපයක් මට යොමු වුණා. මම ඒ සියලුම වරප්‍රසාද ප්‍රශ්න වරප්‍රසාද කමිටුවට යොමු කරනවා. ඔබතුමාත් කථා කිරීමේදී අදාළ මාතෘකාවට කථා කරන්න ගරු මන්ත්‍රීතුමා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අදාළ මාතෘකාවට තමයි කථා කරන්නේ ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පෞද්ගලික දෝෂාරෝපණ කරන්න යන්න එපා. ඒක හොඳ නැහැ. ඒක රීති විරෝධීයි. ඔබතුමා මත්ද්‍රව්‍ය පිළිබඳව කථා කරන්න කෝ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඉතින් මත්ද්‍රව්‍ය ගැන කථා කරද්දී

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

කථා කරන්න වෙනවා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා පුට් සයිකල් ගැන කථා කරන්න ඕනෑ නැහැ නේ?

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මත්ද්‍රව්‍ය ගැන කථා කරද්දී

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

කථා කරන්න වෙනවා. නැත්නම් කොහොමද කථා කරන්නේ? ගරු සභාපතිතුමනි, මීගමුවේ ගණිකා නිවාස, මත්ද්‍රව්‍ය ගැන කථා කරද්දී

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉතින් ඕක වෙන -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

වෙන කොහොමද කථා කරන්නේ? එක එක්කෙනාගේ චරිත බේරන්න නොවෙයි අපි මෙතැනට ඇවිල්ලා තියෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා මට ඒකට ඉඩ දෙන්න බැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මීගමුවේ ජනතාව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඒක හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මීගමුවේ ජනතාව දන්නවා -

[සභාවේ ඝෝෂා]

මීගමුවේ ජනතාවට ඒක රහසක් නොවෙයි.

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

ගරු සභාපතිතුමනි, මෙහෙම කරන්න දෙන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ද්වේශ සහගතව කථා කරන්න එපා. ගරු මන්ත්‍රීතුමන්ලා කරුණාකරලා වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මේ වලත්ත කථා කියනකොට ඔබතුමා වාඩි කරවන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා මොහොතකට වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මම කියපු දේ ඉවර කරන්න දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කියපු දේවල් මම හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මගේ වාක්‍ය ඉවර කරන්න දෙන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු සුනිල් ජයමිණි –** සභානායකතුමා
Hon. Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභානායකතුමා කරුණාකරලා ඔබතුමා පොඩ්ඩක් වාඩි වෙන්න.

**ගරු සුනිල් ජයමිණි –** සභානායකතුමා
Hon. Hon. Sunil Jayamini - Leader of the House

මෙතුමා කියපු දේවල් හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න ඔබතුමා කියනවා. රූපවාහිනියෙන් ගෙනැල්ලා, පත්තරකාරයෝ ගෙනැල්ලා -

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම රූපවාහිනියෙන් ගෙනාවේ නැහැ. මම පත්තරකාරයෝ ගෙනාවේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දිගින් දිගටම -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මගේ වාක්‍ය ඉවර කරන්න දුන්නොත් ඔබතුමා තේරුම් ගනියි මම මොනවාද කියන්නේ කියලා. මට වාක්‍ය ඉවර කර ගන්න දෙන්න. ගරු සභාපතිතුමනි, මම කිව්වේ (බාධා කිරීම්) මගේ වාක්‍ය ඉවර කරන්න දීලා කරුණාකරලා ඔබතුමා කථා කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට කථා කරන්න තව විනාඩි භාගයයි තියෙන්නේ. අවසන් කරන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම කිව්වේ ගරු සභාපතිතුමනි, ලන්සලා ගැන කථා කරනකොට නිමල් ලාන්සා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ආයිත් කථා කරනවා. මම ඒවා ඉවත් කරනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

නිමල් ලාන්සා ඇමැතිතුමාම කියලා තිබෙනවා, එතුමා නොදැනුවත්ව මීගමුවේ කිසි දෙයක් කරන්නත් බැහැ. වෙන්නෙත් නැහැ කියන එක එතුමා ඉතාමත් පැහැදිලිව ප්‍රකාශ කරලා තිබෙනවා. එහෙම නම් මීගමුවේ -

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කුඩු ජාවාරම ගැන -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ කාලය අවසන් ගරු මන්ත්‍රීතුමා. වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒකයි මම කියන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මම කිව්වේ එතුමා ප්‍රකාශ කරනවා එතුමා නොදැනුවත්ව මීගමුවේ කිසිම දෙයක් වෙන්නේ නැහැයි -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාලය අවසන්. ඔබතුමා වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඉතින් මම කියන්නේ -

[සභාවේ ඝෝෂා]

මම කිව්වේ නැහැ එතුමා කරනවා කියලා. එතුමාත් දැනුවත්ව -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

වාඩි වෙන්න. වාඩි වෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා ඔබතුමා වාඩි වෙන්න.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් මම මතු කරන්නේ. සියලුම මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද සම්බන්ධව. මමත් දෙරණ රූපවාහිනී නාලිකාවේ අදාළ ප්‍රවෘත්තිය නැරඹුවා. දෙරණ රූපවාහිනී නාලිකාව පිළිබඳව අපට ප්‍රශ්නයක් නැහැ. හැබැයි අපට ප්‍රශ්නයක් තිබෙනවා, මේ සභාව තුළ මන්ත්‍රීවරයෙක් තවත් මන්ත්‍රීවරයෙකුට නම කියලා චෝදනාවක් එල්ල කරනවා නම්. එහෙම නම් අධිකරණය ඉදිරියේ යම් වරදක් බවට ඔප්පු විය

යුතු දෙයක් වෙන්නට ඕනෑ. එහෙම නැතුව හෙට තව මන්ත්‍රීවරයෙක් ඇවිල්ලා තවත් මන්ත්‍රීවරයෙක්ට ඇඟිල්ල දික් කරලා ඕනෑම දෙයක් කියාගෙන, කියාගෙන ගිහිල්ලා ඊට පස්සේ ඔබතුමා හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරනවා කියන තැනට ආවාම සභාවක ගෞරවය පිළිබඳ ප්‍රශ්නයක් මතු වෙනවා. දෙරණ මාධ්‍ය නාලිකාවේ ගිය ප්‍රවෘත්තිය සම්බන්ධව පරීක්ෂණයක් පවත්වලා අවශ්‍ය ක්‍රියා මාර්ගයන් නීත්‍යානුකූලව ගැනීම පොලිස්පතිතුමාගේ වගකීමක්. එතකොට නීත්‍යානුකූලව කටයුතු කිරීම තුළ අපි නීතියට ගරු කරන්නන් හැටියට ඒ සියලුම දේවල් භාර ගන්නවා. එතකොට මේ සභාව තුළ හිතා මතාම ඕනෑම කෙනෙකුට ඇවිල්ලා, ඕනෑම කෙනෙක් සම්බන්ධව නමක් කියලා ප්‍රකාශයක් කිරීම බරපතළ ප්‍රශ්නයක්. ඒ නිසා සියලුම මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද ආරක්ෂා කිරීම ඔබතුමාගේ වගකීමක්. ඒ නිසා ඔබතුමාගෙන් මම කාරුණික ඉල්ලීමක් කරනවා, ආණ්ඩු පක්ෂයේ සංවිධායකවරයා හැටියට මේ සභාවේ සියලුම මන්ත්‍රීවරුන්ගේ ගෞරවය ආරක්ෂා වන විධියට සභාවේ මන්ත්‍රීවරු හැසිරිය යුතුයි කියලා. මන්ත්‍රීවරයෙක් තවත් මන්ත්‍රීවරයෙක්ට චෝදනාවක් කරනවා නම්, ඒක අපේ රීති සංග්‍රහයේ පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා. ඒ සම්බන්ධව ඔබතුමා අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතුයි. නැතුව සභාව තුළ හිතුමතේට ඇවිල්ලා ඕනෑම කෙනෙකුට - අඩු ගාණේ අධිකරණයක පවතින නඩු නිමිත්තක් හෝ මාධ්‍යවලින් විවිධ දේවල් වාර්තා වෙනවා. අධිකරණයක නඩු නිමිත්තක් හෝ යම් දෙයක් තිබෙනවා නම් ප්‍රශ්නයක් නැහැ. ඒ සම්බන්ධව ඇවිල්ලා මේ සභාවේ ප්‍රකාශයක් කිරීමට ඉඩ දිය යුතුයි. හැබැයි, එහෙම නැතුව මාධ්‍ය වාර්තා - මම මේ ඔබතුමාට උදාහරණයක් කියන්නේ.

මහර පළාත් සභා මන්ත්‍රීවරයෙක් තවත් පුද්ගලයෙකුගේ නහාය හපා කෑවා කියලා පළ වුණා. එතකොට මේ සම්බන්ධව ඇඟිල්ල දිගු වෙන්නේ, යූ. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාට. අපි එතුමාට එහෙම චෝදනා කළේ නැහැ. මොකද, අපි මේ කාරණය සොයා බැලුවා. එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකවරයා කරපු දෙයක් සම්බන්ධව මාධ්‍යයේ වාර්තා වුණේ, එක්සත් ජාතික පක්ෂයේ පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට. හැබැයි ප්‍රතිපත්තිමය වශයෙන් අපි අතර කොතරම් ගැටුමක් තිබුණත්, අපි ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ සංවිධායකතුමාට ඇඟිල්ල දික් කළේ නැහැ. ඒ නිසා මම කියන්නේ, සදාචාරයක් තියෙන්න ඕනෑ. අම්මා, තාත්තාගෙන් වැදගත්කම කියන එක දරුවෝ පුරුදු වෙන්න ඕනෑ. එහෙම නැතුව අශීලාචාර ලෙස අවලම් විධියට හැදුණු දරුවෝ ඒ ගතිගුණ මේ සභාව තුළ පෙන්වීම මම හිතන්නේ ශිෂ්ට සම්පන්න සමාජයකට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු සංවිධායකතුමා වරප්‍රසාද ප්‍රශ්නය අවසන් කරන්න.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

සුදුසු නැහැ කියන එකයි. ඒ නිසා ඔබතුමාගේ අවධානය මම යොමු කරනවා මේ සම්බන්ධව කටයුතු කරන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා වාඩි වෙන්න. විවාදයකට යන්න දෙන්න බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මම නිමල් ලාන්සා ගරු ඇමැතිතුමා මේවා කරනවා කියලා කිව්වේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය කියන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම කිව්වේ -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වරප්‍රසාද ප්‍රශ්නය කියන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම කියන දේ පොඩ්ඩක් අහන්න කෝ? පැහැදිලි කරලා දෙන්න හදන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වරප්‍රසාද කඩවීම කියන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා කියන්න දෙන්නේ නැහැ නේ?

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පෞද්ගලික දෝෂාරෝපණ කරන්න බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා මගේ කථාව මගින් නවත්වලා, ඔබතුමා මට චෝදනා කරනවා. ගරු සභාපතිතුමනි, මම කිව්වේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට මම කාලය දෙනවා. වාඩි වෙන්න කෝ?

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ අවධානය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සමාවෙන්න ගරු ප්‍රධාන ඇමැතිතුමා. කාලය දෙන්නම්. මම ඉතාමත් කාරුණිකව ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලීමක් කරනවා. පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේ සිදු වන මේ ක්‍රියාවට මට දිගින් දිගටම කරන්න ඉඩ දෙන්න බැහැ. මොකද, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක්, ආණ්ඩු පක්ෂයේ ඇමැතිවරයෙක්ව විවේචනය කරනවා. තව විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් ආණ්ඩු පක්ෂයේ ඇමැතිවරයෙක් විවේචනය කරනවා. මගෙන් ඉල්ලීම කළාට මම මුකුත් දන්නේ නැහැ. මම කිසි දෙයක් දන්නේ නැහැ. විපක්ෂයේ සංවිධායකතුමා අත්සන් කරලා කොළ කෑල්ලක් එවනවා මත්ද්‍රව්‍ය පිළිබඳව කථා කරන්න. ඉතින් මම අවසර දෙනවා. නොදී ඉන්න බැහැ නේ? ඊළඟට තව මන්ත්‍රීවරයෙක් තවත් ප්‍රශ්නයක් කථා කරන්න කාලය ඉල්ලනවා. කථා කරන්න ගියාම පෞද්ගලික ප්‍රශ්නවලට යනවා. මේක ඉදිරියට කරන්න දෙන්න බැහැ. ඒ නිසා මම අනිවාර්යෙන්ම ඉදිරියේදී පෞද්ගලික පැහැදිලි කිරීමකට ඉඩ දෙනකොට හොඳට කියවලා බලලා ඉඩ දෙන්නේ. නැත්නම් ඉඩ දෙන්නේ නැහැ. ඒක මම ගරු ප්‍රධාන ඇමැතිතුමා ඇතුළු ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් කියනවා. විපක්ෂ නායකතුමා ඇතුළු විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් කියනවා. මින් ඉදිරියට මගේ තිබෙන බලාධිකාරිය තුළ පෞද්ගලික පැහැදිලි කිරීමක් සඳහා අවස්ථාව දෙන්නේ, මම හොඳට කියවලා බලලා, සොයා බලලා. නැත්නම් ඒ සඳහා ඉඩ දෙන්නේ නැහැ. මගේ බලය පාවිච්චි කරනවා. ගරු ප්‍රධාන ඇමැතිතුමාට අවස්ථාව.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ අවධානය 64 (2) ත් 67 (8) ත් කෙරෙහි යොමු කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ සම්බන්ධව ඔබතුමා තීන්දුවක් අරගෙන මේ කථාව හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්නත්, එතුමාගේ පැහැදිලි කිරීම සම්බන්ධව ඔබතුමා තීන්දුවක් ගන්නා ලෙසත් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන ඇමැතිතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා ඒ කාරණාව ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මට අවස්ථාව දෙනවාද?

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙනවා. ඒ අනුව ද්වේශ සහගතව කරන ලද සියලුම ප්‍රකාශ මම හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරනවා. මම මාධ්‍යයෙනුත් කාරුණිකව ඉල්ලා සිටිනවා ඒ වාගේ දේවල් මාධ්‍යයේ පළ කිරීමෙන් පුළුවන් තරම් වළකින ලෙස. මම මාධ්‍යයට අභියෝග කරන්නේ නැහැ. නමුත් පුළුවන් තරම් ඒ වාගේ ප්‍රකාශ කිරීම් සභා ගර්භය තුළදීවත් -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට දෙන්න බැහැ නේ? කාලය ඉවරයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා මට කාලය දෙනවා කියලා මට ඉඳගන්න කිව්වේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වරප්‍රසාද සඳහා කාලය දෙනවා කිව්වේ. ඔබතුමාට වරප්‍රසාද ප්‍රශ්නයක් නැහැ නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. අවස්ථාව දෙනවා කිව්වා.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ගරු සභාපතිතුමනි, මේ සභාවේ කාර්ය භාරය කරගෙන යෑම සඳහා ඔබතුමාට සහායෝගය දැක්වීමක් වශයෙන් මා මෙම ප්‍රකාශය කරන්නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා මට අවස්ථාව දෙන්නේ නැද්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙනවා.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ මා මෙම ප්‍රකාශය කරන්නේ ඔබතුමාගේ කාරුණික අවධානය සඳහා යොමු කිරීමටයි. 64 (2) වගන්තිය පිළිබඳව මම ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරනවා.

*"පළාත් සභා මන්ත්‍රීවරයකුගේ පැවැත්ම පිළිබඳව එම විෂය සඳහා වන විශේෂ යෝජනාවක දී හැරුණු විට සාකච්ඡා නොකළ යුතුය."*

ඊළඟට 64 (4) වගන්තිය කෙරෙහිත් ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ අවධානය යොමු කරනවා.

*"ඉහත අංක 64 (1) සහ 64 (2) රීතිවල සඳහන් වන්නා වූ පුද්ගලයකුගේ හැසිරීම පිළිබඳවත් අංක 64 (3) රීතියෙහි දැක්වෙන කිසියම් කරුණක් පිළිබඳවත් යම් සංශෝධනයක දී හෝ අමාත්‍යවරයකු වෙත ඉදිරිපත් කෙරෙන යම් ප්‍රශ්නයක දී හෝ විවාදයක දී හෝ සඳහන් කිරීම නොකළ යුතුය."*

කරුණාකර ඔබතුමා මේ රීතීන් අනුව මෙම සභාවේ වුණු සිද්ධිය පිළිබඳව තීරණයක් ගන්නා ලෙස කාරුණිකව ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

නොමඟ ඇරීමක් කර තිබෙනවා. සභාපතිවරයාව නොමඟ ඇරියා.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, -

[සභාවේ ඝෝෂා]



**ගරු සභාපතිතුමා**
Mr. Chairman

67 (8) වගන්තියෙත් තිබෙනවා. මමත් ඒකට පොඩි කොටසක් එකතු කරන්නම් ගරු ඇමැතිතුමා.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඔබතුමාව බොරු කියලා නොමඟ ඇරියා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු විපක්ෂ නායකතුමා පොඩ්ඩක් වාඩි වෙන්න. ගරු මන්ත්‍රීතුමන්ලා මේ සභාවේ ගරුත්වය ආරක්ෂා කරන්න. දිගින් දිගටම හැම මන්ත්‍රීවරයෙක්ම මේ සභාව විහිළුවට අරගෙන වරප්‍රසාද ප්‍රශ්නයක් කියලා වරප්‍රසාද ගැන කථා කරන්නේ නැතුව, වෙන වෙන පෞද්ගලික ප්‍රශ්නවලට යන්නේ. ඉතින් එවැනි දේවල්වලට මට ඉඩ දෙන්න බැහැ. ඔබතුමාගේ වරප්‍රසාද කඩවීමක් සිදු වුණා නම්, මට ඒක ගැන කියන්න. වරප්‍රසාද ප්‍රශ්න කියලා ඊට එහා වෙන වෙන කරුණුවලට යොමු වෙන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

36 (1) කියන්නේ වරප්‍රසාද ප්‍රශ්න විතරයි. වෙනත් දේවල්වලට ඉඩ දෙන්න බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම කියන දේ පොඩ්ඩක් ඔබතුමා අහන්න කෝ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය කියන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අහලා ඉන්න. ගරු සභාපතිතුමනි, -

[සභාවේ ඝෝෂා]

පොඩ්ඩක් අහගන්න. කියවන්නේ නැතුව.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට අවස්ථාව දෙන්න කෝ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අහගන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වරප්‍රසාද ප්‍රශ්නය කියන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, නිමල් ලාන්සා ගරු ඇමැතිතුමා -

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පොඩ්ඩක් අහගන්න කියන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මේ සත්තුන්ගේ නම් කියන එක වහාම නවත්වන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට නවත්වන්න බැහැ මේක. මම කොහොමද -

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මේ ප්‍රශ්න වුණත් -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු විපක්ෂ නායකතුමා මේ මන්ත්‍රීවරු ඔක්කෝම කැගහනකොට මට වළක්වන්න බැහැ.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, මම මේ කියන්නේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම හඬ පටය බලලා ඒවා ඉවත් කරන්නම්.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මේ කාරණයේදී මන්ත්‍රීවරු වෙනුවෙන් මමත් වරප්‍රසාද ප්‍රශ්නයක් පිළිබඳව කථා කරන්නේ. මේ ප්‍රශ්නයට මූලික ප්‍රස්තුත කාරණය බවට පත් වුණේ, යම් නාලිකාවක් (බාධා කිරීම්) ඉන්න කෝ පොඩ්ඩක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට ඉඩ දෙන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

යම් නාලිකාවක් ව්‍යංගයෙන් හෝ නම සඳහන් නොකර මේ පළාත් සභාවේ කවුරු හරි පුද්ගලයෙක් පිළිබඳව යම් ප්‍රකාශයක් කළාම ඒක විවිධ විධියට මේ සභාව තුළ පාවිච්චියට ගන්න උත්සාහ කරනවා. ඒ නිසා මම හිතනවා, ඇත්තෙන්ම මේ මාධ්‍ය මේ විධියට කටයුතු කරද්දී ඇමැතිවරයෙක් හෝ වේවා, වෙන යම් මන්ත්‍රීවරයෙක් හෝ වේවා මේ හැම මනුස්සයෙකුගේම ආත්ම ගරුත්වයක් තිබෙනවා. මේ පිළිබඳව නීතිය ඉදිරියේ යම් කාරණයක් වෙනවා නම්, අත්අඩංගුවට ගැනීමක් වෙලා තිබෙනවා නම්, එහෙම කාගේ හරි සාක්ෂියක් මත පදනම් වෙලා තිබෙනවා නම් මේවා මාධ්‍ය හෙළිදරව් කළාට කමක් නැහැ. ඒ පිළිබඳව කිසි ප්‍රශ්නයක් නැහැ. අපි කියන්නේ මේ ආසන්න උදාහරණය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය කියන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මන්ත්‍රීවරුන් වෙනුවෙන්. මම කියන්නේ, උදාහරණයක් විධියට අපි සියලු දෙනාගේම වරප්‍රසාද කඩවීමක් සිද්ධ වෙනවා. ඊයේ පත්තරේ බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් නාහය හපා

කැවයි කියලා කිව්වා. ඒ කියපු ගමන් අපි යම් විමතියකට පත් වුණා. මේ පිළිබඳව අපි සොයා බැලුවා. අදාළ පුවත්පත්වල මේ පළ වෙන වාර්තාවන් ඒ වාර්තාකරුවෝ වගකීමෙන් යුක්තව නොදීමේ හේතුවෙන්, පක්ෂයක් හැටියටත්, සභාවේ මන්ත්‍රීවරු හැටියටත් අපි සියලු දෙනා හැල්ලුවට පත් වෙනවා. ඉතින් ඒක අපටත් බලපානවා. දැන් ඊයේ මගෙන් කිහිප දෙනෙක් ඇහුවා, කවුද මේ මන්ත්‍රීවරයා කියලා. පස්සේ ලංකාදීපේ කර්තෘතුමාට කථා කරලා මට මේක පැහැදිලි කරන්න වුණා. මම කිව්වා, වහාම තමුන්නාන්සේ මේක නිවැරැදි කිරීමක් කරන්න. අනෙක් එක මේක අයිනක දාන්න එපා කියන ඉල්ලීමක් මත අද පත්තරේ පළමුවැනි පිටුවේම මේක සඳහන් වෙලා තිබෙනවා. ඒ නිසා මම හිතන්නේ, මේ මාධ්‍ය වුණත් යම් ද්වේශ සහගතව හෝ යම් සිද්ධියක් කාට හරි විරුද්ධව පුද්ගලිකව හෝ පොදුවේ මතවාදයක් මතු කරනකොට ඒවා මේක ඇතුළේ සාකච්ඡාවට බඳුන් වෙනවා. මම කියන්නේ, අපි කියන්නේ නැහැ මේ වෙන සිද්ධි සියල්ලම ඇත්ත කියලා. දැන් අපේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා රවී කරුණානායක මන්ත්‍රීතුමාගේ කාරණයක් සම්බන්ධයෙන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක අවශ්‍ය නැහැ. නැවත එතැනට යන්න එපා.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, ඒ කාරණය අපි සොයා බැලුවාම, එය යම් සාකච්ඡාවක් ඇතුළේදී යම් කාරණයක් සම්බන්ධයෙන් කථා කළා විතරයි. පත්තරෙන් තමයි ඒක ලොකුවට පුම්බලා දාලා තියෙන්නේ. ඒ අය හිතන විදියට. ඒ නිසා අපි මේ කාරණාව වුණත්, මේවා මාධ්‍යවල පළ කරනකොට මේ පිළිබඳව මම හිතන්නේ, සභාවක් විදියට මේවායේ ඇත්ත නැත්ත සොයලා මේවා වැරැදි නම් අදාළ මාධ්‍යවලට වුණත් නීත්‍යානුකූලව කටයුතු කිරීමේ වගකීමකට මේවා යන්න ඕනෑ. නැතුව හැමදාම මේක ඇතුළේ මන්ත්‍රීවරු හැල්ලුවට ලක් වෙනවා. ඒ නිසා ඒ මූලික හේතුව මත තමයි මේ වාගේ ප්‍රශ්න මතු වෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හොඳයි. ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, ඔබතුමා මාව හැම තිස්සේම ඉන්දවනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නය කියන්න. ඉන් එහාට ඔබතුමාට මුකුත් කථා කරන්න දෙන්න බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, දැන් මේ මන්ත්‍රීවරු ඔක්කෝම මට චෝදනා කළා නිමල් ලාන්සා ඇමැතිතුමාගේ නම කියලා එතුමාව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක රීතිවල තිබෙනවා. එහෙම කියන්න බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒක තමයි. මම එහෙම කිව්වේ නැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කිව්වා නේ? ඇයි කිව්වේ නැහැයි කියන්නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, නිමල් ලාන්සා ඇමැතිතුමා, එතුමාගේ කටින්ම ප්‍රකාශ කරලා තිබෙනවා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා මේක අහන්න කෝ? ඔබතුමා ආයිත් -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා මට කියන්න දෙන්නේ නැහැ නේ?

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වරප්‍රසාද ප්‍රශ්නය කියන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

වරප්‍රසාදය කියන්නේ කොහොමද? කියන්න දෙන්නේ නැත්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය කියන්න ගරු මන්ත්‍රීතුමා.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

36 (1).

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉතින් කියන්න. මට වරප්‍රසාද ප්‍රශ්නය කියන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම කියන්නේ -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ලන්සා ඇමැතිතුමා ගැන කියන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඉතින් එහෙම නම් කොහොමද කියන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කියන්න, කියන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කොහොමද කියන්නේ? කියන දේ අහලා ඔබතුමා කරන ප්‍රකාශයක් කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කෙටියෙන් කියන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම කිව්වේ, එතුමා නොදැනුවත්ව මීගමුවේ කිසිම දෙයක් වෙන්නෙත් නැහැ. වෙන්නත් බැහැ කියලා එතුමාම ප්‍රකාශයක් කරලා තිබෙනවා කියලයි. මම ඒකයි කිව්වේ,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

ඒකයි මම දැන් කියන්නේ. මේ අය බොරුවට පැනලා -

[සභාවේ ඝෝෂා]

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, 36 (1) වරප්‍රසාදයට යට වෙලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනේ, ගරු මන්ත්‍රීතුමා කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, -

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, ඒ නිසා කරුණාකරලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කරුණාකරලා වාඩි වෙන්න. මට මේකට දිගින් දිගටම ඉඩ දෙන්න බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඕක නේ -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වරප්‍රසාද ප්‍රශ්නවලට යට වෙලා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මමද කැගැහුවේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමන්ලා ඔක්කෝම වාඩි වෙන්න. නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට විනාඩි 03 ක කාලයක් තිබෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කවුද අපහාස කළේ?

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රාදේශීය දේශපාලඥයන්ගේ -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කෑගහන්නේ නැතුව ඉඳගන්න. අහන්න කියන දෙයක්. මෝඩයෝ වාගේ නැගිටලා කියවනවා. වාක්‍යයක් -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා. ප්‍රාදේශීය දේශපාලඥයන්ගේ සදාචාර විරෝධී ක්‍රියා කලාපය සම්බන්ධයෙන් කථා කිරීමට ඔබතුමාට විනාඩි 03 ක කාලයක් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා ඔබතුමා පෞද්ගලික දෝෂාරෝපණවලට යන්න එපා. ද්වේශ සහගතව කථා කරන්න එපා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

කලබල වෙන්න එපා. ගරු සභාපතිතුමනි, ආණ්ඩුවේ බොහෝ ව්‍යාපෘති අසාර්ථක වුණාට, ආණ්ඩුව පටන් ගත්තාට එක ගමකට එක වැඩක් කියන ව්‍යාපෘතියට සමගාමීව අපට පෙනෙනවා, ප්‍රාදේශීය සභා සභාපතිවරුන් සහ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් විශේෂයෙන්ම ස්ත්‍රී දූෂණ, මිනී මැරුම්, පහර දීම් ආදී ක්‍රියාවලට සම්බන්ධ වෙලා තිබෙනවා. පළාත් සභාවකට වගකීමක් තිබෙනවා මේ මන්ත්‍රීවරුන්ගේ ක්‍රියා කලාපය අධීක්ෂණය කරන්න සහ සුපරීක්ෂාකාරීත්වයකට එන්න. ඒ අනුව අපේ බස්නාහිර පළාත් සභාවේත් ගරු සභාපතිතුතිමනි, කළුතර ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ලක්ෂ 30 ක අල්ලසක් අරගෙන මාට්ටු වුණා. වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා මීට සති දෙකකට විතර ඉස්සරවෙලා ලක්ෂ 15 ක අල්ලසක් අරගෙන මාට්ටු වුණා. ඒ වාගේම මොරටුව නියෝජ්‍ය නගරාධිපතිවරයා හාමුදුරුවන් වහන්සේ නමක් ඝාතනය වීම සම්බන්ධයෙන් හිරගත වෙලා තිබෙන්නේ. ඒ වාගේම බියගම ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙක් මේ වනකොට පහර දීමකට සම්බන්ධව සොයමින් සිටිනවා. ඒ නිසා මේ ප්‍රාදේශීය සභා සභාපතිවරුන්ගේ සහ ප්‍රාදේශීය දේශපාලඥයින්ගේ ක්‍රියා කලාපය ඇතුළේ සම්පූර්ණ දේශපාලන සංස්කෘතිය හෑල්ලුවට ලක් වෙලා තිබෙනවා.

ඒ වාගේම තමයි මේ වනකොට අපේ රටේ වගකිව යුතු මාධ්‍ය ආයතනයක් වන දෙරණ නාලිකාව පසුගිය ජූලි මාසේ 20 වැනිදා මත්කුඩු වසංගතයක් පිළිබඳ අවධානය යොමු කළා. ඔබතුමා දන්නවා ගරු සභාපතිතුමනි මත්කුඩු කියලා කියන්නේ, අපේ රටේ තරුණ පරම්පරාව විනාශ කරන, මේ රටේ අනාගතය කුඩේ කුඩු කරන බරපතළ උවදුරක්. ඒ සම්බන්ධයෙන් හෙළිදරව් කරන්න - විශේෂයෙන් කොළොන්නාව ප්‍රදේශයේ තිබුණු මත්කුඩු උවදුර ගැන. දැන් මීගමුව ප්‍රදේශයේ මත්කුඩු උවදුර ගැන හෙළිදරව් කිරීමට ඒ නාලිකාව ගත්තු ප්‍රයත්නය සම්බන්ධයෙන් අපි අගය කරනවා. ඔවුන් භයක් නැතුව - අපි දන්නවා, මේ වනකොටත් ආරංචියි, ඒ නාලිකාවට දැනටත් තර්ජන එල්ල වෙලා තිබෙනවා කියලා මේක නතර කරන්න කියලා. හැබැයි, එහෙම තියෙද්දීත් තමන්ගේ මාධ්‍ය භූමිකාව කරගෙන යනවා. ජූලි මාසේ 20 වැනිදා, සෙනසුරාදා රාත්‍රී 8.00 ප්‍රවෘත්තිවලින් ඉදිරිපත් කළ ප්‍රධාන ප්‍රවෘත්තිය කුමක්ද? මීගමුව කුඩු තිප්පොලක්. ජාවාරම පිටුපස සිටින අය දේශපාලන හයිය සහ පොලීසියේ සමහර නිලධාරීන්ගේ හයිය ඇතුව මෙම ජාවාරම සිදු වෙනවා. ඒකේ දානවා මහ මොළකරු කවුද? ඔහු නගර සභාවට තරග කරලා, නාගරික සභිකයෙක් විධියට පත් වෙලා, කාලයක් ගත වුණාට පස්සේ පළාත් සභාවට පත් වෙලා, පළාත් සභාවේ ප්‍රබල ඇමැතිවරයෙක් බවට පත් වෙනවා. ඔහුගේ අතීතය ගත්තාට පස්සේ ඔහු නගර සභාවට ආවේ පුටු සයිකලයෙන්. නමුත් දැන් තත්ත්වය, අවුරුදු 10 ක 12 ක කාලය තුළදී ලංකාවේ අතිසුඛෝපභෝගී වාහන තියෙනවා. අපට හිතාගන්න බැරි තරම් මුදල් ප්‍රමාණයක් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට එතැනට එන්න මට ඉඩ දෙන්න බැහැ.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

මම අහන්නේ ගරු සභාපතිතුමනි, -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතැනට එන්න ඉඩ දෙන්න බැහැ.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ඉන්න, ඉන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වෙනත් මාතෘකාවකින් කථාව පටන් අරගෙන -

**ගරු රංජිත් සෝමවංශ** - නියෝජ්‍ය සභාපතිතුමා
Hon. Ranjith Somawansa - Deputy Chairman

ගරු සභාපතිතුමනි, -

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

අපේ මේ සභාවේ ඇමැතිවරුන් පස් දෙනා -

**ගරු රංජිත් සෝමවංශ** - නියෝජ්‍ය සභාපතිතුමා
Hon. Ranjith Somawansa - Deputy Chairman

මටත් තිබෙනවා වරප්‍රසාද ප්‍රශ්නයක්.

[සභාවේ ඝෝෂා]

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ඇමැතිවරුන් පස් දෙනෙක් බරපතළ විධියට හැල්ලුවට ලක් කරලා තිබෙනවා. ප්‍රසන්න රණතුංග මහ ඇමැතිතුමනි, ඔබතුමා ප්‍රසන්න පළාත් සභාවක් හදන්න යන්නේ. එතකොට තමන්ගේ පළාත් සභාවේ ඉන්න ඇමැතිවරයෙකුට රටේ වගකිව යුතු මාධ්‍ය නාලිකාවක් මෙහෙම චෝදනාවක් එල්ල කරලා තියෙද්දී, ඒක ඔබතුමාට නොසලකා හරින්න බැහැ. අපි අහන්නේ, ඔබතුමාට වගකීමක් තිබෙනවා තමන්ගේ ඇමැති මණ්ඩලයේ මෙහෙම කෙනෙක් ඉන්නවා නම් ඒ පිළිබඳව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාත් එතැනටමයි යන්නේ. ඔබතුමාගේ කාලය අවසන්.

[සභාවේ ඝෝෂා]

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ඒ පිළිබඳව සාක්ෂි තිබෙනවා කියලා කියනවා. ඒ නිසා මේ ඇමැති -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට මීට වඩා කාලය දෙන්න මට ඉඩකඩ නැහැ.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

අපට මතකයි 2011 දී ඔක්තෝබර් මාසේ -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කරුණාකරලා වාඩි වෙන්න ගරු මන්ත්‍රීතුමා.

[සභාවේ ඝෝෂා]

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

2011 ඔක්තෝබර් මාසේ මේ පළාත් සභාවේ ඇමැතිවරයෙකුගේ ගෙදරටයි ඒ හිතවතුන්ගේ ගෙදරටයි STF එක ගියා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ආයිත් පටන් ගත්තා. ඔබතුමාගේ කාලය අවසන්. වාඩි වෙන්න කාලය අවසන්.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ඒ නිසා මුළු පළාත් සභාවේම නීතිය කඩ -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා වාඩි වෙන්න ගරු මන්ත්‍රීතුමා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

කරන මේ වාගේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ඇමැතිවරුන් ගැන -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට ඉඩ දෙන්න බැහැ. කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

පළාත් සභාවේ සභාපතිවරයා හැටියට ඔබතුමාගේ වගකිමක්. ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ වගකීමක්. මේ හානි කරන්නේ -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, -

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

පළාත් සභාවට විරුද්ධයි තමයි.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් ඇහුම්කන් දෙන්න. ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

පළාත් සභාවේ ඇති කරන්න හදන කීර්තියට, යශෝරාවයට හානි කරනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ඒ වෙනුවෙන් විශේෂ -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වාඩිවෙන්න. කාලය අවසන්.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, මම නැවතත් ඔබතුමාගේ අවධානය යොමු කරනවා. මාධ්‍ය වාර්තාවක් ඇසුරු කරගෙන මෙවැනි ප්‍රකාශ මගින් සභාවේ මන්ත්‍රීවරුන්ට ඇඟිල්ල දික් කිරීම පිළිබඳව ඔබතුමා අවධානය යොමු කරන්න ඕනෑ. මාධ්‍ය නාලිකාව කරන කාර්ය පිළිබඳව අපි අගය කරනවා. යම්කිසි කාර්යයක් සම්බන්ධව, රටේ යම් දෙයක් සම්බන්ධව මාධ්‍ය කථා කරන එක අපි අගය කරනවා. හැබැයි, යම් පුද්ගලයෙක් ඉලක්ක කරලා යම් දෙයක් කියනවා නම්, ඒ පිළිබඳව ඒ මාධ්‍ය ආයතනය වගකීම දරන්න වෙනවා. ඒ වගකීම දරනවා වාගේම ඒ මාධ්‍ය නාලිකාව නීතිය ඉදිරියට - අපි බලාපොරොත්තු වෙනවා. මම විශ්වාස කරනවා ඉදිරි දින කිහිපය තුළ පොලිස්පතිතුමා මේ සම්බන්ධව යම්කිසි ක්‍රියා මාර්ගයක් අරගෙන මේ සම්බන්ධව වහාම රටට යම් ප්‍රකාශයක් කළ යුතුයි. මොකද, -

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ඒක තමයි ගරු සභාපතිතුමනි, අපිත් කියන්නේ. දැන් මේ පළාත් සභා ඇමැතිවරයෙකුට -

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු මන්ත්‍රීතුමනි.

[සභාවේ ඝෝෂා]

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

චෝදනා එල්ල වෙලා තියෙද්දී, පළාත් සභාවේ ගරුත්වය වෙනුවෙන් -

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, එවැනි පරීක්ෂණයකින් පසුව මේ සභාවේ ඒ පිළිබඳව කථා කරනවා නම් අපට ගැටළුවක් නැහැ. හැබැයි, පරීක්ෂණයක් වන්නට පෙර යම්කිසිවෙකුට ඇඟිල්ල දික් කරලා තවත් මන්ත්‍රීවරයෙක් චෝදනා කිරීම අපට අනුමත කරන්න බැහැ.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

මම කාටවත් ඇඟිල්ල දික් කළේ නැහැ. ගරු සභාපතිතුමනි, මම කිසිම ඇමැතිවරයෙක් නම් කළේ නැහැ.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා -

[සභාවේ ඝෝෂා]

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

මම කිව්වේ පළාත් සභාවට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සංවාදයකට යන්න දෙන්න බැහැ මට.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ඇමැතිවරු -

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා පොලිස්පතිතුමාගෙන් ඉල්ලීමක් කළා නම් අපි එකඟ වෙනවා, මේ සම්බන්ධව පරීක්ෂණයක් කරන්න කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සංවාදයකට යන්න දෙන්න බැහැ ගරු සංවිධායකතුමා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ඒකනේ ඔබතුමන්ලාගේ අවධානය යොමු කළේ, ඒ නාලිකාවේ වාර්තාව කළ ප්‍රවෘත්තිය සම්බන්ධයෙන් සොයා බලන්න කියලා.

[සභාවේ ඝෝෂා]

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ඔබතුමා ඒ වාර්තාව පිළිබඳව පරීක්ෂණයක් කරන්න කියනවා නම් අපි එකඟයි. හැබැයි, පොලිස්පතිවරයාගෙන් පරීක්ෂණයක් කරන්න කියලා ඉල්ලීමක් කරනවා නම් එකඟයි. හැබැයි ඒක නොවෙයි ඔබතුමා කළේ. ඔබතුමා චෝදනා කරනවා. එතැනයි වැරැද්ද.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

මම ඒ ප්‍රවෘත්තිය සම්බන්ධයෙන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට ඉඩ දෙන්න අමාරුයි. දිගින් දිගටම මේ විවාදයට යන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ඒ නිසා ඔබතුමන්ලාට වගකීමක් තිබෙනවා, ඒ ඇමැතිවරයා කවුද කියලා හෙළිදරව් කරන්න. ඔබතුමන්ලාගේ වගකීම. පළාත් සභාවේ සම්පූර්ණ - (බාධා කිරීමක්)

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

පාර්ලිමේන්තුවේ කොම්පියුටර් අරගෙන ගිය ඒවා ගැන අපි කිව්වේ නැහැ. පාර්ලිමේන්තුවේ තනතුරු දරලා කොම්පියුටර් හොකරම් කරපු අය ගැන අපි මේ සභාවේ සඳහන් කළේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු සංවිධායකතුමා දිගින් දිගටම -

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

අපි එහෙම කථා කරන්නේ නැහැ. අපි ශිලාචාර විධියට මේ සභාවේ හැසිරෙන්නට ඕනෑ. ශීලාචාර විධියට සභාවේ හැසිරෙන්න ඕනෑ. සභාවේ ගරුත්වයක් තිබෙන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේක දිගින් දිගටම යන්න දෙන්න බැහැ. මෙම අවස්ථාවේදී මෙම සභාව -

**ගරු රංජිත් සෝමවංශ** - නියෝජ්‍ය සභාපතිතුමා
Hon. Ranjith Somawansa - Deputy Chairman

ගරු සභාපතිතුමනි, මේ සභාවේ -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

භයද කියන්න. කියන්න දේවල් නැහැ. බොරුවට කයිය ගහන්න එපා. කියන්න දේවල් නැතුව බොරුවට කයිය ගහන්න එපා. කට විතරයි. බොරු බයිලා.

[සභාවේ ඝෝෂා]

කියන්න කෝ?

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, අපි කොළොන්නාවේ බලන්නේ බොදු බලයයි, රාවණා එකයි. පොලිස්පතිතුමා නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා විසින් මේ සභා ගර්භය තුළදී ද්වේශ සහගතව කරන ලද සියලුම ප්‍රකාශ හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කිරීමට මම ලේකම්තුමාට උපදෙස් දෙනවා. කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ගරු සභාපතිතුමනි, මම කරපු ප්‍රකාශය ද්වේශ සහගතයි කියලා ඔබතුමා තීන්දු කරන්නේ කොහොමද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ද්වේශ සහගතව කරන ලද ප්‍රකාශන.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

කොහොමද ද්වේශ සහගත වෙන්නේ? කාටද ඒක ද්වේශ සහගත වෙන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති ප්‍රකාරව.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

කාගේවත් නම සඳහන් කළේ නැත්නම් ඒක ද්වේශ සහගතව කාටවත් එල්ල වෙන්නේ නැත්නම් මගේ ප්‍රකාශය ඉවත් කරනවාට බලවත් විරෝධය ප්‍රකාශ කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සොයා බලලා මම ඒක කරනවා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ඉවත් කරන්න බැහැ. මේ රටේ ජනතාව වෙනුවෙන්, මේ රටේ තරුණ පරපුර වෙනුවෙන් කුඩුවලට එරෙහිව අපි හඬ නැගුවාට පස්සේ කාටද අයිතියක් තියෙන්නේ ඒක ද්වේශ සහගතයි කියලා කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා වාඩි වෙන්න. මම ඒක හොයලා බලන්නම්.

මේ අවස්ථාවේදී පෙරවරු තේ විවේකය සඳහා මෙම සභාව විනාඩි 15 කට කල් තබනවා.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්හිටුවන ලදින් පූ.භා. 11.38 ට ගරු නියෝජ්‍ය සභාපතිතුමාගේ [ රංජිත් සෝමවංශ මහතා] ප්‍රධානත්වයෙන් යළිත් රැස්විය.***

*Accordingly the Sitting, Suspended temporarily and. it resumed at 11.38 a.m with Hon Deputy Chairman [Mr.Ranjith Somawansa] in the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ අවස්ථාවේදී ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමාට අවස්ථාව සභාවේ කටයුතු සම්බන්ධ යෝජනාව ඉදිරිපත් කිරීමට. සභා කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් උදය ප්‍රභාත් ගම්මන්පිල ගරු ඇමැතිතුමාට මම ඇරයුම් කරනවා එම කටයුත්ත සඳහා.

# පළාත් සභාවේ කටයුතු
PROVINCIAL COUNCIL AFFAIRS

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල –** අමාත්‍යතුමා [ගරු සභා කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Udaya Prabhath Gammanpila - Minister [On Behalf of Minister of Council Affairs]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"අද දින පොදු කටයුතු ප්‍රමුඛතාවය ගත යුතුය"* යන යෝජනාව මම ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# 2013 මෝටර් වාහන ගාස්තු පිළිබඳ නියෝග
MOTOR TRAFFIC FEES REGULATIONS 2013

**ගරු උදය ගම්මන්පිල -** අමාත්‍යතුමා [ගරු උපාලි කොඩිකාර අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Udaya Gammanpila - Minister [On Behalf of Hon. Upali Kodikara, Minister]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"1991 අංක 07 දරණ බස්නාහිර පළාතේ මෝටර් වාහන ප්‍රඥප්තියේ 129(1) වැනි වගන්තිය යටතේ බස්නාහිර පළාතේ ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදනු ලැබ, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1908/11 දරණ හා 2013 අප්‍රේල් මස 30 වැනි දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද "2013 මෝටර් වාහන ගාස්තු පිළිබඳ නියෝග" යනුවෙන් හඳුන්වනු ලබන නියෝග බස්නාහිර පළාතේ පළාත් සභාව වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි."*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එම නියෝග පිළිබඳව විස්තරාත්මකව සලකා බැලීම සඳහා විශේෂ කාරක සභාවක් ලෙස සලකා ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කිරීමට මූලාසනය කටයුතු කරන බව දැනුම් දෙනවා.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක ප්‍රඥප්තියක් නොවෙයි නේ? මේක ගැසට් නිවේදනයක් නේ? වැඩි කිරීමක්. ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යන්න අවශ්‍යතාවයක් තිබෙනවාද? නැහැ නේ?

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, මේක රජයේ අයවැයෙන් යෝජනා වූ යෝජනාවලියක්.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

මේක ප්‍රඥප්ති කාරක සභාවට යන්න ඕනෑ නැහැ නේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මම ඔබතුමාගේ පැහැදිලි කිරීම පිළිගන්නවා. අපට සභාවේ එකඟතාව අනුව කටයුතු කරන්න පුළුවන්.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ඒ පිළිබඳව සාකච්ඡා කරන්න අපට අවස්ථාවක් දෙන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හොඳයි. ඔබතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරපු මෝටර් රථ ආදායම වැඩි කිරීමේ යෝජනාව පිළිබඳව මුලින්ම අපේ විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. විපක්ෂයේ අනෙකුත් මන්ත්‍රීවරුනුත් අදහස් ප්‍රකාශ කරාවි. විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. මේ ගාස්තු වැඩි වීම එක දිගටම වෙනවා. ඒක වැඩි කරලා තිබෙන්නේ පළාත් සභාවෙන් නොවෙයි. රේඛීය අමාත්‍යාංශයෙන් වැඩි කරලා, අපට එවනවා මේක කරන්න කියලා. අද වර්තමානයේ පළාත් සභා පත් වෙලා තිබෙන්නේ ඒකයි. ඉහළින් එන නියෝග පිළිපදින්න තමයි අපට සිදුවන්නේ. පසුගිය දවස්වල පළාත් සභාව පිළිබඳ සංශෝධන ඉදිරිපත් කිරීමේදී මේ කරුණු කිව්වා. සංශෝධන කරන්නේ නැත්තේ ඒකයි. ඒගොල්ලෝ ඕනෑම පනතක් එහේ සම්මත කරලා, පළාත් සභාවට තල්ලු කරන්න පුළුවන් මේක ක්‍රියාත්මක කරන්නය කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද මිනිස්සුන්ගේ ජීවන වියදම් ගැන බලන කොට මේ ත්‍රී රෝද රථ සහ අනෙකුත් වාහනවලට ගාස්තු වැඩි කිරීමෙන් අහිංසක, අසරණ ජනතාවට තමයි මේ බර දරන්න වෙන්නේ. විශේෂයෙන්ම ත්‍රී රෝද රථයක ගාස්තු වැඩි වීමෙන් අඩු තරමින් ඉස්කෝලේ යන ළමයින්ටත් මේ ගාස්තුවලින් බලපෑමක් වෙනවා. රෝගියෙකුට රෝහල්ගත වීමට රෝහලකට යාමේදීත් මේ ගාස්තු වැඩි වීම සිදු වෙනවා. අද ඒකයි තත්ත්වය. මේ ගාස්තු පමණක් නොවෙයි. ජීවන වියදම පවා අද අහස උසට නැගලා තිබෙනවා. විශේෂයෙන්ම මේ දවස්වල ආහාර මිල ගණන් පිළිබඳව කල්පනා කළාම ජනතාවට දරන්න බැරි තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. විදුලි බිල්පත්. ජල බිල්පත්. හෙට අනිද්දා වන කොට මම හිතන්නේ, බස් ගාස්තුත් වැඩි වෙන්න පුළුවන්. පුද්ගලික ගාස්තුත් වැඩි වෙන්න පුළුවන්. ඒ නිසා මේ බර පැටවීමෙන් ජනතාව තවත් කබලෙන් ලිපට තල්ලු වෙන එක තමයි වෙන්නේ. මේ රජයේ හරි ආර්ථික කළමනාකරණයක්, ආර්ථික වැඩ පිළිවෙළක් නැති නිසා තමයි රජය අද ජනතාව මිරිකලා, ඒ මුදල් අරගෙන යම් යම් පාඩුවට පවත්වාගෙන යන සංස්ථාවලට, ඒ වාගේම රජයේ අවශ්‍යතාවයන් ඉටු කර ගන්න, යම් උත්සව පවත්වන්න, ඒ වාගේම සැණකෙළි කරන්න ඒ වාගේ නොයෙකුත් විධියේ කටයුතු කරන්න තමයි උනන්දු වෙන්නේ. මේ රජය විසින්ම අද ජනතාවට බර පටවලා තිබෙන්නේ. අද වැටුප් වැඩි වීමක් සිද්ධ වෙලා නැහැ. වැටුප් වැඩි වෙන්න ඉල්ලුවාම ඒකට විකල්පයක් කර ගෙන ඒ ස්ට්‍රයික් එක කඩා කප්පල් කරනවා. විදුලි බිල්පත් වැඩි වෙලා උද්ඝෝෂණය කරන කොට, ඒකට විරුද්ධව රජය විවිධ මාදිලියේ කටයුතු කරනවා. බස් ගාස්තු වැඩි කරන්න ඉල්ලුවාම ඒවා කඩාකප්පල් කරනවා. රජය මොන ප්‍රකාශ කළත්, මහ බැංකුව මොන ප්‍රකාශ කළත්, අපි විදේශයන්ට ණය වෙලා ඉවරයි. ඒ විදේශ ණය බර දන්න අද - (බාධා කිරීම්)

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ණය නැතිව වැඩ කරන්න බැරි බව දන්නවා. ගන්න ණය සඳහා නිවැරදි ආයෝජනයක් තිබෙනවා නම් කමක් නැහැ. රටේ හරි ආයෝජනක් සිද්ධ වෙන්න ඕනෑ. අද විදුලිබල මණ්ඩලයට එක්කෝටි පන්සීයක අදායමක් ලැබෙනවා, වැස්ස ලැබෙන නිසා. ඒකේ ප්‍රතිලාභ අපට දෙන්නෙත් නැහැ. අද දුප්පත් ජනතාව රැකියා පැත්තෙන් බැලුවත්, ඒ වාගේම තමන්ගේ දෛනික ආදායම් මාර්ගය දිහා බැලුවත් ඉතාමත් අමාරු තත්ත්වයක පවතින්නේ. ඊයේ පෙරෙයිදා රට ලූණු කිලෝ එක රුපියල් පහළොවක් වැඩි කළා. දේශීය නිෂ්පාදන වැඩි වෙලා තිබෙනවා නම්, කමක් නැහැ. මේ රටේ සිදු වන නාස්තිය -

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni de Soysa

ගොවියාව ආරක්ෂා කරන්න එපාද?

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

මේවායින් ගොවියෝ ආරක්ෂා වෙන්නේ නැහැ.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni de Soysa

ඇයි නැත්තේ?

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ගොවියාට මේ කන්නය වගා කරන්න කලට වේලාවට පොහොර ටික දුන්නේ නැහැ. එවැනි රජයක් තුළ මේක වෙලා තිබෙන්නේ. ඒ නිසා මේ මිල වැඩි වීම රටේ ජනතාවට ඔරොත්තු දෙන්නේ නැහැ. අද මේ රටේ එක පුද්ගලයෙක් - කථා කරන මමත් උපදින්න ඉන්න දරුවාත් විදේශ රටවලට 380,000/- ක් විතර ණයකාරයෝ වෙලා තිබෙනවා. රටක් දියුණු වෙන්න ආයෝජනය

වෙන්න ඕනෑ. ගත්ත ණයවලට මොකද වුණේ? ගත්ත ණය ප්‍රයෝජනයක් නැති විධියට, අනවශ්‍ය විධියට ආයෝජනය කරලා, එක් කොටසක් ජීවත් වෙන්න - අද පාර්ලිමේන්තුවේ කෝප් වාර්තාවේ විශේෂයෙන් මිහින් ලංකා පිළිබඳව, ඒ වාගේම ලංගම පිළිබඳව අද වාර්තාවේ සඳහන් වෙනවා. පාඩු ලබන ආයතන ගණනාවක්. ඒ නිසා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ලංගම හැදුවේ ඔබතුමන්ලා නේ?

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

අපි ලංගම හදපු බව ඇත්තයි. තමුන්නාන්සේලා ඉතිරි ටික අද කනවා. තමුන්නාන්සේලාගේ පවුල් තර කර ගන්න අද මේ රටේ ජනතාව මිරිකලා - අද අඩු තරමින් මේ ආණ්ඩුවට කොළොන්නාවේ කුණු ටික අස් කර ගන්න බැරි වුණා. හැම පැත්තෙන්ම, හැම වට පිටාවෙන්ම බදු දාලා. බදු බැම්ම අද මුළු රටේ ජනතාව වෙලාගෙන - (බාධා කිරීම්) ඒ කොළොන්නාවේ කුණුයි කුඩුයි දෙකම තිබෙනවා. අපි නොවෙයි කියන්නේ. අද දුමින්ද සිල්වා ගරු මන්ත්‍රීතුමා ප්‍රසිද්ධියේම කියනවා. කුණු ගැන කථා කරන අයට (බාධා කිරීමක්) එහෙම නම් මේ වැඩි වන ජීවන වියදමට ඔරොත්තු නොදෙන විධියට මේ ගාස්තු වැඩි වීමෙන් වෙන්නේ ත්‍රීවීල් හෝ වේවා, බජව් ටැක්සි හෝ වේවා ජනතාවගේ ඒ දෛනික කටයුතුවලට විශාල පහරක් වෙනවා. ජීවත් වෙන්න බැරි තත්ත්වයක් උද උදා වෙලා තිබෙනවාය කියමින් මේ වැඩි කිරීම් පිළිබඳ යෝජනාවට අපි කණ්ඩායමක් හැටියට එක්සත් ජාතික පක්ෂයත්, විපක්ෂයත් විරුද්ධ බව මම මතක් කරන්න ඕනෑ.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු වැඩ බලන සභාපතිතුමනි, -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එහෙම තනතුරක් නැහැ.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීතියේ සඳහන් වෙන්නේ, නියෝජ්‍ය සභාපති කියලා තමයි.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා මේ කාරණාව සම්බන්ධවද?

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඔව්. ඔව්. ඇයි?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හොඳයි. අවස්ථාව දෙනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මේ කාරණාව සම්බන්ධව තමයි කථා කරන්නේ. වෙන මුකුත් කාරණා සම්බන්ධව නොවෙයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මට එහෙම විමසීමේ අයිතියක් තිබෙනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

විමසීමේ අයිතියක් තිබුණාට කමක් නැහැ. මම කථා කරලා වැරදි දෙයක් කථා කරනවා නම් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නැහැ. මම එකඟයි. ඔබතුමා කථා කරන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අද කොක්කම නේ?

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

විශේෂයෙන්ම අපි දන්නවා. මේ වැඩි වීමේදී ත්‍රී රෝද රථවල හා මොටර් සයිකල් යන දෙකේම ගාස්තුව හා බලපත්‍ර ගාස්තුව වාර්ෂිකව වැඩි වීමේ තැනකට යනවා. ස්වයං රැකියාවක් විධියට ත්‍රීරෝද රථ පදවන මිනිස්සු අද මේ රටේ ලක්ෂ ගණනක් ඉන්නවා. ඒ වාගේම තමන්ගේ රාජකාරී ගමන් බිමන්වල යන, පුද්ගලික ගමන් බිමන්වල යන මෝටර් බයිසිකල්, යතුරු පැදි පාවිච්චි කරන විශාල පිරිසක් ඉන්නවා. මේ කාරණයේදී එක පැත්තකින් ඉන්ධන මිල වැඩි වෙනවා. අනික් පැත්තෙන් බලපත්‍ර ගාස්තු වැඩි වෙනවා.

[ ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා ]

අනික් පැත්තෙන් ඒ අයට තිබෙන ආදායම් බලපත්‍ර ගාස්තුව වැඩි වෙනවා. මේ තත්ත්වය තුළ මේ රටේ සාමාන්‍ය මිනිස්සුන්ගේ ජීවත් වීමේ අයිතිවාසිකම දවසින් දවස ආණ්ඩුව උදුරා ගන්නා තැනකට ගිහිල්ලා තිබෙනවා. ඒ නිසා මම හිතන්නේ මේක ජනාධිපතිතුමාගේ අයවැය වාර්තාවේදී මේ වැඩි කිරීම කර ගත්තත්, පළාත් සභාවට මෙය අය කර ගැනීම සඳහා අපේ පළාත් සභාවේ අනුමැතිය අවශ්‍ය නිසා තමයි මේ ගැසට් පත්‍රය මේ පළාත් සභාවට යොමු කරලා තිබෙන්නේ. මම කියන්නේ, සාමාන්‍ය මිනිස්සු ගැන කථා කරන, කල්පනා කරන, සාමාන්‍ය මනුස්සයා ජීවත් කරවීමේ උවමනාවෙන් ඉන්නවාය කියන මේ රජය දවසින් දවස සාමාන්‍ය මිනිස්සු අසීරුවට, අමාරුවට පත් කරන තැනකට තමයි ගිහිල්ලා තිබෙන්නේ. ඒ නිසා මම හිතන්නේ, මෙවැනි දේවල් මීට වඩා කල්පනාකාරීව කළ යුතුව පවතිනවා. අද ත්‍රීරෝද රථයක් අයිති තරුණයෙකුගෙන්, ස්වයං රැකියාවක් විධියට තමන්ගේ ව්‍යාපාරය පවත්වාගෙන යන කෙනෙකුගෙන් ඇහුවොත් - අද ඒ මිනිස්සුන්ගේ රාජකාරිය කඩා වැටිලා. තමන් යම් මුදලක් දීලා, ත්‍රී රෝද රථයක් ලීසිං කරලා හෝ වෙන යම් ක්‍රමයකින් ලබා ගත්තත්, බැංකුවකට ණය වෙලා අද ඒක ගෙවා ගන්න බැරි තැනකට ගිහිල්ලා තිබෙනවා.

ඒ නිසා විශේෂයෙන්ම මේ කාරණයේදී අපි කියන්නේ, දවසින් දවස හැම බඩුවකම මිල ඉහළ යනවා. හැම දෙයකම මිල ඉහළ යන යුගයක සාමාන්‍ය මනුස්සයාට තමයි බලපාන්නේ. සාමාන්‍ය මනුස්සයා පාවිච්චි කරන ඒවාටත් බලපත්‍ර ගාස්තු, ආදායම් ගාස්තු ඉහළ යාම මම හිතන්නේ, ඉතාම දරා ගන්න බැරි තත්ත්වයකට ගිහිල්ලා තිබෙන්නේ. අද මේවා අය කර ගන්න පුළුවන් ක්‍රම තිබෙනවා. දැන් ලැම්බෝගිනි ලංකාවට ගෙන්වන්න ඒජන්සියක් විවෘත කරලා තිබෙනවා. ලැම්බෝගිනිවලට කිසිම බදුවල ප්‍රශ්නයක් නැහැ. ඕනෑ තරම් ගේන්න අයිතිය, අවකාශය රජ පුත්තුන්ට, ඒ ඕනෑ කෙනෙකුට ගේන්න පුළුවන්කම තිබෙනවා. රජ පුත්තු කියලා මම කිව්වේ සල්ලි තිබෙන මිනිස්සුන්ගේ පුත්තුන්ට. මේ සාමාන්‍ය මිනිහා පාවිච්චි කරන දේවලට තමයි මේ බදු ගහන්නේ.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

ඔබතුමා රටේ සංවර්ධනයට අකමැතිද?

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

අනික් පැත්තෙන් දැන් මේ සාමාන්‍ය මිනිහාගේ -

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

ඔයාට පර්මිට් එක දුන්නොත් ගෙන්වනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

අද අර පැකර්ලාට බදු සහන දෙනවා අවුරුදු දහයකට. කැසිනෝ සම්බන්ධව. ඒ නිසා අපි අනික් පැත්තෙන් අද - (බාධා කිරීම්) අපි කියන්නේ බදු ගැන. ආණ්ඩුව කැසිනෝවලට බදු දෙනවා. බදු ගහන්නේ නැහැ. මේ පක්ෂයේ නායකයෝ මේ රට බෞද්ධ රටක් කියලා, පන්සල් ගානේ ඇවිදිනවා. හැබැයි, මේ රටේ අනාගත තරුණ පරපුර ව්‍යසනයට පත් කරන, තමන් හම්බ කරන දේ විනාශ කර ගන්න තැනකට ගෙනියන කැසිනෝ ව්‍යාපාරය මෙතෙක් සම්බන්ධ කරලා තිබුණේ D.R. විජේවර්ධන මාවතට විතරයි. ඒක මේ රටේ ඕනෑම තැනක පවත්වාගෙන යන්න පුළුවන් විධියට, අද අණ පනත් සකස් වෙලා පාර්ලිමේන්තුව මේ වන කොට ඒ අවශ්‍ය පහසුකම් ඒකට ලබා දෙනවා. ඒ නිසා අපි කියන්නේ මේවාවලට බදු අය කර ගන්න. (බාධා කිරීම්)

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

කවදද එහෙම පනතක් ආවේ. මොන පනතද?

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

හරි. ඒ පනතත් ආවාම අපි කියන්නම්. අපි සූදානම් වෙලා තිබෙන්නේ. ගෙනැත් දෙන්නම්. ඒ නිසා අපි කියන්නේ සාමාන්‍ය මිනිස්සුන්ට, ලොකු මිනිස්සුන්ට, ඉහළ මිනිස්සුන්ට, වැරදි අතින් මුදල් හම්බ කරන අයගෙන් බදු අය කිරීම වහාම නවත්වලා, ඒ අයට විශාල බදු සහන ලබා දීලා තිබෙනවා. ඒ නිසා ඒවාට බදු අය කරලා සාමාන්‍ය මිනිස්සුන්ගේ අවශ්‍යතාවයන් සම්පූර්ණ කරන්නය කියලා යෝජනා කරනවා.

මම මේ කාරණයට අමතරව ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මතක් කරන්න ඕනෑ, ගිය හැන්සාඩ් එකේ කාරණයක් සම්බන්ධව. මේක මගේ වරප්‍රසාදයක් යටතේ මම ඉදිරිපත් කරන්නේ. මම ගියවර සභාවේදී ගරු ප්‍රවාහන අමාත්‍යතුමාගේ අවධානයට යොමු කළා, බස්නාහිර පළාත් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් කාර්යාලයේ දුම් සහතික ගන්න ගියාම සිද්ධ වන අක්‍රමිකතාවයන් පිළිබඳව. මම හිතන්නේ, මේ කාරණය සම්බන්ධව පුවත්පත්වල විශාල වශයෙන් නම් ගම් ඇතිව හෙළි කරලා තිබුණා. මේ රටේ පුවත්පත් කිහිපයකම. නමුත් මම මේක විශේෂ ප්‍රකාශයක් හැටියට ඉදිරිපත් කළත්, මේ හැන්සාඩ් වාර්තාවේ මේ සම්බන්ධයෙන් ගන්න තීන්දුව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරලා නැහැ. ඒ නිසා අපි යම් ප්‍රකාශයක් මේ සභාවේ කළාම ඒ ප්‍රකාශයට සිද්ධ වෙන්නේ මොකක්ද? මේක කෙළින්ම පළාත් සභාවට බලපාන කාරණයක්. පළාත් සභාවට අයිති කාරණයක්. මේක පළාත් සභාව හෑල්ලුවට ලක් වුණු කාරණයක් බවට පරිවර්තනය වුණා. මේ සම්බන්ධයෙන් ගත් පියවරක් මේ හැන්සාඩ් එකේ අපට දකින්න නැහැ. ඒ නිසා මේ පිළිබඳව ගරු නියෝජ්‍ය සභාපතිතුමාගේ අවධානයට යොමු කරවලා, මේ වෙනුවෙන් ගත් පියවර මොකක්ද කියන එක ඔබතුමා විමසන්න කටයුතු කරන්න කියලා මතක් කරනවා. බොහොම ස්තූතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒ වගකීම භාර ගන්නවා. මෙහිදී නම් කිරීමක් නැහැ. එක් එක් පාර්ශව නියෝජනය කරන ගරු මන්ත්‍රීතුමන්ලාට අවස්ථාව තිබෙනවා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෝටර් වාහන ගාස්තු පිළිබඳ නියෝගය පිළිබඳව සාකච්ඡා කරන කොට අපි දන්නවා, මේ වෙලාවේදී රටේ ජනතාවට බලපාන ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. ආණ්ඩුව අනුගමනය කරන මේ ආර්ථික ප්‍රතිපත්තිය විසින්ම ජනතාව දිනෙන් දින පීඩාවට පත් වෙලා තිබෙන්නේ. ඔවුන් මත අය කරන දඩවලින්, බදුවලින් සහ ජනතාව ණයකාරයෝ කරලා ගන්න ණයවලින් තමයි මේ ආණ්ඩුව දුවන්නේ. ඒ නිසාම එක පැත්තකින් ආහාර ද්‍රව්‍ය මත මිල වැඩි වෙලා, ඒ වාගේම සාමාන්‍ය වාහනයක් පාවිච්චි කරන මනුස්සයාගේ ඒ වාහන බදු මුදල් සැහෙන ප්‍රමාණයකින් ඉහළ ගිහිල්ලා. තෙල් ගාස්තු ඉහළ ගිහිල්ලා, ඒ මදිවාට අප්‍රේල් මාසේ ඉඳන් ඇරියස් එකට විදුලි බිල එන්න පටන් අරගෙන තිබෙනවා. මෙහෙම තත්ත්වයක් යටතේ මේ ගාස්තු වැඩි කිරීම අපට කීයටවත් අනුමත කරන්න බැහැ. අනෙක් පැත්තෙන් මේ ගාස්තු වැඩි කිරීමේ කිසිදු සාධාරණයක් නැහැ. අර කිව්වා වාගේම, ආණ්ඩුව එක පැත්තකින් නිස්කාරණ වියදම් කරද්දී - දැන් ලෝකයේ තිබෙන සියලුම උත්සව, සියලුම සන්දර්ශන, සියලුම ක්‍රීඩා උළෙලවල්, සියලුම මහා පරිමාණ සමුළු ලංකාවට ගේන්න සැලසුම් කරලා තිබෙනවා. මම හිතන්නේ, ඔලිම්පික් හැර ඉතිරි සියලු උත්සව ටික ලංකාවේ කරන්න තමයි ආණ්ඩුව බලාපොරොත්තු වෙන්නේ. මේ සඳහා කෝටි ප්‍රකෝටි ගණන් වියදම් දරන්න වෙනවා. දැන් අපි දන්නවා, පොදු රාජ්‍ය මණ්ඩලයීය නායක සමුළුව වෙනුවෙන් ආණ්ඩුව කරන්න බලාපොරොත්තු වන වියදම. අනික් පැත්තෙන් -

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

මුලින් කිව්වේ රාජ්‍ය නායකයන් එන්නේ නැහැයි කියලා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

නැහැ. දැන් එනවා නේ? ඒක තමයි රැජිනගේ හරි. රැජින නම් එන්නේ නැහැ දැන්. රැජිනගේ නොවෙයි චාර්ල්ස් කුමාරයාගේ kiss එක වෙනුවෙන් මුළු රටක් උකස් තියලා තිබෙන්නේ. ඒ නිසා මෙවැනි ණයකාරයෝ බවට රට පත් කරලා, ඒ ණය බර ජනතාව මත පටවලා තිබෙනවා. ඒ නිසා මේක ගත්තොත් එහෙම කිසිදු -

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ඒ ණය බර දැම්මේ කවුද? කවුද ගිනි තිබ්බේ?

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

මේ තමුන්නාන්සේලාත්, එක්සත් ජාතික පක්ෂයත් අනුගමනය කරපු ආර්ථික ප්‍රතිපත්තියයි. තමුන්නාන්සේගේ අමාත්‍යාංශයෙන් නාස්ති කරන්නේ බොහොම පොඩ්ඩක් වෙන්න පුළුවන්. හැබැයි ඊට එහා ගියපු මහා පරිමාණ නාස්තියක් මේ රටේ සිද්ධ වෙනවා. (බාධා කිරීම්)

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

පුළුවන් නම් උත්තරයක් දෙන්න. ඇමතිතුමා අහපු දේට උත්තරයක් දෙන්න.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

මොකක්ද? ජනාධිපතිවරයා ප්‍රමුඛ පවුලයි, අනික් පැත්තෙන් කැබිනට් මණ්ඩලයයි මහා පරිමාණයෙන් වියදම් කරන වියදම් ප්‍රමාණය. ලැම්බෝගිනි ගේන්න වෙන්න පුළුවන්, අනික් පැත්තෙන් ගත්තොත් එහෙම අර දැන් රටේ ජනතාව ඉල්ලලා නැහැ. හැබැයි ගේනවා, එයාර් බස් දහයක්. කෝටි තිස් එක් දහස් පන්සියයි. කාට පදින්නද? කාට යන්නද? මේ සාමාන්‍ය ජනතාව පාවිච්චි කරන ත්‍රී රෝද රථයට, මෝටර් සයිකලයට ගහන බද්දෙන් තමයි ඒවා ඔක්කොම එකතු කරලා මේවා ගේන්නේ. ඒ නිසා මේ ගාස්තු වැඩි කිරීමට අපි සම්පූර්ණයෙන් විරුද්ධයි. ජනතාවට සහන දෙන්න මීට වඩා ක්‍රියා මාර්ග අනුගමනය කරන්න කියන බල කිරීම අපි ආණ්ඩුවට කරනවා.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අතිගරු ජනාධිපතිතුමා 2013 අයවැයට යෝජනා කරපු යෝජනාවක් තමයි මේ යෝජනා කරන්නේ. මධ්‍යම ආණ්ඩුව විසින් 2013.02.08 වන දින අනුමත කර ඇති අයවැය යෝජනාවක් තමයි මේ පළාත් සභාවට ගෙනැල්ලා අද මේ මිල සංශෝධනයක් ඇති කරන්නේ. මම කනගාටු වෙනවා. ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රීතුමාත්, එක්සත් ජාතික පක්ෂයේ ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරයෙක් වන අපේ ඒ.එම්. යූසුෆ් ගරු මන්ත්‍රීතුමාත් මේ සම්බන්ධව අයුතු සහගත කරුණු ඉදිරිපත් කිරීම සම්බන්ධව. හරියට මේක කියවලාවත් නැහැ. කවදාද මේ ගැසට් එක පළ වුණේ. කොහොමද ආවේ කියලා දැන ගෙන නොවෙයි. මොකක්ද මේ වැඩි කළේ කියලා දැන ගෙන වත් නොවෙයි කථා කරන්නේ. දැන් බලන්න ජනතා විමුක්ති පෙරමුණ. බොහොම සතුටෙන් කථා කළා මේ වැඩි කරනවාට කැමැත්ත පළ කරලා. මොකද හේතුව? එයා කැමැත්ත පළ කරලා කථා කරන්න හේතුව වුණේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටේ පසුගිය ඉතිහාසයේ ගත්තොත් L.T.T.E සංවිධානය අවුරුදු 30 ක් මේ රටේ යුද්ධ කළා වාගේ ජනතා විමුක්ති පෙරමුණ අවුරුදු 13 ක් මේ රටේ යුද්ධ කළා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

කොහේද?

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

මේ රටේ අවුරුදු 13 ක්. ඒ කැරැල්ලට අහුවුණු තරුණ තරුණියන්, ඒ සිරබත් කාපු තරුණ තරුණියන් තවමත් තමන්ගේ ජීවිත සාර්ථක කර ගෙන නැහැ. ඒගොල්ලෝ ගිනි තියපු බස් තවම වෙන්දේසි කර ගන්න පුළුවන්කමක් ලැබිලා නැහැ. තවම ඒ ට්‍රාන්ස්ෆෝමර් කඩපු තැන්වලට අලුත් ට්‍රාන්ස්පෝමර් දෙන්න පුළුවන්කමක් ලැබිලා නැහැ.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. මේ මාතෘකාව මොකක්ද කියලා දැන ගන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමතිතුමා, දැන් මේ ඔබතුමාගේම අමාත්‍යාංශය.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

ඒ විතරක් නොවෙයි. අපේ තේ ෆැක්ටරි. එතකොට කර්මාන්ත ශාලා. දණහිසෙන් උඩට මිනිය ගෙනියන්න දුන්නේ නැහැ. බබා හම්බ වෙන අම්මාට ටොයිලට් එකට යන්න -

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විවාදය මොකක්ද කියලා දැන ගන්න කැමැතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා වාඩි වෙන්න. ගරු ඇමතිතුමා, දැන් මේ -

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

අහගෙන ඉන්න පුරුදු වෙන්න. අහගෙන හිටියොත් තමයි මන්ත්‍රීකම හරි බේරෙන්නේ. නැත්නම් එකක්වත් නැහැ. බින්දුවයි. ඒක හොඳට හිතේ තියා ගන්න.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමතිතුමා, යෝජනාවට අදාළව මූලාසනය අමතන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

නැහැ. එතුමා ඒක කියවලා ආවේ කිව්වා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

පරිශීලනය කරලා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම අහන්නේ එතුමා පරිශීලනය කරලා ආපු යෝජනාවේ කොහේද තිබෙන්නේ ජනතා විමුක්ති පෙරමුණේ එදා කරපු සහ දැන් කරන ඒ කරුණු කාරණා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා මදකට අසුන් ගන්න.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ඔබතුමාත් අහගෙන ඉන්න නිසා මම මේ අහන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමතිතුමා, මේ කාරණාව තුළ ඔබතුමාගේ ලොකු වගකීමක් තිබෙනවා. ඒ තුළ රැඳී සිටිමින් වෙනත් විවාදවලට නොගිහින් මේ කටයුතු අවසන් කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

මම මේ රටේ පුරවැසියෙක් හැටියට, බදු ගෙවන කෙනෙක් හැටියට, වාහනයක් තිබෙන කෙනෙක් හැටියට -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නැහැ ඔබතුමාට අදාළ මෝටර් රථ ගාස්තු නියෝගය -

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මීන් එහාට යන්නේ නැහැ. විශේෂයෙන්ම අපේ 1991 අංක 07 දරණ බස්නාහිර පළාත් මෝටර් රථ ප්‍රඥප්තිය අනුමත කරන්න මම යෝජනා කරනවා. මේ ගැසට් නිවේදනය අනුමත කරන්නය කියලා මම යෝජනා කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද 2013 මෝටර් වාහන ගාස්තු පිළිබඳ නියෝග සම්බන්ධව විස්තරාත්මක සලකා බැලීම සිදු කරන අවස්ථාවේදී අපේ විපක්ෂ නායකතුමාත්, ඒ.එම්. යූසුෆ් ගරු මන්ත්‍රීතුමාත්, නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමාත්, ඒ වාගේම ගරු අමාත්‍යතුමාත් අදහස් ප්‍රකාශ කිරීමෙන් අනතුරුව මේ සම්බන්ධව සභාවේ එකඟතාවය විමසා සිටිනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

බෙදීමක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකර සීනුව නාද කරන්න.

***ප්‍රශ්නය විමසන ලදින්, 61 (3) රීතිය යටතේ පළාත් සභාව පක්ෂව 23 යි, විරුද්ධව 15 යි වැළකුණු 01 යි යනුවෙන් බෙදුණේය.***
*Amended question put and the Provincial Council divided as per Rule 61(3) as 23 for, 15 against and 01 decliners.*

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 36(1) යටතේ මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. ගරු ඇමතිතුමාත් ඉන්න නිසා මට වටිනවා. මහර ආසනයේ මම ලබපු අත්දැකීම, මට වුණු අබැද්දියක්. ඒ ආසනයේ අපේ ඌරුවල් පේරුවේ - ඌරුවල, නැඳුන්ගම, සිවුරුඑමුල්ල, කිඹුල්ගොඩ, කිණිගම, බුත්පිටිය යන ප්‍රදේශවල ජලය විෂ වීමේ ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ඔබතුමන්ලා දන්නවා ඇති. පත්තරවලත් ගියා. ඒ සම්බන්ධව ජනතාව කියපු නිසා මම ඒ ස්ථානයට ගියා. එතැනට ගියාම එහෙම නම් මන්ත්‍රීතුමා, ඔබතුමාත් පොඩ්ඩක් පාවිච්චි කරලා බලන්න කිව්වා. ඇත්තටම මටත් දැනුනා, ඒ වෙලාවේ ඒකේ විෂ තත්ත්වය. ඒ නිසා ඒ ජනතාව භයට පත් වෙලා තිබෙන වෙලාවක ගම්පහ ප්‍රාදේශීය සභාවත්, මහර ප්‍රාදේශීය සභාවත් ජල ටැංකි දීලා, ජනතාව දැනුවත් කරලා වතුර ලබා දුන්නත් විශාල ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. වසර 20 කට අධික කාලයක සිට මේ හේලීස් සමූහ ව්‍යාපාරයට අයත් විශාල ව්‍යාපාරයක්, රබර් ග්ලවුස් සම්බන්ධ ව්‍යාපාරයක් එහි පවත්වාගෙන යනවා. සේවකයන් 800 කට, 1000 කට ආසන්න ප්‍රමාණයක් රැකියා කරනවා.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

ඉතින් වරප්‍රසාදයක් වෙන්නේ කොහොමද ඒක.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ජනතාවට බියක් ඇති වෙලා තිබෙනවා. ජනතාවට අත්‍යාවශ්‍ය දෙයක් තමයි ජලය කියන්නේ. ඉතින් විෂ වීමක් ඇති වෙලා තිබෙන්නේ. මම ගරු වැඩ බලන සභාපතිතුමා මාර්ගයෙන් ඉල්ලීමක් කරනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

වැඩ බලන සභාපතිවරු නැහැයි කිව්වා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

උප සභාපතිතුමා මාර්ගයෙන් ඉල්ලීමක් කරනවා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

නියෝජ්‍ය සභාපතිතුමා -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මම කැමැතියි හැම වෙලාවේම එතුමාට ඒ සභාපතිකම දෙන්න. ඒ නිසා මේ අවස්ථාවේ අපේ පරිසර කටයුතු අමාත්‍යතුමාගෙන් මේ පිළිබඳව පැහැදිලි කිරීමක් බලාපොරොත්තු වෙනවා. අපේ බස්නාහිර පළාත් සභාවට, අපේ ගම්පහ දිස්ත්‍රික්කයේ දැවෙන ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ගිහිල්ලා බලන්න. ඇඳිරි නීතිය දාලා වාගේ. ජනතාව ඔක්කොම රොක් වෙලා ටැංකි ගානේ පෝලිම්වල ඉන්නේ. එවැනි තත්ත්වයක් තිබෙන්නේ. ඉතින් ඒ සම්බන්ධව කවුද පරීක්ෂණයක් කළේ? බස්නාහිර පළාතේ ජනතාව, ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාව අපව පත් කරලා එවලා තිබෙනවා. එම නිසා පරිසර කටයුතු අමාත්‍යතුමා, මේ සම්බන්ධව ගත්ත ක්‍රියාමාර්ගය දැන ගන්න කැමැතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

පරිසර කටයුතු පිළිබඳ ගරු අමාත්‍යතුමාට යොමු කරනවා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාගෙන් ඉල්ලනවා, මේ සම්බන්ධව තොරතුරු මට ලිඛිතව ලබා දෙන්න කියලා. පරිසර දැනුවත් කිරීම සහ සංරක්ෂණය තමයි අපේ විෂය පථය වෙන්නේ. පරිසර නියාමනය අයිති වෙන්නේ මධ්‍යම ආණ්ඩුව යටතේ තිබෙන මධ්‍යම පරිසර අධිකාරියටයි. මම මධ්‍යම පරිසර අධිකාරියට මේ කාරණය යොමු කරලා, සහනයක් ලබා දෙන්න කටයුතු කරන්නම්.

**ගරු යූ.පී. චන්ද්‍රසෝම සරණලාල්**
Hon. U.P. Chandrasoma Saranalal

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. බස්නාහිර පළාත් සභා මන්ත්‍රීවරයකු හැටියට පත් වෙලා මාස දෙකකට වැඩි කාලයක් ගත වෙනවා. නමුත් මේ සභාව නියෝජනය කරන මහජන නියෝජිතයකු හැටියට අඩුම තරමින් මට ඒ අවශ්‍ය නිදහස් තැපැල් පහසුකමවත් මට මේ වන කොට ලැබිලා නැහැ. ඒ වාගේම මම පළමුවැනි දවසේ කථාවේදීම ඉල්ලීමක් කළා. මොකද, ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාව බලාගෙන ඉන්නවා මහජන නියෝජිතයකු හැටියට පත් වුණාට පස්සේ යම් ප්‍රතිපාදනයක්, යම් කාර්යයක් මම කරයි කියලා. ඒ සඳහාවත් අවශ්‍ය පහසුකම් තවම මට මේ වන කොට ලැබිලා නැහැ. මොකද, මම මේ ගැන සභා ලේකම්තුමාගෙන් ඉල්ලීමක් කළාම එතුමා එවලා තිබෙනවා, මධ්‍යම රජයේ නියෝජ්‍ය තැපැල්පතිනිය මේ තැපැල් පහසුකම් ලබා දෙන්න බැහැයි කියන එක. මම ඉල්ලීමක් කරනවා, මේක වරප්‍රසාද යටතේ සභා කටයුතු කාරක සභාවට හෝ යොමු කරලා ඒ ගැන කටයුතු කරන්නය කියලා. මම යළිත් එම ඉල්ලීම කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මගේ එක දෙන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මොකක්ද ශ්‍රීනාත් මන්ත්‍රීතුමා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මගේ තැපැල් ප්‍රතිපාදන දෙන්නම් කිව්වා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා ලිඛිතව දෙනවා නම්, අපට සලකා බලන්න පුළුවන්.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

එපා. ඒක එතුමාගේ අයිතිවාසිකමක්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අපේ ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරනවා එතුමාට වෙන් වුණු මුදලින් -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

නැහැ. නැහැ. එහෙම බැහැ. මන්ත්‍රීවරයෙක් වශයෙන් පත් වුණාට පස්සේ තිබෙන අයිතිවාසිකමක් ඒක. කාගේවත් එකක් දෙන්න බැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

දැන් මේ ගරු මන්ත්‍රීතුමා, මේ සභාවේ එක්සත් ජාතික පක්ෂයේ ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරයෙක්. මේ සභාවේ දීර්ඝ කාලයක් කටයුතු කරලා තිබෙනවා. දැන් මෙතැනදී පුංචි අපහසුවකට සභාව පත් වෙලා තිබෙනවා. සභා ලේකම් කාර්යාලය. රු. 24,000/- ක වැනි මුදලක් තමයි නිදහස් තැපැල් ගාස්තු හැටියට මුදා හරින්නේ. ඒක අපේ කලින් හිටපු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා භාවිතයට අරන් තිබෙන බව තමයි මම ලේකම්තුමාට කථා කළාම දැන ගන්න ලැබුණේ. ඒ වුණාට අපි සභා කටයුතු කාරක සභාවට මේ කාරණාව යොමු කරන්නට ඕනෑ. මන්ත්‍රීවරයෙකුගේ තිබෙන අයිතිවාසිකමක් තිබෙනවා නම් යළි සලකා බලලා ඊට අවශ්‍ය සම්පූර්ණ සහයෝගය ඔබතුමා වෙනුවෙන් ලබා දීමට සභා කටයුතු කාරක සභාවට යොමු කරලා සුදුසු තීරණයක් ගන්නය කියලා මම ලේකම්තුමාට යොමු කරනවා.

ඒ වාගේම ඔබතුමාගේ ප්‍රතිපාදන සම්බන්ධව ගරු මහ ඇමතිතුමා දැනුවත් කරන්න. දැනට ජගත් අංගගේ ගරු ඇමතිතුමා මෙතැන සිටිනවා. එතුමාට මතක් කරනවා, මේ සම්බන්ධව ගරු මහ ඇමතිතුමාත් එක්ක කථා කරලා එතුමාට ලබා දිය යුතු ප්‍රතිපාදන, ගරු මන්ත්‍රීවරුන්ට ලබා දෙන ප්‍රතිපාදන ලබා දීමට අවශ්‍ය සාකච්ඡාවකට ඔබතුමා සම්බන්ධ වෙන්නය කියලා. ඔබතුමා ගරු මහ ඇමතිතුමා මුණ ගැසී සාකච්ඡා කරන්න කියලත් මම මූලාසනය හැටියට ඔබතුමාට මතක් කර සිටිනවා.

**ගරු යූ.පී. චන්ද්‍රසෝම සරණලාල්**
Hon. U.P. Chandrasoma Saranalal

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඒක පිළිගන්නවා. නමුත් මම හිතන්නේ, පාර්ලිමේන්තු සම්ප්‍රදායන් තමයි අපි බොහෝ දුරට මේ පළාත් සභාව තුළ අනුගමනය කරන්නේ. ඒ අනුව හිටපු මන්ත්‍රීවරයා කුමන ආකාරයෙන් කටයුතු කළාද කියන එක පිළිබඳව නවක මන්ත්‍රීවරයෙක් හැටියට මට ඒකේ වගකීමක් භාර ගන්නත් බැහැ. එතැනදී මම කථා කරන්නේ, මගේ වරප්‍රසාද කඩ වීමක් හැටියට. මොකද, මමත් මහජන ඡන්ද ලබා ගෙන නියෝජනය කරන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එතැනදී ඔබතුමාට අසාධාරණයක් නොවන තැනට මූලාසනය වගකීමක් දරනවා.

**ගරු යූ.පී. චන්ද්‍රසෝම සරණලාල්**
Hon. U.P. Chandrasoma Saranalal

පොදුවේ ජනතාවට මගෙන් සිදු විය යුතු සේවාවට වුණු අඩුපාඩුවක් හැටියට තමයි මම දකින්නේ. ඒකයි මම ඒ කාරණය පෙන්නුම් කරලා දුන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හොඳයි. මීළහට පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ යෝජනා යටතේ යෝජනා දෙකක් තිබෙනවා. සිරිකමල් පිලීෂියන්ද සිල්වා ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව තමයි ප්‍රථම යෝජනාව හැටියට න්‍යාය පත්‍රයේ සඳහන් වෙන්නේ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ යෝජනාව ඇත්ත වශයෙන්ම අදාළ වන්නේ, ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අමාත්‍යාංශයට. එතුමා කාරුණික ඉල්ලීමක් කළා, මේ පිළිබඳව ප්‍රකාශයක් කරන්න. නැත්නම් ඒ පිළිබඳව විවාදයට සම්බන්ධ වෙන්න ඉතා කැමැත්තෙන් ඉන්න නිසා සභාවේ අනුමැතිය පරිදි, සභාවේ කැමැත්ත පරිදි මේ යෝජනාව ලබන සභාවට ඉදිරිපත් කරලා සභාවේ අනුමැතිය ලබා ගන්නය කියලා එතුමා ඉල්ලීමක් කළා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

දැන් මේ සම්බන්ධව සභාවේ විරෝධතාවයක් එහෙම තිබෙනවාද?

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

එකහයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එහෙම නම් ඊළඟ න්‍යාය පත්‍රයේ ප්‍රමුඛතම යෝජනාව හැටියට සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව ගනු ලබනවා. ඊළඟට කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව තමයි න්‍යාය පත්‍රයේ තිබෙන්නේ. මම එතුමාට ආරාධනා කරනවා එම යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලෙස.

# පෞද්ගලික මන්ත්‍රී යෝජනාව :
PRIVATE MEMBERS MOTION:

## වලංගු භාවයට පත් නොවීය
NOT VALIDATED

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පහත සඳහන් යෝජනාව මම ඉදිරිපත් කරනවා.

*"වර්තමානයේ වාර්තා වන පරිදි ප්‍රාදේශීය දේශපාලනයේ සිට ජාතික දේශපාලන තලය දක්වා වූ මහජන නියෝජිතයන්ගේ ගුණාත්මකභාවය අතිශයින්ම පිරිහෙමින් පවතී. ඊට පිළියමක් වශයෙන් මැතිවරණවලදී නාම යෝජනා ලබා දීමේදී දේශපාලන පක්ෂ ඉදිරිපත් කරන නාම ලේඛන විද්වත් මණ්ඩලයකට යොමු කොට එයින් නිර්දේශ වන නම් පමණක් පිළිගැනීමට මැතිවරණ කොමසාරිස් වෙත නියම කෙරෙන පරිදි නව නීති රීති සැකසිය යුතු බවට මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජය වෙත යෝජනා කර සිටියි."*

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

***[විසින් ස්ථිර කරන ලදී.]***
*[Seconded]*

**ගරු සුගත් මතුගමගේ**
Hon. Sugath Mathugamage

***[විසින් ස්ථිර කරන ලදී.]***
*[Seconded]*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ස්ථිර කිරීම් දෙකක් සිදු වුණා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

විපක්ෂයේ එක භාර ගන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

යූ. ජොර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාගේ ස්ථිර කිරීම මුලින්ම සිදු වුණා. ඒක භාර ගන්නවා මූලාසනයෙන්. කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමාට ඔබතුමාගේ යෝජනාව සම්බන්ධව අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව.

[ අ.භා. 12.15 ]

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා මෙම යෝජනාව ස්ථිර කිරීම සඳහා ජාතික නිදහස් පෙරමුණ නියෝජනය කරන අපේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නැහැ. එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන.

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

ඉන්න. ඒක මම කියන්නම්. මතුගම මන්ත්‍රීතුමාත්, ඒ වාගේම ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාත් එකවිටම මේ යෝජනාව ස්ථිර කිරීම ගැන. කෙසේ වුවත් විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාට ඒ අවස්ථාව ලැබී තිබෙනවා. එතුමා ඒ යෝජනාව ස්ථිර කිරීම ගැන මා පළමුවෙන්ම මගේ ස්තුතිය පුද කරන්න කැමැතියි. මෙම යෝජනාව ව්‍යතිරේකයන් දෙකකට යටත්ව ඉදිරිපත් කිරීමටයි මා අදහස් කළේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙවැනි පුළුල් යෝජනාවක් ඉදිරිපත් කිරීමේදී මා අපේක්ෂා කරන සියලුම කරුණු කාරණා ඒ යෝජනාව තුළ ලඝු කිරීම අපහසු නිසා ඉතාම සංක්ෂිප්තවයි මේ කරුණු ඉදිරිපත් කොට තිබෙන්නේ. මා ඉදිරිපත් කරන ව්‍යතිරේකයන් දෙක නම්, මා මෙයින් අදහස් කරන ගුණ යහපත්කම, ගුණාත්මක භාවය උගත්කම මත පදනම් නොවන බවයි. ඒ වාගේම කෙනෙකුගේ ගුණාත්මක භාවය සැලකීමේදී මා ඉදිරිපත් කරන කරුණු අපේ පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන් ඉදිරිපත් කරන්නා වූ ධනාත්මක අදහස් මත සංශෝධනය කිරීම සම්බන්ධයෙන් මාගේ විරුද්ධත්වයක් නොමැති බව යන ව්‍යතිරේකයන් දෙකට යටත්වයි මම මේ යෝජනාව ඉදිරිපත් කරන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටේ දේශපාලඥයන්, විශේෂයෙන්ම ප්‍රාදේශීය තලයේ දේශපාලඥයන් මෙතරම් පරිහානියට පත් වූ යුගයක් ඉතිහාසයේ අපි කවර කාලයකවත් දැක නැහැ. පසුගිය සතියේ ලංකාදීප පුවත්පත - පසුගිය සතියේ නොවෙයි. ඊට කලින් සතියේ 2013.07.13 වන දින. 13 ඒවා දෙකක් තිබෙනවා. මහා නරක ඉලක්කමක්. පළාත් දේශපාලන ලොක්කන් 84 ක් උසාවියට ඉදිරිපත් කරලා තිබෙනවා. මතක තියා ගන්න. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ 13 වැනිදා වන විටයි. ඉන්පසු සති දෙක තුළ අර ටැක්සි මීටරයක් ඉහළ යන්නා සේ මේ සංඛ්‍යාව දිනෙන් දින වැඩි වී යනවා. මේ නිසාම ගුණ යහපත් දේශපාලඥයෙකුට, හොරකම් නොකරන දේශපාලඥයකුට, පගා නොගහන දේශපාලඥයකුට, ස්ත්‍රී දූෂණ නොකරන දේශපාලඥයකුට, මංකොල්ල නොකන දේශපාලඥයෙකුට තමන් දේශපාලඥයෙක් කියා කියන්න බැරි තරමේ අවාසනාවන්ත තත්ත්වයක් තමයි මතුවී තිබෙන්නේ. ඒ නිසා අද අපේ දරුවන්ට තාත්තා කවුද කියලා ඇහුවාම මන්ත්‍රීවරයෙක්ය කියලා කියන්න එපාය කියන තත්ත්වයට අපි මානසිකව ඇද වැටී තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දේශපාලඥයා මේ රටේ ඈත ඉතිහාසයේ සලකනු ලැබුයේ, ඉතාම උසස් පුද්ගලයෙක් විදියටයි. ඔවුන් කොතරම් ජනතාවගේ සිත් සතන් තුළ විරාජමාන වී සිටියාද කිව්වොත් සමහර දේශපාලඥයන් දේවත්වයෙන් පුදනු ලැබුවා. මට මතකයි. මම මගේ පසුගිය කථාවලදීත් කියලා තිබෙන ආකාරයට දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමාව, දිවංගත ඩී.එස්. සේනානායක මැතිතුමාව, ඩඩ්ලි සේනානායක මැතිතුමාව, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියව, පිලිප් ගුණවර්ධන මැතිතුමාව, එස්.ඒ. වික්‍රමසිංහ මැතිතුමාව මේ රටේ ජනතාව දේවත්වයෙන් සලකපු දේශපාලඥයන් හැටියට සඳහන් කරන්න කැමැතියි. මේ ලැයිස්තුවේ තව නම් තිබෙන්න පුළුවන්. හැබැයි, මේ වර්තමානය වන කොට විශේෂයෙන්ම මේ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක, වැඩි වශයෙන් ආණ්ඩු කරන පක්ෂය. මේ දේශපාලන පරිහානිය තුළ තමන්ගේ සංඛ්‍යාව පැත්තෙන් ගොඩාක් ඉස්සරහායින් සිටිනවා. මේ අවාසනාවන්ත තත්ත්වය කොතරම් දරුණුද කිව්වොත්, අද මේ රටේ ජනතාව මේ පිළිබඳව නිසියාකාරව දැනුවත් වෙලා නැහැ. ඔවුන් මැතිවරණයකදී සලකා බලනු ලබන කරුණු කාරණා ඉතාම කනගාටුදායකයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද ඔවුන් දේශපාලඥයෙකුට ඡන්දය දීමේදී සලකා බලන්නේ, දේශපාලඥයා සමඟ පැජරෝ රථ කීයක් ගමන් කරනවාද? ඔහු වාහනය නැවතු සැනින් ආරක්ෂක භටයන් කී දෙනෙක් ඔහු පසුපසින් ගමන් කරනවාද? ඔවුන් ඇඳ සිටින්නේ, කළු යුනිෆෝම් එකක්ද? එහෙම නැත්නම් සුදු පාට එකක්ද? ඒ වාගේම ඔවුන් සමඟ එන සහචරයන් ජනතාවට බෙදන්නේ මොනවාද? හාල් ද? පොල් ද? සීනි ද? සල්ලි ද? එක්සයිස් පොත්ද? මොනවාද? ඒ බෙදන ප්‍රමාණය කුමක්ද? ඒවා ලබා ගන්නේ මොන ආකාරයෙන්ද කියන කාරණාව ජනතාවට වැදගත් වන්නේ නැහැ. ඒ ආකාරයට මේ රටේ මහජන නියෝජිතයන් තෝරා ගැනීමේදී මෙන්න මෙවැනි නිර්ණායකයන් පදනම් කර ගෙන තමයි ජනතාව, ජනතා නියෝජිතයන් තෝරන්නේ. මා පසුගිය සභාවක කිව්වා වාගේ, මේ කොළඹ දිස්ත්‍රික්කයේ - මේ කරුණු කාරණාව උදය ගම්මන්පිල ගරු අමාත්‍යතුමාට අදාළ වන එකක් නැහැ. සල්ලි වැඩියෙන්ම වියදම් කරන අපේක්ෂකයාට කිසිම කරදරයක් නැතිව පළමුවැනි තැනට එන්න පුළුවන් වාතාවරණයක් මේ රටේ තිබෙනවා. ඒ නිසා අයුතු ක්‍රමයෙන් සල්ලි හම්බ කර ගත්තේ නැති දේශපාලඥයන්ට ඉදිරි මැතිවරණය තුළ තමන්ට ජයග්‍රහණය කරන්න පුළුවන්ද බැරිද කියන කාරණාව ඉස්මතු වෙනවා. මට මතකයි. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය තෙවන පළාත් සභාවේ මහ ඇමතිවරිය වශයෙන් ඉඳලා, අගමැති වෙලා, ජනාධිපති ධූරයට පත් වුණාට පස්සේ, මේ මන්ත්‍රීවරුන්ගේ ආර්ථික තත්ත්වය ගැන කල්පනා කරලා, ඔවුන්ට දියුණු වෙන්න මාර්ගයක් හැටියට යම් යම් ප්‍රතිපාදන, වරදාන දුන්නා. මම ඒකේ වරදක් දකින්නේ නැහැ. මම මේ බොහොම සර්ව සාධාරණ, සාදු චර්යාවෙන් මේ සියලු දෙනාම දිහා බලන කෙනෙක් නොවෙයි. අපි ප්‍රායෝගික විය යුතුයි. අදත් අපේ සමහර මන්ත්‍රීවරු ජීවත් වෙන්නේ, දේශපාලනය කරන්නේ, එතුමිය එදා දීපු ඒ වරදානවලින්. ඒවා හොඳද නරක ද කියන එක නොවෙයි මා මෙතැන කථා කරන්නේ. හැබැයි, එදා එතුමිය දීපු

මත්පැන් බලපත්‍ර ගත්තේ නැති මන්ත්‍රීවරු පස් දෙනෙක් හිටියා. එක්කෙනෙක් තමයි නිව්ටන් ගුණරත්න මැතිතුමා. එක්කෙනෙක් තමයි අපේ අර කකුලේ පෝලියෝ රෝගය හැදිලා තිබුණු, ලලිත් පෙරමුණෙන් තරග කරපු සුසිල් කුලතුංග මන්ත්‍රීතුමා. අනික් එක්කෙනා හෝමාගම අපේ සම සමාජ පක්ෂයෙන් තරග කරපු කුලසිරි කුමාරගේ මන්ත්‍රීතුමා. රාජපක්ෂ මන්ත්‍රීතුමා සහ මම. හැබැයි ඒ පස් දෙනාගෙන් -

**ගරු සුනිල් ජයමිණි –** සභානායකතුමා
Hon. Hon. Sunil Jayamini - Leader of the House

නවුසර් ෆවුසිත්.

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

කවුද? මම ඒක දැන ගෙන හිටියේ නැහැ. මෙතුමා කියනවා. ඒක මම පිළිගන්නවා. එතුමා ගත්තේ නැහැ. හැබැයි, ඒ අයගෙන් හතර දෙනෙක් ඊළඟ මැතිවරණයේදී පරාජයට පත් වුණා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, අනික් දිස්ත්‍රික්කවලත් එහෙම නොගත් අය හිටියා.

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

මම කොළඹ දිස්ත්‍රික්කය ගැන සඳහන් කළේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔව්. දන්නවා. මම ඒක ඔබතුමාගේ අදහසට ගරු කිරීමක් කළේ, මූලාසනය හැටියට.

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

ඔව්. වෙනත් දිස්ත්‍රික්කවල ඇති. මම මේ කොළඹ -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නියෝජ්‍ය සභාපතිතුමා ගත්තෙත් නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මම ගත්තේ නැහැ.

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

මාත් එහෙම ලබාගෙන නැහැ.

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

එතකොට ඔබතුමිය හිටියේ නැහැ. මම මේ කියන්නේ, ඒවා ගත්ත මන්ත්‍රීවරු පහත් කරන්න නොවෙයි. ඇත්තටම ඒ බලපත්‍රය නිසා ජීවත් වන සමහර මන්ත්‍රීවරු ඉන්නවා. අද රැකියාවල් නැතිව. මම ඒ ගැන තර්ක කරනවා නොවෙයි. මම මේ කියන්නේ එවැනි ප්‍රතිපත්තියක ඉඳගෙන තමයි අපි දේශපාලනය කළේ. සමහර වෙලාවට සමහර පුද්ගලයෝ අපෙන් ඇහුවා ඔයාගේ ඔලුවේ අං තට්ටුවක් තිබෙනවාද කියලා. ඇයි ඒක ගත්තේ නැත්තේ කියලා. අං තට්ටුවක් තිබෙනවාද කියලා ඇහුවා. එවැනි පිරිසිදු දේශපාලනයක් අපි කළා. ඒ වාගේම අපට ආණ්ඩුවෙන් ලබා ගන්න තිබුණු වරදාන, වරප්‍රසාද, ලබා ගත්තේ නැති නිසා අපේ අත් පිරිසිදු නිසා තමයි අද අපි මෙහෙම කථා කරන්නේ. එවැනි පිරිසිදු මන්ත්‍රීවරු වෙනුවෙන්.

අද දේශපාලඥයන්ගේ වැරදි සොයන මාධ්‍ය, දේශපාලඥයන්ට චෝදනා කරන ස්වේච්ඡා සංවිධාන, බහු ජන සංවිධාන, ආගමික නායකයන්, හොඳින් දේශපාලනය කරන මිනිස්සු ඉස්මතු කරන්න කවදාවත් ජනමාධ්‍ය හමු, සාකච්ඡා තියන්නේ නැහැ. ඔවුන් කියනවා, අහවල් මන්ත්‍රීතුමා අහවල් දැරිය දූෂණය කළා. අහවල් මන්ත්‍රීතුමා අහවල් පගාව ගැහුවා. අහවල් අල්ලස ගත්තා කියලා. ඒ වාගේම ජන මාධ්‍යවලට යුතුකමක් තිබෙනවා, සදාචාරාත්මකව දේශපාලනය කරන මිනිස්සු ඔසවා තබන්න. එහෙම දෙයක් මාධ්‍යවලින් සිදු වන්නේ ඉතාම කලාතුරකින්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ වැරදි කරන දේශපාලඥයන් ජනතාව හමුවේ එළිදරව් කිරීමේ යුතුකම සහ වගකීම මාධ්‍යයට තිබෙනවා වාගේම, එසේ නොකරන මිනිසුන් ඔසවා තැබීමේ වගකීමත් ඒ හා සමානව මාධ්‍යට තිබෙනවාය කියන එකත් මේ වෙලාවේ අපි මතක් කරන්නට ඕනෑ. අද මේ දේශපාලනය මොන තරම් කුණු වෙලාද තිබෙන්නේ කියන කාරණාව මම මුලින් ඉදිරිපත් කරපු සංඛ්‍යා ලේඛනයෙන් ඔබතුමාට පෙනෙන්නට ඇති. කෙනෙක් තර්ක කරන්න පුළුවන්, ඔය දූෂණ, වැරදි, මේ රටේ දේශපාලනය ආරම්භ වූ දා සිට සිද්ධ වුණා කියලා. මම ඒක නැහැයි කියන්නේ නැහැ. නමුත් ඉතාම නින්දිත විධියට මේ රට තුළ මේ විධියට පැතිරිලා ගිහිල්ලා තිබෙන කරුණු කාරණා පිළිබඳව අපි මොහොතක් සාකච්ඡා කරන්නට ඕනෑ. මගේ මිත්‍ර රාජපක්ෂ මන්ත්‍රීතුමා මේ යෝජනාව සම්බන්ධයෙන් මා සමඟ මීට මොහොතකට පෙර කථා කළා. බොහොම ගෞරවයෙන් මම එතුමා සමඟ එකඟ වෙනවා. මේ වැරදි සහගත දේශපාලනය මේ රටට බෝ වෙන්නේ මේ වැරදි මැතිවරණ ක්‍රමය නිසයි. කෙනෙක් ඇයි මේ විධියට අසීමිත ලෙස සල්ලි හොයන්නේ? කුඩු විකුණලා හරි, පගා ගහලා හරි, කප්පන් අරගෙන හරි, මිනී මරලා හරි ඇයි මෙහෙම සල්ලි හම්බ කරන්නේ? තමන්ට මුළු දිස්ත්‍රික්කයේම දුවන්න වෙලා තිබෙනවා. ඒ දිස්ත්‍රික්කයේ දුවලා ඡන්ද හොයා ගත්තොත් විතරයි ඔහු මන්ත්‍රීවරයෙක් වෙන්නේ. පැරදුනොත් අනේ, ඒ මිනිහා හොඳ මිනිහා. ඒ නිසා පැරදුනා කියලා කවුරුවත් ඔහුට අනුකම්පා කරන්න එන්නේ නැහැ. දිනපු මිනිහා මොන විනාශය කරලා හරි දිනුවොත් ඒක තමයි ජයග්‍රහණය.

[ ගරු කීර්ති උඩවත්ත ]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට මතකයි. පසුගිය පළාත් සභා මැතිවරණයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් නාම යෝජනා ගන්න කුඩු ලාල් කියන මනුස්සයා මහවැලි කේන්ද්‍රයට ආවා. ඇත්තටම මම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආගම විධියට අදහන කෙනෙක් හැටියට මට විශාල ලජ්ජාවක් සහ පිළිකුලක් ඇති වුණා. මම දන්නේ නැහැ. මම කවදාවත් ඒ මිනිහාව දැකලා තිබුණේ නැහැ. කළු පාට පෙජරෝ හතරක් එකවර ඇවිල්ලා අර මහවැලි කේන්ද්‍රයේ පෝටිකෝව ඉස්සරහා නැවැත්තුවා. බොඩිගාඩ්ලා හිටියා 24 දෙනෙක්. කවුද කියලා අහපුවාම එයා තමයි කුඩු ලාල් මැතිතුමා කියන්නේ. එතුමා පියගැට පෙළ - අර අතකොට මැතිතුමෙකුත් ඉන්නේ. අපේ හිටපු සභාපති කෙනෙක් ඊයේ පෙරෙයිදා. පඩි පෙළ නැගලා ගියා. බුදු අම්මේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම හිතා ගත්තා අපේ පක්ෂය කණපිට පෙරළිලා මේ මනුස්සයාට නාම යෝජනා දුන්නොත්, මගේ නාම යෝජනාව මම ඉල්ලා අස් කර ගෙන ගෙදරට වෙලා ඉන්නවාය කියලා. විශේෂයෙන්ම මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට, අපේ ජනාධිපතිතුමාට පින් සිද්ධ වෙන්න ඒ කාලකණ්ණි වැඩේ වුණේ නැහැ. හැබැයි, තව පොඩ්ඩෙන් වෙනවා. මම වගකීමෙන් කියන්නේ. තව පොඩ්ඩෙන් වෙනවා ඒක. හැබැයි නූලයි දශම ගණනකින් ඒ අවස්ථාව ගිලිහී ගියා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඔබතුමාට බොහොම කනගාටුවෙන් කියනවා. කුඩු ලාල් ඉල්ලුවා නම් පළාත් සභා මන්ත්‍රීවරයෙක් වෙනවා ඒකාන්තයි. ඔහු ඊළඟට පාර්ලිමේන්තුවටත් යනවා. කවුරු හරි අවංක දේශපාලනයක් කරන අහිංසකයෙක් ඒ වෙනුවට ලැයිස්තුවෙන් කැපිලා යනවා. අන්න ඒ නිසා තමයි මම මේ පක්ෂවලට කියන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකට යුතුකමක් තිබෙනවා, තමන් ඉදිරිපත් කරන අපේක්ෂකයන් පිළිබඳව ස්වයං වාරණයක යෙදෙන්න. ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයට ඒ ස්වයං වාරණය තිබෙනවා. ජනතා විමුක්ති පෙරමුණට ඒ ස්වයං වාරණය තියෙනවා. අපේ ජාතික හෙළ උරුමයට ඒ ස්වයං වාරණය තිබෙනවා. හැබැයි, අපි ලජ්ජා වෙන්න ඕනෑ. ප්‍රධාන පක්ෂ දෙකට ඒ ස්වයං වාරණය නැහැ. ඒ නිසා තමයි අපට මේ වාගේ යෝජනා ගේන්න වෙලා තිබෙන්නේ. සමහරවිට හෙට මට විනය පරීක්ෂණයකට යන්න වේවි. හැබැයි, ඒ සඳහා බොහෝම සන්තෝෂයෙන් මුහුණ දෙන්න මම ලැහැස්තියි. මේක අපි පක්ෂයක් විවේචනය කිරීමක් නොවෙයි. මේ වගකීම අපි ඉෂ්ට කළේ නැත්නම් අනාගත පරපුර, අපේ දරුවෝ අපට සාප කරනවා. අපේ දෙමව්පියන් අපේ වැඩිහිටියන් මොනවාද කළේ කියලා. අද පක්ෂවලට ඕනෑ කරන්නේ, ජයග්‍රහනය සහ බලය පමණයි. ඒ සඳහා ඕනෑම පාදඩයෙක්, ඕනෑම චනවරයෙක්, ඕනෑම හොරෙක් තමන්ගේ අපේක්ෂකයා හැටියට දමන්නට ප්‍රධාන පක්ෂ පැකිලෙන්නේ නැහැ. මේ අහිතකර තත්ත්වයේ ප්‍රතිවිපාක අපි දෙගොල්ලෝම එකට භුක්ති විඳිනවා. හොරාත් භුක්ති විඳිනවා. හොරකම් කරන්නේ නැති එක්කෙනත් භුක්ති විඳිනවා. අන්න ඒකයි අපට තිබෙන දුක. ඒ නිසා අද මේ සභාවේ ඉන්න මේ බුද්ධිමත් මන්ත්‍රීවරුන්ට, මේ ආදරණීය අපේ සහෝදර මන්ත්‍රීවරුන්ට මම කියා සිටින්නේ, මෙතැනදී අපි ඉස්සරහට එන්නට ඕනෑ. මම දන්නවා. දේශපාලනයේදී මේ තුච්ඡ, අධම, නින්දිත ගණයට වැටෙන්නේ සියයට දශම ගණනයි. අපි ආඩම්බර වෙන්න ඕනෑ. සියයට දශම ගණනයි. හැබැයි, ඒ කාලකන්ණි දශමය කරන වැඩ නිසා 99% ක් වූ අවංක, වැදගත්, බුද්ධිමත් දේශපාලනයක යෙදෙන මිනිස්සු අසරණ වෙනවා. ඒ නිසා තමයි මම යෝජනා කරන්නේ. පක්ෂවලින් ඉදිරිපත් කරන නාම යෝජනා ලේඛනය යම්කිසි විද්වත් මණ්ඩලයකට ඉදිරිපත් කොට එය ශුද්ධ කළ යුතුයි. ඒ මණ්ඩලය කුමක්ද? ඒක පරාජිත දේශපාලඥයන්ගෙන්, එහෙම නැත්නම් පක්ෂවලින් යෝජනා කරන ඇම්බැට්ටයන්ගෙන්, හෙංචයියන්ගෙන් සමන්විත මණ්ඩලයක් නොවෙයි. අපේ අති පූජනීය පූජ්‍ය පක්ෂය. බෞද්ධ වේවා. ක්‍රිස්තියානි වේවා. හින්දු වේවා. ඉස්ලාම් වේවා. ඒ පූජක පක්ෂය මේ මණ්ඩලය තුළ නියෝජනය විය යුතුයි. ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්, විවිධ ක්ෂේත්‍රවල ගොවි, කම්කරු සංවිධාන, නීතිඥවරු, වෛද්‍යවරු ඒ වාගේ වෘත්තිකයන් ඇතුළත් වන මේ සමාජයේ මේ ප්‍රශ්න ගැන විවෘතව කථා කරන බුද්ධිමත් පිරිසක් මේ විද්වත් මණ්ඩලය තුළ ඉන්න ඕනෑ. ඒ අයට පුළුවන්කම තිබෙන්න ඕනෑ, තමන්ගේ හෘදය සාක්ෂිය අනුව පක්ෂවලින් ඉදිරිපත් කරන ලැයිස්තුව ශුද්ධ කරලා දෙන්න. ඒ සඳහා නීතිමය ප්‍රතිපාදනයක් අවශ්‍යයි.

දැන් අපි කියනවා, වත්කම් ප්‍රකාශ කරන්නය කියලා. ඒක හරියට බස් එකේ දුම්බීම තහනම් වාගේ තමයි. කවුද වත්කම් කියන්නේ? ඇයි අපට බැරි වත්කම් ප්‍රකාශ නොකරන සියලු අපේක්ෂකයන්ගේ නාම යෝජනා අවලංගු කරන්න? ඇයි අපට එහෙම කරන්න බැරි. මේවා ඉතාම සරල කාරණා. මම ළඟ තිබෙනවා, මේ පිළිබඳව කරපු අධ්‍යයනයන්. ඇයි අපට බැරි අපේක්ෂකයා ගැන පොලිස් වාර්තාවක් ගන්න. ශ්‍රී ලංකා කාරයෙක් විධියට මම බොහොම දුකෙන් මේක කියන්නේ. මිනී මැරුම් චෝදනාවකට ලක් වෙලා හිටපු පුද්ගලයන්ට - පස්සේ දඩුවම් කළා. ඇත්ත. කියන්න පුළුවන් පූර්ණ නිගමනයක් තිබෙනවා දඩුවම් ලබන තුරු ඔහු නිවැරදිකරුවෙක් කියලා. ඒවා නිකම් මේ ප්‍රලාපයන් නේ? අපට බැලූ බැල්මට මෙතැන වරදක් වෙලා තිබෙනවා කියලා තීරණය කරන්න අපේ පක්ෂයේ විනය කමිටුවට බැරිද? නීතිඥයෝ ඕනෑතරම් ඉන්නවා. විශ්‍රාමලත් විනිශ්චයකාරවරු ඉන්නවා. බැලූ බැල්මට තීරණය කරන්න පුළුවන්. දැන් විනිශ්චයකාරවරයෙක් අල්ලස් අරගෙන අහු වුණා. අපේ පක්ෂවල නීතිය අනුව විනිශ්චයකාරතුමා ඇප ගත්ත ගමන් ගිහිල්ලා ආයිත් උසාවියක නඩු අහන්න පුළුවන්. ඇයි ඔහු තවම වරදකරුවෙක් වෙලා නැහැ නේ? වරදකරුවෙක් වෙලා නැහැ. ඒ නිසා එයාට නඩු අහන්න පුළුවන්. එහෙම වෙන්න බැහැ. එහෙම වෙන්නේ නැහැ. ඒක තමයි සදාචාරය. ඒක තමයි පිළිගැනීම. ඇයි අපට එවැනි සරල දෙයකට යන්න බැරි? පගාව ගහලා අහුවුණු මිනිහා, ස්ත්‍රී දූෂණය කරලා අහු වුණු මිනිහා, මිනී මරලා අහු වුණු මිනිහා තවමත් සභාපතිකමේ වැඩ කරනවා.

අද පොදු රාජ්‍ය මණ්ඩලයීය සංවිධානය වෙනුවෙන් බ්‍රිතාන්‍ය මන්ත්‍රී කණ්ඩායම ඇවිල්ලා තිබෙනවා. එක මන්ත්‍රීවරයෙක් කියනවා, අපට තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි අපේ පුරවැසියෙක් මරලා තිබෙනවා. ඒ මරණය ගැන හරියට වැඩ පිළිවෙළක් වෙනවාද කියලා බලන්න තමයි අපි ආවේ. බලන්න මේ මිනිස්සු කරන වැඩවලින් දේශීය වශයෙන් විතරක් නොවෙයි, ජාත්‍යන්තර වශයෙනුත් මේ රට අපකීර්තියට පත් වෙනවා. ඒ සියල්ලම යන්නේ අවසානයේදී අතිගරු ජනාධිපතිතුමාගේ ගිණුමටයි. මතක තියා ගන්න. රාජ්‍ය නායකයා වශයෙන් අසීරුවට පත් වන්නේ එතුමායි. දැන් ඔක්කෝටම තිබෙන්නේ දැන ශක්තිමත් කරන්න නේ? අනේ එහෙම උවමනාවක් තිබෙනවා නම්, වැරදි වැඩ නොකර හිටියා නම් ඊට වඩා ශක්තියක් තවත් නැහැ. එහෙමයි කරන්න ඕනෑ. වැරදි වැඩ නොකර සිටියා නම් තමයි හොඳ. මම අහන්නේ අල්ලස් අරගෙන, අතට අහු වුණාට පස්සේ ඒ සභාපතිවරයාට පුළුවන් නම් සභාපතිකමේ වැඩ කරන්න. මොකක්ද මේ රටේ සදාචාරය? මොකක්ද මේ රටේ නීතිය? හැබැයි, මම මුලින් ව්‍යතිරේඛ දෙකක් ගැන කිව්වා. ව්‍යතිරේඛ දෙකක්. එකක් තමයි නීතිය ඉදිරියේ යම්කිසි කාරණයක් ආ පමණින් ඔහු මිනීමරුවෙකු, දූෂිතයෙකු කරන්න අපි සූදානම් නැහැ. හැබැයි, මේ නඩුව ඉක්මණට අහන්න ඕනෑ. රීටා ජෝන්ස් ප්‍රශ්නයේදී අධිකරණය එවැනි ක්‍රියා මාර්ගයකට ගියා. ජනතා නියෝජිතයෙකුට විරුද්ධව නඩුවක් ආවොත් ඒ නඩුවට ප්‍රමුඛත්වය දීලා, ඉක්මණට ඒ නඩුව අහන්න ඕනෑ. ඒකෙන් දෙපැත්තටම සාධාරණය වෙනවා. අපි දන්නවා. අද උදෙත් යම් යම් චෝදනා අපේ ගරු ඇමතිවරයෙකුට ආවාය කියලා. චෝදනා නගන්න ඕනෑම හැකර කටකට පුළුවන්. දේශපාලඥයෙකු වෙන්න නම් ඉගෙන නොගැනීමත්, හැකර කටක් තිබීමත් විතරයි අවශ්‍ය වන්නේ. ඔය දෙක තමයි දේශපාලනයේ ඉහළටම යන්න තිබෙන සුදුසුකම් දෙක. හැකර කටක් සහ නූගත්කම. ඔය දෙක තිබෙනවා නම්, ඕනෑම තැනකට ඔලුව පහත් කරලා ඉස්සරහාට යන්න පුළුවන්. ඒ දෙක නැති නිසා තමයි අද මේ හුඟාක් මන්ත්‍රීවරු ඉන්න තැනම ඉන්නේ. ඔබතුමාත් ඇතුළුව.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මේ කියන්නේ මෙවැනි චෝදනා කෙනෙකුව විනාශ කරන්න ඉදිරිපත් කරන්න පුළුවන්. අන්න, ඒ ගැන අපි ප්‍රවේසම් වෙන්න ඕනෑ. අභූත චෝදනා ඉදිරිපත් කරන්න පුළුවන්. දැන් කෙනෙක් කියන්න පුළුවන් මෙතුමා මේ කථා කරන්නේ, පරස්පර විරෝධී කථාවක්. මම මේ කියන්නේ අපි කරන හැම යෝජනාවක්ම සාධාරණ වෙන්න ඕනෑ. මෙවැනි චෝදනාවකට අපි ලක් වුණොත් අපව විනාශ කරන්න, අපේ දේශපාලන ගමන නැති කරන්න බොරු චෝදනාවක් අපට දාලා, මිනී මැරුම් චෝදනාවක්, අල්ලස් චෝදනාවක් දාලා ඉදිරිපත් කළාය කියන්න උත්සාහ ගන්න පුළුවන්. මේ නඩුව කෙටි කාලයකින් විභාග වෙන්න ඕනෑ. විභාග වෙලා ඔහු නිවැරදිකරු වුණොත් ඉතාම ගෞරවාන්විතව ඔහුව නැවත ඒ පුටුවේ වාඩි කරවන්න ඕනෑ. හැබැයි, වැරදිකාරයා වුණොත් එයාව ඒ තනතුරෙන් අයින් කරන්න ඕනෑ. එතකොට ප්‍රශ්න දෙකක් විසඳෙනවා. පක්ෂයට ගැටළුවක් තිබෙනවා. මෙයා නිවැරදිකරු වුණොත්, මේ මනුස්සයාට අසාධාරණයක් වුණා නේද කියලා. එහෙම දෙයක් තිබෙනවා. හැබැයි, කෙටි කාලයක් තුළ මේ නඩුව අහනවා නම්, කෙටි කාලයකින් මේ නඩුවට විනිශ්චයක් ලැබෙනවා නම් ඔහුට ලොකු අසාධාරණයක් වෙන්නේ නැහැ. ඕනෑ නම් මාසයක්, දෙකක්, තුනක්, හතරක් ඇතුළත ඒ ප්‍රශ්නය විසඳෙයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම එක කාරණාවක් ඔබේ අවධානයට යොමු කරවනවා. කොළඹ මහ නගර සභාවට අවුරුදු 100 ක් පිරීම නිමිත්තෙන් හුළුගල්ලේ මැතිතුමා - දැන් ඉන්න අර එක්කෙනා නොවෙයි. හුළුගල්ලේ මැතිතුමා පොතක් ලියනවා. දැන් ඉන්න එක්කෙනා නොවෙයි. නැත්නම් හිතයිනේ එහෙමයි කියලා. හුළුගල්ල මැතිතුමා ලියනවා පොතක්. ඒ පොතේ තියෙනවා, මේ කොළඹ නගර සභාව නියෝජනය කර මහත්වරුන්ගේ සහ නෝනාවරුන්ගේ නාම ලේඛනය. එෆ්.ආර්. සේනානායක, එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක, ඒ.ඊ. ගුණසිංහ, ශ්‍රීමත් මොහොමඩ් බාකීර් මාකර්, ආර්.ඒ. ද මැල්, ඒ.පී. ද සොයිසා, ජේ.ආර්. ජයවර්ධන, එස්.සී. නිශ්ශංක, වෛද්‍ය කුමාරන් රත්නම්, එම්.ජී. මෙන්ඩිස්, එම්.එච්. මොහොමඩ්, වී.ඒ. සුගතදාස, පීටර් කේනමන්, එන්.එම්. පෙරේරා, විවියන් ගුණවර්ධන, බර්නාඩ් සොයිසා, වින්සන්ට් පෙරේරා, ඩී.පී.ආර්. ගුණවර්ධන යනාදී වශයෙන්. එදා අනේ ඒ උත්තරීතර සභාව දෙවැනි වුණේ ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුවට පමණයි. කොළඹ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීතුමන්ලාගේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ෆවුසි ඇමතිතුමා.

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

ෆවුසි ඇමතිතුමා. සමාවෙන්න. ඔබතුමාට ස්තුතියි. මීට අවුරුදු කිහිපයකට පෙර අපට සිද්ධ වුණා, කොළඹ මහ නගර සභාව විසුරුවා හරින්න. ඇයි? අපි එහි නගරාධිපති ධූරයට තෝරා ගත්තේ කවුද? මේ රටේ යතුර වාගේ තිබෙන, මේ රටේ දොරටුව කොළඹ නගරය නම් එහි යතුර වාගේ තිබෙන කොළඹ නගර සභාව පාලනය කරන්න අපි පත් කර ගත්තේ කවුද? ඇත්තෙන්ම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අඳුරු යුගය වහාම වෙනස් කළ යුතුව තිබෙනවා. එතැනදී ඒක කොළ පාටද? නිල් පාටද? රතු පාටද? කියන එක නොවෙයි. අපි හරි මිනිස්සු තෝරා ගන්නට ඕනෑ. ඒ නිසා තමයි මම ජනමාධ්‍යයට ඇඟිල්ල දික් කළේ. ඔබතුමන්ලා කළු පාට පෙන්වනවා. වැරැද්ද පෙන්වනවා. නමුත් සුදු පාට සහ නිවැරදි දේ පෙන්වන්න ඒ තරම් උනන්දුවක් දක්වන්නේ නැහැ. ඒ නිසා ඒ අවංක මිනිස්සු අසීරුතාවයට පත් වෙනවා. මම මගේ දේශපාලන විද්‍යා නිබන්ධනයේදී පශ්චාත් උපාධිය සඳහා සම්මුඛ පරීක්ෂණ ගණනාවක් කළා, නියැදි කිහිපයක් ලබා ගන්න. විදුහල්පතිවරුන්, ස්වාමීන් වහන්සේලා,

[ ගරු කීර්ති උඩවත්ත ]

ඒ වාගේම ඉංජිනේරුවෝ, වෛද්‍යවරු. ඒ අයගෙන් 90% ක්, මම ඔබතුමාට බොහොම කනගාටුවෙන් කියනවා, ඡන්ද පොළට ඡන්දය දාන්න යන්නේ නැත. ඔවුන්ගේ මතය මොකක්ද? වැඩක් නැහැ. ඔක්කොම හොරු බව. ඒ උගතුන්, බුද්ධිමතුන් කියන වෘත්තිකයන්, ඡන්ද පොළට යන්නේ නැහැ. එක්කෙනෙක් බොහොම ආඩම්බරයෙන් කියනවා. විදුහල්පතිවරයෙක්. මම අවස්ථා පහකදී මේ වන තුරු ඡන්දය පාවිච්චි කරලා නැහැයි කියලා. ඒ කියන්නේ, මැතිවරණ පහකට ඔහු ඡන්ද පොළට ගිහිල්ලා නැහැ. ඇත්තෙන්ම ඔවුන් මේ කියන්නේ මොකක්ද? ඔවුන් මේ සමාජය විවේචනය කරමින්, මහා සංවාදවල යෙදෙමින් ඔවුන් උදව් කරනවා අනියමින් හොරුන්ට, කුඩුකාරයන්ට, ස්ත්‍රී දූෂකයන්ට, මංකොල්ලකාරයන්ට, පගාකාරයන්ට දේශපාලනයේ රැහුම් රහන්න. ඒ අය උදව් කරනවා. ඇයි? ඒ අය ඡන්ද පොළට ගියොත් තමයි, ඒ බුද්ධිමත් මිනිස්සු ඡන්ද පොළට ගියොත් තමයි, ඒ මධ්‍යම පාන්තිකයන් ඡන්ද පොළට ගියොත් තමයි හොඳ මිනිස්සුන්ට ඡන්දයක් වැටෙන්නේ. එහෙම නැත්නම් ඡන්දය දාන්න යන්නේ පාදඩ ලුම්පන් පන්තියේ වැඩි කොටසක්. කුඩු පැකට් එකට. බත් පාර්සලයට. අරක්කු බෝතලයට. රුපියල් දෙදාහට. ඒ අයගේ ඡන්ද ගන්න තිබෙනවා දම්වැල් න්‍යාය කියලා එකක්. දම්වැල් න්‍යාය. චේන් ක්‍රමය. පළමුවැනි කුඩුකාරයා පළමුවැනි ඡන්ද පත්‍රිකාව අරන් එළියට එනවා. ආපු ගමන් 1000 ක් දෙනවා. දෙවැනි කුඩු කාරයාට ඒක දෙනවා. තුනම ගහලා මේක දාලා උඹේ එක අරගෙන වරෙන් කියලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, වෙලාව පිළිබඳව සැලකිලිමත් වුණොත් -

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

මම තව විනාඩි පහකින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

බොහොම වටිනා කථාවක්.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

වටිනවා. වටිනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, පොඩ්ඩක් රැඳී සිටින්න. මේ යෝජනාව හරිම වැදගත්. ඒ නිසාවෙන් මම මූලාසනය හැටියට එතුමාට ගරු කරනවා. ඔබතුමන්ලා යෝජනා කරන්නේ මොකක්ද? විනාඩි පහක්ද? කීයක්ද දෙන්නේ.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ඉවර වනකල්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඉවර වනකල් කියන කාරණාව රීතිත් එක්ක පොඩි ගැටළුවකට මට මුහුණ දෙන්න වෙනවා. එහෙම නම් අපි එතුමාට විනාඩි 10 ක් දෙමු. හොඳයි.

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

මම ස්තුතිවන්ත වෙනවා අපේ සහෝදර මන්ත්‍රීතුමන්ලාටත්, මූලාසනයටත් මේ කථාව මට තවදුරටත් කර ගෙන යාමට ඉඩ දීම ගැන. මා මේ කියන්නේ ඉතාම දැඩි වේදනාවකින් මිසක් තරහකින් නොවෙයි.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කියාගෙන ආවේ චේන් ක්‍රමය ගැන.

**ගරු එම්. ෂාෆි රහීම්**
Hon. M Shafi Raheem

ගරු මන්ත්‍රීතුමා, චේන් ක්‍රමය ගැනත් කියන්න.

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

චේන් ක්‍රමය මම කිව්වා. ඔබතුමාට ඒක රස කර කර තලු මරන්න පුළුවන් බව මම දන්නවා. ඒකෙන් ගොඩාක් සතුටු වන බවත් දන්නවා. ඒ චේන් ක්‍රමයෙන් ඡන්ද ගන්න හැටි අපි කවුරුත් දන්නවා. ඒ නිසා අපි ඒ ගැන දිගින් දිගට කථා කරලා වැඩක් නැහැ. මම මගේ කථාව කථා දෙකකින් අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, සභාවේ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා එකඟ නිසාවෙන් ඔබතුමාට අපි වේලාව නියම කරන්නේ නැහැ.

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

ස්තුතියි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. තමුන්නාන්සේලාට පොඩ්ඩක් නිදිමතත් හැදීගෙන එන නිසා කථා දෙකක් කියනවා.

හැබැයි, නම් ගම් අහන්න එපා. මොකද, මගේ ජීවිතය, මගේ අහිංසක දරුවාගෙයි නෝනාගෙයි ජීවිතය මට වඩා වටිනවා. ඒ නිසා මගෙන්, නම් ගම් අහන්න එපා. කොහේද කියලා අහන්න එපා. හැබැයි, මම බොහොම වගකීමෙන් කියනවා මේ කථා දෙකම - මම කථා ගොතන්නෙක්. ඔබතුමා දන්නවා. හැබැයි, මේ කථා දෙකම ගෙතු කථා නොවෙයි. මේවා අපි ජීවත්වන සමාජය තුළ ඉතාම මෑත ඉතිහාසය තුළ සිදු වූ කථා දෙකක්. මන්ත්‍රීවරු දෙන්නෙක් ගැනයි මම මේ කියන්නේ. මේ මන්ත්‍රීවරු අඳින්නේ සුදු ඇඳුම. දාන්නේ සුදු සපත්තු. අඩු තරමේ ඔවුන්ගේ බෙල්ට් එක පවා සුදුයි. මම හිතන්නේ, යටට අඳින ඇඳුමත් සුදු විය යුතුයි. ඒ තරම් සුදුයි. මේ අය තමන් නියෝජනය කරන සභා තුළට යන්නේ උදේ අටට. බලන්න කොපමණ හොඳ මන්ත්‍රීතුමන්ලාද කියලා. උදේ අටට. හැන්දෑවේ හතර වනතුරු ඔවුන් ඒ සභාව තුළ ඉන්නවා. ඉඳගෙන ඔවුන් සාකච්ඡා කරනවා, අද ගලවන දත කුමක්ද? කියලා. අද ගලවන දත. දැන් සැලසුමක් අනුමත කරගන්න මනුස්සයෙක් එනවා. මම මේ කියන කථාව මම දන්න කෙනෙක්ට සම්බන්ධයි. මට ඡන්දය දීපු මිනිහෙක්. ඒ මනුස්සයා හතරවැනි වරටත් ගිහිල්ලා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කොහේද?

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

මම කොළඹ දිස්ත්‍රික්කයේ. නිකන් මාව අපහසුතාවයට පත් කරන්න එපා. හරිද? අනවශ්‍ය සීමා කිරීම් කරලා. කොළඹ දිස්ත්‍රික්කයේ මම. ඒ සැලසුම අනුමත කරගන්න. හතර පාරක් ඒ ආයතනයට යනවා. මේ දිහා අර ජනතා පුත්‍රයන් බලගෙන ඉන්නවා. කාර්යාල කාර්ය සහයකයෙක් ඇවිල්ලා කියනවා, අහවල් මන්ත්‍රීතුමා අහනවා ඇයි ඔබතුමා මේ රස්තියාදු වෙන්නේ කියලා. එක්කරගෙන යනවා. මොකද මේ? මම දැක්කා දවස් හතරක් පහක් ඇවිල්ලා ඉන්නවා. අනේ මහත්තයෝ මගේ සැලැස්මක් අනුමත කරගන්න බැහැ. පොඩ්ඩක් ඉන්න. ඕවා ඉතින් එහෙම ලෙහෙසි පහසු වැඩ නොවෙයි. මම වැඩේ කරලා දෙන්නම්. කොච්චර වියදම් කරන්න පුළුවන්ද? ප්‍රශ්නය තමයි, කොච්චර වියදම් කරන්න පුළුවන්ද? මහත්තයෝ එච්චර සල්ලි නැහැ. පොඩ්ඩක් කථා බහ කරලා එන්න කෝ? මේවා ඉතින් ඉහළට දෙන ඒවා විධියට තමයි වැඩේ කෙරෙන්නේ. උඩට ගිහිල්ලා එනවා. ලක්ෂ 01 1/2 ක් දෙනවා නම්, සතියෙන් මේක සම්මත කරලා දෙන්න පුළුවන්. අර පුද්ගලයා කියනවා, මට ලක්ෂ 01 1/2 ක් දෙන්න බැහැ මහත්තයෝ. ලක්ෂයක් දෙන්නම්. ඒක නේ කියන්නේ. මෙහෙම කළාම අපටත් වැඩක් කරගන්න බැරිව යනවා නේ? බාල කළාම. උඩට ගිහිල්ලා ලක්ෂයකට එකඟ වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔතැන නොවෙයි කථාව. ඕක නොවෙයි මට කියන්න ඕනෑ. දැන් මම හිතුවා, මගේ හිතවතා ඇවිල්ලා අර වැඩේ කරලා දීපු මන්ත්‍රීතුමාගේ දෙමව්පියෝ මතක් කරලා බනියි කියලා. මොකක්ද ඔහු කිව්වේ? අනේ මන්ත්‍රීතුමා ඔයගොල්ලෝ සිටියාට වැඩක් නැහැ නේ? අර මන්ත්‍රීතුමාට ලක්ෂයක් දීලා තමයි මම ඒ වැඩේ කර ගත්තේ. එතුමාට අපි ලබන පාරත් මගේ ඡන්ද තුනම දෙනවා. මේවා මේ ගෙතු, හැදූ කථා නොවෙයි. මම මේ හිතට එකහව කිව්වේ.

ඊළඟ කථාව සල්ලි පිළිබඳ කථාවක් නොවෙයි. ඒක ඊට වඩා බරපතළ කථාවක්. ඒකත් මහජන නියෝජිතයෙක් කරපු දෙයක්. මේ මහජන නියෝජිතයා ලිංගික අල්ලසක් ගන්න ගෙදරකට යනවා. ගියාම දැන් ඔහුට තිබෙන එකම බාධාව තමයි ගෙදර ඉන්න ස්වාමි පුරුෂයා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මොනතරම් අවාසනාවන්ත තත්ත්වයක්ද? භාර්යාව වසඟයට ගන්නා මේ ජනතා නියෝජිතයා භාර්යාව ලවා පොලීසියේ පැමිණිල්ලක් දානවා. ඔවුන්ට ඉන්න අවුරුදු 18 හැවිරිදි එකම දියණිය තාත්තා දූෂණය කරන්න හැදුවා කියලා. දාන්නේ අම්මයි දුවයි ගිහිල්ලා. අනියම් පෙම්වතා සමඟ රිසි සේ කම්සුව විඳීම සඳහා තමන්ගේ ස්වාමි පුරුෂයා හිරගෙට යවනවා. තාමත් හිරේ. අම්මා විතරක් නොවෙයි. මේ අවුරුදු 18 දියණියත් අනාථ කෙරුවේ, ඒ ජනතා පුත්‍රයා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මතක තියාගන්න. ලබන පාර මේ පාරටත් වැඩිය මනාප අරගෙන ඒ ජනතා පුත්‍රයා ඒ අදාළ සභාවට යනවා. මෙන්න මේ කාලකණ්ණි දේශපාලනය තමයි අප නතර කරන්න ඕනෑ. ඇඩූ කඳුලෙන් අද රිමාන්ඩ් භාරයේ ඉන්න ඒ සහෝදරයාගේ සහෝදරියෝ, අම්මලා තාත්තලා ඇවිල්ලා මට කිව්වා. අනේ මහත්තයෝ මේකට මොනවා හරි කරන්න කියලා. මමත් පෘතජ්ජන මිනිහෙක්. මම ඒකයි කිව්වේ, මම මේ සියලු දේ අත්හැරලා ආපු බෝධි සත්වයෙක් නොවෙයි කියලා. මටත් කල්පනා කරන්න දේවල් තිබෙනවා. ඒකයි මම කිව්වේ, මටත් බිරිඳක් ඉන්නවා. මටත් දරුවෙක් ඉන්නවා. මම ඒවා කල්පනා කළා. මම දන්නවා, මම මේකට මැදිහත් වුණොත්, මගේ හිස නැති මළ කඳ ඔය දෙහිවල පැත්තේ කාණුවක තිබෙන්න පුළුවන්. ඔබතුමන්ලා මල් වඩමක් තියලා අනේ කීර්ති ඉන්න කාලයේ හොඳ කථා ටිකක් කිව්වා. හැබැයි, මතක තියාගන්න. මේ සියලුදේම අවසානයක් එනවා. දැන් අපි ජීවිතයේ මැදිවිය පසු කරන මිනිස්සු. ඒ නිසා අපි මේ ගැන දෙපාරක් හිතනවා.

මට මතකයි, තමුන්නාන්සේලාගේ පත්බේරිය. කඩුවෙල සම සංවිධායක. ඉස්කෝලේ මහත්මයෙකුගේ දත් ඇන්ද ගැලවෙන්න ගැහුවා. යූ.ඇන්.පී. ආණ්ඩුව කාලයේ අධ්‍යාපන ඇමැති කරුණාසේන කොඩිතුවක්කු. සුසිල් ප්‍රේමජයන්ත වත්මන් ඇමැතිතුමා -

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

දැන් නම් -

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

මම මේ කිව්වේ, විසඳිලා ඉවර වුණු එකක්. අර කරුණු තවම යනවා. හරිද? ඔහු තවම රිමාන්ඩ් බන්ධනාගාරයේ. තවම ඒක

[ ගරු කීර්ති උඩවත්ත ]

ඉවර නැහැ. මම මේ කරුණු කියන්නේ, මේක ඉවර වුණු නිසා. තරහා වෙන්න එපා. මේක වාර්තා වුණු නඩුවක්. කඩුවෙල උසාවියේ අහපු. සුසිල් ප්‍රේමජයන්ත වත්මන් ඇමැතිතුමා මට උදේ කථා කරලා කියනවා, කීර්ති කඩුවෙල උසාවියේ නීතිඥයෝ මේ නඩුවට පෙනී සිටින්න භයයි. යූ.ඇන්.පී. ආණ්ඩුව ඇවිල්ලා තිබෙන්නේ. පත්තිරිය කියන්නේ මෙහෙම නාහෙට අහන්නේ නැති මිනිහෙක්. ඔයාට බැරිද මේ නඩුවට ඇවිල්ලා කථා කරන්න. මොකද, කෙනෙක් හිතන්න පුළුවන්, අපි මේවා කථා කළාට, අපි මහ කොන්ද පණ නැති මිනිස්සු කියලා. ඒකයි කිව්වේ අපේ වයසත් එක්ක අපේ ජවය අඩු වෙනවා. අපේ තිබෙන එඩිතරකම අඩු වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඔබතුමාට කියන්න කැමැතියි. පනස් දෙපාරක් මම ඒ නඩුවට තනිවම ගියා. මට රියැදුරෙක් නැහැ. මට බොඩිගාඩ්ලා නැහැ. මම ළඟ ආයුධ නැහැ. හැබැයි, අද අපි මේ කළු කබාය දාගෙන ඉන්නේ ඉස්කෝලේ මහත්මයෙක් අපට උගන්වපු නිසයි. ඒ නිසා ඒ තරුණකමට, ඒ ජවයට පුළුවන් වුණා, ඒ උසාවියට ගිහිල්ලා පත්තිරියව හිරේ අරින්න. මම අන්තිමේදී සාම සාකච්ඡා කළා. හරි ගියේ නැහැ. පත්තිරිය හිරේ ගියා. හැබැයි, පොලීසිය කරපු අමන වැඩක් නිසා, හරියට නඩුව ගොනු කරලා තිබුණේ නැති නිසා ඇපැලෙන් එයා නිදහස් වුණා. හැබැයි, නීතිඥයෙක් හැටියට මම මගේ යුතුකම, මගේ ජීවිතය බලන්නේ නැතිව මම ඒ පැන්ෂන් ගියපු ඉස්කෝලේ මහත්මයා වෙනුවෙන් කළා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. අපට එහෙම ඉතිහාසයක් තිබෙනවා. අපි බොහොම පිරිසිදු දේශපාලනයක් කරපු නිසා තමයි මෙහෙම වේගයෙන් කථා කරන්න පුළුවන්. අපි දන්නවා, එහෙම කරපු මිනිස්සු තව ඉන්නවා. ඒකයි මම කිව්වේ, මේ කාලකණ්ණි දේශපාලනය කරන්නේ සියයෙන් දශම ගණනයි. ඇයි? උන් නිසා අපි සියල්ලම ඒ ජරා තත්ත්වයට වැටෙන්නේ.

ඒ නිසා එක්සත් ජාතික පක්ෂයේ ගරු මන්ත්‍රීවරුනි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපේ සන්ධානයේ මන්ත්‍රීවරුනි, අපි පක්ෂ භේද අත්හැරලා දේශපාලනයේ ඉන්න හොඳ මිනිස්සු වෙනුවෙන් යම් සංවිධානයක් ගොඩනැගිය යුතුයි. මාව පක්ෂයෙන් අස් කෙරුවත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් හෙට මාව දොට්ට දැම්මත් එක්සත් ජාතික පක්ෂයේ ඉන්න හොඳ මිනිහෙකුගේ වේදිකාවට නැඟලා මේ මිනිහා හොඳ මිනිහෙක්. මේ මිනිහාට ඡන්දය දීපන් කියලා කියන්න ආත්ම ශක්තියක් මට තිබෙනවා. ඒ වාගේම ඔබටත් ඒක තිබෙන්න ඕනෑ. අපි මෙතැනදී පක්ෂ භේද වෙලා, පාට භේද වෙලා, ආගම් භේද වෙලා, ජාති භේද වෙලා අපි මේ විනාශ කරන්නේ, අපේ දරුවාගේ ආනාගතයයි. ඒ නිසා ආදරණීය ගරු මන්ත්‍රීවරුනි, අපි අවදි විය යුතු කාලය එළැඹී තිබෙනවා. අපි මොහොතක් හෝ ප්‍රමාද වුවහොත් මේ දූෂිතයන් අපි සියලුදෙනාම පෙරළාගෙන ඉස්සරහාට යනවා. අපි පක්ෂවලට බල කරන්න ඕනෑ. අපේ පහළ මණ්ඩලවල ඉඳලා අපි බල කරන්න ඕනෑ. අපේ නායකයන්ට බල කරන්න ඕනෑ. හොඳ ලැයිස්තුවක් ඉස්සරහාට ගෙනි යන්න. හැබැයි, ඒක හරියට වෙන්නේ නැහැ. අන්න ඒක සුද්ධ කරන්න තමයි අප යම් නෛතික පද්ධතියකට, විද්වත් මණ්ඩලයකට මේක භාර දෙන්න කියන්නේ. ඒ මණ්ඩලය අර මම කලින් කිව්වා වාගේ පැන්ෂන් ගිය දේශපාලනඥයන්ගෙන්, එහෙම නැත්නම් පරාජිත දේශපාලඥයන්ගෙන්, පක්ෂවල හෙන්චයියන්ගෙන් නොව මේ රට පිළිගත් සියලු දේශපාලන පක්ෂවලට එකඟ විය හැකි විද්වත් මණ්ඩලයක් විය යුතු බව ප්‍රකාශ කරමින් මගේ කථාවට ඔබතුමන්ලා දැක් වූ අවධානය මේ වැඩ පිළිවෙළ වෙනුවෙනුත් දක්වන්නය කියන ආයාචනය කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

[ අ.භා. 12.55 ]

**ගරු සිරිකමල් පිලිෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පළාත් සභා ඉතිහාසයේ අවුරුදු 25 ක් විතර ඈතට යන කාලයක අපි මේ සභාවේ ඕනෑ තරම් යෝජනා ගෙනැල්ලා තිබෙනවා. සමහර යෝජනා එදා කථා කරලා මේ හැන්සාඩ් එකට ඇතුළත් වෙලා තිබෙනවා. සමහර යෝජනාවලින් බොහොම අල්පයක් ක්‍රියාත්මක වෙලා තිබෙනවා. මම හිතන්නේ, මම මේ පළාත් සභාව නියෝජනය කරන්නේ තුන්වැනි වතාවට. මේ යෝජනාව ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරයෙක්, කොන්ද පණ තියෙන මන්ත්‍රීවරයෙක් තමන්ගේ හෘදය වස්තුවෙන් ඒ නැඟෙන වේදනාව වචනයට පෙරළපු අවස්ථාවක් හැටියට තමයි මම දකින්නේ. ඒ නිසා මම මගේ ශීර්ෂ ප්‍රණාමයෙන් මෙතුමාට ස්තුතිවන්ත වෙනවා, මෙතුමා එහෙම යෝජනාවක් ගෙනැල්ලා මේ කරුණු කාරණා මේ සභාවේදී දිග හරින්න කොන්දක් තිබීම පිළිබඳව.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පාදඩ දේශපාලනය කියන එක අපි දන්න කියන කාලයේ අපේ ජීවිත කාලයේ, අපට මතක තිබෙන කාලයේ තමයි උරුම වුණේ. මේ රටේ ඉතිහාසය දිහා බලපුවාම නිදහසට පෙරත්, නිදහසින් පසුව අවුරුදු ගණනාවකුත් ඉතාමත්ම සුවිශේෂී ආකාරයට හිටපු පුද්ගලයෝ - අර කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ හැමෝටම උගත්කම තිබුණේ නැහැ. හැබැයි, වැදගත්කම තිබුණා. හැමෝටම සල්ලි භාගේ නොතිබෙන්න පුළුවන්. නමුත් ඔවුන් මේ දේශපාලනයෙන් හරි හම්බ කරගත්තු මිනිස්සු නොවෙයි. එහෙම චරිත අනන්ත අප්‍රමාණ මේ ඉතිහාසයේ තිබෙනවා. ඔබතුමාගේ කථාවේදී ඔබතුමාට මහ හැරුණා. මම හිතන්නේ තමන්ගේ සියලු දේපළ අවසානයේ රජය සතු කළා. ජෝන් කොතලාවල මැතිතුමා. මම හිතන්නේ එතුමා වාගේ පුද්ගලයනුත් මේ දේශපාලනයේ අමරණීය චරිත බවට පත් වෙලා සිටියා. හැබැයි, මේ චෝදනා ක්‍රම ක්‍රමයෙන් එල්ල වෙන්න පටන් ගත්තේ, මේ සමානුපාතික ඡන්ද ක්‍රමය ලංකාවට හඳුන්වලා දුන්නාට පස්සේ. විශේෂයෙන්ම මම හිතන්නේ, ඒ ක්‍රමය නිසා තමයි මෙවැනි සමාජයක් බිහි වෙන්න සිද්ධ වුණේ. පක්ෂවලට වගකීමක් තිබෙනවා. විශේෂයෙන්ම මේ නාම යෝජනා දෙනකොට - මේ යෝජනාවේ පළමුවැනි කාරණාව තිබෙන්නේ, අදාළ දේශපාලන පක්ෂයට. ඔබතුමා කිව්වා වාගේ ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයට,

සම සමාජ පක්ෂයට, ජාතික හෙළ උරුමයට, ජනතා විමුක්ති පෙරමුණට එවැනි අතීතයක් තිබෙනවා නම්. එවැනි ක්‍රියා කලාපයක් ගෙන තිබෙනවා නම්. මේ රටේ තිබෙන ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකේ ප්‍රධාන වගකීම වන්නේ, නාම යෝජනා ලබා දීමේදී ඔවුන්ගේ සුදුසුකම් පරීක්ෂා කරලා බලන්න කටයුතු කිරීමයි.

සමහර වෙලාවට මේ දවස්වල ජනමාධ්‍ය මාර්ගයෙන් දිගින් දිගට, දිගින් දිගටම පළාත් පාලන ආයතනවල සභාපතිවරුන් පිළිබඳව, පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරුන් පිළිබඳව යම් යම් වැරැදි චෝදනා ඉදිරිපත් කරනවා. හැබැයි, එකක් මතක තියාගන්න ඕනෑ. මේ කියැවෙන ප්‍රමාණය බොහොම අල්පයි. මේ පළාත් සභාවල ඉන්න මන්ත්‍රීවරු, පාර්ලිමේන්තුව නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරු මේ ජඩකම්වල, මේ මැරකම්වල, මේ දූෂිත දේශපාලනයේ ඉහළින්ම ඉන්නවාය කියන එකත් මතක තියාගන්න ඕනෑ. එහෙම නිසා තමයි පසුගිය පළාත් පාලන මැතිවරණයේදී මේ රටේ ජනතාවට ආදරය කරපු භාරත ලක්ෂමන් වාගේ ජනතා පුත්‍රයෙක් අපට අහිමි වුණේ. මේ ජරා දේශපාලනය නිසා තව පක්ෂයකින් ඉදිරිපත් වෙනවා. ජනප්‍රිය වෙනවා. සල්ලි තියෙනවා. පෝස්ටර් ගහනවා. අර තිබෙන වරදානයන් ඔක්කෝම ජනතාවට බෙදලා ලැයිස්තුවේ උඩට එනවා. ඊට පස්සේ ඔවුන් වැඩකාරයෝ වෙනවා. අනික් දේශපාලන පක්ෂය බලනවා, මොහුව ගත්තොත් තමයි අපේ පැත්ත දිනා ගන්න පුළුවන් කියලා. ඒක නිසා මේ පක්ෂ මාරුවත් විධිමත් ආකාරයට මම හිතන්නේ නීත්‍යානුකූල කළ යුතුව පවතිනවා. ඉස්සර තිබුණා. පක්ෂය අතහැරලා ගියොත් මන්ත්‍රී ධුරය නැහැ. නමුත් අද මොන ජඩ වැඩේ කරලා විපක්ෂයේ ඉඳලා ආණ්ඩුවට එකතු වුණත්, ආණ්ඩුවේ ඉඳලා විපක්ෂයට එකතු වුණත් පිළිගන්න සූදානම් නිසා ගැටළුවක් මතු වන්නේ නැහැ. මොකද, ඔහුට බලයක් තිබෙනවා. සල්ලි තිබෙනවා. දිනා ගන්න පුළුවන් නිසා මම හිතන්නේ, ඒ පරිසරය හදලා තිබෙනවා. මේවා ක්‍රමයෙන් වෙනස් වෙන්න ඕනෑ කාලය දැන් ඇවිල්ලා තිබෙනවා. ඒක නිසා මේක අත්තිවාරමක් විධියට හොඳයි.

ඒක නිසා තමයි 17 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මේ රටේ ඉදිරිපත් කෙරුවේ. ස්වාධීන පොලිස් කොමිෂමක් ඇති කරන්න, ස්වාධීන මැතිවරණ කොමිසමක් ඇති කරන්න මේ ක්‍රමය මම හිතන්නේ අද තාවකාලිකව යටපත් කරලා තිබෙනවා. කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ පක්ෂයේ නායකයා තමයි අද මේ රටේ ජනාධිපති පුටුවේ වාඩි වෙලා ඉන්නේ. ඔබතුමාගේ හඬ, ඔබතුමා අද මෙතැන කරපු කථාව අකුරක් නැර ගරු ජනාධිපතිතුමාට ඇහෙන්න, ලැබෙන්න සැලැස්සුවොත් එහෙම මම හිතන්නේ මේ ප්‍රශ්නයට ඉතා ඉක්මණින් විසඳුමක් අපට සොයන්න පුළුවන් වෙයි. (බාධා කිරීමක්) මේ තත්ත්වය තිබෙන්නේ වෙන කාටවත් නොවෙයි.

අද පාර්ලිමේන්තුවේ 2/3 බලය හදාගත්තු ක්‍රමය මම හිතන්නේ මෙතැන ඉන්න අපි කවුරුත් දන්නවා. ඒක අපි කියන්න ඕනෑ නැහැ. මේ පාර්ලිමේන්තුවට 2/3 ක බලයක් තිබුණේ නැහැ. නමුත් වරදානයන්වලට, වරප්‍රසාදයන්වලට ලක්ෂ 300 ට, 400 ට විකිණුනු මන්ත්‍රීවරු තමයි එක්සත් ජාතික පක්ෂයෙන් හරි අනික් දේශපාලන පක්ෂවලින් හරි ගිහිල්ලා ආණ්ඩුවේ අද වැඩකාරයෝ වාගේ ඉන්නේ. නැත්නම් ඒ ගොල්ලෝ අද හිරේ. ඒක නිසා මේ ක්‍රමය සකස් වෙන්න ඕනෑ. මම කියනවා, ප්‍රාදේශීය දේශපාලඥයෝ දෙදහස් ගණනක් විතර ඉන්න නිසා වැරැදි ප්‍රමාණය වැඩියි. ප්‍රාදේශීය සභාවල සභාපතිවරුන්ට, නගර සභාවල සභාපතිවරුන්ට, පළාත් පාලන ආයතනවල සභාපතිවරුන්ට මේ තිබෙන බලතල, විශේෂයෙන්ම අපේ පළාත් සභාවේ ඉන්න මන්ත්‍රීවරුන්ට වැඩිය තිබෙනවා. ඒ තිබෙන අවස්ථාවෙන් උපරිම ප්‍රයෝජනය ගන්නවා. අර කියන සියලුම ආකාරයේ අල්ලස් ගන්නවා. මේ බස්නාහිර පළාත් සභාව තුළ දැනට චෝදනාවට ලක් වුණු පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරු, පළාත් පාලන ආයතනවල සභාපතිවරු කී දෙනෙක් ඉන්නවාද? ඒ පිළිබඳව නිවැරැදිව කටයුතු කරන්න මේ සභාවට හැකියාවක් තිබෙන්න ඕනෑ. මේ පක්ෂ දේශපාලනයේ මන්ත්‍රී ධුරය ආරක්ෂා කරගන්න, තමන්ගේ බලය රඳවා ගන්න උවමනා නිසා අද යම් යම් වැරැදිවලින් මිනිස්සුන්ව නිදහස් කරන්න උත්සාහ කරනවා. ඒක ඉතාමත්ම අසාධාරණයි. මෙතැන්දී අපි කියන්න ඕනෑ. උගත්කම කියන එක මේ නීතිඥයෙක්ද? දොස්තර කෙනෙක්ද? ගණකාධිකාරිවරයෙක්ද? එහෙම නැත්නම් වෙනත් ක්ෂේත්‍රයක ඉගෙන ගත්ත කෙනෙක්ද කියන නොවෙයි. ඊට වඩා, උගත්කම කියන එක මම හිතන්නේ, මහජනතාවත් එක්ක ඉඳලා - ප්‍රේමදාස ජනාධිපතිතුමාට ඔය කියන කිසිම උපාධියක් තිබුණේ නැහැ. නමුත් එතුමා ජනතාව හඳුනාගත් දේශපාලඥයෙක්. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ඇත්ත වශයෙන්ම මේ රටේ ශ්‍රේෂ්ට කාන්තාවක්. එතුමියට තිබුණේත් නැහැ. හැබැයි, මේ රටේ අගමැතිකම් කරන්න, ජනාධිපතිකම් කරන්න ඔවුන්ගේ හැකියාවෙන් ඔවුන් ඉහළට ගියා. මෙතැන ප්‍රශ්නය තිබෙන්නේ, විශේෂයෙන්ම මේ නිදහස් විවෘත ආර්ථිකය මේ රටට හඳුන්වලා දුන්නාට පස්සේ, මේ තිබෙන ඡන්ද ක්‍රමයත් ලංකාවට ආවට පස්සේ මම හිතන්නේ ඒකෙන් උපරිම ප්‍රයෝජන ලබා ගන්නවා.

මම මේ දේශපාලඥයාගේ නම කියන්නේ නැහැ. මම පළාත් සභාවට ඉදිරිපත් වුණේ 1999 යේදී. එතකොට මේ පළාත් සභාව නියෝජනය කෙරුවා, සේනක සමරනායක ගරු මන්ත්‍රීතුමා. නීතිඥයෙක්. 2004 දී, එතුමයි, සංජය ගලබඩ මන්ත්‍රීතුමයි, සුජිත් කුරේ මන්ත්‍රීතුමයි කිව්වා, ආයේ තරග කරන්නේ නැහැයි කියලා. ඉල්ලා අස් වුණා. නමුත් සේනක මට කථා කරලා කිව්වා, මම ඔයාට පෝස්ටර් ටිකක් ගහන්න තැනක් කියන්නම්. යන්න රත්මලානට කියලා. මම ගියා. මගේ අංකය දාලා මම ගැහුවේ පෝස්ටර් 30,000 යි. හැබැයි, ඒ වේලාවේ කොළඹ දිස්ත්‍රික්කයෙන් එක්සත් ජාතික පක්ෂයෙන් ඉදිරිපත් වුණු අපේක්ෂකයා අංකය නැතිව ලක්ෂ තුනක් පෝස්ටර් ගැහුවා. අංකය නැතිව. මම ඇවිල්ලා සේනකට කිව්වා, සේනක මාර වැඩක්.

**ගරු ඒ.එම්. යූසුප්**
Hon. A M Yoosuf

දූමින්ද වෙන්න ඇති.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

කවුරු හරි. මම නම කියන්නේ නැහැ. එහෙම චරිත නම් හදා ගත්තා. එහෙම නම් තිබුණේ නැහැ. ඒ නම් හැදුවා. එහෙම නම් හදාගෙන ඊට පස්සේ එතැනින් ගිහිල්ලා, ගිහිල්ලා, ගිහිල්ලා අද කොතැනද ඉන්නේ කියන එක මම හිතන්නේ මම මෙතැන වචනයෙන් සඳහන් නොකෙරුවට තමුන්නාන්සේ දන්නවා. ඒක නිසා මේකේ වගකීම තිබෙන්නේ විශේෂයෙන්ම මේ රටේ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක වන එක්සත් ජාතික පක්ෂයට හා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට. නාම යෝජනා දෙන කොට සාධු චරිතම සොයන්න බැහැ. මම කියන්නේ නැහැ, 100% ක් මේකේ එහෙම වෙන්න උවමනායි කියලා. මේ ගම්වල සාමාන්‍යයෙන් සුළු වැරැද්දක් කළාට - එහෙමනම් පාර්ලිමේන්තුවේ ඉන්න, පළාත් සභාවල ඉන්න මන්ත්‍රීවරුයි කිව්වාම අද තමන්ගේ කසාද භාර්යාව විතරක් නොවෙයි, තව කී දෙනෙක් ප්‍රසිද්ධියේත් තියාගෙන ඉන්න අය ඉන්නවාද? හැබැයි, මනාප ඡන්ද ක්‍රමය අනුව දිස්ත්‍රික්කයේ පළමුවැනියාටම එනවා.

**ගරු ඒ.එම්. යූසුප්**
Hon. A M Yoosuf

ගොඩක් ඉන්නවා නේ?

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඔව්. ගොඩක් ඉන්නවා. එතුමා කියනවා වාගේ. එක්කෙනෙකුගෙන් හම්බ වෙන මනාපේ තුන් හතර දෙනෙකුගෙන් හම්බ වෙන කොට උන්ගේ පරම්පරාවල ඡන්දත් හම්බ වෙනවා. ඉතින් ඒක නිසා මේකේ පරිපාලනයක්, මේකේ පාලනයක් ඇති කරන්න ඕනෑ. මේකේ සීමාවක් ඇති කරන්න ඕනෑ, අදාළ දේශපාලන පක්ෂ විසින්. ඒකට තමයි මේ රටේ තිබෙන ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකට ඒ බලය තිබෙන්නේ. ඒක නිසා අපේක්ෂකයෝ ඉදිරිපත් කරනකොට, මම අර කිව්වා වාගේ සාධු චරිතම ඉදිරිපත් කරලා බැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

දැන් මේ අවස්ථාව වෙන කොට මේ රටේ පළාත් සභා තුනක් විසුරුවලා හමාරයි. මේ වන කොට බලන්න මැරවරකම්, මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා ආරම්භ කරලා තිබෙනවා, එකම දේශපාලන පක්ෂය ඇතුළේ. ප්‍රතිවිරුද්ධ දේශපාලන පක්ෂ ඇතුළේ නොවෙයි. එකම දේශපාලන පක්ෂය ඇතුළේ. මේවා ඔක්කෝම වාර්තා කරනවා. නාමයෝජනා දෙන්න පෙර, නාම යෝජනා දුන්නාට පස්සේ සහ මැතිවරණය අවසානයේ. මේ රටේ මේ තිබුණු මැරකම්වලට, මේ තිබුණු මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියාවලට නිවැරැදි තීන්දුවක් අරගෙන නිවැරැදි විධියට දඬුවමක් දීලා තිබෙන්නේ, කවදාද කියලා තමුන්නාන්සේ හෘදය සාක්ෂියට අනුව විමසා බලන්න. ඒක නිසා මම ඉතාමත්ම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මේක යෝජනාවකට විතරක් සීමා කරන්න එපා. එතුමා විද්වත් මණ්ඩලය කොයි ආකාරයෙන් සකස් විය යුතුද කියලා තීරණය කෙරුවා. තව පුළුල් වෙන්න ඕනෑ. අපි කියන්නේ නැහැ, ස්වාමීන් වහන්සේලා මේකට ඇතුළත් කළ පමණින්ම, ගරු පියතුමන්ලා ඇතුළත් කළ පමණින්ම 100% ක් සාධාරණයි කියලා. ඒ අතරෙත් ඉන්නවා. මොකද, සමහර පන්සල්වලට ගිහිල්ලා, සමහර පල්ලිවලට ගිහිල්ලා මේ දූෂිත දේශපාලඥයෝ වැඩ කරලා දෙන හැටි දැක්කාම අපට උඩ බලාගෙන ඉන්න සිදු වෙලා තියෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මිදුලට ගල් අල්ලනවා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඒවාවලත් ප්‍රශ්න තිබෙනවා. කවුද නිවැරැදි පුද්ගලයා? ඒ හින්දා ඒ නිවැරැදි පුද්ගලයින්ගෙන් සමන්විත වුණු විද්වත් මණ්ඩලයක් සකස් කරලා මේ සභාව අද මේ කරන යෝජනාව, මෙය න්‍යාය පුස්තකයට ඇතුල් වෙලා, මේක අපේ අර ගබඩාවල රස්තියාදු වෙන්නේ නැතිව, කවුරුත් බලන්නේ නැති තත්ත්වයට පත් නොකර මේකට මේ රටේ කථිකාවක් ඇති කරන්න. ඒක නිසා තමයි ජනමාධ්‍යයේ ප්‍රධාන වගකීම තිබෙන්නේ. ජනමාධ්‍ය යම් ප්‍රමාණයකට අද මේ තිබෙන ප්‍රශ්න ඉදිරිපත් කරන එක ඇත්ත. යම් ප්‍රමාණයකට ඉදිරිපත් කරනවා. යම් යම් ආයතනවල බලපෑමුත් තිබෙනවා. මොකද, ජනමාධ්‍ය දුවන්නෙත් විවිධ වරප්‍රසාද එතුමන්ලාට ලැබෙන ආකාරයට.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

එතුමන්ලාටත් තිබෙන ඒ බලතල පාවිච්චි කරලා මේක ප්‍රචාරය කරන්නට - මොකද, නැත්නම් වෙන්නේ අර කිව්වා වාගේ මේ හොඳ වැඩ කරන මිනිස්සු - බලපුවාම හොඳ වැඩ කරන ඒවා පෙන්වන්නෙත් අර ඉන්න යම් යම් ක්‍රියාදාමවලින් උඩට ඇවිල්ලා, හරි හම්බ කරලා ඒ අයගේ ඒවා විතරයි පෙන්වන්නේ. බොහොම දුප්පත් විධියට දේශපාලනය කරලා, බයිසිකලයේ ගිහිල්ලා, ගමේ ජීවත් වෙලා, ගමේම ඉඳලා අවංකවම වැඩ කරන එක්කෙනාව පෙන්වන්නේ ඉතාමත්ම කලාතුරකින්. ඒ නිසා මෙහි

ප්‍රධාන වගකීමක් ජනමාධ්‍යවලට තිබෙනවා. ඒ ජනමාධ්‍ය සහ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක මේ වගකීම හරියට ඉෂ්ට කරනවා නම් මම හිතන්නේ, ඉතිරි මැතිවරණවලදී - දැන් ගරු මන්ත්‍රීතුමා චරිත දෙකක් ගැන කිව්වා. අර උදේට ගිහිල්ලා නගර සභාවට වෙලා බලාගෙන ඉන්නවා කියලා. ඒක නම් 100% ක්ම ඇත්ත. අද ඒවා නිසා එකම දේශපාලන පක්ෂයේ පුද්ගලයෝ අතර විවිධ ගැටීම් ඇති වෙලා තියෙනවා. මා නියෝජනය කරන දේශපාලන පක්ෂය නියෝජනය කරන මැතිවරණ කොට්ඨාශයේ පවා ඒ ඒ මන්ත්‍රීවරු අතරත් ප්‍රශ්න ඇති වෙලා. මොකද, මේ වැඩිපුර බෙදාගන්න. මේ අල්ලස් දීම ශාරීරික, මානසික වාගේම සියලුම කටයුතු නිසා මම හිතන්නේ, මේ යෝජනාව හුදු හමස් පෙට්ටියට නොයන, මේ රටේ කථිකාවක් ඇති කරන විද්වත් සමාජය ඇතුළට ගිහිල්ලා, ආගමික ස්ථානවල දේශනා කරන, දිනෙන් දින මතුරන කථිකාවක් ඇති කරන යෝජනාවක් බවට පත් වේවා කියලා ප්‍රාර්ථනය කරමින් මම නැවත වතාවක් මගේ මිත්‍ර කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමාට මෙවැනි යෝජනාවක් මේ කාලසීමාව ඇතුළත, විශේෂයෙන්ම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට ඉදිරිපත් කරන්න කොන්දක් තිබීම පිළිබඳව එතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

[ අ.භා. 01.08 ]

**ගරු සුගත් මතුගමගේ**
Hon. Sugath Mathugamage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන ලද යෝජනාව සම්බන්ධයෙන් අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මම ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වාගේ කාලීන වැදගත්කමකින් යුක්ත වූ යෝජනාවක් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ඇත්තෙන්ම අපි අපේ ගෞරවය, සහෝදරාත්මක සහාය කීර්ති උඩවත්ත සහෝදර ගරු මන්ත්‍රීතුමාට පිරිනමන්නට ඕනෑ. අපි දන්නවා, මේ රටේ සෑම පුරවැසියෙක් තුළම ඉතාම සුන්දර අහිංසක සිහිනයක් තිබෙනවා. ඒ සුන්දර අහිංසක සිහිනය තමයි හෙට දවසේ වඩා යහපත්, යහගුණ පිරි සමාජයක් නිර්මාණය වෙයි කියන බලාපොරොත්තුව. ඒක ඔබතුමාටත්, මේ ගෞරවනීය සභාවේ ඉන්න අපේ සහෝදර මන්ත්‍රීවරු බොහෝ පිරිසකටත් තිබෙන සුන්දර බලාපොරොත්තුවක්. හැබැයි, මේ රට තුළ ක්‍රියාත්මක වන මේ පාදඩ දේශපාලන සංස්කෘතිය නිසා ඒ සුන්දර බලාපොරොත්තුව අද මිනිසුන් තුළින් වියැකිලා ගිහිල්ලා තිබෙනවා. අපි දන්නවා, මේ තරම් නරුම තත්ත්වයකට මේ රටේ දේශපාලනය ඇද වැටෙන්නේ, 1977 න් පසු කාලයේ කියලා. ඊට පෙර එහෙම තිබුණේ නැහැයි කියලා අපි කියන්නේ නැහැ. හැබැයි, යම් අඩු වැඩි වශයෙන් තිබුණා. යම් මාත්‍රා ගණනකින් තිබුණා. හැබැයි, මේ තරම් නරක තත්ත්වයට මේ රට පත් වෙන්නේ, 1977 න් පසු හඳුන්වා දුන් මේ ඊනියා කොල්ලකාරී විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හා එයට සමගාමීව නව ව්‍යවස්ථා සංශෝධනය හරහා මේ රටට පැමිණි මේ පාදඩ මනාප මැතිවරණ ක්‍රමය හේතුකොට ගෙනයි. ඒ නිසා විපක්ෂයේ සහෝදර මන්ත්‍රීවරු උරණ වෙන්න ඕනෑ නැහැ, මේ කාලජේදය නම් කිරීම සම්බන්ධයෙන්. 1977 න් පසු එක්සත් ජාතික පක්ෂය වාගේම අප නියෝජනය කරන එක්සත් ජනතා නිදහස් සන්ධානයත් වරින් වර මේ රට පාලනය කළා. ඒ නිසා ඒ කාලවකවානු සම්බන්ධයෙන් තමුන්නාන්සේලා අමනාප විය යුතු නැහැ. හැබැයි, 1977 න් පසු අපි අවංකවම පිළිගන්න ඕනෑ, මේ රටේ දේශපාලන සංස්කෘතිය සම්පූර්ණයෙන්ම උඩු යටිකුරු වුණාය කියන කාරණාව.

1977 මේ නිදහස් විවෘත ආර්ථික ප්‍රතිපත්තිය - ලෝකයේ අද විවෘත ආර්ථික ප්‍රතිපත්තිය බැහැර කරපු රටවල් අතළොස්සක් පමණයි තිබෙන්නේ. ඒ රටවල් ඉතාමත් හොඳ තත්ත්වයෙන් ක්‍රියාත්මක වෙනවා. හැබැයි, අපි තර්ක කරන්න උත්සාහ ගන්නේ, මේ විවෘත ආර්ථික ප්‍රතිපත්තිය සියල්ලට වග කියන්න ඕනෑ. ඒ නිසා මේ විවෘත ආර්ථික ප්‍රතිපත්තිය වෙනුවට විකල්ප ආර්ථික ප්‍රතිපත්තියක් අවශ්‍යයි කියන කාරණය මත නොවෙයි. ලෝකයේ බොහෝ රටවල් විවෘත ආර්ථික ප්‍රතිපත්තිය පාවිච්චි කළා, තමන්ගේ ආර්ථික, සමාජයීය, දේශපාලනික පුනර්ජීවනය උදෙසා. හැබැයි, අපි 77 න් පස්සේ මේ විවෘත ආර්ථික ප්‍රතිපත්තිය භාවිතා කරලා තිබෙන්නේ, වඩා යහගුණ සමාජයක්, වඩා යහපත් රටක් නිර්මාණය කරන්න නොවෙයි. විවෘත ආර්ථික ප්‍රතිපත්තියේ තිබෙන නරකම පූර්වාදර්ශයන් තමයි අපි වැඩිපුර ප්‍රමාණයක් අරගෙන තිබෙන්නේ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි චෝදනා කරන්නේ මේ සමස්ත විවෘත ආර්ථික ප්‍රතිපත්තියට නොවෙයි. ඒ විවෘත ආර්ථික ප්‍රතිපත්තියෙන් අපි උරාගත්තු, අපි අවශෝෂණය කරගත්තු වැරැදි ප්‍රතිපත්ති සම්බන්ධයෙනුයි.

1977 න් පස්සේ බිහි වුණු ඒ කොල්ලකාරී විවෘත ආර්ථික ප්‍රතිපත්තිය තුළ තරගකාරී ලෙස මිල මුදල් උපයන සමාජ පන්තියක් බිහිවීමත් සමඟ - විශේෂයෙන් 1977 න් පස්සේ මේ රට තුළ ඉස්මතු වෙන්නේ ජාවාරම්කාරයෝ. සාධාරණ ආකාරයෙන් මුදල් උපයන මේ රටේ ව්‍යාපාරිකයෝ ඕනෑ තරම් ඉන්නවා. හැබැයි, 1977 න් පස්සේ මේ රටේ ආර්ථික, සමාජයීය, දේශපාලන බලය මාරු වෙන්නේ, ඒ ව්‍යාපාරික ප්‍රජාව අතට නොවෙයි. ජාවාරම්කරුවන් අතට. ඒ ජාවාරම්කරුවන්ට තමන්ට කිසියම් ආර්ථික වටිනාකමක් නිර්මාණය වෙද්දී, තමන්ට අවශ්‍ය කරන සමාජ වටිනාකම නිර්මාණය කරගන්නට දේශපාලනයට පිවිසෙනවා. ඔවුන් දේශපාලනය භාවිතා කරන්න පටන් ගන්නේ සමාජය සම්පූර්ණයෙන්ම සෝදා පාළුවට ලක්වන ආකාරයට. මැතිවරණ ක්‍රමය සංශෝධනය කරලා මේ දිස්ත්‍රික් මනාප ක්‍රමය හරහා ඔවුන්ගේ බලය තහවුරු කරගන්න අවශ්‍ය කරන දේශපාලන ශක්තිය ඔවුන්ට ලබා දෙනවා. ඒ නිසා සල්ලි වියදම් කරලා, අයථා ක්‍රම ඔස්සේ මුදල් උපයමින් ඒ ධනය රැස් කරන පුද්ගලයන්ට තමන්ගේ දේශපාලන බලය තහවුරු කරගන්නට අවශ්‍ය වටපිටාව මේ සමාජ ආර්ථික දේශපාලන වටපිටාව ඇතුළේ නිර්මාණය වෙනවා. මේ නිසා තමයි එතෙක් වඩා යහගුණ පිරි මිනිසුන් දේශපාලනයට ආවා වෙනුවට සමාජයේ සියලු සාරධර්ම කණපිට පෙරළන, සමස්ත සමාජයම නාය යාමට ලක් කරන ආකාරයේ දේශපාලන ක්‍රියාවලීන්වලට නායකත්වය දෙන

[ ගරු සුගත් මතුගමගේ ]

ඉතාමත්ම පහත් සමාජ පන්තියක් දේශපාලනය තුළ බලය තහවුරු කරගන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි පසුගිය කාලය තුළ දැක්කා, ප්‍රාදේශීය දේශපාලනයේ සිට ජාතික දේශපාලනය දක්වා මේ නරුමවාදී මිනිසුන් මේ රටේ දේශපාලනය කළේ කොහොමද? මේ රටේ දේශපාලනය මොනතරම් නරක තැනකට ගෙන ගියාද කියන කාරණය. කොළඹ දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා පැහැදිලි කළා වාගේ අපට ඕනෑ තරම් උදාහරණ අපේ කළුතර දිස්ත්‍රික්කය ඇතුළේ තිබෙනවා. මම හිතන්නේ, දැන් මේ මෑත භාගයේදී වැඩිපුරම කථා බහට ලක් වුණු දිස්ත්‍රික්කයක් බවට කළුතර දිස්ත්‍රික්කය පත් වුණා. සභාපතිවරු, නියෝජ්‍ය සභාපතිවරු, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, ඇමති ඇමැතිවරුන්ගේ නම් පවා බරපතළ ලෙස චෝදනාවන්වලට ලක් වුණා. ඒ නිසා අපි විශ්වාස කරනවා, මේ සමාජ ආර්ථික දේශපාලන ක්‍රමය ඇතුළේ බරපතළ වැරැද්දක් තිබෙනවා. මේ සමස්ත සමාජ ක්‍රමයම වෙනස් කිරීමේ ක්‍රියාවලියට යෑමේදී පළමුව අපි විශ්වාස කරනවා, මෙන්න මේ ආර්ථික සමාජ දේශපාලන ක්‍රමය තුළින් විශේෂයෙන්, මේ මැතිවරණ ක්‍රියාවලිය තුළ - මම පෞද්ගලිකව විශ්වාස කරන දෙයක් තමයි මේ ආර්ථික, සමාජ හා දේශපාලන ක්‍රමයම විශාල පරිවර්තනයකට ලක් කෙරෙන්න ඕනෑ. ඒක කළ යුතු වන්නේ කෙසේද කියන කාරණාව පිළිබඳව සංවාදශීලීයි. මේ මැතිවරණ ක්‍රියාවලිය ඇතුළේ බොහොම පැහැදිලිවම මේ පවතින මනාප ඡන්ද ක්‍රමය නම් ඉවත් කළ යුතුයි කියන කාරණාව සම්බන්ධයෙන් දෙගඩියාවක් නැහැ. ඒ තර්කයට එනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, බොහොම ස්තුතියි.

**ගරු සුගත් මතුගමගේ**
Hon. Sugath Mathugamage

මට තව සුළු අවස්ථාවක් දෙන්න, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා අවධානයට ලක් නොකළත්, එතුමා මේ අධ්‍යාපනය සම්බන්ධයෙන්, ප්‍රාදේශීය දේශපාලනයට හෝ ජාතික දේශපාලනයට පිවිසෙන අයගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් කථා නොකළත් මම හිතනවා, පොඩි ඌණ පූරණයක් මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන්න ඕනෑය කියලා. මේ රටේ කසළ ශෝධක තනතුරට යන පුද්ගලයාට පවා කිසියම් අවම අධ්‍යාපන සුදුසුකමක් නියම කරනවා. පකිස්තානය අපට වඩා සාක්ෂරතාවය පහළ මට්ටමක තිබියදී ජාතික දේශපාලනයට පිවිසීම සඳහා උපාධිධාරියෙක් වෙන්නට ඕනෑ කියනවා. අපි කියන්නේ නැහැ, උපාධියක් තිබෙන්නට ඕනෑය. ඒ සඳහා උසස් පෙළ සමත් විය යුතුයි. සාමාන්‍ය පෙළ සමත් විය යුතුයි කියලා. යුද්ධ සමයේදී තමන්ගේ ජීවිතය රට වෙනුවෙන් පූජා කරන්න යන වීරෝධාර සෙබළුන්ටත් අවම අධ්‍යාපන සුදුසුකම් නියම කරපු රටේ දේශපාලනයට එන්න කිසිදු අවම සුදුසුකමක් අවශ්‍ය වෙන්නේ නැහැ. මේක බරපතළ තත්ත්වයක්. ඒ නිසා අපි කියන්නේ නැහැ, උපාධිය, උසස් පෙළ, සාමාන්‍ය පෙළ කියලා මේකට බැරියර් එකක් දාන්න කියලා. හැබැයි, දේශපාලනයට ප්‍රවිෂ්ට වීමේදී ඔවුන්ගේ ආචාර ධර්ම පිළිබඳව සලකා බැලීමේ කාරණාවට පරිබාහිරව කිසියම් අවම අධ්‍යාපන සුදුසුකමක් පිළිබඳවවත් සලකා බැලීම අවශ්‍ය වෙනවා.

මට තව විශේෂ කාරණාවක් මතු කරන්න ඉඩ දෙන්න. පසුගිය දවස්වල බේරුවල ප්‍රාදේශීය බල ප්‍රදේශය තුළ සිදු වුණු කටයුතු කීපයක් සම්බන්ධයෙන් පුවත්පත්වල පළ වූ ලිපි කීපයක් මා සතුව තිබෙනවා. මම ඒක මේ මොහොතේ සභාගත කරනවා.[1] මේක සභාගත කරන්නේ විශේෂයෙන්ම *"සිසුවෙකු අපයෝජනය කළ ප්‍රාදේශීය සභා මන්ත්‍රීට සිර දඬුවම්."* අවුරුදු 07 ක අත්හිටවූ සිර දඬුවමක් නියම කරනවා. ඒ වාගේම රුපියල් හත් ලක්ෂ පනස්දාහක දඩ මුදලක් මේ කියන ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයාට නියම කරනවා. ඔහු පිළිබඳ සියලු තොරතුරු මේ පුවත්පත් වාර්තාවේ තිබෙනවා. හැබැයි, ඔහු තවමත් නිරුපද්‍රිතව ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධුරය උසුලනවා. මම දන්නේ නැහැ, නීතිය පිළිබඳව. මට තිබෙන්නේ අවම දැනුමක්. අත්හිටවූ සිරදඬුවම් ලබා දීම නිසා මන්ත්‍රී ධුරය අහෝසි කරන්න පුළුවන්ද? බැරිද? කියන කාරණය පිළිබඳව මම දන්නේ නැහැ. හැබැයි, ඔහුට මන්ත්‍රී ධුරයේ ඉන්න කිසිම සදාචාරාත්මක අයිතියක් නම් නැහැ.

ඒ එක චෝදනාවක් විතරක් නොවෙයි. කිරි දරුවන් පිරටකට විකිණීම සම්බන්ධයෙන් ඔහුට ඊට පෙරත් එවැනිම චෝදනා අධිකරණයේ ගොනු කරලා තිබුණා. ඒ නිසා මේ වාගේ චරිත දහස් ගණනක් අද දේශපාලනයේ නිරත වෙලා ඉන්නවා. අන්න ඒ නිසා මෙවැනි පාදඩ දේශපාලනයක නිරතවන පුද්ගලයන් මේ රටේ දේශපාලනයෙන් ඉවත් කරලීම සඳහා කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා ගෙන එන ලද යෝජනාව හෙට දවසේ භාවිතයට නංවාලිය යුතුයි කියන කාරණාව මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[ අ.භා. 01.16 ]

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කාලය ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මේ සභාවේ කථා ගොතන අපේ මන්ත්‍රීතුමා හැටියට ඉන්න කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා ගෙනෙන ලද යෝජනාව, පළාත් සභාවට අවුරුදු 25 කට පස්සේ ගෙනෙන ලද යෝජනාව ඉතා වැදගත් යෝජනාවක් ගැන තමයි අද අපි මේ සභාවේ සාකච්ඡා කරන්නේ. මේ යෝජනාවේ කියපු කරුණු සියල්ලම සැලකිල්ලට අරගෙන විශේෂයෙන්ම ජනාධිපතිතුමාට යවනවා නම් හොඳයි. මේ ගැන ඉදිරියටවත්

[1] සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.

හිතන්න. ඒ වාගේම ජනමාධ්‍යයන් විශේෂයෙන් මේ ගැන අවධානය යොමු කරලා ජනතාව දැනුවත් කරන්න ඕනෑ. සිරිකමල් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේම ඡන්දය පාවිච්චි කිරීම පිළිබඳව ජනතාව දැනුවත් කරන්න වෙනවා.

විශේෂයෙන්ම දැන් මොහොතකට කලින්, කථා කරපු මගේ සහෝදර මන්ත්‍රී සුගත් මතුගමගේ මැතිතුමා බේරුවල ප්‍රදේශය පිළිබඳව කරුණු ඉදිරිපත් කළා. කථාව සත්‍යයක්. මේ අයට නාම යෝජනා දෙන්නේ කවුද? පෙර වැරැදිකරුවෙක් වෙලා ඉන්න කාලයේදී පවා නාම යෝජනා දුන්නා. මේ වතාවේත් නාම යෝජනා දුන්නා. ඉතින් මේක ඒ පක්ෂයේ වගකීමක් වෙනවා. පිට පිට තවත් වැරැදි කරන්නත් - ඔහු පිළිබඳව හැමෝම දන්නවා. ඔබතුමා පවා දන්නවා. ඔහුට අවුරුදු හතක සිර දඬුවම් දුන්නේ ඒ නිසා තමයි. ඔහුගේ බාල අපචාර පිළිබඳව, ඔහුගේ ජීවිතය පිළිබඳව වැරැදි ගණනාවක් තිබුණා. අපෙත් හොඳ හිත මිත්‍රයෙක්. ඒක වෙනයි. නමුත් දේශපාලන වශයෙන් මේ යෝජනාව හැටියට මෙවන් පුද්ගලයින්ට ඒ නාම යෝජනා දීම පිළිබඳව අපි කනගාටු වෙන්න ඕනෑ. ඒ වාගේම අද අපි වාගේ පුද්ගලයින්ට, ආර්ථික වශයෙන් අපි ඉන්න තත්ත්වය උඩ අපට, ඒ උදවියට ඉහළට යන්න කිසිම ක්‍රියා මාර්ගයක් නැහැ. අද පාර්ලිමේන්තු මැතිවරණයකට යනවා නම් ලක්ෂ 100 ක් වත් අතේ තියාගෙන යන්න ඕනෑ. ඒක ඔබතුමාට පුළුවන් වෙයිද දන්නෙත් නැහැ. කළුතර දිස්ත්‍රික්කයේ ඉන්න, මම වාගේම සදාසොත්ති පළාත් සභාවේ ඉන්න, අපේ ගරු ඇමැතිතුමා ඉන්නවා. කණ්ඩායමක් ඉන්නවා. ඒ නිසා මේ යෝජනාව තුළින්, විශේෂයෙන්ම මේ රටේ අවංක මිනිස්සු ඉදිරියට ගෙනෙන්න ජනමාධ්‍යයට පුළුවන් වෙනවා. කථා කරන්න. ඒ නිසා මේ යෝජනාවේ වැදගත්කම අද මුළු සභාවම තේරුම් ගන්නවා. තේරුම් ගන්න ඕනෑ. අපි ජ්‍යෙෂ්ඨයෝ හැටියට විතරක් නොවෙයි. ඉන්න මහජන නියෝජිතයෝ හැටියට අපි කල්පනා කරනවා නම්, ඉදිරියේදී අපෙන් පස්සේ එන තරුණ උදවියට මේ යෝජනාවෙන් ලොකු ආදර්ශයක් ලබා දෙනවා. ඒ වාගේම හරි බැඳීමක් ඇති වෙනවා. ඒ වාගේම සමාජයේ වගකීමක් දරන පුද්ගලයා මෙවන් පුද්ගලයෙක් වෙන්න ඕනෑය කියලා මම මතක් කරනවා. මට මතකයි. ඉස්සර ගම්මුලාදෑනිලා බඳවා ගන්න කොට, රාළහාමිලා බඳවා ගන්න කොට - ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ පියා රාළහාමි කෙනෙක් හැටියට කටයුතු කළා. ඒ කාලයේ පසු විපරම් කළා. එයා කවුද -

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

පැටිකිරිය.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

පැටිකිරිය. මම පොලීසියට බැඳෙන්න යන කාලයේත් මගේ පරම්පාරාව හෙව්වා කවුද කියලා. අද පරම්පරාව සෙවීමක් නැහැ. නිකන් හිටි ගමන් ඕනෑ එක්කෙනෙක් ගහෙන් ගෙඩි වැටෙනවා වාගේ ගන්නවා. ඉස්සර ග්‍රාමසේවක රාළහාමි කෙනෙක් හැටියට පත් වෙනවා නම් පැටිකිරිය බලනවා. ඔහුට යම් ඔප්පුවක් තිබෙන්න ඕනෑ. ඉඩමක් තිබෙන්න ඕනෑ. වත්කමක් පෙන්වන්න ඕනෑ. වත්කමක් තිබෙන පුද්ගලයෙකුට තමයි එදා දුන්නේ. නැති වුණොත් අනික් පැත්තට යනවා. අද ඒවා සොයා බැලීමක් නැහැ. අපි සුද්දාට බැන්නත් සුද්දන්ගේ නීති රීතිවල හොඳ දේවල් තිබෙනවා. ඒවා අරගෙන අපි ආරක්ෂා වෙන්න ඕනෑ. එවන් මට්ටමකට ගිහිල්ලා තිබුණා නම් අද වර්තමානයේ මේ රටේ සිදුවන දේවල් ඇති වෙන්නේ නැහැ. අදත් මම පත්තරේ Headline එක දැක්කා. හොරොව්පතාන සභාපති භාර වේ. මේක ලජ්ජයි. අද දේශපාලනයේ ප්‍රාදේශීය සභා මට්ටමේ, පාර්ලිමේන්තු මට්ටමේ අපි කල්පනා කළාම ඉතා පහත් දේශපාලනයක් කරන්නේ. ඒක නිසා විශේෂයෙන්ම ඔබතුමාගේ මාර්ගයෙන් මම මතක් කරන්න ඕනෑ. ඔබතුමා මාර්ගයෙන් මම බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන විෂයය භාර ගරු ප්‍රධාන අමාත්‍යතුමාට යොමු කරනවා. කළුතර දිස්ත්‍රික්කයේ මේ සිදුවීම්වලට විතරක් නොවෙයි. මේ බස්නාහිර පළාතේ මේ සිදුවීම්වලට සම්බන්ධ වුණු පුද්ගලයින්ට උසාවියෙන් දඬුවම් දෙනතුරු බලාගෙන ඉන්නේ නැතිව විෂයය භාර අමාත්‍යවරයා හැටියට අද වහාම ඒ අය පිළිබඳව තීරණයක් ගන්නය කියලා. අල්ලස් එකට. අද මැතකදී ඔබතුමාගේ වලල්ලාවිට, අප නියෝජනය වන ප්‍රදේශය. ලක්ෂ 15 යි. සභාපතිවරයෙක් තවත් සභාපතිවරයෙකුට දුන්නා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මගේ ගෝලයෙක් එහෙම නොවෙයි.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ගෝලයෙක් නොවෙයි. ඒක මම දන්නවා. අපි නියෝජනය වන ප්‍රදේශයක්. වලල්ලාවිට. අපේ ගම අසළ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ප්‍රශ්න ඔක්කෝම මැතකදී ආවේ. අද රජය ඇහැ ඇරලා තිබෙන්නේ උතුරු මැද, වයඹ හා උතුරු පළාතේ ඡන්දය තිබෙන නිසා. මේ ඡන්දය ජයග්‍රහණය කරවීමේ තීරණයක් ඇතිව. අර ඉස්කෝලේ හාමිනේව දණ ගස්වපු එකෙන් තමයි අද මතු වෙලා තිබෙන්නේ. නාම යෝජනා දීම පිළිබඳව. ඒක මොන තීරණයෙන් වුණත්. මෙන්න මේවා මතු වෙලා තිබෙන හේතුව නිසා. ඒ වාගේම ඒ මන්ත්‍රීතුමාට ගත්ත ක්‍රියා මාර්ගය අපේ මේ දැනටමත් දඬුවම්වලට සම්බන්ධ වෙලා ඉන්න සභාපතිවරයාට අල්ලස් නඩු යනවා, කළුතර. ඒ නිසා වහාම ඔබතුමාගේ මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට යොමු කරනවා. මෙන්න බස්නාහිර පළාතේ මෙවන් සිදුවීමකට සම්බන්ධ සියලුදෙනාටම යම්කිසි ක්‍රියාමාර්ගයක් ගන්නය කියලා. ඒ ක්‍රියාමාර්ගය ගන්න එක අපි මහජන නියෝජිතයන් හැටියට බලාගෙන ඉන්නවා කියන එකත් මතක් කරමින්, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව මම ස්තුතිවන්ත වෙනවා.

[ අ.භා. 01.22 ]

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වෙලාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන් කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාව ගැන අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා මම, අපි බොහොම අගය කරන මන්ත්‍රීවරයෙක්. එතුමා ඉදිරිපත් කරන අදහස්, එතුමා ඉදිරිපත් කරන විවිධ කයි කතන්දර සියල්ල අපි බොහොම සාවදානව අහනවා. රස විඳිනවා. නමුත් මේ යෝජනාව ගැන නම් අදහස් ප්‍රකාශ කිරීමේදී මුලදීම කියන්න තිබෙන්නේ අපේ එකඟතාවය මේ යෝජනාවට නැහැයි කියන කාරණය තමයි. මේ න්‍යාය පත්‍රය මට ලැබුණු පළමුවැනි වතාවේ න්‍යාය පත්‍රය කියවපු පළමුවැනි තත්පරයේ මම ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාට දුරකථන ඇමතුමක් දීලා ඇහුවා, මේ යෝජනාව ඉදිරිපත් කරනවා, ඔබතුමා දන්නවාද කියලා. එතුමා දන්නේ නැහැයි කිව්වා. එතකොට එතුමා න්‍යාය පත්‍රය කියවලා තිබුණේත් නැහැ. මම එතුමාට එවලේම කිව්වා, මේ යෝජනාවට විරුද්ධව තමයි මගේ ඡන්දය මම පාවිච්චි කරන්නේ කියලා. ඒකට කාරණා ගණනාවක් තිබෙනවා. මට තවමත් තේරෙන්නේ නැහැ, කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා මෙහෙම යෝජනාවක් ඉදිරිපත් කරන්න පෙළඹුණේ ඇයි කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මීට පෙරත් සභාවේ කියලා තිබෙනවා. අපි දන්න බොහොම සුන්දර කථාවක් තිබෙනවා, අපායේ තිබෙන දඬුවමක් ගැන. ඒ දඬුවම වෙන්නේ, අශූචි ගොඩේ ඉඳලා අයිස්ක්‍රීම් කන්න දඬුවම් ලබන අයට යෝජනා කිරීමයි. ඒ අය අයිස්ක්‍රීම් කනවා. හැබැයි, දන්නේ නැහැ ඉන්නේ අශූචි ගොඩේ කියලා. ඉතින් මට දැනෙන්නේ මේ යෝජනාව හරහාත් කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා අලුත් විධියකට අයිස්ක්‍රීම් එක කන්න යෝජනා කරනවා. හැබැයි, ඉන්නේ අශූචි ගොඩේ බව තවම තේරෙන්නේ නැහැ. සමස්ත සමාජයක් කඩා වැටෙන කොට, සමස්ත සමාජයක් ගිලා බහිනකොට ඒකේ පුංචි පුංචි කැලි අල්ලගෙන අඳෝනා තියලා ඒ සමාජ ක්‍රමය වෙනස් කරන්න පුළුවන් කියන විශ්වාසය මට නම් පෞද්ගලිකව නැහැ. ඉතින් ඒ නිසා මට තේරෙන්නේ නැහැ, මේ යෝජනාව හරහා කොහොමද අපි දේශපාලනය නිවැරැදි කර ගන්නේ කියලා. මෙහෙම යෝජනා දැම්මාම ඒකේ බරපතළ තත්ත්වයකුත් නිර්මාණය වෙනවා. ගරු මන්ත්‍රීතුමෙක් කථා කරනකොට කිව්වා, මහජන මන්ත්‍රීවරු තෝරා ගන්නකොට අවම වශයෙන් විභාග සහතිකවත් ඉදිරිපත් කරන්නය කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තමුන්නාන්සේ දන්නවා, බලය ගොඩනහා ගැනීම කලාවක්. බලය ගොඩනහා ගැනීම සඳහා වූ Academic lessons ලෝකයේ කොහෙවත් නැහැ. ලෝකයේ කිසිම විශ්ව විද්‍යාලයක, කිසිම පාසලක බලය ගොඩනහා ගැනීම සඳහා වූ පාඩම් කියලා දෙන තත්ත්වයක් නිර්මාණය වෙලා නැහැ. බලය ගොඩනහා ගැනීම එක එක අයගේ සුවිශේෂී තත්ත්වයන් මත, නිර්මාණය කරගන්න තත්ත්වයන් මත ඇතිවන දේවල්. ඒ නිසා බලය ගොඩනහා ගන්න කෙනෙකුට තමන්ගේ අධ්‍යාපනය අවශ්‍ය නැහැ. අනික් එක අධ්‍යාපනය කියන එක මොකක්ද? පාසලේ ගන්න අධ්‍යාපනය, අධ්‍යාපනයද? විශ්ව විද්‍යාලයේ ගන්න අධ්‍යාපනය, අධ්‍යාපනයද? සමාජයේ අධ්‍යාපනයක් නැද්ද? සමාජ ක්‍රමය මත මිනිහෙක් දේවල් ඉගෙන ගන්නේ නැද්ද? සමහර විශ්ව විද්‍යාලවල අධ්‍යාපනය හදාරපු අය අද දේශපාලනයේ ඉන්නවා. ඒ අය දේශපාලනයද කරන්නේ? ඒ අය සමාජය හැසිරවීමද කරන්නේ? ඒ නිසා අපට එහෙම අධ්‍යාපනයක් තීරණය කරන්න පුළුවන්කමක් නැහැ.

ඒ වාගේම මේ යෝජනාවේ තීරණය කරන්නේ, විද්වත් මණ්ඩලයක් මඟින් මහජන නියෝජිතයන්ට අවස්ථාව දෙන්න කියලා. මේ සමාජයේ විද්වතුන් කවුද? අද මේ සමාජය තුළ ඉන්න විද්වතුන් තීරණය කළොත්, ඒ අය තෝරන අය නිවැරැදි සුදුස්සෝද? අද ඉන්න බුද්ධිමතුන් කියන සියලුදෙනා, විද්වතුන් කියන සියලුදෙනා අතරින් බහුතරයක් තක්කඩීන් තමයි මේ සමාජය ඇතුළේ ඉන්නේ. ඉතින් මේ සමාජය ඇතුළේ ඉල්ලුම් පත්‍ර දාලා මහජන නියෝජිතයින් තෝරා ගන්නේ, ඒ තක්කඩීන් හරහාද? එහෙමද අපි සුදුස්සෝ තෝර ගන්නේ? ඒ නිසා බුද්ධිමතුන් කියන අය මේ සමාජ ක්‍රමය ඇතුළේ සොයා ගන්න පුළුවන්කමක් නැහැ. ඒ වාගේම හොඳ මන්ත්‍රීවරුන් කියලා ජාතියක් මේ සමාජ ක්‍රමය ඇතුළේ ඉතිරි වෙන්න පුළුවන්ද? කිසි මන්ත්‍රීවරයෙකුට, දේශපාලඥයෙකුට හොඳ කෙනෙක් වෙන්න පුළුවන්ද? මේ සමාජය සියලුදෙනාට බල කරන්නේ, තමන්ට තිබෙන උපරිම නරක දේ සමාජය මත මුදා හරින්න. එතකොට තමයි තමන්ට මන්ත්‍රීවරයෙක් වෙන්න, එහෙම නැත්නම් මහජන නියෝජිතයෙක් වෙන්න පුළුවන්කම ලැබෙන්නේ කියලා. ඒ නිසා හොඳ මිනිස්සු වෙන්න මේ සමාජ ක්‍රමය ඇතුළේ කාට හරි පුළුවන්කම තිබෙනවාද? ඒ නිසා සමාජ ක්‍රමයක් වෙනස් කර ගන්නේ නැතිව, සමස්ත සමාජය වෙනස් කර ගන්නේ නැතිව මේ මන්ත්‍රීවරු තෝරන්න විද්වත් මණ්ඩලවලට දීලා තාවකාලික සැලසුම්වලින් පුළුවන් කියන කාරණය අපි විශ්වාස කරන්නේ නැහැ.

ඒ වාගේම මහජන නියෝජිතයන් තෝරා ගැනීමේ පරම අයිතිය තිබෙන්නේ, මේ රටේ ජනතාවට. ඒ අයිතිය වෙන කාට හරි පවරා දෙන්න පුළුවන්ද? ජනතා නියෝජිතයන් තමයි, ජන මූල නායකයන් තමයි මතු වෙන්නට ඕනෑ. ජනතාවගේ කර මතින් තමයි මහජන නියෝජිතයෝ ඉස්සරහාට එන්න ඕනෑ. ඒ නිසා ඒක තීන්දු කිරීමේ බලය කිසිම විද්වතෙකුට දෙන්න පුළුවන්කමක් නැහැ. ඒක ජනතාව සතු පරම පූජනීය අයිතියක්. ඒ අයිතිය කාටවත් පවරා දෙන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා මා විශ්වාස කරන්නේ, මේ යෝජනාව ඇතුළේ ක්‍රියාත්මක කරන්න කියලා බල කරන දේ, තව තවත් තක්කඩියෝ, තව තවත් හොරු, තව තවත් වැරැදි මිනිස්සු පාලකයෝ බවට පත් කරන්න ඉඩ හරින

තත්ත්වයක් තමයි නිර්මාණය වෙන්නේ. ඒ නිසා මෙවැනි යෝජනාවකට කැමැත්ත ප්‍රකාශ කරන්න පුළුවන්කමක් නැහැයි කියන කාරණය තමයි මම මතක් කරන්නේ. ඒ නිසා සමස්ත සමාජ ක්‍රමය වෙනස් කරන්න අපි සියලුදෙනාටම තිබෙන වගකීම නිවැරැදිව ක්‍රියාත්මක කරලා, සමාජ ක්‍රමය වෙනස් කිරීම මත මිසක මේ රටේ ජනතාවට මහජන නියෝජිතයෝ විධියට හොඳ මිනිස්සු පත් කරගන්න, යහපත් මිනිස්සු පත් කරගන්න අවස්ථාවක්, ඉඩකඩක් නොලැබෙනවා කියන විශ්වාසය තමයි අපට තිබෙන්නේ. ඒ නිසා මේ යෝජනාවට කිසිසේත්ම එකඟ වෙන්න පුළුවන්කමක් නැහැයි කියන කාරණාව ඔබතුමාට කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

# රීති අංක 09 යටතේ යෝජනාව
MOTION UNDER RULE NO : 09

**ගරු ජගත් අංගගේ - අමාත්‍යතුමා**
Hon. Jagath Angage - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රීති අංක 9 කෙරෙහි ගරු ඔබතුමාගේ අවධානය යොමු කරනවා. "*න්‍යාය පත්‍රයේ අංක 10 (02) දරන විෂයය පිළිබඳ වැඩ කටයුතු අංක 8(5) හා 8(6) රීතිවල විධිවිධානයන්ගෙන් නිදහස්ව පවත්වාගෙන යා යුතුය* " යනුවෙන් මම මෙම සභාවට යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතියි. ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 08 ක කාලයක් නියමිතව තිබෙනවා.

[ අ.භා. 01.28 ]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බොහොම ස්තුතියි. ප්‍රථමයෙන්ම කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාවට පොඩි සංශෝධනයක් එකතු කරන්න කැමැතියි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එහි සඳහන් වන,

"*ඉදිරිපත් කරන නාම ලේඛනයට විද්වත්*" වෙනුවට මම යෝජනා කර සිටිනවා, "*ඒ ප්‍රදේශයේ ආගමික නායකයන් විසින් නිර්දේශ කරන නාම ලැයිස්තුවක්*" කියන සංශෝධනය ඉදිරිපත් කරන්න කැමැතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒ කියන්නේ ගරු මන්ත්‍රීතුමා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

විද්වත් වෙනුවට, ඒ ප්‍රදේශයේ ආගමික නායකයින්ගෙන් නිර්දේශ වන -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමාගේ අවධානයට යොමු කරනවා. හොඳයි. ඔබතුමා කථා කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒ සංශෝධනය ගැන සලකා බලන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ අර අශූචි ගොඩක ඉඳන් අයිස්ක්‍රීම් කන්න හදනවා කියන කථාව මම හිතන්නේ, මේ යෝජනාව ඉතාමත් වටිනා යෝජනාවක් වුණත්, එතුමා අද නියෝජනය කරන පක්ෂය තුළ තිබෙන මේ ජරා ගොඩ පිළිබඳව ඇතුළේ ඉඳන්, ඒ පක්ෂය ඇතුළේ ඉඳන් හඬ නඟන්නේ නැතිව මෙතැන යෝජනාවක් හැටියට ගෙනැවිත් තිබෙනවා. මම හිතන්නේ, ඊට වැඩිය සුදුසුයි ඒ පක්ෂය ඇතුළට මේ යෝජනාව ගෙනැල්ලා ඒ පක්ෂය තුළ මේකට සටන් කළා නම්. මොකද, එතුමා නියෝජනය කරන පක්ෂය තුළ, සන්ධානය තුළ තමයි අද වැඩිපුරම මේ ජරා ගොඩ එකතු වෙලා තිබෙන්නේ. ප්‍රධාන පක්ෂයක් හැටියට එක්සත් ජාතික පක්ෂයේත් සුළු ප්‍රමාණයක් තිබෙනවා. නමුත් අපේ තිබුණු ඒ අශූචි ගොඩෙන් 99% ක්ම අද ඒ පැත්තට ගිහිල්ලා තිබෙන්නේ. ඒ අශූචි ගොඩ ඔක්කෝම අද තිබෙන්නේ ඒ පැත්තේ. ඒක නිසා අපේ තිබෙන ඒ ජරා ගොඩ ඉබේම සුද්ධ වෙලා ඉවරයි. ඒක නිසා එක්සත් ජාතික පක්ෂය 99% ක්ම පිරිසිදු පක්ෂයක් බවට ඉබේම පත් වෙලා. මොකද, ඒ ජරා ගොඩවල් ඔක්කෝම අපේ කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමාගේ කෝට් එක ඇතුළේත් දැන් ගැවිලා තිබෙන්නේ. මොකද, එතුමා නියෝජනය කරන දෙහිවල - ගල්කිස්ස ආසනයත්. මම හිතන්නේ, එතුමා නොකියා කිව්වාට, එතුමාව කපලා දාපු එක්කෙනා ගැන වෙන්න ඕනෑ මම හිතන්නේ ඒ කිව්වේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද අපි කථා කරන්නේ. මාධ්‍ය කථා කරන්නේ මේ ගහේ ඉන්න පොඩි මාළු ගැන විතරයි. මේකට ප්‍රධාන හේතුව ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද ඉහළින්ම දූෂණය ඉහළට ගිහිල්ලා. ඒ ආදර්ශය අර යට ඉන්න පොඩි එකාත් අද පාවිච්චි කරනවා. ඒක තමයි අද මේ රටේ වෙලා තිබෙන්නේ. අපි ප්‍රාදේශීය මට්ටමෙන් ප්‍රාදේශීය සභාවල, එහෙම නැත්නම් නගර සභාවේ ඒ මහජන නියෝජිතයන්ට අද අත දික් කරනවා. (බාධා කිරීමක්)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි මේ පිරිසිදු කිරීම පටන් ගත යුත්තේ ඉහළින්. අද ඉහළ කෙතරම් දූෂණය වෙලාද කිව්වොත් ඒ ආදර්ශය තමයි අද පහළත් නගර සභාවේ, ප්‍රාදේශීය සභාවේ ඒ අය අනුගමනය කරන්නේ. ඒක නිසා අද මේ සභාවේත්

[ ගරු ශ්‍රීනාත් පෙරේරා ]

ඉන්නවා, මේ වාගේ අපිරිසිදු චරිත. හැබැයි, සමහර අය ඒවා ගැන කියපුවාම ඒ අයව ආරක්ෂා කරන්න රොත්ත ගණන් නැඟිටිනවා. ඒ වාගේ තත්ත්වයක් තමයි අද තිබෙන්නේ. මම හිතන්නේ අද මේ පළාත් සභාවේ මෙතැන ඉතුරු වෙලා ඉන්නේ ඉතාම පිරිසිදු කට්ටියක්. අඩුම ගණනේ මේ කථාව අහන්නත්. මේ වැදගත් සාකච්ඡාවට සහභාගි වෙලා ඉන්න පිරිස ඉතාමත් පිරිසිදුයි. දේශපාලනය ගත්තාම අද කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ 1% ක් නොවෙයි. මම හිතන්නේ 90% ක්ම ඉන්නේ සුදුසු නැති චරිත. 10% ක් වාගේ අල්පයක් තමයි අද පිරිසිදු චරිත හැටියට ඉතිරි වෙලා ඉන්නේ.

ඒක නිසා මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. පොඩි පක්ෂ ගැන කථා කළා. පසුගිය ජාතික සම්මේලනයේදී මම දැක්කා, ජාතික හෙළ උරුමයේ චම්පික රණවක ඇමැතිතුමා කථා කරනවා. එතුමන්ලා කථා කළා. මම හිතන්නේ, ආණ්ඩු පක්ෂයේ වෙන්න ඕනෑ. අද ඉහළම තැන්වල ඉන්න සමහර අය කෙතරම් දූෂණය වෙලාද? කොතරම් හොරකම් කරනවාද? නාස්ති කරනවාද? ඒ ගැන එතුමා කථා කළා. මම හිතන්නේ, එතුමාගේ පක්ෂය නොයෙකුත් අවස්ථාවලදී මේ රටේ දේශපාලනය හරිමඟ ගෙනි යන්න කථා කරනවා. ඒක අපි අගය කරන්න ඕනෑ. ඒ එක්කම ඒ කථා කළාට මදී. එතුමන්ලාත් අද ඉන්නේ මේ ජරා ගොඩ මැද්දේ. ඒ නිසා මම හිතන්නේ, මේ අයට හොඳ අවස්ථාවක්. මේ ජරා ගොඩෙන් එළියට ඇවිල්ලා මේවා ගැන කථා කරන්න. ජරා ගොඩේ ඉඳගෙන නිකන් විවේචනය කර කර සිටියාට වැඩක් නැහැ. අද අවශ්‍ය වෙලා තිබෙන්නේ මේ ජරා ගොඩෙන් එළියට ඇවිල්ලා ඒ වැරැදි පෙන්නලා දෙන්න. ජරා ගොඩේ ඉඳන් පෙන්වනවා කියන්නේ, අර කිව්වා වාගේ ජරා ගොඩේ ඉඳගෙනම අයිස්ක්‍රීම් එකක් කන්න හදන එක තමයි හුඟාක් දෙනෙක් අද කරන්න හදන්නේ. පොඩි පක්ෂ. ඒක නිසා අපි බලාපොරොත්තු වෙනවා. මම හිතන්නේ, දේශපාලන පක්ෂ විතරක් නොවෙයි. ආගමික නායකයින් පවා අද කථා කරන්න පටන් අරගෙන තිබෙනවා. මේ රටේ එක්සත් ජාතික පක්ෂයේ අවුරුදු දෙකේ ආණ්ඩුව කාලයේ ඇති කරපු 17 වැනි සංශෝධනය. මේ 17 වැනි සංශෝධනය ගෙනාවේ මේ දේශපාලනයේ තිබෙන දූෂණය නැති කරන්න. ස්වාධීන කොමිෂන් සභා පත් කළේ මේවා නැති කරන්න. පොලීසිය තුළ දේශපාලන ඇඟිලි ගැසීම් නැති කරන්න, ඒ වාගේම ඡන්දයක් ආවාම ඒ ඡන්ද ක්‍රමය තුළ ස්වාධීනව ඡන්දය නිරීක්ෂණය කරන්න, ඡන්දය පවත්වන්න ඒ අවශ්‍ය වාතාවරණය මම හිතන්නේ ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඒ අවුරුදු දෙක තුළ ඇති කළා. මේ ආණ්ඩුව ආව ගමන් කළේ, ඒක ආයේ උදුරලා ගත්ත එක. උදුරලා අතට අරගෙන -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා වෙලාව පිළිබඳව පොඩ්ඩක් අවධානය යොමු කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

18 වැනි සංශෝධනයක් ගෙනැල්ලා ඒකාධිපති බලයක් අතට අරගෙන අද ඒක නිසා තමයි මේ සියලුම දේවල් මේ රටේ සිදු වන්නේ. අද ඒ ඒකාධිපති බලයේ 2/3 බලයක් තිබෙනවා කියලා, ඒ ජනාධිපතිවරයාගේ අතේ තිබෙන බලය ප්‍රාදේශීය සභාවේ ඉන්න පොඩි මිනිහත් අද පාවිච්චි කරන්න පටන් අරගෙන තිබෙනවා. අද අපි මේ සභාවේ කථා කරන්න නැඟිට්ටාම අපට බණින්නේ නොයෙකුත් වචන කියලා. සත්තුන්ගේ නම් කියලා අපට බණිනවා. සමහර අය ඒ ජනාධිපතිතුමාගේ බලය අරන් අපිව මර්දනය කරන්න හදනවා. අන්න ඒක තමයි අද මේ රටේ දේශපාලනයට වෙලා තිබෙන්නේ.

අර කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ එක කාලයක් තිබුණා. මේ ඡන්ද ක්‍රමය පටන් ගත්තු කාලයේ ඉඳන් ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ කාලයේ, ඒ කාලය නිම වනතුරු මේ රටේ හොඳ දේශපාලනයක් තිබුණා. මම හිතන්නේ, මනාප ක්‍රමය තිබුණත්, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ජනාධිපති වෙලා ඉන්න තුරු මෙවැනි දූෂිත කථා අපි ඇහුවේ නැහැ. දේශපාලනය වෙනුවෙන් හොඳ වාතාවරණයක් මේ රට තුළ තිබුණා. ඊට පස්සේ තමයි ක්‍රම ක්‍රමයෙන් මේ ඡන්ද ක්‍රමය, මේ දේශපාලනය අද ජනතාවට තිත්ත වෙලා තිබෙන්නේ. නමුත් මම මේ මෑතකදී ගරු නියෝජ්‍ය සභාපතිතුමනි ඇහුවා, එක්තරා මන්ත්‍රීවරයෙක් කියනවා. දේශපාලනයට බල්ලා ගිහිල්ලා නැහැ. බල්ලෝ දේශපාලනයට ඇවිල්ලා කියලා. අන්න ඒක තමයි අද වෙලා තිබෙන්නේ. ඉතින් ඒක නවත්වන්න තමයි මම හිතන්නේ, අපේ කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා මෙවැනි යෝජනාවක් ගෙනැල්ලා තිබෙන්නේ. මෙවැනි යෝජනාවක් මෙම සභාවට ගෙන ඒම පිළිබඳව මම සතුටු වෙනවා. මම හිතන්නේ, අපි සභාවේ ඉන්දැද්දීත් අපට අද තේරෙනවා, සමහර වේලාවට මේ සභාව ක්‍රියාත්මක වන විධිය බලපුවාම මොන ජාතියේ අය මේ සභාවේ ඉන්නවාද කියලා. අපි කොපමණ අකැමැති වුණත්, මේ කියන ජාතියේ අය මේ සභාවේත් අද ඉන්නවා. ඒක නිසා අපි බලාපොරොත්තු වෙනවා. එතුමා තමන්ගේ සන්ධානය තුළ මේ හඬ නඟලා, තමන්ගේ පක්ෂය ඉදිරිපත් කරන ඒ නියෝජිතයන්, පිරිසිදු නියෝජිතයන් බවට පත් කරන්න එතුමාට ඒ ශක්තිය, හැකියාව ලැබේවායි කියලා ප්‍රාර්ථනය කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[ අ.භා. 01.40 ]

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බොහොම ස්තුතියි. කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව පිළිබඳව එතුමාට ගොඩාක්ම ස්තුතියි. මොකද, එතුමා යම් දශම ගණනක හරි උත්සාහයක් අරගෙන තිබෙනවා, අපි කවුරු හරි මේ පිළිබඳව කරීකාවකට යන්න ඕනෑය කියන අදහසින්. විශේෂයෙන්ම මේ පිළිබඳව අපටත් හරියට වේදනාවක් තිබෙනවා.

මොකද, කළුතර දිස්ත්‍රික්කයේ නියෝජනය කරන ඔබතුමා, මම සහ අපේ ගරු ඇමැතිතුමන්ලා සියලුදෙනාම නියෝජනය කරන්නේ කළුතර දිස්ත්‍රික්කය. කළුතර දිස්ත්‍රික්කය තුළ අපට පසුගිය දවස්වල ඇති වුණු තත්ත්වයන්වලදී අපි හරියට අසරණ වුණා. (බාධා කිරීමක්)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාත් දන්නවා. පසුගිය කාලයේ අපි කණ්ඩායම් රැස්වීමේදීත් මේ පිළිබඳව නිතරම කථා කළා. මේ තිබෙන තත්ත්වයන් පිළිබඳව. මොකද, පළාත් පාලන ආයතනවල තිබෙන ගැටලු පිළිබඳව ගරු ප්‍රධාන අමාත්‍යතුමා යටතේ තිබෙන විෂයයක්. මේක තුළ ජාතික දේශපාලනයේ ඉන්න අපේ පාර්ලිමේන්තු නියෝජිතයෝත් මේවා පිළිබඳව කර අරිනවා. මේවා පළාත් පාලන විෂයයට අයිතියි. ගරු ප්‍රධාන ඇමැතිතුමාට තමයි මේකේ බලය තිබෙන්නේ කියලා. ඒ වාගේ පළාත් සභාවත් ලොකු විවේචනයක් කරනවා. ඉතින් ඒ වාගේ වේලාවට අපත් බොහොම අසරණ වෙනවා. මොකද, මේ සභාපතිවරුන්ගේ හා ඒ ආශ්‍රිත අයගේ කටයුතුවලට වගකීම තිබෙන්නේ, මහ ඇමැතිතුමාටද කියලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාව නිශ්ශබ්ද වන්න.

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

ඉතින් විශේෂයෙන්ම -

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මූලාසනයට ගරු කරලා හිටගෙන කථා කරන්න කියන්න.

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

සමාවෙන්න. රට වෙනුවෙන් තමයි අපට මේ තත්ත්වයට පත් වෙන්න වුණේ. මොකද, මම හිටගෙන කථා කරපු කෙනෙක්. අද මේ තත්ත්වයට පත් වෙන්න වුණාට. සමාවෙන්න. අපට පොඩි ගැටලුවක් තිබෙනවා. විපක්ෂය, පක්ෂය කියලා නැහැ. මේක තුළ සාදාචාරාත්මකව හැදෙන්න. මොකද, අපි රට වෙනුවෙන් බොහොම දුක් විඳපු අය. මට තව ජීවිතයේ කොපමණ කල් දුක් විඳින්න වෙයිද දන්නේ නැහැ. ඔබතුමන්ලා අපි හිනා වෙලා සිටියාට අපිත් බොහොම වේදනාවක් විඳින කට්ටිය. මොකද අපට රට වෙනුවෙන් ලොකු කැක්කුමක් තිබෙනවා. මොකද, මේ අපේ තිබෙන කොටස් ඔක්කෝම මේ රටට පස් කරපු අය අපි. අපට වේදනාවක් තිබෙනවා. කිසිම වරප්‍රසාදයක් විඳපු කෙනෙක් නොවෙයි මම.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

විකුම් ගුණසේකර ගරු මන්ත්‍රීතුමා, විපක්ෂ නායකතුමා ඒක නිකන් ආදරේට කිව්වේ.

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

දේශපාලන ක්ෂේත්‍රය තුළ මේවා ඇහෙන කොට අපට හරි වේදනයි. මොකද අපිත් මේ දේශපාලන ක්ෂේත්‍රය තුළ බොහොම දුක් විඳපු කට්ටිය. අපේ ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා උදේ කිව්වා, බයිසිකලේ ඇවිල්ලා ඊට පස්සේ අද බොහොම වරප්‍රසාද විඳිනවා කියලා කිව්වා. ඇත්ත තමයි. මමත් ආවේ ත්‍රීවිල් එකේ. මම අද තමයි රෝද හතරේ වාහනයක මේ සභාවට ආවේ. මොකද, මට ලැබුණු වරප්‍රසාදය, ජනාධිපතිතුමා ඇතුළු ආණ්ඩුවෙන් අපට දුන්න වරප්‍රසාදය ඒ බලපත්‍රයට මට වාහනයක් ගන්න බැරි වුණා. ඒ වෙනුවට මම ඒක මුදල් කරලා, අද තමයි මම මේ සභාවට අලුත් වාහනයක ආවේ. මේ සඳහා අවුරුදු 04 යි මාස තුනක් ගත වුණා. මොකද, හොකරම් කරපු මිනිස්සු නොවෙයි. ඔබතුමා දන්නවා, අපි විඳපු දුක කොහොමද කියලා. හැබැයි, ජාතික මට්ටමේ තිබෙන සේවා සහ ඒ ආසනයේ තිබුණු සියලුම දේවල්වලට මම සහභාගි වෙලා තිබෙනවා. ඒ වාගේම මේ සභාවේ සෑම සභා වාරයකටම ඇවිල්ලා තිබෙනවා. හැම උපදේශක කාරක සභාවකටම ගිහිල්ලා තිබෙනවා. මට කරන්න පුළුවන් යුතුකම මම කළා. මොකද, මම ත්‍රීවිල් එකේ ගිහිල්ලා හරි ඒ දේ කළා. හැබැයි, මම හුඟාක් අපහසුතාවයන්වලට පත් වුණු අවස්ථා තිබෙනවා.

මම විශේෂයෙන්ම කියන්න ඕනෑ. මොකද මෙතුමා ඉදිරිපත් කරපු යෝජනාව සම්බන්ධව ජනතාවත් මාධ්‍යයත් අවධානය යොමු කරන්න ඕනෑ. මොකද, උතුරු මැද පළාතට මම වාගේම රණවිරුවෙක් ඡන්දය ඉල්ලුවා. ඔහුගේ කැකිරාව ආසනය භාරව කටයුතු කළේ මම. එතැනදී කැකිරාව ආසනය භාර දීලා තිබුණේ තෙන්නකෝන් ඇමැතිතුමාට. මාතලේ දිස්ත්‍රික්කයේ ඇමැතිතුමාට. එතුමාට දීපු වෙලාවේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරු ඇතුළු සියලුම අයගේ ප්‍රගතිසමාලෝචන රැස්වීම ඉරිදා තිබුණේ. ඊට මමත් සහභාගි වෙලා යන වේලාවේ, ඒ සභාපතිවරුත් එකටම ඒ වාහනවල ගියා. ජීප් රථ සහ වෙනත් වාහන. මම කැකිරාවේ ඉඳලා ත්‍රීවිල් එකේ එනකොට පොලීසියෙන් අත දාලා නැවැත්තුවා. නවත්තපුවාම මගේ ළඟ ඉන්න බඩියා ගිහිල්ලා කිව්වා, මේ මන්ත්‍රීතුමා ඉන්නේ කියලා. මන්ත්‍රීතුමා ඉන්නේ කියලා කියනකොටම ලයිට් ගහගෙන දඹුල්ල නගර සභාවේ සභාපතිතුමා ගියා. ඊට පස්සේ නාවුල්ලේ සභාපතිතුමා ගියා. ඉතින් බොහොම වේගයෙන් ගියා. ඔවුන්ට කිසි ගැටලුවක් නැහැ. එතැනදී පොලීසියේ රාළහාමි මගේ ළමයාගෙන් අහලා තිබුණා, කොහෙද පළාත් සභා මන්ත්‍රීවරු ත්‍රීවිල්වල යන්නේ කියලා. ඔහුට සැර කරලා තිබුණා, බොරු කියන්නේ කියලා. ඊට පස්සේ එතුමා ඇවිල්ලා මගෙන් Identity card එක ඉල්ලුවා. මම Identity card එක දුන්නා. අර පළාත් සභාවෙන් අපට දීලා තිබෙන Identity card එක දුන්නාම මම කවදාවත් දැකලා නැහැයි කිව්වා, පළාත් මන්ත්‍රීවරයෙක් ත්‍රීවිල් එකක යනවා කියලා. හැබැයි මම කිව්වා, මම රණවිරු මන්ත්‍රීවරයෙක්. එවිට ඔහු කියනවා, නැහැ. ජේනවා නේ දැන් ගිය හැටි. අර ගිය හැටි දැක්කා නේද කියලා ඇහුවා. මම කිව්වා, ඒක ඒ ගොල්ලන්ගේ තිබෙන තත්ත්වය. මේ මම

[ ගරු විකුම් ගුණසේකර ]

දුප්පත් මන්ත්‍රීවරයෙක්. මම රණවිරුවෙක් හැටියට දේශපාලනයට ආවේ. ඒ නිසා ඔබතුමන්ලා එහෙම හිතන්න එපා. මොකද, ත්‍රීවිල් එකේ ගියත් මම මන්ත්‍රීවරයෙක්. ඒ විධියට කියලා, ඊට පස්සේ මම ස්ථානාධිපතිටත් කිව්වා, යන වාහනය බලන්න එපා කියලා. ඒ වාගේ අපි බොහොම අසරණ අවස්ථාවන්ට පත් වුණු තැන් තිබෙනවා. ත්‍රීවිල් එකෙත් ගිහිල්ලා හැබැයි අවුරුදු 04 යි මාස තුනක් මේ සභාව නියෝජනය කරලා මට කරන්න පුළුවන් දේ මම කළා. මම කියන්නේ ඒකයි. ඒ වාගේ දේශපාලනයක් කරන්නේ. මොකද, හොරකම් කරන්න තිබුණා. අපි හොරකම් කරන්න කැමැති මිනිස්සු නොවෙයි.

ඒක නිසා ඔබතුමා දන්නවා, වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා. අපි හරියට අපහසුතාවට පත් වෙනවා. මොකද, අපේ දිස්ත්‍රික්කයේ මේ බස්නාහිර පළාතේ අගලවත්ත තිබෙන තත්ත්වය ගැන අපි බොහොම දුක් විඳිනවා. අපට බොහොම දුක හිතෙනවා. ඔබතුමා දන්නවා. මම ඒ පැතිවලට පාලම් හදලා දීලා, සමහර වේලාවට මේ බස්නාහිරද කියලා හිතෙනවා. එහෙම පළාතක සභාපති කෙනෙක් ඔය වාගේ හැසිරෙනවා නම් අපට ලොකු ගැටලුවක් ඇති වෙනවා. මේවා කථා කරන්න කට්ටිය භයයි. මම නම් භය නැහැ. මොකද මම එතුමාගේ නිවසේ තිබුණු මඟුල් උත්සවයට ගියාමත් මම හිතේ තියාගෙන ආවේ දෙයියනේ මේවා කොහොම ලැබුණාද කියලා. ඔබතුමාත් එක්කත් මම සාකච්ඡා කළා. මොකද, ඇත්ත වශයෙන්ම අල්ලස් එකේ එක්කෙනා තමයි සභාපතිතුමාගේ ලේකම් හැටියට ගියේ. පැහැදිලිවම හොඳ විධියට එතුමා ඒක ඔප්පු කරලා තිබුණා. මම කියන්නේ ඒකයි. ඔබතුමාගේ මාර්ගයෙන් ගරු ප්‍රධාන ඇමැතිතුමාට මම යෝජනා කරනවා. මේවාට පැහැදිලි උත්තරයක් ගන්න. මේක එක්කෝ විශ්‍රාම ලත් විනිශ්චයකාරවරයෙක් හරි පත් කරලා ඒ අවශ්‍ය කටයුතු කරන්නය කියලා ඔබතුමා මාර්ගයෙන් මම යෝජනා කරනවා. පැහැදිලිවම. කළුතර එක්කෙනා, එතුමා දැන් ඇවිල්ලා ආපසු ඒ ආසනයේ ඉන්නවා. ඒ පුටුවේ වාඩි වෙලා. ඒ අවශ්‍යතාවයන් කරනවා. සමහර වේලාවට මේක වෙනුවෙන් විරුද්ධ වුණු අයට ලොකු ගැටලුවක් වෙලා තිබෙනවා. මම කියන්නේ ඒකයි. මේවා කවුරු හරි කොහෙන් හරි පටන් ගන්න ඕනෑ. හැබැයි එතැනදී මොනවාද කියන්නේ? එතැනදී ජාතික දේශපාලනය සහ පාර්ලිමේන්තුව කියන්නේ මේක අපට අයිති නැහැ. පළාත් සභාවේ ප්‍රධාන ඇමැතිතුමාට අයිති වෙන්නේ. ඒක නිසා අපට කරන්න දෙයක් නැහැයි කියලා කියන්නේ. ඉතින් ඒ චෝදනා අපි ගන්න ඕනෑ නැහැ නේ? අපි එක්කෝ මොකක් හරි ක්‍රමවේදයක් යොදලා ඇත්ත වශයෙන්ම චෝදනා ලබපු වේලාවේම අර එතුමා කිව්වා වාගේ මොනාහරි ක්‍රමවේදයකට යන්න ඕනෑ. නැති වුණොත් අපත් අපහසුතාවයට පත් වෙනවා. දේශපාලඥයෝ හැටියට අපටත් ලජ්ජාවක් හිතිලා තිබෙනවා, මේක තුළ මේ කටයුතු කරන්න. මොකද අපි බොහොම හරි අවංකව කටයුතු කරන්නේ. නැත්නම් මට මේ අවුරුදු 04 යි මාස තුනක් යන්න ඕනෑ නැහැ නේ වාහනයක් ගන්න. මට දුන්න බලපත්‍රයෙන් තමයි මම වාහනයක් ගත්තේ. මම කියන්නේ, ඒවා ගේන්න ඕනෑ නැහැ නේ. මම හිතන්නේ ඔබතුමා දන්නවා. පළාත් සභාව හැටියට මහ ආණ්ඩුව මඟින් ලැබෙන දේවල්, ඒ වාගේ දේවල්වලින් කොපමණ දේවල් කරන්න පුළුවන්ද? ඇත්තටම ඔය කැපකරු ඇමැතිවරුත් මට සිටියේ නැහැ නේ? අපේ පැත්තට ඇමැතිවරු 08 දෙනෙක් ඉන්නවා. මම මේ යන්නේ ත්‍රිවිල් එකේ කියලා කිසිම ඇමැතිවරයෙක් වාහනයක් දුන්නාද? නැහැ නේ? කිසි කෙනෙක් අපට එහෙම කළේ නැහැ. ඉතින් අපට කැපකරු ඇමැතිවරු -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, වෙලාව පිළිබඳව අවධානය යොමු කරමු.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

වාහනයක් දෙන්නද?

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

නැහැ. නැහැ. අවශ්‍ය නැහැ. දැන් ඕනෑ නැහැ. දැන් ඉතින් දෙයියනේ කියලා මොන්ටෙරෝ එකක් හම්බ වුණා. දැන් දෙයියනේ කියලා මට කරදරයක් නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ත්‍රීවිල් එක ගෙදර තිබෙනවාද?

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

කවදාවත් ත්‍රීවිල් එක නැති කර ගන්නේ නැහැ. ත්‍රීවිල් එක කවදාවත් නැති කර ගන්නේ නැහැ. මොකද, Driver නැති වෙලාවට මට එන්න වෙන්නේ ඒකෙනේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සමාවෙන්න. ඒක මට දෙන්න බැරිද?

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

ඔබතුමාට දෙන්න බැහැ. මොකද, මම කාගෙන්වත් යැපෙන්න බලාපොරොත්තු වන කෙනෙක් නොවෙයි. හදිසියේ රියැදුරා නැති වෙලාවට සභාවට හරි එන්න තිබෙන්නේ ඒක. මම දන්නවා ඔබතුමා ඉල්ලන්නේ මොකටද කියලා. මොකද, ඔබතුමා බොහොම දුෂ්කර පළාතක් නියෝජනය කරන්නේ. මොකද ඔබතුමාට තිබෙන තත්ත්වය. හැබැයි, අධෛර්යමත් වෙන්න එපා. මම කියන්නේ ඒකයි. කොයිම වෙලාවකවත් අධෛර්යමත් වෙන්න එපා. කරන්න බැරි දෙයක් නැහැ. දෙයියෝ කොහෙන් හරි දෙයි. හරි දේ කළොත් එච්චරයි. මම හිතනවා, කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා ගත්ත ප්‍රයත්නය තුළ ඇත්ත වශයෙන්ම

අධ්‍යාපන සුදුසුකම්ද ඒවාද මේවාද කියලා නැහැ. ඒ වාගේ කුමක් හෝ ක්‍රමවේදයකට ගිහිල්ලා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

අවශ්‍ය කටයුතු කරන්න. මොකද, හමුදාවකට බැඳෙන්නත් - ඉස්සර නම් අපි හමුදාවට බැඳෙන කොට අපේ පැටිකිරිය හෙව්වා. පරම්පරාව කොහොමද, පොලීසියකට අහුවෙලා තිබෙනවාද? කාටද නඩුවක් තිබෙන්නේ? ඒ වාගේ හෙව්වා. අද දේශපාලඥයන්ට එහෙම සොයන්නේ නැහැ නේ? ඕනෑ කෙනෙකුට ඕනෑ දේකට එන්න පුළුවන්. සල්ලි තිබෙනවා නම් එන්න පුළුවන්. එහෙම නොවෙයි මම කියන්නේ, මොකක් හරි ක්‍රමවේදයකට යන්න ඕනෑ. එතුමා යෝජනා කරන ඒ යෝජනාවට මාගේ සම්පූර්ණ සහයෝගය සහ අපේ කෘතඥතාවය පළ කරමින් නවතිනවා. ස්තූතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මූලාසනය හැටියට නොවෙයි ගරු මන්ත්‍රීතුමා, ඒ ත්‍රීවිල් එක ඉල්ලුවේ ඇයි කියලා ඔබතුමා දන්නවා නේද? සභා ලේකම් කාර්යාලයෙන් සභාපතිතුමාට වාහන තුනම දීලා මමත් ත්‍රීවිල් එකේ එන්නේ. මට ඒක ගෞරවයක්. ඒක කියන්නට ඕනෑ. මම නිවැරැදි මහජන නියෝජිතයෙක්.

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

ඔබතුමාට තිබෙන වරප්‍රසාදත් එක්ක - ඔබතුමාට තිබෙනවා නේ වාහන -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මම කියන්න කනගාටු වෙන්නේ නැහැ. මම අගය කිරීමක් කළේ. ඔබතුමාවත් අගය කරනවා. අනික් මන්ත්‍රීවරුන්වත් අගය කරනවා. මම අගය කිරීමක් කළේ. බොහොම ස්තූතියි. නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු නියෝජ්‍ය සභාපතිතුමා, අපට පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. ඔබතුමා කියනවා, සභා ලේකම් කාර්යාලය වාහන තුනම සභාපතිතුමාට දුන්නා කියලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා ගිහිල්ලා නේද මේ ආවේ?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මම සභාවේ දිගටම සිටියා. අපට ප්‍රශ්නයක් තිබෙනවා. එහෙම දෙන්න පුළුවන්ද? මොකක්ද ඒ රීතිය කියලා දැන ගන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා ඒක සභා කටයුතු කාරක සභාවට යොමු කරන්න. හිටපු අමාත්‍යවරයෙක්. ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරයෙක්. පක්ෂ නායකයෙක්.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඔබතුමා කියනවා සභා ලේකම් කාර්යාලය වාහන තුනම දුන්නා කියලා. කවදාද දුන්නේ? කවුද ඒ බලය පැවරුවේ? මේ සභාවට හෙළි කරන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාගේ අදහස සභා කටයුතු කාරක සභාවට යොමු කරනවා.

[ අ.භා. 01.52 ]

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි ජීවත්වන සමාජ ක්‍රමයේ නිරුවත හොඳින්ම පිළිඹිබු වන කාලයක තමයි අපට අද මේ විවාදය කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. සාමාන්‍යයෙන් මේ රටේ පොදු ජනතාව අධිකරණය සම්බන්ධයෙන් විශ්වාසය තියාගෙන සිටියා. හැබැයි මෑත කාලයේදී අල්ලස් අරගෙන නඩුකාරයෝ අහු වෙනවා. ඒ වාගේම මේ රටේ ජනතාව නීතිය සම්බන්ධයෙන් විශ්වාසයක් පොලීසිය මත තියාගෙන සිටියා නම්, මෑත කාලයේදී නියෝජ්‍ය පොලිස්පතිවරු කූළියට මිනී මරලා අහු වෙනවා. ඒ වාගේම ජනතාව තම තමන් අදහන ආගමික සංස්ථා පිළිබඳව විශ්වාසය තියාගෙන සිටියා නම් මේ වන විට 2005 අවුරුද්දේ වාහනයේ ලයිසන්, ඉන්ෂුවරන්ස් මොකක්වත් නැතිව, බ්‍රේක් නැතිව බීලා වාහනය පදවපු, දඩ ගැහුම් කාපු ඒ හාමුදුරුවෝ කියන බණවලට සවන් දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. වෙනත් ආගමික සංස්ථාවලටත් මේ වාගේ ඕනෑ තරම් උදාහරණ ඇති. ඒ නිසා මේ පිරිහීම දේශපාලනයේ විතරක් නොවෙයි. සියලු ක්ෂේත්‍රවල දකින්න පුළුවන්. ඉතින් එහෙමනම් අපි ගත්තොත් එහෙම කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ යෝජනාවට එකතු කිරීමක් විදියට ප්‍රාදේශීය දේශපාලඥයෝ සහ ජාතික දේශපාලඥයෝ මේ වේලාවේ යෙදිලා තිබෙන විෂමාචාර

[ ගරු නලින්ද ජයතිස්ස ]

ක්‍රියා සම්බන්ධයෙන් ලැයිස්තුවක් ඉදිරිපත් කරන්න පුළුවන්. කොහොම වුණත් අපි සියලුදෙනා පිළිගන්න ඕනෑ. ශුද්ධ වූ සියල්ල කෙළෙසමින් යන්නේ. එහෙම නේද මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා. ශුද්ධ වූ සියල්ල කෙළෙසමින් යන්නේ. ඒ නිසා මේ සමාජ ක්‍රමයම පිරිහීමීමට පත් වෙමින් යන්නේ. හැබැයි, සමාජ ක්‍රමය වෙනස් කිරීම සඳහා - ඒක කරන්න බැහැ. ඒ සඳහා අරගලයක් තිබෙන්න ඕනෑ. ඒ සඳහා තමන්ගේ ස්වාධීන වූ දේශපාලන ගමන් මාර්ගයක ගමන් කරන්නට ඕනෑ. අපි හිතන්නේ නැහැ, මේ සමාජ ක්‍රමය වෙනස් කරන්න පුළුවන් කියලා සාරි පොටේ හෝ සාටකයේ එල්ලිලා ගිහිල්ලා. ඒක කරන්න හම්බ වෙන්නේ නැහැ. දැන් මේ ක්‍රමය ඇතුළේ වුණත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රටක් හදනවා නම්, රටක විනය හදනවා නම් ඒ රට පාලනය කරන ආණ්ඩුවට විනයක් තිබෙන්න ඕනෑ. ආණ්ඩුවට විනයක් හදන්න නම් ඒ ආණ්ඩුවේ තිබෙන ප්‍රධාන පක්ෂයට, එහෙම නැත්නම් ආණ්ඩු බලය හොබවන පක්ෂයට විනයක් තිබෙන්න ඕනෑ. ඒ පක්ෂයේ විනයක් තිබුණොත් අපි කල්පනා කරනවා, මේ මොන ක්‍රමයේ ඇතුළේ වුණත් යම්කිසි ආකාරයකට රටේ සදාචාරයක් හදන්න පුළුවන් වෙයි කියලා. දැන් මේ කැණි මඩලට හෙණ ගැහිලා තිබෙන්නේ. අපි මේ ප්‍රාදේශීය දේශපාලනය ගැන කොපමණ කථා කළත් වැඩක් වෙන්නේ නැහැ. ජාතික දේශපාලනයේ හොරු රංචු පිටින් කරක් ගහලා ඉන්නකොට. දැන් කල්පනා කරලා බලන්න. මම ඔබතුමාට කියන්නම්. මේක ඉහළ සිට පහළට හදන්න ඕනෑ වැඩක්. කකුළුවා ඇදේට යද්දී තමන්ගේ පැටවුන්ට කෙළින් යන්න කියලා කිව්වාට වැඩක් නැහැ. මම ඔබතුමාගෙන්ම උදාහරණයක් ගන්නම්. වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ලක්ෂ පහළොවක අල්ලසක් අර ගෙන අහු වුණා.

හැබැයි, මම දන්නා තරමට ඔබතුමා ඔහුව බේරා ගැනීම සඳහා හෝ ඒ සඳහා කිසිම ආකාරයක මැදිහත් වීමක් සිද්ධ කළේ නැහැ. ඔබතුමා එතුමා බලන්න උසාවි ගානේ ගියේ නැහැ. හැබැයි, මේ පළාත් සභාවේම ඉන්න ඇමතිවරයෙක් සහ ඒ ආසනයේ කැබිනට් ඇමතිවරයා, මීගමුවේ නගරාධිපතිවරයා පොලීසියට බාධා කරලා අත්අඩංගුවට ගත්තාට පස්සේ ඔහුව නිදහස් කරන්න ගියාද? නැද්ද? එතකොට අර වාගේ ප්‍රාදේශීය දේශපාලඥයන්ට හොරකම්, ජඩකම්, මැරකම්, වලත්තකම් කරන්න අනුබලය ලැබෙන්නේ කොහෙන්ද? දැන් බලන්න. තංගල්ල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විදේශීය කාන්තාවක් දූෂණය කරලා ඔහුගේ පෙම්වතා මරලා දැම්මා. කෝ පරීක්ෂණ? දැන් මේ නොබැඳි සමුළුව තියෙන වෙලාවේ ජාත්‍යන්තරයෙන් කියනවා, මේකට පරීක්ෂණ කරන්න කියලා. පරීක්ෂණ නැහැ. අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා. ඔහු ස්ත්‍රී දූෂණ හාරසියයකට සම්බන්ධයි. හාරසියයක්. ලේසි නැහැ. කොහොම කළාද කියලා හොයාගන්න ඕනෑ. හාරසියයකට සම්බන්ධයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා කියන්නේ සත්‍යම කාරණාද?

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

සත්‍යයි. මොකද, හාරසියය සමරන්න පාටියක් දැම්මා. ඒ පාටියට ඒ ප්‍රදේශයේ පොලීසියේ ප්‍රධානීන් සහ ආණ්ඩුවේ කැබිනට් ඇමතිවරයෙකුත් ගියා. ඔහුගේ පක්ෂ සාමාජිකත්වය අහෝසි කරන්න ආණ්ඩුව සාකච්ඡා කරන වෙලාවේ ඔහු අභියෝග කරනවා එහෙම කළොත් එහෙම අර ෆොටෝ ටික එළියට දානවා කියලා. එහෙම තමයි මේවා ඉහළ ඉඳලා පහළට එන්නේ. ඒ විතරක් නොවෙයි. දැන් කල්පනා කරලා බලන්න ජාතික දේශපාලනය ගැන. මොළෙන් සියයට හැටක් වැඩ කරනවා කියලා අපේ රටේ උසාවිය පිළිගත්තු කෙනෙක් පාර්ලිමේන්තුවේ දෙසිය විසිපහ නියෝජනය කරද්දී මොන සදාචාරයක්ද ගරු නියෝජ්‍ය සභාපතිතුමනි? මොළේ සියයට සියයක් වැඩ කරන මිනිස්සුන්ව පාලනය කරන්න මේ රටේ ලක්ෂ විසි හතරක් වූ අපව පාලනය කරන්න මොළෙන් සියයට හැටක් වැඩ කරන කෙනෙක් පාර්ලිමේන්තුවේ ඉන්නවා නම්, රටට කලක් යාවිද?

ඒ නිසා මේක හදන්න වෙන්නේ ඉහළ සිටම තමයි. ඉහළින් ආදර්ශයක් දුන්නොත්, ඉහළ නීතිය ක්‍රියාත්මක කළොත් ඒක පහළට බලපානවා. තමන්ගේ බිරිඳ විසින් තමන්ගේ අනියම් බිරිඳව හා සේවිකාවක් ඝාතනය කළාට පස්සේ, කැබිනට් ඇමතිවරයෙක් තමන්ගේ නීත්‍යානුකූල බිරිඳව ජීවිතාන්තය දක්වා සිරගත කළා. මරණීය දණ්ඩනය. හැබැයි, මොකද වුණේ? ලෝක කාන්තා දිනයේදී ජනාධිපති සමාවක් දුන්නා. බලන්න කෝ? අඩු ගණනේ වෙන දිනයක් තෝරා ගත්තා නම්. ලෝක කාන්තා දිනයේදී, ජාත්‍යන්තර කාන්තා දිනයේදී කාන්තාවෝ දෙන්නෙක් ඝාතනය කරපු කාන්තාවකට විශේෂ ජනාධිපති සමාවක් දෙනවා. එතකොට මේ අකුරැස්සේ සභාපතිවරයා කාන්තාවන් හාරසියයක් දූෂණය කරලා ඕනෑ තරම් සල්ලි වියදම් කරලා ඒක වහගන්න පුළුවන් කියලා හිතන එක අහන්නත් දෙයක්ද? අහන්නත් දෙයක්ද? අහන්න දෙයක් නොවෙයි. තමන්ගේ පුත්තු රගර් මැච් එකේදී විනිශ්චයකාරවරයාට ගහන කොට කෝ ගත්තු පරීක්ෂණ? ඒවා මොකක්වත් නැහැ. කථා කරනවා නම් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, උවමනා තරම් උදාහරණ තියෙනවා. අපි කියන්නේ, මුලින්ම පක්ෂ විනය හදා ගන්න. දැන් බලන්න. පහුගිය කාලේදී අර ගුරුවරිය දණ ගස්වපු මන්ත්‍රීවරයා සම්බන්ධයෙන් රටේ ලොකු ආන්දෝලනයක් ඇති වුණා. ගුරුවරු පාරට බැස්සා. හැබැයි දැන් මොකෝ වෙලා තියෙන්නේ? දැන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නාම යෝජනා මණ්ඩලය ඉදිරිපිටට ඔහු කැඳවලා තියෙනවා. අපි හිතන්නේ, ඔහු නැතත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට වයඹ පළාත් සභාව ජයග්‍රහණය කරන්න පුළුවන්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අපට දිනන්න පුළුවන්.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

පුළුවන්. බලන්න, මේ වාගේ මැරකම් කරපු, ප්‍රසිද්ධියේ ගුරුවරියක් දණ ගස්වපු කෙනෙකුට නාම යෝජනා දෙන තැනට ඇද වැටිලා තියෙන්නේ. මේකේ තිබෙන්නේ නීතිය නොවෙයි. නීතිය පැත්තකට දාලා. හැබැයි පක්ෂයට විනයක් තියෙන්න ඕනෑ, පළමුවැනි මොහොතේදී එවැනි අය අයින් කරන්න. එහෙම ආදර්ශයක් දුන්නොත් - මම හිතන්නේ කොමියුනිස්ට් පක්ෂයේ, හෙළ උරුමයේ, ඒ වාගේම ජනතා විමුක්ති පෙරමුණ අපි ආදර්ශය දීලා තියෙනවා. අපිත් ප්‍රාදේශීය සභාවක් අවුරුදු අටක් තිස්සේ පාලනය කරපු පක්ෂයක්. අපිත් මේ රටේ ඇමතිකම් කරපු පක්ෂයක්. අපිත් පළාත් සභා ප්‍රාදේශීය සභා නියෝජනය කරන පක්ෂයක්. පාර්ලිමේන්තුව නියෝජනය කරන පක්ෂයක්. හැබැයි, වරදක් අහුවුණොත් තරාතිරම බලන්නේ නැතුව දඬුවම දෙනවා. එලවනවා. එහෙම තමයි කරන්න ඕනෑ. ඒ ආදර්ශය දෙන්නේ නැතුව රටක් හදන්න බැහැ. පටන් ගන්න ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මේ අයට නාම යෝජනා නොදෙන්න. ඒ නිසා මම මේ යෝජනාවට මගේ එකඟතාවය පළ කරන්නේ පළමුවැනි කරුණට විතරයි. මොකක්ද? රටේ මෙහෙම දේවල් තියෙද්දී, ඒ සඳහා ආණ්ඩුවේ ඉහළින්ම ආශීර්වාදය, සහයෝගය, අනුග්‍රහය ලැබෙමින් තියෙද්දී මෙවැනි යෝජනාවක් පළාත් සභාවට ඉදිරිපත් කරන්න කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමාට තිබුණ ධෛර්යය ගැන මම අගය කරනවා. සතුටු වෙනවා. හැබැයි, දේශපාලන පක්ෂවලට තියෙන අයිතිය කිසිදු විද්වත් මණ්ඩලයකට පවරනවාට අපි එකඟ නැහැ.

ඔබතුමා දන්නවා, යුරෝපයේ වැඩවසම් යුගය තිබුණා. අඳුරු යුගය. ඒ කාලයේ සම්පූර්ණ බලය හිමි වෙලා තිබුණේ, කතෝලික පල්ලියට. දෙවියන් වහන්සේගේ කැමැත්තට තමයි රජ්ජුරුවෝ තීරණය කළේ. දෙවියන් වහන්සේ කැමැත්ත තමයි නීතිය. ඒ කාලයේ පල්ලියේ බලයක් භුක්ති වින්දා. හැබැයි, මේ ක්‍රමය ඇතුළේ රාජ්‍ය බලය තියෙන්නේ පල්ලියට හෝ වෙනත් ආගමික සංස්ථාවකට නොවෙයි. විද්වතුන්ට නොවෙයි. ඒක තියෙන්නේ, දේශපාලන සංස්ථාවලට. ඒ නිසා මේ දේශපාලන සංස්ථාවල දේවල් තීන්දු කරන්න වෙන කාටවත් බැහැ. ඕනෑම ස්වාධීන, අපක්ෂපාතී කොමිෂන් හරි මොනවා හරි දාන්න බැහැ. අවසානයේ කවුද මේවාට පත් කරන්නේ? ජනාධිපතිවරයා. පක්ෂවල නායකයෝ. මේවා නිකම් බොරු පඹයෝ විතරයි. රූකඩ විතරයි. එහෙම කරනවා නම්, අඩු තරමින් මේ ව්‍යවස්ථාව තුළ තියෙන ස්වාධීන කොමිෂන් සභා ටික ක්‍රියාත්මක කරන්න එපැයි. එහෙමත් නැහැ. ඒ නිසා මේක පක්ෂයට අයිති දෙයක්. අපි හැමෝම දේශපාලන පක්ෂ නියෝජනය කරන අය. අපේ පක්ෂවල මධ්‍යම කාරක සභාවලට තමයි මේකේ අයිතිය තිබෙන්න ඕනෑ. ඒ බලය අපි පවරා ගන්න ඕනෑ. ජනතාව කොහෙන් හරි චෝදනා කරනවා නම්, අහවල් මන්ත්‍රීවරයා වැරදියි කියලා, ඔහු පිළිබඳ පරීක්ෂණයක් කරලා එලවන්න අයිතිය තියෙන්න ඕනෑ. තමුන්නාන්සේට මතක නම් කෑගල්ල දිස්ත්‍රික්කයේ අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හිටියා. වරදක් කරලා අහු වුණා. එවෙලේම එලෙව්වා. ඒකෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කෙනෙකුට තමයි පාර්ලිමේන්තුවට යන්න අවස්ථාව හම්බ වුණේ. හැබැයි, එලවලා ඒ ආදර්ශය දුන්නා. ඒ නිසා අපි මේක ඉහළ සිට පහළට කරන්න ඕනෑ වැඩක්. ඒ නිසා මේ යෝජනාවට ඔබතුමාගේ ධෛර්යය අගය කරන අතරේ - හැබැයි, ඔබතුමා පිළිගන්නවා මේ ප්‍රාදේශීය දේශපාලනයේ සිට ජාතික දේශපාලනය දක්වා මෙවැනි බරපතළ ගැටළුවක් තියෙනවා කියලා. ඒකට විසඳුම තියෙන්නේ, විද්වත් මණ්ඩලය ඇතුලේ නොවෙයි. අඩු තරමේ මේ මන්ත්‍රීවරු වෙනුවෙන්, මේ අහුවුණු වැරදිකාරයන් වෙනුවෙන් සාමාන්‍ය නීතිය ක්‍රියාත්මක වෙන්න ඉඩ දෙන්න කෝ? දැන් මේ අයට සාමාන්‍ය නීතියවත් නැහැ. යුක්තිය ජනතාවට ඉෂ්ට වන්නේ නැහැ. අඩු තරමින් මේ අයට නීතිය ක්‍රියාත්මක කරන්න පුළුවන් නම් - අපි දන්නවා පහුගිය කාලයේ මොකද වුණේ කියලා. නීතිපතිවරයා බොහෝ නඩු ඉවත් කර ගත්තා. නාම්පමුණුව සිද්ධියේ දෙන්නෙක් ඝාතනය වුණා. අවුරුදු දාහතරක් නඩු ඇහුවා. ඔහුට මරණ දණ්ඩනය දෙන්න ඔන්න මෙන්න කියලා තියෙද්දී, නීතිපතිවරයා නඩුව ඉල්ලා අස්කර ගත්තා. චන්දන කත්‍රිආරච්චි මහත්තයා දැන් නිදහස්. අබ්දුල් කාදර් මන්ත්‍රීවරයා, අර කම්බ කාරයෝ හොරකම් කළා කියලා අහු වුණා. ඒකට සමාව දුන්නා. නීතිපතිනිය නඩුව ඉල්ලා අස්කර ගන්නවා. පහුගිය කාලයේ ඔහොම එක වැලට නීතිපතිවරයා නඩු ඉල්ලා අස්කර ගත්තා.

ඊයේ සිද්ධියක් වාර්තා වුණා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. හලාවත අනවසර ඉදිකිරීමක් කළා කියලා අර පුංචි දරුවෝ දෙන්නෙක් ඉන්න කාන්තාවක් අරගෙන ගිහිල්ලා පැය හැත්තෑ දෙකකට ආසන්න කාලයක් පොලීසියේ තියාගෙන ඉඳලා තියෙනවා. අවසානයේ උසාවියට දැම්මාට පස්සේ නඩුකාරයා පොලීසියටත් බැණලා රුපියල් සියයක් දඩ ගහලා එව්වා. දැන් බලන්න. එවැනි සාමාන්‍ය මනුස්සයෙකුට නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා - අනවසර ඉදිකිරීමක් කියලා කියන්නේ ඇත්ත. රජයේ ඉඩමක ගෙයක් හදා ගෙන ඉන්නවා. ගෙයක් හදා ගන්න විධියක් නැහැ. දරුවෝ දෙන්නාට කන්න දෙන්න විධියක් නැහැ. හමුදාවේ කෙනෙකුගේ පවුලක්. එතකොට මෙහෙම නීතිය ක්‍රියාත්මක කරන ආණ්ඩුවක්. මේ රටේ කෝටි ප්‍රකෝටි ගණන් වංචා කරපු ඇමතිවරු, මන්ත්‍රීවරු ඕනෑතරම් ඉන්නවා. කෝ නීතිය? ඒ නිසා මිනිස්සුන්ට පළමුවෙන්ම නීතිය පිළිබඳ විශ්වාසයක් හදන්න ඕනෑ. ඒ නිසා අපි සමාජ ක්‍රමය වෙනස් කරමු. හැබැයි, සමාජ ක්‍රමය වෙනස් කරන්න ඉස්සෙල්ලා අඩුම තරමේ මේ මිනිස්සුන්ගේ ජීවිත ටික රකින්න නම් මේ නීතිය ඉහළ සිට පහළට ක්‍රියාත්මක කරන්න ඕනෑ. වෙන කොහෙන්වත් නොවෙයි. ඉහළ සිට පහළට මේ ආදර්ශය දෙමු. එහෙම දීලා, පෙන්නලා සාර්ථක කරපු අත්දැකීම් අපට තියෙනවා. අපි සියල්ල සාකච්ඡා කරන්න ලැහැස්තියි. ඒ නිසා මේ යෝජනාව පිළිබඳ මම

[ ගරු නලින්ද ජයතිස්ස ]

නැවතත් කියන්නේ, ඔබතුමාගේ ධෛර්යය අගය කරන අතර, හැබැයි මේක ක්‍රියාත්මක කරන්න බැහැ. මොකද, මේක නොවෙයි විසඳුම කියන එකත් කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[ අ.භා. 02.00 ]

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ යෝජනාවට කථා කරන්න අවස්ථාවක් දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම කවදත් අසාධාරණයට, අයුක්තියට විරුද්ධව සටන් කරන කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා දේශපාලන භේදයකින් තොරව මේ වාගේ යෝජනාවක් ගෙන එන්න ශක්තිය ලබා ගැනීම පිළිබඳවත් අපේ ගෞරවය මා පුද කරනවා. කවුරු වරදක් කළත් ඒ වරද වරදක් හැටියට පෙන්වන්න කෙනෙකුට පුළුවන් නම්, ඒක මම හිතන්නේ මේ වාගේ යුගයකදී විශිෂ්ට ක්‍රියාවක්. ඔබතුමා, ඔබතුමාගේ හදවතට කථා කළා. ඔබතුමා හදවතට කථා කරලා නිකම් හිටියේ නැහැ. මෙතුමා මෙතුමාගේ ශක්ති ප්‍රමාණයෙන් ඒක නිවැරදි කරන්න පුළුවන්ද කියලා බලන්න මේ යෝජනාව දැම්මා. කවුරු ඒකට උසුළු විසුළු කළත්, කවුරු අසූචි ගොඩේ ඉඳ ගෙන අයිස් ක්‍රීම් කන්න කථා කළත්, ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ යෝජනාව මේ කාලයට උචිත යෝජනාවක් හැටියට මම පිළිගන්නවා. එක එක පක්ෂ එක එක කෝණවලින් ඒ ප්‍රශ්න දිහා බලන්න පුළුවන්. තමන් ඇති කරපු ප්‍රශ්නය අනෙක් අයට ලබා දීලා ඒ අය කළාය කියලා ඇඟිල්ල දික් කරන්න බොහෝ අය කටයුතු කරනවා. නමුත් බලාගෙන ඉන්න මිනිහා දන්නවා, මේ විධියේ ක්‍රියාදාමයක ආරම්භය ඇති වුණේ කොයි කාලේද? කොහොමද? කියන එක. අතීතයේ මේ පක්ෂ සියල්ලම පිරිසිදුවට තිබුණා. පිරිසිදු නායක නායිකාවෝ හිටියා. නමුත් මේවා කිළිටි වෙන්න පටන් ගත්තා. ඒවා එන්න එන්නම දියුණු තත්ත්වයට එන නිසා පක්ෂය වුණත්, කවුරු වුණත් වැරැද්දක් කරනවා නම් ඒ වරද නිවැරදි කර ගන්න පුළුවන්ද කියලා මෙතුමා යම් උත්සාහයක යෙදුනා. හැබැයි, මෙතුමාට නිකම්ම මේ ගැන කථා කරන්න බැහැ. මෙතුමාත් අසූචි ගොඩේ ඉඳ ගෙන අයිස් ක්‍රීම් කන ජාතියේ කෙනෙක් වුණා නම්. මෙතුමාට පිරිසිදු දේශපාලන චරිතයක් එක්ක කටයුතු කරන්න පුළුවන්කම තිබුණු නිසා හෘදය සාක්ෂියට එකඟව මේ වාගේ යෝජනාවක් ඉදිරිපත් කරන්න පුළුවන් වෙලා තියෙනවා.

අද සමහර අය ජනමාධ්‍ය ගැන කථා කළා. මාත් හිතනවා, අපේ රට හොඳ පැත්තට ගෙන යන්න හරි, නරක පැත්තට ගෙන යන්න හරි ජනමාධ්‍යයට තියෙන හයිය ගැන ජනමාධ්‍ය අමතක කරන්න එපා. ජනමාධ්‍ය මධ්‍යස්ථ වෙන්න ඕනෑ. ජනමාධ්‍ය මධ්‍යස්ථව මේ කරුණු දිහා බලනවා නම්, මේ සියලු දෙනාටම වැඩි හයියක් මේවා නිවැරදි කරන්න ජනමාධ්‍යයට තියෙනවාය කියන මතයේ බොහෝ දුරට මාත් ඉන්නවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ජනමාධ්‍ය වැරදිකරුවන් හඳුන්වා දෙනවා. අපට ඒ පිළිබඳව කිසිම ගැටළුවක් නැහැ. අපි දන්නවා. කොයි ආකාරයෙන් ක්‍රියා කළත්, තමුන්නාන්සේලා අපි වාගේ අය වැරදිකාරයෝ ගොඩට වැටෙන්නේ නැති නිසා අපට ඒවාට ශක්තිමත්ව මුහුණ දෙන්න පුළුවන්. හැබැයි, අර කිහිප දෙනෙක්ම කිව්වා වාගේ ජනමාධ්‍ය වැරදි කරන අය මෙන්ම හොඳින් ජීවත් වන අය පිළිබඳවත් යම් නිගමනයකට එනවා නම් ජනතාවට කරුණු තෝරා බේරා ගන්න හරි ලෙහෙසියි. අපි දකිනවා. මැතිවරණ ව්‍යාපාරයේදී සමහර අය කියනවා. මට මතකයි, පහුගිය පාර්ලිමේන්තු මැතිවරණයේදී එක අපේක්ෂකයෙක් ගහලා තිබුණා, බස්නාහිර පළාත් සභාවේ රණහඬ කියලා. දිස්ත්‍රික්කයේ පුරාම ගියා. හැබැයි, හැන්සාඩ් අරගෙන බැලුවොත් ඔහු එකම දවසක්වත් මේ සභාවේ කථා කරලා නැහැ. කථා කරලා නැතුව විතරක් නොවෙයි. එක පැය භාගයක් රැඳිලා ඉඳලවත් නැහැ. ජනමාධ්‍ය ඒවා දන්නවා. ජනමාධ්‍යය ඒවා දැක්කා. නමුත් කවදාක්වත් ඒවා ජනමාධ්‍ය විසින් නිවැරදි කරන්න උත්සාහ කළේ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

පාර්ලිමේන්තුවටත් ගියා.

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

ඒ වාගේම අපි අපේ කාලය සම්පූර්ණයෙන්ම - අර උදේ උදය ගම්මන්පිල ගරු ඇමතිතුමා එතුමා ගැන කිව්වා. එතුමා මේ සභාව නියෝජනය කරන්නේ කොහොමද? ඇමති මණ්ඩලය නියෝජනය කරන්නේ කොහොමද කියලා. ඒ වාගේ මේකේ ලැගලා ඉඳගෙන, මේ පළාත් සභාව ශක්තිමත්ව පිරිසිදුව ගෙන යන්න ඉන්න මන්ත්‍රීවරු ඉන්නවා. මන්ත්‍රීවරියෝ ඉන්නවා. නමුත් ඒවා ගැන කවදාවත් සඳහන් කරන්නේ නැහැ. පිටු ගණන් ලියන්නේ වෙනත් අයුරින් ශක්තිමත් වූ අය ගැන. ඒ අය නිවැරදි වෙන විධියට මිසක් ඒ අයගේ අවංකකම ගැන නොවෙයි. මම හිතන්නේ, ජනමාධ්‍ය අර වැරදි කරන අය පිළිබඳව පිටු දහයක් ලියන කොට එක චූටි කොනක හරියට වැඩ කරන දේශපාලඥයන් ගැන දානවා නම් මම හිතන්නේ, ජනතාවට හොඳ මිනිස්සු, නරක මිනිස්සු කවුද කියලා තෝරා බේරා ගන්න පහසු වෙනවා. අන්න එහෙමවත් දෙයක් කරන්න කියලා ජනමාධ්‍යයෙන් මම ඉල්ලා සිටිනවා. හැබැයි, මම තරහ නැහැ, ඔබතුමන්ලා මේ වැරදි කරන ඒවා එළිදැක්වුවාට. මොකද, ඒක අත්‍යවශ්‍ය දෙයක්. ඒකට මම තමුන්නාන්සේලාට හිස නමා ගරු කරනවා. ඒක හරියට කරන්න. වැරදි කරන මිනිස්සුන්ට සමාව දෙන්න එපා. හරියට කරන්න. ඒ වාගේම ජනමාධ්‍යයට පුළුවන්, හොඳ මිනිස්සුත් මේ ක්ෂේත්‍රයේ ඉන්න බව හඳුන්වලා දෙන්න. සිංහ නාද කරන්න පුළුවන් දේශපාලනඥයෝ මේ සභාවේ ඉන්නවා. අපේ බෞද්ධාගමේ කියලා තියෙනවා, බෞද්ධයන්ට තමා ගැන සිංහ නාද කරන්න පුළුවන් අවස්ථා මොනවාද කියලා. එහෙම කරන්න පුළුවන් අය ගොඩාක් ඉන්නවා. මටත් කියන්න පුළුවන්.

මම ප්‍රාදේශීය සභාවක සභාපතිනියක් ලෙස අවුරුදු ගණනාවක් හැටියට හිටියා. උප සභාපතිනියක් හැටියට හිටියා. තුන්පාරක් මම මේ පළාත් සභාව නියෝජනය කළා. මට අභියෝග කරන්න පුළුවන්. මම පගාවක් අරගෙන තියෙනවා නම්, මම හොරකමක් කරලා තියෙනවා නම්, මම වැරදි වැඩක් කරලා තියෙනවා නම් පෙන්නලා දෙන්න කියලා. ඒ සිංහනාදය කරන්න අපට පුළුවන්. නමුත් සමහර දේශපාලඥයන් කරන වැරදි දිහා බැලුවාම ඒවායින් වැඩක් නැති වෙලා තියෙනවා. ඒ ගතිය දෙපැත්තේම තියෙනවා. ඒක අපි අවිවාදයෙන් පිළිගන්න ඕනෑ. මට මතකයි හැත්තෑ ගණන්වල හිටියා පොල්ගස්ඕවිට, කොහේද -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

පොල්ගහවෙල.

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

පොල්ගහවෙල. මිනිස්සු උස්සලා පොළොවේ ගහපු මිනිස්සු එහේ හිටියේ. මේ වාගේ නොයෙකුත් දරුණු වැඩ කරපු අය. දැන් ඒවා එන්නම උග්‍ර වෙලා තියෙනවා. මම තමුන්නාන්සේලාට ඇඟිල්ල දික් කරන කොට මම දන්නවා, මට ඇඟිලි හතරක් දික් වෙනවා කියලා. එහෙම දික් කරන්නේ වැරදි චේතනාවකින් නොවෙයි. කොහෙන් හරි මේක හදාගන්න. ඒ නිසා මම කියන්නේ, මේක හදා ගන්න අපි කවුරු කවුරුත් උත්සාහ කරන්න ඕනෑ. ඒකේ පළමුවැනි වෙඩි මුරය ඉතාම අවංකව, පිරිසිදුව කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා විසින් පත්තු කළා. ඒ නිසා අපි එක එක්කෙනාට ඇඟිල්ල දික් කරගන්න නොවෙයි, අපට තියෙන්නේ. අපි පුළුවන් තරම් අපේ පක්ෂ තුළ අරගල කරලා හරි මේ තත්ත්වය නැති කර ගන්න කටයුතු කරන්න ඕනෑ. ඇත්තෙන්ම මේ සභාපතිවරු සමහර වෙලාවට හිතන්නේ, සභාපතිවරු හැටියට මිනිස්සු ඡන්දේ දුන්නාම ඒ අය සියලු දේවල්වල බලතල තියෙන පුද්ගලයෝ කියලා. මේ මනාප ක්‍රමය ඒකට ලොකු රුකුලක් ලබා දෙනවා. අද මේ මනාප ක්‍රමය නිසා හුභාක් වැරදි කරන අයට රැඳිලා ඉන්න පුළුවන්. එදා ඒ තිබුණු ඡන්ද ක්‍රමය අනුව ඒ ආසනයේ ඉන්න මිනිස්සු දන්නවා, ඒ ඉන්න නියෝජිතයා හොඳ මිනිහෙක්ද, නරක මිනිහෙක්ද, වැරදි කරන මිනිහෙක්ද කියලා. ඒ නිසා පරද්දන්න අවස්ථාව තියෙනවා. අද ක්‍රමය තුළ තමාගේ ආසනයේ වැරදි කරලා වෙනත් ආසනයකට මාරු වුණාම ඔහු සුපිරිසිදු පුද්ගලයෙක් හැටියට හිතලා අර ආසනයෙයි මේ ආසනයෙයි දෙකම එකතු කරලා විශාල ඡන්ද ප්‍රමාණයක් ගන්න පුළුවන්කම තියෙනවා. ඒ වාගේ නොවන්නට ඡන්දදායකයා අපි හදා ගත යුතුයි කියන මතයයි මගේ තියෙන්නේ. මම විශ්වාස කරන්නේ ඡන්දදායකයා ගොඩ නගන්න ඕනෑ අපි. ඡන්දදායකයාට දැනුම දෙන්න ඕනෑ අපි. ඡන්දදායකයා දැනුවත් කරන්න ඕනෑ අපි. ඒක කරන්න පුළුවන් ප්‍රධාන පුද්ගලයා ජනමාධ්‍යය. ඡන්දදායකයා අද දුප්පත්කම නිසා හෝ වේවා, නැත්නම් මත් ද්‍රව්‍යවලට ආශාකම නිසා හෝ වේවා ඒ පසුපස ගියත්, වැඩි දෙනෙක් හරි පැත්තට හරවන්න අපට පුළුවන්කම තියෙන්න ඕනෑ. ඒ තුළින් විතරයි අපට, මේ ක්‍රමයට, මේ ක්‍රම අනුගමනය කරන නායකයින්ට යම් ආදර්ශයක් දිය හැකි වන්නේ. එහෙම නැති වුණොත් අපි දෙපැත්තම කියවා ගනී. නමුත් මේ තත්ත්වය එන්න එන්න ඉහළට යාවි. අද තහඩු ටිකක් බෙදපු, හාල් කිලෝ කිහිපයක් බෙදපු එහෙම නැත්නම් තවත් මොනවා හරි දැකුම් පෙන්නපු මිනිස්සු ආසනයේ අංක එකට එනවා. සංගීත සංදර්ශන තියන - නමුත් අපට ආඩම්බර වෙන්න පුළුවන්. අපි ඒ කිසිම දෙයක් කරල නොවෙයි මේ තැනට ඇවිල්ලා තියෙන්නේ. ඒ නිසා මාධ්‍යට මම කියන්නේ, තමුන්නාන්සේලා පොඩි කොටසක් වෙන් කරගෙන හොඳ දේශපාලඥයෝ, පිරිසිදු දේශපාලඥයෝ සමාජයට හඳුන්වා දෙන්න.

ඒ වාගේම මැතිවරණයේ තියෙන ඒ නාම යෝජනා List එකේ හොඳ නරක මිනිස්සු දෙගොල්ලන්ම ඉන්නවා. නමුත් ඡන්දදායකයා දැකුම් පෙන්නුම්වලට අනුව යන්නේ අර නරක මිනිහා පස්සේ. හැබැයි, හොඳ මිනිහා ගැන හරි අවබෝධයක් ඡන්දදායකයාට දුන්නොත් ටිකක් හරි සහනයක් අපට ලබා ගන්නට පුළුවන් වේවි. ඒ නිසා මම දීර්ඝව කථා කරන්න යන්නේ නැහැ. මගේ හිතට බොහොම එකඟ දේවල් මෙතැන කථා වුණා. අපි වුණත් සමහර වෙලාවට අසරණ වෙලා ඉන්න තැන් පිළිබඳව මෙතැන විග්‍රහයක් වුණා. ඒ නිසා කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමාව අපි තනි කරන්නේ නැහැ. මේ ගැටළුවලදී අපත් ඔබ සමග ඉන්නවා. ඔබතුමාගේ හදවතට දැනුණු, ඔබතුමාගේ හිතට පෙනුණු, ඔබතුමාගේ දෑසට අත්දැකීම් සහිතව දැක්ක දේවල් පිළිබඳව දුවක් ඉන්න තාත්තා කෙනෙක් හැටියට ඔබතුමා කථා කළේ දුවගේ අනාගතයත්, අනාගතයේ මේ රටේ ඉන්න දූවරු පුත්තුන්ගේ අනාගතයත් වෙනුවෙන් කියලා අපි දන්නවා. හැබැයි, ඔබතුමා ලොකු අවදානමක් භාර ගත්තා. නමුත් ඒ අවදානම මේ රට වෙනුවෙන්. මේ රටේ ජනතාව කුද්දන්න, ජනමාධ්‍ය ඇහැරවන්න, මේ මන්ත්‍රීවරු අවදි කරන්න හොඳ සංඥාවක් නිකුත් කළයි කියන එක මම මේ අවස්ථාවේ කියනවා. ඒ නිසා මම ප්‍රාර්ථනා කරනවා මින් ඉදිරියට මේ දේශපාලන ක්ෂේත්‍රයට නර්පයින් එන්නට තියෙන ඉඩ ඇහිරේවා. අපේ ප්‍රධාන පක්ෂ දෙකේ නායක කාරකාදීන්ට මේකෙන් වන විනාශය මේවා තුළින් පෙනේවා. ඇස් ඇරේවා. අවංක දේශපාලඥයින් ඉහළට ඇවිල්ලා සියලු දෙනාම එකතු වෙලා මේ රට ආසියාවේ ආශ්චර්ය බවට පත් කරන්නට ශක්තිය වාසනාව ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා.

[ අ.භා. 02.12 ]

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

ස්තුතියි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා වැදගත් යෝජනාවක් ඉදිරිපත් කිරීම පිළිබඳව මම සතුටු වෙනවා. විශේෂයෙන්ම මේ කාලවකවානුවේදී අපට අහන්න ලැබෙන දේවල් ගැන කථා කරන කොට මෙය කාලෝචිත

[ ගරු හර්ෂණ රාජකරුණා ]

යෝජනාවක් වෙනවා. ඒ ගැන කිසිම සැකයක් නැහැ. අද ප්‍රාදේශීය සභා සභාපතිවරු පමණක් නොවෙයි. අපේ පළාත් සභා මන්ත්‍රීවරු, ඒ වාගේම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සියලු දෙනා ගැන කථා කරන කොට ඇත්තටම කනගාටුදායී තත්ත්වයක් උදා වන්නේ. ඒ වාගේම මෙතුමා සඳහන් කරපු කාරණා කිහිපයක් ගැන කථා කරන කොට - මේ කාලයත් සමග තිබෙන සටනේදී මම ඉතා කෙටියෙන් කථා කරන්න බලාපොරොත්තු වන්නේ. මෙතුමාගේ යෝජනාවේ ඒ විද්වත් මණ්ඩලය ගැන ඇත්තටම මටත් සැකයක් තියෙනවා. නමුත් මම දකින මගේ අදහස වන්නේ, මේ කටයුත්ත කිරීමේදී වගකීමකින් භාරගත යුතු පාර්ශව දෙකක් තියෙනවා. එක පාර්ශවයක් තමයි නියෝජනය කරන ඒ ප්‍රධාන පක්ෂය. විශේෂයෙන්ම ප්‍රධාන විපක්ෂය හැටියට මාත් ඇතුළත් එක්සත් ජාතික පක්ෂයටත් ඔබ, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන පක්ෂය හැටියට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටත් කියන මේ පක්ෂ දෙකට විශාල වගකීමක් තියෙනවා. මේ පක්ෂ දෙක ඇතුළත මේ කාලවකවානුවේදී අපි දේශපාලනය කරන කාල සීමාව තුළදී සියයට අනූ නවයක්ම අපට දකින්න, අහන්න ලැබිලා තියෙන්නේ - කනගාටුයි කියන්න ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහජන නියෝජිතයින් තමයි මේකට මූලිකත්වය අරගෙන තියෙන්නේ.

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

ඒ ආණ්ඩු පක්ෂය නිසා.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

ගරු මන්ත්‍රීතුමියනි, මම මෙතැන දේශපාලනයක් නොවෙයි කථා කරන්නේ. මම යථාර්ථය කථා කරන්නේ. අද ඇති වෙලා තියෙන තත්ත්වය පිළිබඳව. විපක්ෂය නියෝජනය කරන මම, එක්සත් ජාතික පක්ෂයේ බලය වෙන වන විට එහෙම වුණා නම්, ඒකත් වැරදියි කියන මතයේ ඉන්නේ. ඒකයි මෙතුමාට මම මේ කර්තව්‍ය පිළිබඳව ගරු කරන්නේ. මෙය ආරම්භයක් හැටියට මෙතුමාගේ ඒ යෝජනාවට මම ගරු කරනවා. ආගමික පූජකවරුන්ද, විද්වතුන්ද කියන එකට වඩා මම විශ්වාස කරන්නේ, මේක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටත් - අපේ ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරන ගරු මන්ත්‍රීතුමා කිව්ව ආකාරයට එක්සත් ජාතික පක්ෂයටත් විශේෂයෙන්ම ආණ්ඩු පක්ෂයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටත් තමයි මේක කරන්න පුළුවන් වන්නේ. අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගරු සභාපතිවරුන්ට, නගරාධිපතිවරුන්ට වෙලා තියෙන තත්ත්වය කුමක්ද? අද ප්‍රාදේශීය සභාවක සභාපතිවරයෙක් තවත් ප්‍රාදේශීය සභාවක සභාපතිවරයෙකුට මුදල් අල්ලස් දෙනවා. මෙවැනි තත්ත්වයක් අපි අහලා තියෙනවාද? අද ස්ත්‍රී දූෂණය කරලා පාටි දානවා. මෙවැනි තත්ත්වයක් අද උදා වෙලා තියෙන්නේ. අද අහලා බලන්න ඕනෑ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඒ ඒ කාරක සභාවන්, ඒ ඒ ප්‍රධානීන් මේ ගැන මොනවාද කරලා තියෙන්නේ? දැන් ප්‍රාදේශීය සභාවක ප්‍රධානියෙක් අල්ලස් චෝදනාවකට ලක් වෙලා තියෙනවා නම්, ඒ එක්සත් ජාතික පක්ෂයේවත්, ජනතා විමුක්ති පෙරමුණේ අයවත් ගිහිල්ලා අල්ලස් අරගෙන නොවෙයි නේ? අල්ලස් කොමිෂමේ නිලධාරීන් ගිහිල්ලා ඒක අල්ලා ගෙන තියෙන්නේ. නැත්නම් වෙන කවුරුවත් නොවෙයි. අල්ලස් කොමිෂමේ නිලධාරීන් එහෙම අල්ලලා තියෙන කොට ඊළඟ මාසේදී ඊළඟ සතියේදී නැවත රිමාන්ඩ් එකෙන් ඇවිල්ලා ඒ ප්‍රාදේශීය සභාවේ සභාපති පුටුවේමයි වාඩි වෙන්නේ. ඉතින් මොකක්ද වෙලා තියෙන මේ තත්ත්වය? මම සම්පූර්ණයෙන් එකඟ වෙනවා ඔබතුමාට. මේ අධිකරණ ක්‍රියාවලියකට ගිහිල්ලා ඉතා ඉක්මණින් ඒ කටයුත්ත, හරි වැරැද්ද තේරුම් ගන්න ලබා දෙන්න ඕනෑ. නමුත් ඒ කාලසීමාව තුළ අඩු ගණනේ ඒ තනතුරුවලින් තාවකාලිකව ඉවත් කරන්න අවශ්‍යයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ විතරක් නොවෙයි, මෙතැන තියෙන ප්‍රධානම ප්‍රශ්නය අපි මේ පොඩි තැනක ඉඳන් බලනවා නොවෙයි. මේකට තියෙන ප්‍රධානම ප්‍රශ්නය මොකක්ද? ස්වාධීන අධිකරණයක් තියෙනවාද නැද්ද කියන එකයි. ඔබතුමා කියනවා මේ අධිකරණ ක්‍රියාවලිය ඉක්මණින්ම ඉවර කරන්න ඕනෑ කියලා. නමුත් මට සැකයක් තියෙනවා. අපි විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුන් හැටියට අපට ඔය වාගේ චෝදනාවක් අවොතින් ඉක්මණින්ම හිරේ දාවි. අපව ඉක්මණින්ම හිරේ දමාවී. මේකයි වෙලා තියෙන තත්ත්වය. අද ස්වාධීන අධිකරණයක් තියෙනවාද? අපව එල්.ටී.ටී.ඊ කියලා ලේබල් කරලා. දැන් මේ මම කවදාක්වත් කථා කරපු නැති දෙයක්. ජිනීවා ගිහිල්ලා එල්.ටී.ටී.ඊ එකත් එක්ක සාකච්ඡා කළා කියලා අපේ ස්වාධීන රූපවාහිනිය කියනවා. නමුත් මම ස්විට්සර්ලන්තයට ගිහිල්ලත් නැහැ. ඒක වෙන කථාවක්. ඒක මම පෞද්ගලිකව දන්නවා. නමුත් අද වෙලා තියෙන තත්ත්වය. ඔබතුමා මාධ්‍ය ආයතනවලට චෝදනා කරනවා. ඉස්සෙල්ලා රජයේ මාධ්‍ය ආයතන ගැන කථා කරන්න. රජයේ මාධ්‍ය ආයතන මොනවාද කරන්නේ? ස්වාධීන රූපවාහිනිය, රජයේ සෑම මාධ්‍ය ආයතනයක්ම. ලේක් හවුස් එක.

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

අපි බෙදුවේ නැහැ. මාධ්‍ය කිව්වාම පොදුවේ කථා කළේ.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

අයියෝ ගරු මන්ත්‍රීතුමිය මම මේ කථා කරන්නේ ඇත්ත කාරණාවක්. මේක තේරුම් ගන්න පුළුවන් අයත් ඉන්නවා. බැරි අයත් ඉන්නවා. බැරි අයට මට කරන්න දෙයක් නැහැ. නමුත් මෙතුමා කියනවා, මේ රාජ්‍ය ආයතන ගැන. අපේ මාධ්‍යවේදීන්ට ආචාර ධර්ම පද්ධතියක් දාන්න යනවා. මොකක්ද මේකේ තේරුම? මාධ්‍යවේදීන්ට ආචාර ධර්ම පද්ධතියක්ද ඕනෑ,

මන්ත්‍රීවරුන්ටද ආචාර ධර්ම පද්ධතියක් ඕනෑ.? එහෙම නැත්නම් මන්ත්‍රීවරුන්ගේ දූවලා පුතාලාට බිරින්දෑවරුන්ටද ආචාර ධර්ම පද්ධතියක් අවශ්‍ය වෙලා තියෙන්නේ. එක අතකින් මේ මාධ්‍යවේදීන්ව අපි අගය කරන්න ඕනෑ. විශේෂයෙන්ම අඩු ගණනේ මෙහෙම හරි අපව දැනුවත් කරන නිසා තමයි මෙවැනි දෙයක් සිදුවෙනවා කියන එක අපට දැනගන්න පුළුවන් වෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඉතා කෙටියෙන් තමුන්නාන්සේට කියන්නේ, රජය නියෝජනය කරන ගරු මන්ත්‍රීවරයෙක් හැටියට මම ඉතාමත් ගරු කරනවා මෙතුමා ආරම්භ කරපු මේ කතිකාවත ගැන. මේ කතිකාවතේදී මූලික වශයෙන් වගකීමක් තියෙන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබ තමුන්නාන්සේලාට. ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුන් හැටියට. මේ ගැන වැඩි වැඩියෙන් කථා කරන්න. මේ ගැන වැඩි වැඩියෙන් කථා කරලා ඔබේ පක්ෂයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මේ රට පාලනය කරන පක්ෂය හැටියට තමුන්නාන්සේලා මේ ගැන වැඩි අවධානයක් යොමු කරන්න. මෙය වැඩි අවධානයක් යොමු කරන්න අත්‍යවශ්‍ය කාරණාවක්. අද අපි දේශපාලනය කරනවා කියන්නත් ලැජ්ජයි. අද මම මේ පළාත් සභාවේ ඉන්න ලාබාලතම මන්ත්‍රී. සමහර වෙලාවට මට ලැජ්ජයි කියන්න මගේ මිතුරන් අතරේ මම දේශපාලනය කරනවා කියන එක.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මට කිව්වා නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා කියලා ලාබාලම.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

අපි ඒක බලා ගනිමු. මම ඒක හරියට දන්නේ නැහැ. මම දන්න තරමට ඒ කිව්වේ. නමුත් මම කියන්නේ අද දේශපාලනයට එන්නේ නැති හේතුව. අද සමාජයේ තියෙන පිළිගැනීම. ඒ පක්ෂවලට වගකීමක් තියෙනවා වාගේම, මේ සමාජයටත් වගකීමක් තියෙනවා. මේ සමාජයට වගකීමක් තියෙන්නේ මොකද? මෙතුමා කිව්වා හරියට හරි. අද බලන්න කොළඹ දිස්ත්‍රික්කයේ ගම්පහ දිස්ත්‍රික්කයේ වැඩියෙන්ම ඡන්ද අරගෙන තියෙන්නේ කවුද කියන එක. ඉතින් මෙපමණ වැරදි කරලා ජනතාව ළඟට ගියාම ජනතාව හොඳින් පිළිගන්නවා. අද ජනතාව වැඩිම මනාපයෙන් පත් කරන්නේ ඒ අය. ඉතින් මම දකින ආකාරයෙන් පක්ෂයට වගකීමක් තියෙනවා. විශේෂයෙන්ම මම විශ්වාස කරන හැටියට අපේ පළාත් සභා මන්ත්‍රීවරයෙක් ගුරුවරියක් දණ ගැස්වුවා. අඩු ගණනේ සම්මුඛ පරීක්ෂණයකටවත් ඒ අයව සම්බන්ධ කර ගන්න අවශ්‍යතාවයක් නැහැ. දැන් බලන්න කෝ? සම්මුඛ පරීක්ෂණයකට දානවා කියන්නේ යම් සුදුසුකමක් තියෙනවා කියන එක නේ? Application දාන්න පුළුවන්. ඕනෑ කෙනෙකුට Application දාන්න පුළුවන්. ඒක වෙන කථාවක්. නමුත් Application එකක් දැම්මාම සම්මුඛ පරීක්ෂණයකට එන්න කියන්නේ ඒ අවස්ථාව ලබා දෙන්න. මේ කිසිම සම්මුඛ පරීක්ෂණයකටවත් අවශ්‍ය නැහැ. මේ අයට ආණ්ඩු පක්ෂයෙන් ආරක්ෂාව තියෙනවා. අන්න ඒකයි ඇත්ත.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමනි, වෙලාව පිළිබඳව සැලකිලිමත් වෙන්න.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

මම ඉතා කෙටියෙන් තමුන්නාන්සේලාට කියන්නේ, මේ ආරම්භ කරපු දේ නතර කරන්න එපා. මට සැකයක් තියෙනවා. ඔතැන ඉඳන් මෙතුමාට ඔය කර්තව්‍යය කරන්න පුළුවන්ද බැරිද කියන එක පිළිබඳව. නමුත් මෙතුමා මේ ආරම්භ කරපු දේ ඉතා වැදගත් කර්තව්‍යයක්. මෙතුමාට මම ශක්තිය ප්‍රාර්ථනා කරනවා. තමුන්නාන්සේ ඉදිරියට ඇවිල්ලා තම ශක්තිය තුළින් මෙවැනි කටයුතු ඉදිරියට කරගන්න පුළුවන් වේවා කියා ප්‍රාර්ථනා කරමින් මම නතර වෙනවා. ස්තුතියි.

[ අ.භා. 02.24 ]

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ දීර්ඝ කාලයක් හිටපු මන්ත්‍රීවරයෙකු හැටියට කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා පක්ෂ දේශපාලනයෙන් ඈත් වෙලා, මේ රටේ ජනතාවට ඇති වෙලා තියෙන අසාධාරණය පිළිබඳව හිතලා දේශපාලඥයින් තෝරා ගැනීමේ වැඩ පිළිවෙළක යෝජනාවක් බස්නාහිර පළාත් සභාවට ඉදිරිපත් කිරීම ගැන මම අද ඉතාමත් සතුටු වෙනවා. ඔබතුමාගේ යෝජනාව දිහා බැලුවාම මම පොඩි සංශෝධනයක් ඉදිරිපත් කරන්න කැමතියි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මෙතුමා දාලා තියෙන්නේ, *"ප්‍රාදේශීය දේශපාලනයේ සිට ජාතික දේශපාලනය"* කියලා. මම සංශෝධනයක් ඉදිරිපත් කරනවා, *"ජාතික දේශපාලනයේ සිට ප්‍රාදේශීය දේශපාලනය දක්වා"* කියලා. මම ඒ සංශෝධනය තුළින් අද රටේ තියෙන දේශපාලන වාතාවරණය පිළිබඳව ඡන්දදායකයා සහ ජාත්‍යන්තරය කළකිරිලා තිබීම පිළිබඳව පොඩි අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්න කැමතියි. අද රටේ තියෙන දේශපාලනයේ විධායක ජනාධිපතිකම හඳුන්වලා දුන්නේ, එක්සත් ජාතික පක්ෂය. ඒ විධායක ජනාධිපති ක්‍රමය යටතේ තියෙන සියලුම පල්ලෙහා පළාත් පාලන ආයතන දක්වා මහජන නියෝජිතයින් නියෝජනය කරන ආකාරයත්, ජනතාවගේ මුදල් රජය සතු කරගෙන කරන වියහියදම් පිළිබඳවත් අද අපේ රටේ දේශපාලඥයින්ට ගැලවීමක් නැහැ, පාලක පක්ෂයේ. මම එහෙම කියන්න මූලික හේතුව වුණේ, මේ රටේ ජනතාවගේ බදු සල්ලි එකතු කරලා යවන මහා භාණ්ඩාගාරයේ ලේකම්තුමා ජයසුන්දර මැතිතුමා, අධිකරණ නියෝගයකින් වැරදිකරු වෙලා එතුමාව

[ ගරු කිත්සිරි කහටපිටිය ]

ඉවත් කළා. ඊට පසුව විධායක බලතලත් එක්ක ඔහුට සමාව දීලා ආපහු එතුමාව පත් කරනවා ජනතාවගේ මුදල් සම්භාරය භාර ලේකම්තුමා හැටියට. ඊට පස්සේ අනෙක් පැත්තෙන් අරගෙන බැලුවාම මේ රටේ ග්‍රාම සේවා නිලධාරි මහත්මයෙක්ව මෙන්ම රාජ්‍ය සේවයේ ඉන්න විශාල ප්‍රමාණයක් දණ ගස්සවලා, ගස් බන්දවලා පසුව ඔවුන්ම කියනවා මම ම ගස් බැඳ ගත්තයි කියලා. එතකොට මේ තත්ත්වය දිහා අරගෙන බැලුවාමත් ජාතික දේශපාලනයෙන් ඒ පැත්තට යනවා. පළාත් දේශපාලනය දිහා අරගෙන බැලුවාම අද පළාත් සභාවල්වල දේශපාලඥයින් කරන දේවල් දිහා බැලුවාම අපට මේ 13 වන සංශෝධනයෙන් ලබා දීපු පළාත් සභාවේ මන්ත්‍රීවරු තුන්සියයක් හාරසියයක් ඉඳගෙන කරන එක සුදු අලියෙක් කියලා තමයි ඉස්සෙල්ලා කිව්වේ. අද නිකම්ම නිකම් නපුංසකයෙක් හැටියට තමයි පළාත් සභාව හඳුන්වලා තියෙන්නේ. මොකද, පසුගිය දවස්වල පළාත් සභා මන්ත්‍රීවරයෙක් ගුරුවරයෙක්ව දණ ගැස්සුවා. (බාධා කිරීම්)

අනෙක් පැත්තෙන් අරගෙන බැලුවාම පළාත් සභාවල මහ ඇමතිවරු විදේශ සංචාර ගිහිල්ලා එන කොට අහස් යාත්‍රාවේ ඉන්න සේවිකාවන්ට නොයෙකුත් චෝදනා දාලා බැන්නයි කියලා චෝදනා ලබනවා. ඊළඟට නගර සභා ප්‍රාදේශීය සභා සියල්ලක්ම අරගෙන බැලුවාම රාජ්‍ය ආයතනයත් එක්ක අපේ රටේ දේශපාලනයේ වැරදි අඩුපාඩු විශාල ප්‍රමාණයක් තියෙනවා. මේ දේශපාලඥයින්ව පත් කර ගන්නේ ජනතාව. ජනතාව පත් කරලා එවනවා හොඳ නියෝජිතයෝ. අද අපි සතුටු වෙනවා. කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා අපේ පළාත් සභාවේ මන්ත්‍රීවරුන් 104 දෙනා අතර ඉතාමත් දක්ෂ මන්ත්‍රීවරයෙක්. එතුමා පක්ෂයක් නියෝජනය කරමින් හිටියත් එතුමා ජනතාවට ඇතිවෙලා තියෙන අසාධාරණය, දේශපාලනයට එන පුද්ගලයින්ගේ නරක අයගේ තියෙන එල විපාක තමයි මේ යෝජනාවෙන් පෙන්වන්නේ. එහෙම නම් අද අපේ රටේ මේ දේශපාලන ක්‍රමවේදය අරගෙන බැලුවාම එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන නියෝජිතයෝ හැටියට අපි සතුටු වෙනවා. රටේ නිදහස ගත්තාට පස්සේ දශක තුනක් විතර මහත්මා දේශපාලනය ශ්‍රී ලංකාවේ තිබුණා. මහත්මා රාජ්‍ය පරිපාලන සේවාව ශ්‍රී ලංකාවේ තිබුණා. නීතිය තිබුණා. පොලිස් දෙපාර්තමේන්තුව තිබුණා. අපේ අර මන්ත්‍රීතුමා දන්නවා ඇති. ඊට පස්සේ දවසින් දවස එන්න එන්න ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අපි ඇති කරපු සංශෝධනත් එක්ක අඩුපාඩු රාශියක් ඇති වැරදි පුද්ගලයන් දේශපාලනයට එන ක්‍රමවේදයක් ඇති වුණා. ඒ තමයි මනාප ක්‍රමය සහ දිස්ත්‍රික් මට්ටමේ දේශපාලනය. අපි එක්සත් ජාතික පක්ෂයෙන් ගෙනාවා වුණත් අපි ඒ වැරැද්ද නිවැරදි කර ගන්න අපේ එක්සත් ජාතික පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමා අලුත් ව්‍යවස්ථාවක් ඉදිරිපත් කරලා තියෙනවා. කතිකාවක් හැටියට ජනතාවට මේකේ හොඳ නරක බලා ගන්න. විධායක ජනාධිපතිකම අහෝසි කරන්න. මනාප ඡන්ද ක්‍රමය නැති කරන්න. පක්ෂ මාරු කරන දේශපාලඥයින්ගේ පක්ෂය මාරු කළාම ඒ මන්ත්‍රීකම අහෝසි වෙන්න කියලා. එහෙම නම් ඉතාමත් හොඳ වැඩ පිළිවෙළක් ගෙනැත් තියෙන යුගයක අපි ඔබතුමා මාර්ගයෙන් අතිගරු ජනාධිපතිතුමාට මතක් කරන්න කැමතියි. එතුමා හොබ වන්නේ, විධායක ජනාධිපතිකම. ප්‍රධාන පක්ෂ දෙකේ නායකයෙක් එතුමා. අනෙක් පැත්තෙන් ප්‍රධාන පක්ෂයක් හැටියට එක්සත් ජාතික පක්ෂයේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා හොබවනවා විපක්ෂ නායකකම. එහෙම නම් මේ පොඩි පොඩි පක්ෂත් එක්ක එකතු වෙලා එක්සත් ජාතික පක්ෂයේ හිටපු, චෝදනා තියෙන, වැරදි තියෙන, නඩු තියෙන, අයථා විධියට මුදල් උපයා ගත්ත සියලු දෙනාටම අද මොකක්ද කරලා තියෙන්නේ? තනතුරු දෙන්න ඒ පැත්තට අරගෙන තියෙනවා. සල්ලි දෙන්න ඒ පැත්තට අරගෙන තියෙනවා. වාහන දෙන්න ඒ පැත්තට අරගෙන තියෙනවා. නොයෙකුත් වරප්‍රසාද මැද මේ ජනතාව අතරින් පත් කරගත්ත අය වැරදියි කියලා එක්සත් ජාතික පක්ෂයෙන් තෝරා ගත්ත කෙනාව ඒ අයව ආරක්ෂා කරනවා. මේ මුදල් හදල් තනතුරු දීලා ඒ අය ඒ පැත්තට භාර ගන්නවා.

එහෙම නම් අපි මේ සභාවේ විවාදයේදී අතිගරු ජනාධිපතිතුමාට මතක් කරන්න ඕනෑ. එතුමා මේ රටේ යුද්ධය අවසන් කරන්න වැඩ කටයුතු කළා වාගේම මේ රටේ ප්‍රෝඩාව, වංචාව, කපටිකම තියෙන දේශපාලඥයින්ව විශේෂයෙන් අහිංසක ජනතාවගේ ඡන්දයෙන් ආපු ජනතා නියෝජිතයින් බලය ලබා ගත්තාට පස්සේ ජනතාවට පයින් ගහනවා. ඒ අයගේ පවුල් වාදය ආරක්ෂා කරනවා. එහෙම නම් ජනතාව ආරක්ෂා කර ගන්න, ජනතාව වෙනුවෙන් ඒ බදු මුදල් ටික රටේ පාලනය සඳහා යොදවා ගන්න කටයුතු කරන්න ඕනෑ. අර කියමනක් තියෙනවා, අහසෙන් වැටෙන එක දිය බිඳුවක්වත් නාස්තියට යොදවා ගන්න එපා කියලා. ඒ වාගේම අපි කියනවා, ජනතාවගෙන් උපයා ගන්න බදුවලින් ජනතාවට සහන දෙන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන දේශපාලන සංස්කෘතියක් අද මේ රටට අවශ්‍යයි කියන එක ජනතාවත් අපත් මතක් කරලා දෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම අර සංශෝධනය ගෙනාවේ මේ සභාවේම තියෙන අසාධාරණය පෙන්වන්න. මම කිව්වා, ඉහළින් එන ජාතික දේශපාලනයයි, ඉහළ මට්ටමයි පිළිබඳව මේ සභාවේ අද තියෙන තත්ත්වය. මේ මූලසුන හොබවන අපේ නියෝජ්‍ය සභාපතිතුමයි, සභාපතිතුමයි අතර වාහනවල අර්බුදයක් තියෙනවා. එහෙමනම් ඉහළ ඉන්න අය පහළ ඉන්න අයට ඒ සහන සලසලා ඒ වැඩ කටයුතු ක්‍රියාත්මක කරලා ඒ සේවාව මෙතුමන්ලාට ලබා දෙන්න ඕනෑ. මහජනතාවගේ මුදල්වලින් ගත්ත භාණ්ඩ හැටියට ඒවා ලබා දීමේදී ඒ ඒ තනතුරුවලට සාධාරණ ලෙස ඒවා ලබා දිය යුතුයි. ඒ නිසා මේ අසාධාරණය අපි පෙන්වන්න කැමතියි. එහෙනම් මම මීට වඩා දීර්ඝව කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. අපේ ගරු නියෝජ්‍ය සභාපතිතුමා කියනවා කාලය අවසන් කියලා. එහෙම නම් අපි කියන්න කැමතියි. පළාත් සභා මැතිවරණ අද වයඹ සහ මධ්‍යම පළාතේ තියෙනවා. පළාත් සභා

මැතිවරණ අනෙක් පැත්තේ උතුරු පළාත් සභා මැතිවරණය, අපේ පළාත් සභා ස්ථාපිත කරලා අවුරුදු ගණනාවකට පස්සේ තියන්න යනවා. අද නාම යෝජනා ඉල්ලලා එක්සත් ජාතික පක්ෂයට කුඩු කාරයින්ගේ Application ඇවිල්ලා තියෙනවා. චණ්ඩින්ගේ Application ඇවිල්ලා තියෙනවා. එල්.ටී.ටී.ඊ. එක නියෝජනය කරපු නියෝජිතයින් නිදහස් වෙලා ඔවුන්ගෙන් Application ඇවිල්ලා තියෙනවා. නමුත් එක්සත් ජාතික පක්ෂය, ඒ නායකත්වයෙන් පත් කරලා තියෙන දේශපාලන කමිටුව ඉතාමත් නිවැරදි තීරණ අරගෙන කුඩුකාර ලැයිස්තුව ඉවත් කර ගෙන යනවා. චන්ඩිකාර ලැයිස්තුව ඉවත් කර ගෙන යනවා. අයථා අන්දමින් රාජ්‍ය නීතිවිරෝධී වැඩ පිළවෙළවල් ක්‍රියාත්මක කරපු අය ඉවත් කර ගෙන යනවා. අද අපේ හිටපු වරාවැව මහත්මයා නීති අංශයේ - මෙතුමා දන්නවා ඇති. වරාවැව මහත්මයා අද එක්සත් ජාතික පක්ෂයෙන් මධ්‍යම පළාත් සභාවට යවනවා. නීතිය පිළිබඳ විශාරදයෙක් හැටියට. ඒ වාගේම නොයෙකුත් පළාත් සභාවල්වල තියෙන අඩුපාඩුකම් දැන හඳුනාගෙන නීතිය කියා දීම සඳහා එතුමාව අපි ජනතා නියෝජිතයෙකු හැටියට ජනතාවට දෙනවා පත් කර එවන්නය කියලා. අපි බලමු. කුඩු කාරයෝද, එහෙම නැත්නම් අර වාගේ විද්වත් මිනිසුන් මේ සමාජයට ගේන්න ජනතාව කටයුතු කරයිද කියලා.

අනෙක් එක ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම අද මතක් කරන්න කැමතියි. අපේ ඉහළ දේශපාලනයේ තියෙන වැරදි. අද අරගෙන බලන්න ජනතා නියෝජිතයින් හැටියට එවන නියෝජිතයින්ව විධායක ජනාධිපතිකම තියෙන කොට කවුද අගමැති කරන්නේ. අගමැති කරන පුද්ගලයා බුද්ධිය හසුරුවාගන්න බැරි, ඇවිදගෙන යන්න බැරි, යම්කිසි දෙයක් නිර්මාණය කරන්න බැරි, රටේ දෙවැනි පුරවැසියා හැටියට රටට ජනතාවට වැඩක් කරන්න බැරි උදවිය අද අපේ දේශපාලනයේ පල්ලෙහා තනතුරුවලට දානවා. එය වහාම නතර විය යුතුයි කියන මතයත් අපි ඉදිරිපත් කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි. මේ යෝජනාව ගෙන එම පිළිබඳව අපේ කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමාටත් මාගේ පෞද්ගලික ස්තුතියත් මම මේ අවස්ථාවේදී පුද කරනවා.

[ අ.භා. 02.34 ]

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළමුව මම ඉතාමත් ගෞරවයෙන් මගේ හදවත තුළ ගෙතුනු මල්දම මාගේ ආදරණීය මිත්‍රයා කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමාට පුද කරන්න කැමතියි. මම එහෙම කියන්නේ, අපි මේ පළාත් සභාවේ පමණක් නොවෙයි, පළාත් පාලනයේ සභාපතිවරයෙක් හැටියට වසර දෙකක් කටයුතු කරලා, ඉන් අනතුරුව පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට අවුරුදු විස්සක් මේ බස්නාහිර පළාතේ කටයුතු කරපු කෙනෙක් හැටියට හදවත තුළ අපටත් යම්කිසි වේදනාවක් දැනෙන නිසා, මහජන නියෝජිතයෙක් හැටියට ගරුත්වයක් ඇතිව මගතොටට හැසිරෙන්න තියෙන අපහසුතාවය දැනෙන නිසා හදවතේ තියෙන වේදනාව ප්‍රකාශ කරන්න ලැබුණු අවස්ථාවක් හැටියට මම මේක සලකනවා. හැබැයි, මම කනගාටු වෙනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මේ පළාත් සභා ජීවිතයේ මන්ත්‍රීවරයෙක් හැටියට ලැබුණු අර මත් බලපත්‍ර ටික, බලපත්‍රලාභීන්ගේ ලැයිස්තුවෙන් නිදහස් වුණු ලේඛනයක් අපේ කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා කිව්වා. නමුත්, මාගේ නම ඒකට ඇතුළත් නොවීම ගැන අතිශයින් කනගාටු වෙනවා. ඒ ඉතිහාසය පුරා අද වනතුරු මහජනයාගේ නියෝජිතත්වය, මහජනයාගේ අපේක්ෂාවන් භංග නොකර, ඒ කාරණාව වෙනුවෙන් කැප වෙන්න පුළුවන් චරිත, අප හඳුනාගත් චරිත ආණ්ඩු පක්ෂයේ වාගේම විපක්ෂයේත් තිබුණා. මම කියන්නේ නැහැ, ආණ්ඩු පක්ෂයේ විතරයි මේ ක්‍රියාවට සුදුස්සන් හිටියේ කියලා. ඒ වාගේම අපි ඉතිහාසය ගැන කථා කළාම එක එක කාලවකවානුවල ලංකාවේ ජීවත්වන පුරවැසියන්ට විවිධ දේශපාලන ක්‍රියාවලියන් තුළ විවිධ අපහසුකම් දැනුණා. ලංකා ඉතිහාසයේ පෘතුගීසි, ලන්දේසි, සොළීන්ගේ ආක්‍රමණ නිසා අපේ මිනිස්සුන්ගේ සංස්කෘතිය විනාශ වුණා. ඒ මිනිස්සුන්ගේ දේපළ විනාශ වුණා. ඒ මිනිස්සුන්ගේ අයිතිවාසිකම් නැති වුණා. ඒ මිනිස්සුන්ට ශාරීරික පීඩාවන්ට ලක් වෙන්න සිද්ධ වුණා. මේ ඉතිහාසය තුළ. 1948 නිදහසෙන් පස්සේ ඇති වුණු දේශපාලන ප්‍රවාහය තුළ විවිධ විවිධ වෙනස්කම් ප්‍රශ්න ඇති වුණා. 1972 වෙන කොට අපි ජනරජ ව්‍යවස්ථාවක් සකස් කර ගෙන අපි නිදහස් ශ්‍රී ලංකාවේ පුරවැසියන් බවට පත් වුණා. නමුත් ඒ එක්කම 1978 ඇති වුණු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් එක්ක නිර්මාණය වුණු නව දේශපාලන සංස්කෘතිය තුළ දැඩි පීඩාවට පත් වුණු ප්‍රජාවක් හැටියට තමයි අද අපි මේ විනාශය පිළිබඳ කථා කරන්නේ. මේක ආණ්ඩු පක්ෂයද, විපක්ෂයද, යූ.එන්.පී.ද, ජේ.වී.පී. ද ශ්‍රී ලංකා ද , කොමියුනිස්ට් ද, සමසමාජ ද කියන ප්‍රශ්න නොවෙයි අපට තියෙන්නේ. අද අපට මොකද මේ වෙලා තියෙන්නේ කියන කාරණාව පිළිබඳව කථා කරන්නයි. මෙහිදී දේශපාලන වශයෙන් පැහැදිලිව යෝජනාව ඉදිරිපත් කළේ, කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා. දේශපාලන මතයක් හැටියට මතයක් ඉදිරිපත් කළේ, මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා. ඒවා දේශපාලන කථා. ඊට එහාට ගියාම මම හුභාක් වෙලාවට දැක්කේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ විචාරවත් දේශපාලන කතන්දරයට පරිබාහිරව ආණ්ඩුව විවේචනය කරමින් දේශපාලන වාසි ලබන්න දරන උත්සාහයන් පිළිබඳවයි. මා අතිශයින්ම කනගාටු වෙනවා. මේක නොවෙයි අපට කථා කරන්න තියෙන කාරණාව, මාතෘකාව. මේ කථා කරන කීර්ති උඩවත්ත කියන තරුණ දේශපාලඥයාගේ හදවත තුළ තිබෙන වේදනාව මේ සභාව තුළ ප්‍රකාශ වෙනවා නම්, ඒ ප්‍රකාශ වීමේ අර්ථය කුමක්ද කියන එක විග්‍රහ කර ගැනීමයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

වැරදි ආරෝපණයක් ගරු ඇමතිතුමා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

වියපත්.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

මට එහෙම දර්ශනය වෙන්නේ නැහැ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාටත් තවම තරුණ බව තියෙනවා. මට පේනවා.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ඒ නිසා දැන් අපි මේ ඉතිහාසය පිළිබඳව නිවැරදිව කථා කළා නම් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ හර්ෂණ රාජකරුණා ගරු මන්ත්‍රීතුමා, රනිල් වික්‍රමසිංහ ගරු විපක්ෂ නායකතුමාගේ දේශපාලන බඩපිස්සා. එතුමා පැහැදිලිව කිව්වා - බඩපිස්සා. හරිද? එතුමා පැහැදිලිව කිව්වා, මේ දේශපාලන බේදවාචකය පිළිබඳ විග්‍රහයන්. ඒ කියන කොට එතුමා පුංචි දරුවෙක් වෙන්න ඇති. සමහර විට ජීවතුන් අතර හිටියාද දන්නේ නැහැ මේ කියන විධියට. 1977 වකවානුවේ අපි පුංචි කාලේ අපේ සීයා, ආච්චි අපට කියලා දුන්නේ, ඇලඩින්ගේ පුදුම පහන ගැන. අපි බොහොම ආශාවෙන් ඇලඩින්ගේ පුදුම පහන ගැන අහගෙන හිටියා. අපි අපේ පොඩි එවුන්ට කියලා දුන්නේ, පොල්ගහවෙල ඩැනියෙල්ගේ රත්තරන් පොලු ගැන.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

හේවාහැට

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ඔව්. හේවාහැට.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මහගම කානායම ගැන.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ඒ වාගේ කාලවකවානුවල, එක එක වකවානුවල විවිධ විවිධ දේ වෙනවා. සමහර වකවානුවල සමහර කට්ටිය දන්නේ නැහැ - රාජකරුණා ගරු මන්ත්‍රීතුමා දැනුයි සභා ගර්භයට ආවේ. කලින් හිටියා නම් බොහොම හොඳයි.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

බඩ පිස්සා. බඩ පිස්සා.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ ඉතිහාසය පුරා ඒ විධියට රත්තරන් පොලු කතන්දර, විවිධ දූෂණ, වංචා පිළිබඳ කතන්දර ඒ ඉතිහාසයේ ලියැවිලා තිබෙනවා. මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍රයන් වැනි විද්වතුන්ට පහර දීලා දරුණු වධ හිංසාවලට පත් කරපු ඉතිහාසය, ඒ ඉතිහාසයේ ලියැවිලා තියෙනවා. ඒ වාගේම ඒ ඉතිහාසයේ ලියලා තියෙනවා, විනිශ්චකාරවරුන්ට ගල් මුල් ප්‍රහාර එල්ල කරපු ඉතිහාසයක්. මේ සියල්ල මේ ඉතිහාස කතන්දරේ දිගටම තියෙනවා. මේක අලුතෙන් නිර්මාණය වුණේ නැහැ. මම මේ කාටවත් චෝදනා කරනවා නොවෙයි. මම කියන්නේ අපි කළත්, කවුරු කළත් වැරදියි කියන එකයි. තමන්ට අකමැති නඩු තීන්දු දුන්නාම විනිශ්චයකාරවරුන්ට අමු අමුවේ -

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

තව නම් තියෙනවා, දෙනවා නම්.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

දැන් ලන්දේසි, පෘතුගීසි, සොළීන්ගෙන් පීඩාවට පත් වුණු ජනතාවට, එක්දහස් නවසිය අසූව දශකයේ නැවත දැඩි ලෙස පීඩාවට පත් වෙන්න සිද්ධ වෙනවා. ඇයි? තමන්ගේ දේපළ මංකොල්ල කනවා. බැංකු කඩනවා. මහ විශාල විනාශයක් මේ ශ්‍රී ලංකාව තුළ එවැන්නක් නැවතත් නිර්මාණය වෙනවා. ඒ නායක -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඇයි ජනතා විමුක්ති පෙරමුණේ -

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

නැහැ, නැහැ. 70 නාන්න ගිය අය මැරුණේ.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ඒ නායකයින්ගේ නිවෙස් පිටුපස වළවල්වල වළදාපු මේ රටේ අහිංසක මිනිස්සුන්ගේ රත්තරන් ආභරණ පවුම් දහස් ගණනක් පසුකාලෙක ගොඩ දානවා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

මරන්න ඕනෑ එවුන් මරන්න ඕනෑ. ගහන්න ඕනෑ එවුන්ට ගහන්න ඕනෑ.

**ගරු ජගත් අංගගේ - අමාත්‍යතුමා**
Hon. Jagath Angage - Minister

මේ ඉතිහාසය. මේක කාටවත් අවේණිකව චෝදනා කිරීම නොවෙයි. මෙන්න මේ අපිරිසිදු වුණු දේශපාලන ඉතිහාසය. මේ දේශපාලඥයින් ජනතාවාදී දේශපාලඥයින් කරන්න, ජනතාවට ආදරය කරන දේශපාලඥයින් කරන්න, වංචාවෙන්, දූෂණයෙන් පිරිහුණේ නැති දේශපාලඥයින් කරන්න, ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කරලා දෙන්න පුළුවන් මහජන නියෝජිතයින් මේ සමාජයට සමාජගත කරන්න කියන ඉල්ලීම තමයි මේ අහිංසක යෝජකයා විසින් යෝජනා කරන්නේ. මේක කිනම් පක්ෂයට අදාළ ප්‍රශ්නයක්ද? මේක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට අදාළ ප්‍රශ්නයක්ද? මේක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට අයිති ප්‍රශ්නයක්ද? මේක එක්සත් ජාතික පක්ෂයට අයිති ප්‍රශ්නයක්ද? මේක යූ.එන්.පී. එකට, කොමියුනිස්ට් පක්ෂයට, සමසමාජ පක්ෂයට, මහජන පක්ෂයට අයිති ප්‍රශ්නයක්ද? මේක සමස්ත ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය, ආරක්ෂාව ප්‍රාර්ථනා කරන, මේ රටේ නිදහස අපේක්ෂා කරන, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය තවදුරටත් අපේ දරුවන්ට උරුම වේවායි කියල ප්‍රාර්ථනා කරන, මේ රටේ සමස්ත පොදු ජනතාවගේ අපේක්ෂාව තමයි මේ කීර්ති උඩවත්ත කියන මන්ත්‍රීවරයා කථා කරන්නේ. අද ඒක වෙනත් දිශාවකට හරවලා, වෙනත් දේශපාලන පක්ෂවල ප්‍රශ්නවලට හරවලා, ආණ්ඩු පක්ෂය තව පොඩ්ඩක් විවේචනය කරලා බිම හෙලන්න පාවිච්චි කරනවා නම් මේකේ මුඛ්‍ය පරමාර්ථයට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශාල හානියක් සිද්ධ වෙනවා.

ස්වාධීන මාධ්‍ය ආයතනයක් විසින් යම් කෙනෙක් මේ රටේ දේශපාලන පක්ෂයක් හෝ වේවා, දේශපාලන පක්ෂයක් නියෝජනය කරන පුද්ගලයෙක් හෝ වේවා, යම් වැරැද්දක් කරනවා නම් ඒ වැරැද්ද නිවැරදි කිරීමට වෙර දැරීම ඉතාමත් සාධාරණ විධියට යම්කිසි නිවැරදි චරිතයකට වැරදි පහරක් එල්ල කරලා ඒ නිවැරදි දේශපාලන චරිතය මොන පක්ෂයේ වුණත් විනාශ කරන්න වෙර දරනවා නම් මාධ්‍ය විසින් කරන්නේ සාහසික අපරාධයක්. මොකද, ඒ මාධ්‍යයත් එක්ක සටන් කරන්න පුළුවන් කිසිම පෞද්ගලික පුද්ගලයෙක් මේ සභාව තුළ නැහැ. කිසිම දේශපාලන චරිතයකට මාධ්‍යයත් එක්ක පෞද්ගලිකව සටන් කරන්න බැහැ. මොකද හේතුව? මම දහස් වාරයක් කට ඇරලා රට වටේ දුව දුව කිව්වත් එක දවසකින්, එක ලිපියකින්, එක මාධ්‍යයකින්, විද්‍යුත් මාධ්‍යයකින් ප්‍රචාරය කරන ඒ දැන්වීම තුළ මුළු රටක් ඒ පණිවිඩය තමන්ගේ සවණට එහෙම නැත්නම් දෑසට ලං කර ගන්නවා. ඒ නිසා යම් දේශපාලන චරිතයක් ඝාතනය කිරීමට වෙර දරනවා නම්, යම් පුද්ගලයෙක් ඒක සියයට දහස් වාරයක් නිවැරදිව හරියට පැහැදිලි කර ගෙන, ඒක තමන්ට ඔප්පු කරන්න පුළුවන් නම් විතරයි ඒ ප්‍රහාරය එල්ල කළ යුත්තේ. එහෙම නැත්නම් එය අපරාධයක්. ඒ නිසා අද කීර්ති උඩවත්ත මගේ සහෝදර ගරු මන්ත්‍රීතුමා මේ කරපු ප්‍රකාශය, මේ කරපු යෝජනාවට -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමතිතුමා, අපි උත්සාහ කරමු වෙලාව පිළිබඳව සළකා බලන්න.

**ගරු ජගත් අංගගේ - අමාත්‍යතුමා**
Hon. Jagath Angage - Minister

සාධාරණ විධියට කෙලින්ම තමන්ගේ දේශපාලන මතය තුළ විරෝධතාවය ඉදිරිපත් කරලා කථා කළේ, මහේෂ් අල්මේදා හිටපු ගරු අමාත්‍යතුමා. එතුමා ප්‍රකාශ කළ අදහස් පිළිබඳව මගේ විරෝධතාවයක් නැහැ. දේශපාලන පක්ෂයක වැඩ කරන යම් පුද්ගලයෙක් පිළිබඳව, ඔහුට වෙන අනාගත වගකීම් පිළිබඳව ඒ දේශපාලන පක්ෂයට තීන්දු ගැනීමේ තියෙන අනන්‍යතාවයට බාධා කිරීමට යුක්ති සහගත සාධාරණ අයිතියක් රටේ තවත් කිසිම විද්වතෙකුට නැහැ. ඒක මම පිළිගන්නවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අපේ කළුතර ගැන කියන්නේ නැහැ නේ?

**ගරු ජගත් අංගගේ - අමාත්‍යතුමා**
Hon. Jagath Angage - Minister

ඒක මම අවංකවම පිළිගන්නවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. දේශපාලන පක්ෂයක් වෙනුවෙන් කළ කැපවීම් ඒ පක්ෂය ගොඩ නගන්න වෙර දරපු ඒ සියල්ල පිළිබඳව ඒ පක්ෂයේ යම් -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සභාපතිවරුත් -

**ගරු ජගත් අංගගේ - අමාත්‍යතුමා**
Hon. Jagath Angage - Minister

මණ්ඩලයකට තමයි ඒ පිළිබඳව තීන්දුවක් ගන්න පුළුවන්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඇමැතිතුමා අපේ කළුතර -

**ගරු ජගත් අංගගේ - අමාත්‍යතුමා**
Hon. Jagath Angage - Minister

ඒක රටේ වෙන කණ්ඩායමකට පැවැරීම කොපමණ කාලෝචිතද කියන කාරණය පිළිබඳව මා දන්නේ නැහැ. මේක ප්‍රජාතාන්ත්‍රවාදීයි. මේ රටේ ඕනෑ තරම් මිනිස්සුන්ට තමන්ගේ අදහස කියන්න පුළුවන්. ඒක පිළිගන්න එක නොපිළිගන්න එක වෙනත් කාරණාවක්. මේ මට ඕනෑ දේ මම කියනවා. ඒකට කාටවත් බාධා කිරීමේ සාධාරණ අයිතියක් නැහැ. නමුත් එක දෙයක් තියෙනවා. පැහැදිලිවම ජනතාව -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමතිතුමා, ඒ.එම්. යූසුෆ් ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට මොකක්ද යෝජනාවක් කරනවා.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

කළුතර දිස්ත්‍රික්කය -

**ගරු ජගත් අංගගේ - අමාත්‍යතුමා**
Hon. Jagath Angage - Minister

මම පුද්ගලයින්ට පහර ගහන්න නොවෙයි මේ අවස්ථාව ගන්නේ. මම පුද්ගලයින්ට පහර ගහන්න මේ අවස්ථාව ගත්තේ නැහැ. සමස්ත කාරණා පිළිබඳව කථා කරන්න මට මේ අවස්ථාව ඕනෑ. වැරදිකරුවන් යැයි චෝදනාවලට ලක් වෙලා ඉන්න, ස්ත්‍රී දූෂණයක්, ළමා අපචාරයක්, මංකොල්ලකෑමක්, කොමිස් ගැහිල්ලක් - අද මේ මැතිවරණ ක්‍රමය තුළ සමහරක් වෙලාවට අපේ මිනිස්සුන්ට මේ දේශපාලනය කරන අයට කොන්ත්‍රාත්කාරයා පිටිපස්සේ යන්න සිද්ධ වෙලා තියෙනවා, 5% දෙන්න කියලා. මේක ඇත්ත කථාව. (බාධා කිරීමක්) තමන්ගේ මන්ත්‍රීකමේ තියෙන ගරුත්වය පල්ලෙහාට දාලා මට මේක දීපන් කියා ගෙන පස්සෙන් යන්න වෙලා තියෙනවා. මේක ඇත්ත කථාව.

නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටේ ජීවත් වන ඡන්දදායකයා හැටියටත් අපි කාටත් මහ විශාල වගකීමක් තියෙනවා. මේ රටේ මේ කථා වෙන කථාබහට ළමා අපචාරයක් කරපු, ස්ත්‍රී දූෂණයක් කරපු මංකොල්ල කාපු, කොමිස් ගහපු, වැරදි වැඩක් කරපු කෙනාට නැවත කතිරයක් ගහන කොට ජනතාව කල්පනා කරන්න ඕනෑ. ස්ත්‍රී දූෂණයක් කරපු එකාට කතිරයක් ගහනවා නම්, මේ කතිරේ ගහන්නේ හෙට මගේ දුවව දූෂණය කරපන් කියලා. ඒ තාත්තා හරි, ඒ අම්මා හරි ඒ දූෂිතයාට ඡන්දයක් දෙනවා නම්, ඒ ඡන්දෙ පාවිච්චි කරන්නේ, හෙට මගේ දුවව, නැත්නම් මිණිපිරියන්ව දූෂණය කරපන් කියලාද? එහෙම නැත්නම් මගේ රටේ මගේ අහිංසක දරුවාගේ දේපළ මංකොල්ල කාපන් කියලාද? ඔවුන්ගෙන් පගා ගහපන් කියලද? කොමිෂන් ගහපන් කියලාද ඒ කතිරෙ ගහන්නේ. එහෙනම් කතිරය ගැහීම පිළිබඳව ජනමාධ්‍ය මගින් ජනතාව දැනුවත් කිරීම ඉතාමත්ම වැදගත් කාරණයක් තමයි මේ යුගයේ. මම දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ. වේලාව ඉතාමත්ම ගෙවී ගොස් ඇති බවයි පෙනෙන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම විශේෂයෙන් නැවත නැවතත් කීර්ති උඩවත්ත ගරු සහෝදර මන්ත්‍රීතුමාට මගේ ගරුත්වය සහ මගේ සතුට ප්‍රකාශ කරමින් ශ්‍රී ලාංකීය අහිංසක ඡන්දය පාවිච්චි කරන ඡන්දදායකයාට යහපත් වූ අනාගතයක් උදා වේවා. ඔවුන්ට බුද්ධිය පහළ වේවා. ඒ බුද්ධිමත් භාවය තුළින් ශ්‍රී ලංකාවේ අනාගතය වාසනාවන්ත වේවා කියා ප්‍රාර්ථනය කරමින් මෙයින් නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මම හිතන්නේ, අපේ හුඟක් මන්ත්‍රීතුමන්ලාට අවස්ථාව මූලාසනය හැටියට ඉතාම සාධාරණය ලබා දීමට කටයුතු කළා. පිළිතුරු කථාව සඳහා උඩවත්ත ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි පහකට සීමා වෙන්න පුළුවන් නේද?

[ අ.භා. 02.46 ]

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පැය හතරකට ආසන්න කාලයක් මන්ත්‍රීවරුන් 13 දෙනෙක් දිවා භෝජනයද නොගෙන මේ සංවාදයට එක්වීම ගැන මට විශාල සතුටක් තිබෙනවා. ඒ වාගේම මේ යෝජනාවට පක්ෂව සහ ප්‍රතිපක්ෂව ඔවුන් දක්වපු අදහස් අපගේ ධෛර්ය තවතවත් වැඩි කළ බව සඳහන් කරන්න කැමතියි.

ඇත්තෙන්ම අපට යා යුතුව තිබෙන්නේ උඩුගම් බලා පිහිනීමකටයි. එය එතරම් සරළ නොවන බව මා දන්නවා. හැබැයි, මේ දේ අපි කොතැනින් හෝ කවදා හෝ පටන්ගත යුතුව තිබෙනවා. ඒ නිසා මේ ආරම්භයට පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව අපි සියලු දෙනාම එකතු විය යුතුයි කියන එකයි මා විශ්වාස කරන්නේ. විශේෂයෙන්ම මේ යෝජනාව සම්බන්ධයෙන් වෙනස් අදහස් දැක්වූයේ, අපේ මහේෂ් අල්මේදා මැතිතුමා සහ අපි බොහොම ආදරය කරන කවීකයෙකු වශයෙන් මේ සභාව තුළ විශේෂ කැපී පෙනෙන චරිතයක් වන අපේ නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා පමණයි. අනෙක් අය බොහෝ දුරට සාම්ප්‍රදායිකව මේ යෝජනාවට පක්ෂව කථා කරනු ලැබුවා.

විශේෂයෙන්ම මගේ මේ යෝජනාව ආරම්භ කරන කොට මම අධ්‍යාපනය සම්බන්ධයෙන් දැක් වූයේ ව්‍යතිරේඛයක් ලෙසයි. මා දන්නවා. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය, ඩී.එස්. සේනානායක මැතිතුමා වැනි මේ රටේ හිටපු ශ්‍රේෂ්ඨ රාජ්‍ය පාලකයින් ලබාගත් උපාධි සහතිකවලින් මේ රට පාලනය කරපු අය නොවෙයි. හැබැයි, අප එකක් මතක තබාගත යුතුයි. බලය ලබා ගැනීමේ සිද්ධාන්ත විද්‍යාත්මකව මේ ලෝකයට ඉදිරිපත් කරප ශ්‍රේෂ්ඨ මිනිසුන් මේ ලෝකයේ හිටියා. ඒවා අධ්‍යයනය කරමින් තමයි අද මේ වර්තමාන ලෝකයේ සියලු රාජ්‍ය නායකයන් බලය ලබා ගෙන තිබෙන්නේ. එයින් එක්කෙනෙක් තමයි කෞටිල්‍යය. ඔහු තමන්ගේ අර්ථ ශාස්ත්‍රය කියන ග්‍රන්ථයෙන් රට පාලනය කළ යුතු ආකාරය පිළිබඳව මීට ශතවර්ෂ ගණනකට පෙර රාජ්‍ය පාලකයන්ට උපදෙස් දී තිබුණා. ඒ වාගේ මධ්‍යකාලීන යුගයේදී මැකියාවෙලිගේ The Prince කියන පොතෙන් දේශපාලනඥයකුට බලය ලබාගත හැක්කේ කෙසේද කියා ඉතා මැනවින් පැහැදිලි කොට තිබෙනවා. ඉතින් ප්‍රශ්නය තිබෙන්නේ මේකයි. බලය ලබා ගැනීමේදී වැදගත් වන්නේ බලය මිසක් එය

ලබා ගන්නා ආකාරය නොවේය කියා එදා මැකියාවෙලි කියපු කාරණාව බලය ලබා ගැනීමට අදාළ වුවත්, එය කෙතරම් සදාචාරාත්මක ද කියන ප්‍රශ්නය බුද්ධිමත් මිනිසුන් හැටියට අපි නැවත සාකච්ඡා කළ යුතුව තිබෙනවා. ඉතින් මම මේ වෙලාවේ දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මම සාමාන්‍ය පුංචි මිනිහෙක් විධියට යම් අදහසක් ඔබට ඉදිරිපත් කළේ, දේශපාලණඥයෝ හැටියට මේ කුණු වෙන දේහපාලන දේහය තුළ පණුවන් විධියට ගඳ ගසා මේ කුණු වුණු ශරීරය තුළ තවදුරටත් ඉන්නවාද? එහෙම නැත්නම් මේ දේහය පිරිසිදු කර ගැනීමට දේශපාලන භේදයකින් තොරව අප ඉදිරියට යනවාද කියන කාරණාවයි.

විශේෂයෙන්ම ජනතා විමුක්ති පෙරමුණත්, ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයත් තමන්ගේ මතයන්, ආස්ථානයන් මේ සභාවට ඉදිරිපත් කළා. ඔවුන් බොහොම පිරිසිදු දේශපාලනයක් කළ බව ඇත්ත. හැබැයි, සංඛ්‍යාත්මකව බලන විට එක්සත් ජාතික පක්ෂය සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඊට විශාල අර්බුදයකට මුහුණ දෙනවා. ඔවුන්ගේ දේශපාලනය අර කැත ගෑණිගේ පතිවත වගෙයි. මොකද, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කියන්නෙත්, එක්සත් ජාතික පක්ෂය කියන්නෙත් බොහොම ආකර්ෂණශීලී කාන්තාවන් දෙදෙනෙක්. ඉතින් මේ දෙදෙනා කරා විවිධ පුද්ගලයෝ ආකර්ෂණය වෙනවා. හොඳ මිනිස්ස එනවා. නරක මිනිස්සු එනවා. චණ්ඩි එනවා. කුඩුකාරයෝ එනවා. නොයෙක් ජාතියේ අය එනවා. එතකොට මේ ගොල්ලන්ව බේරලා තෝරලා ගන්න යන කොට මේ කාන්තාවට නොයෙක් හිරිහැර සිද්ධ වෙන්න පුළුවන්. (බාධා කිරීමක්) ඉතින් මෙතුමාලා ගාවට එන්නේ එක්කෙනයි දෙන්නයි නේ? ඉතින් ඔබතුමාලාට ඒවා තෝරලා බේරලා ගන්න පුළුවන්. ඇත්තටම රාජ්‍ය පාලකයෙක් හැටියට, පක්ෂ නායකයෙක් හැටියට අතිගරු ජනාධිපතිතුමාට, අපේ පක්ෂයේ මහලේකම්තුමාට විශාල වගකීමක් තියෙනවා. නාම යෝජනා ගැන බලන්න. අද එක්සත් ජාතික පක්ෂයෙන් තරග කරන්න, නාම යෝජනා සිය දහස් ගණනක් ලැබෙනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටත් එහෙමයි. නමුත් කොමියුනිස්ට් පක්ෂයෙන් නාමයෝජනා දෙන්න ඉන්නේ, ගරු මහේෂ් අල්මේදා මන්ත්‍රීතුමා විතරයි. ඉතින් මෙයාගේ මොකක්ද පතිවත බලන්න තියෙන්නේ? මෙයාගේ පතිවත බලන්න දෙයක් නැහැ. මෙයාට ඉන්නේ එක්කෙනයි. ඒ නිසා අපි ප්‍රධාන පක්ෂ දෙක හැටියට අපිට ලොකු වගකීමකට මුහුණ දෙන්න සිද්ධ වෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, මෙයා කියලා ආමන්ත්‍රණය කරන්න එපා. සහෝදර මන්ත්‍රී කෙනෙක් නේ?

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

අපේ හිතවත් මන්ත්‍රීතුමා. ඒ නිසා මා කියන්නේ, ප්‍රධාන දේශපාලන ධාරාවන් දෙකට තිබෙන වගකීම සුළු දේශපාලන පක්ෂවලට නැහැ. නමුත් ඔවුන් පෙන්නුම් කරනවා, ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකට ඇඟිල්ල දික් කරලා පෙන්වනවා, උඹලා යා යුත්තේ මෙන්න මේ වාගේ මාර්ගයකයි කියලා. ඒකට අපි කිසිම තර්කයක් විවාදයක් නැහැ. අපි බොහොම නිහතමානීව ඔවුන්ගේ ඒ ඉතිහාසයේ කීර්තිමත් දේශපාලනය අගය කරනවා. ඒ ගැන කිසි විවාදයක් නැහැ. නමුත් අපි ප්‍රායෝගිකව ඊට වඩා දුෂ්කරතාවන්ට මුහුණ දෙනවා. ඒ නිසා තමයි අපි මේ යෝජනා කරන්නේ, පක්ෂ නායකයෝ හැටියට බලය ලබා ගැනීම සඳහා අපට විවිධ පුද්ගලයන් ඉදිරිපත් කරන්න - බලන්න දෙමළා. දුවිඩයා අපට කණට ගහලා තියෙනවා, උතුරු පළාත් සභා ඡන්දෙදි. ඔවුන් පටු දේශපාලඥයන් මෙතැන්ට දැම්මේ නැහැ. අධිකරණ ක්ෂේත්‍රයේ කීරතිමත් විනිශ්චයකාරයෙක් විධියට කටයුතු කරපු තමන්ගේ වෘත්තීය ගෞරවය බොහොම ගාම්භීර ලෙස තියා ගත්ත විග්නේෂ්වරන්ව එතැනට ගේන්න පුළුවන් වුණා.

[සභාවේ සෝෂා ]

මෙතන තර්ක කරන්න පුළුවන්. හැබැයි, මම මේ ප්‍රශ්නය අහන්න කැමතියි. විග්නේෂ්වරම්ට ගැලපෙන බුද්ධිමත්, තමන්ගේ වෘත්තීය ප්‍රතිරූපය රැක ගත්ත, නායකයෙක් දාන්න පුළුවන් තත්ත්වයක් ප්‍රබල දේශපාලන පක්ෂ හැටියට අපට නැහැයි කියලා අපි කනගාටුවෙන් වුණත් පිළිගන්න ඕනෑ. අපට එහෙම නැහැ. අපි එවැනි මිනිස්සු හදන්න ඕනෑ. ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චකාරයෙක් අනිත් පැත්තෙන් එනවා නම්, ඒකට ප්‍රතික්‍රියා දක්වන්න පුළුවන් ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චකාරයෙක්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හදන්න ඕනෑ - අපට එහෙම මිනිස්සු හිටියා. කුරුණෑගල දිස්ත්‍රික්කයේ ජායා පතිරණ විනිශ්චයකාරතුමා, වෘත්තීය ගරුත්වය බොහෝම හොඳින් ආරක්ෂා කරගෙන කටයුතු කරපු, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් කුරුණෑගලට තරඟ කරපු නායකයෙක්. අද අපට ඒ වගේ නායකයෝ හිඟයි. අපට හිඟයි. වරාවැව මහත්තයා මධ්‍යම පළාතෙන් තරග කරනවා නම්, ඒ ගැන අපි සන්තෝෂ වෙනවා. ඇත්තෙන්ම අපට තියෙන්නේ, අනිත් පක්ෂවලට ඇඟිල්ල දික් කරන එක නොවේ. ඔවුන්ගේ අඩුපාඩුකම් හොයන එක නොවෙයි. බුද්ධිමත් මිනිස්සු, හොඳ මිනිස්සු, වැදගත් මිනිස්සු අපේ ලැයිස්තුවලට ගෙනැල්ලා අපිට මේක ජයග්‍රහණය කරන්න කටයුතු කිරීමයි. අර අපේ මන්ත්‍රීතුමා කිව්වා වගේ එතුමාගේ කට බොරු කිව්වත්, දිව බොරු කියන්නේ නැහැ නේ? එතුමා පැහැදිලිවම කිව්වා, වයඹ පළාත් සභාව අපි දිනනවා කියලා. එතුමා කිව්වා, ඒ දිනන ඡන්දෙට මොකටද එක එක රොඩු බොඩු දාගන්නේ කියලා. හරි මම කියන්නෙත් එක තමයි. අපට දිනන්න පුළුවන් ශක්තියක් තියෙනවා. මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වය ගැන මේ රටේ තාමත් විශාල ජන ප්‍රසාදයක් තියෙනවා. ඒ ජනප්‍රියත්වය තුළ අපට මේ පළාත් සභා දිනන්න පුළුවන්. එහෙමනම් ඇයි අපි මේ කුණු රොඩු බාර ගන්නේ? මේ කුණු රොඩු ප්‍රතික්ෂේප කරලා, මේ මැතිවරණයේ දී එක්සත් ජාතික පක්ෂයටත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ එක්සත් ජනතා නිදහස් සන්ධානයටත් - මම කියන්නේ නැහැ හොඳ මිනිස්සු, බුද්ධිමත් මිනිස්සු උගත් මිනිස්සු කියලා.

[ ගරු කිත්සිරි කහටපිටිය ]

හොඳ මිනිස්සු තමන්ගේ නාම යෝජනාවලට ඉදිරිපත් කරන්න ශක්තිය හා ධෛර්යය ලැබේවා. අපේ උඩුගම් බලා පිහිනන මේ අවංක උත්සාහයට සහාය පළ කළ සියළුදෙනාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහෝම ස්තුතියි. අද සියළුම ගරු මන්ත්‍රීතුමන්ලා තමන්ගේ නියමිත ආසනයට කරුණාකරලා ප්‍රවේශ වෙන්න. මම හිතන්නේ අද දෙපක්ෂයේ ම එකඟතාවය ඇතිව මුලාසනය හැටියට යුසුෆ් ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජනාව සම්බන්ධව -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

බෙදීමක් තියෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මම ඇහුවේ නැහැ නේ තාම. ඔබතුමාට තාම හෝරාව බලන්න තියෙනවා. බලන්න කඩිසරකම. (බාධා කිරීමක්) මම එකඟතාවය කිව්වේ, මේ යෝජනාව යද්දී විමසීමක් කළා. කිර්තී උඩවත්ත ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාවට සභාවේ ඉතාම ප්‍රසාදාත්මක ප්‍රතිචාරයක් තියෙනවා කියලා මුලාසනය හැටියට මම දුටුවා. ඒ නිසාවෙන්ම ඉතාම කාලෝචිත වූ, වැදගත් වූ යෝජනාවක් නිසාවෙන්ම මම දෙපාර්ශයෙන්ම ඉඩකඩ විමසා සිටියා, වේලාව පිළිබඳව අපි එකඟතාවයකට එන්න කැමති ද කියලා. මොකද මට ගරු මන්ත්‍රීතුමන්ලා යෝජනා කළා, මගේ වේලාව කිර්තී උඩවත්ත ගරු මන්ත්‍රීතුමාට දෙන්න. එතුමාට වේලාව සීමා කරන්න එපාය කියලා. මම මේ සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලාට ඇහුන්කන් දීමක් හැටියට, මේ මුලාසනය හැටියට, මම විමසීමේ දී මට කිව්වා වේලාව සීමා නොකර අපි මේ යෝජනාව ඉස්සරහට ගෙන යමුයි කියලා. ඒ අනුව අද මේ යෝජනාවට පැය හතරක කාලයක් ගත වෙලා තියෙනවා. මම හිතන්නේ, මන්ත්‍රීතුමන්ලා 13 දෙනෙක් පක්ෂ, විපක්ෂ සහ බස්නාහිර පළාත් සභාව නියෝජනය කරන විවිධ දේශපාලන පක්ෂ නායකත්වයන් දරන ගරු මන්ත්‍රීතුමන්ලා ඉතාම වැදගත් අදහස් රැසක් ඉදිරිපත් කළා. ඉතින් මට ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමාත්, ඒ වගේම විපක්ෂයේ ශ්‍රේෂ්ට මන්ත්‍රීවරු, සහ විපක්ෂ නායකතුමා මටත් වරින් වර ඇඟිල්ල දික් කළා මොකද, ඔබතුමාගේ පැත්තටත් මෙහෙම ප්‍රශ්න තියෙනවා නේ කියලා. ඒ නිසා මට ඒ ගැනත් විනාඩියක් කථා කරන්න ඕනැ. මොකද මගේ හෘදය සාක්ෂිය අවදි කළොත් කිර්තී උඩවත්ත ගරු මන්ත්‍රීතුමාත් මමත් එක කාලයේ මේ දුක් විඳපු, මේ හිරිහැර බාධක මැද මේ සියළු පතිව්‍රතතා ධර්මයන්, මම එහෙම කියන්නේ අපි අතිනුත් පෘථජ්ජනයෝ හැටියට අඩු පාඩු වෙලා ඇති. එහෙම නොවේ ඔය කියන දේවල්. ඔය විවේචනයට භාජනය වුණ දේවල්වලින් මහ හැරලා, බොහෝම ප්‍රවේශම් සහගතව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ශ්‍රේෂ්ට පරණ අය - ඉතිං අපි අද ශ්‍රේෂ්ටයෝ හැටියට සන්තෝෂයි. අපි එක පැත්තකින් දුක් වෙනවා. මොකද, අපි ආරක්ෂා කළා. අපි පක්ෂය ආරක්ෂා කළා. අපි සමාජය ආරක්ෂා කළා. අපට ඡන්දය දුන්න ඡන්දදායකයාව ආරක්ෂා කළා. මට කියා ගන්න බැරි දේ, ඔබට කියා ගන්නට බැරි දේ, ඔබේ අදහස් ඉතාම නිර්භිතව, ස්වර්ණමය කොන්දක් සහිතව, ස්වර්ණමය කොන්දක් සහිත ගරු මන්ත්‍රීවරයෙක් හැටියට කිර්තී උඩවත්ත ගරු මන්ත්‍රීතුමා මේ සභාව හමුවේ තැබුවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඔබතුමාට සභාව ඇතුළෙත් ප්‍රශ්නයක් තියෙනවා. සදාචාරාත්මක දේශපාලනය නැති වුණා. ඒකත් කියන්න ඔබතුමා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමනි, මම නිහතමානීව එක ඉවසා දරා ගෙන ඉන්න කෙනෙක්. මගේ ප්‍රාර්ථනාව හෙට දවසේ රාජ්‍ය දේපළ වැරදි විධියට හසුරුවන්නට නොවේ. පාසල් යන කාලේවත්, බස් එකේ සිට් එකක්වත් කපාපු නැති කෙනෙක්. මම පාසල් වියේ ඉඳන් දේශපාලනය කළා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමා කියන්නේ අපි කැපුවා කියලද ? අපි කැපුවෙත් නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නැහැ, එහෙම නොවේ. මම රාජ්‍ය දේපළ නරක විධියට භාවිතා කරන්නේ නැහැ. ඔබ වගේම මම ද, කිසිදු කෙනෙකුගෙන් කොමිස් මුදලක්වත් ලබා ගෙන නැහැ. මගේ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් දන්නවා. ඒ නිසාවෙන් මට විනාඩියක් දෙන්න. වලල්ලාවිට මගේ ගම. මගේ දුරකථනය සහ මගේ ලේකම්ගේ දුරකථනය, මගේ මේසය මත තියෙන දුරකථනය, විතරක් නොවෙයි මගේ පවුලේ අයගේ දුරකථනවලට පවා, කිසිම ඉස්පාසුවක් නැතිව ජගත් අංගගේ ගරු ඇමතිතුමනි, දුරකථන ඇමතුම් ගලා ගෙන ආවා මේ වලල්ලාවිට සිදුවීම නිසාවෙන්. ඉතාම අසීරුවට, ලැජ්ජාවට සහ පිළිකුලට මම පාත්‍ර වුණා. නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ කටේ කෙළ බිම දැම්මේ නැහැ. උඩ බලාගෙන කෙළ ගැහුවා වගේ. මුහුණට වැටෙනවා විතරක් නොවෙයි, බොහෝම දුර්ගන්ධයි. ඉතින් මම මතක් කරන්න ඕනැ ප්‍රාදේශිය දේශපාලඥයෝ - ඔය කියපු දේශපාලඥයා පවා පොලිසියේ රාළහාමිලාට පවා පහර දීලා තියෙනවා. පොලිසියේ දොර ඇරලා තියෙනවා. ඔය කියන ස්ත්‍රී දූෂණ රැසක් තියෙනවා. ඔය ප්‍රාදේශිය සභාවට දීලා තියෙන කැබ් රථය වෙනම පාටකින් ආවරණය කළා. කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා, අපි කථා කරලා තියෙනවා පක්ෂ භේදයකින්

තොරව. ඉතින් මේ පළමුවෙනි වරට නොවෙයි. මේ දිස්ත්‍රික්කය නියෝජනය කරන ජගත් අංගගේ ගරු ඇමතිතුමා වගේ අය, අපි වගේ අය-

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි රීති ප්‍රශ්නයක්. මෙය අධිකරණයේ විභාග වන නඩුවක් නිසා ඊට අදාළ දේවල් සම්බන්ධව ප්‍රකාශ කරන එක වැරදියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නැහැ. කොයිද තියෙන්නේ ? එහෙම අධිකරණ නඩුවක් නැහැ.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

මොකද, ඒ සභාපතිවරයා අල්ලස් සම්බන්ධව අත්අඩංගුවට අරගෙන තියෙන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මම නම කිව්වේ නැහැ.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ඒ සම්බන්ධව අධිකරණයේ නඩුවක් පවතිනවා. ඒ නිසා සභාවේ අධිකරණයේ පැවැත්වෙන දෙයක් සම්බන්ධව කථා කිරීමේ හැකියාවක් නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නැහැ. මම නම සඳහන් කළේ නැහැ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

තවම නඩුවක් ගොනු කරලා නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මම බොහෝම අවංකව කථා කරන්නේ, මූලාසනයේ හැටියට මම වැඩිපුර කථා කරන්නේ නැහැ. නමුත් මම කිර්තී උඩවත්ත ගරු මන්ත්‍රීතුමාට කිව්වා ගිය සතියේ, කිර්තී උඩවත්ත ගරු මන්ත්‍රීතුමාට මතක ඇති. මම ගිය සභා වාරයේදී කිව්වා කිර්තී, මම තමයි ඕක ස්ථිර කරන්නේ කියලා. මට අද ඒ අවස්ථාව නොලැබුණා. මොකද ගරු සභාපතිතුමා බැහැර වෙලා. ඒ නිසා මගේ අඩුව ජගත් අංගගේ ගරු අමාත්‍යතුමා තරමක් පිරෙව්වා කළුතර දිස්ත්‍රික්කයෙන්. යුසුෆ් හිටපු ගරු ඇමතිතුමා, කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා, නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා තරමක් පිරෙව්වා. ඒ නිසා මටත් යළි කථා කරන්න ලැබෙන්නේ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගරු සභාපතිතුමාගේ වාහන තුන ගැන ටිකක් කියන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නැහැ අවශ්‍යයම නැහැ. ඒ නිසා මම කියන්නේ අපේ ප්‍රාර්ථනාව සඵල වේවා. හොර මැරකම්, ජඩකම්, පාදඩකම්, දූෂණ, පොලිසියට පහර දීලා, නීතිය කඩ කරපු, අල්ලස් ගහපු, මේ විනාශකාරී දේශපාලනය තුරන් වී, යහපත් සමාජ නායකයෝ බිහි වන වාතාවරණයක් උදා වේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම කිර්තී උඩවත්ත ගරු මන්ත්‍රීතුමාට මම යළිත් කියන්න ඕනෑ, ඔබට තියෙන්නේ ස්වර්ණමය කොන්දක්.

යෝජනාවට සංශෝධන ඉදිරිපත්ව තිබෙනවා. මේ සංශෝධන මම ප්‍රකාශයට පත් කරනවා. සංශෝධන දෙකක් ඉදිරිපත් වෙලා තියෙනවා. කිර්තී උඩවත්ත ගරු මන්ත්‍රීතුමනි, වර්තමානයේ වාර්තා වන පරිදි ඔබතුමා සඳහන් කරලා තියෙනවා, ප්‍රාදේශිය දේශපාලනයේ සිට ජාතික දේශපාලන තලය දක්වා වූ මහජන නියෝජිතයින්ගේ ගුණාත්මකභාවය කියලා. ඒකේදී කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා යෝජනා කරනවා, ප්‍රාදේශිය දේශපාලනයේ සිට ජාතික දේශපාලනය දක්වා කියන වචන දෙපැත්ත හරවන්න. අනිත් පැත්තට. ඒ කියන්නේ, ජාතික දේශපාලනය කියන කාරණාව මුලට ගන්නත් -

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. ඒ වාගේ ම අපේ ශ්‍රිනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා සංශෝධනයක් ඉදිරිපත් කරලා තියෙනවා, නාම යෝජනා ලේඛනය විද්වත් කමිටුව කියන එක වෙනුවට ආගමික නායකයන්ගෙන් සැදුම්ලත් කමිටුවකට යොමු කොට -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

බොදු බල සේනා-

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

විනාඩියක් දෙන්න. කිර්තී උඩවත්ත ගරු මන්ත්‍රීතුමාගෙන් මම විමසා සිටියාම එතුමා කියනවා, *"ආගමික නායකයන්ගෙන්*

[ ගරු නියෝජ්‍ය සභාපතිතුමා ]

*සෑදුම් ලත් විද්වත් කමිටුවකට"* කියන සංශෝධනයට එතුමා එකඟයි කියලා.

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

දැන් මෙතනින් අදහස් වෙන්නේ නැහැ ආගමික නායකයන් පමණක් කියා. ඔවුන්ද ඇතුළත් විද්වත් කමිටුවක්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අපි එහෙම නම් එහෙම කරමු. ඒ වාගේම මම අද ඉතාම වෙහෙස මහන්සි වී මූලාසනයේ ස්තුතියක් හිමි කරන්නට ඕනෑ, පැය හතරකට අධික කාලයක් මෙම අතිශයින්ම වැදගත් වූ යෝජනා සඳහා පක්ෂ, විපක්ෂ දෙපක්ෂයේ ම ගරු මන්ත්‍රීතුමන්ලා අදහස් ප්‍රකාශ කළා. ඉතාම සෑජුව.

ඒ වාගේම මම හිතන්නේ, මාධ්‍ය හොඳ ආවරණයක් අපට ලබා දේවී. ඒක අතිශයින්ම වැදගත්. අද දවසේ අපි ඉල්ලා සිටිනවා මාධ්‍යයෙන්, මේ සියළු මන්ත්‍රීතුමන්ලා වාගේම මූලාසනයෙන්. යහපත් වූ ජන සමාජයකට මාධ්‍යය උපකාර කරන්නට කැමති නම්, ඔවුන් හිතැති නම්, අපේ යහපත් විධියට ඉන්න ගරු මන්ත්‍රීතුමන්ලාටත් මාධ්‍ය හරහා පොඩි සහයෝගයක් දෙන්න කියලා, ඒ වාගේම මම බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා, මාධ්‍යයට. මේ යෝජනාව එන්න ප්‍රස්තුථ වුණේ උඩවත්ත ගරු මන්ත්‍රීතුමනි, මාධ්‍යයෙන් මුල් පිටුවෙන් සහ රූපවාහිනි මාධ්‍ය හරහා මේ අපචාර, අල්ලස්, දූෂණ, හෙළි දරව් කරපු නිසාවෙන්. මම නම් අවංකවම ස්තුතිවන්ත වෙනවා. ඉදිරියටත් එසේ කරන්න කියලා මම මාධ්‍යයට බොහෝම කාරුණිකව මතක් කරනවා. ඒ නිසා දැන් සභාවේ මේ යෝජනාව සම්බන්ධයෙන් එකඟතාව විමසා සිටිනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

බෙදීමක් තිබෙනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සීනුව නාද කරන්න.

***සංශෝධිත ප්‍රශ්නය විමසන ලදින්, 61 (3) රීතිය යටතේ පළාත් සභාව පක්‍ෂව 20 යි, විරුද්ධව 01 යි වැළකුණු 04 යි යනුවෙන් බෙදුණේය.***

*Amended question put and the Provincial Council divided as per Rule 61(3) as 20 for, 01 against and 04 decliners.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාව නිශ්ශබ්ද වන්න. මෙම යෝජනාවට පක්ෂව ජන්ද 20 ක් ලැබිලා තියෙනවා. විපක්ෂව එක ජන්දයක් ලැබිලා තියෙනවා. ජන්දය දීමෙන් වැළකිලා සිටිනවා ජන්ද 04 ක්.

සභාව ඇහුන් කන් දී ගෙන ද ඉන්නේ? අහගෙනද ඉන්නේ? පක්ෂව ජන්ද 20 ක්, විපක්ෂව 01 ජන්දයක් සහ ජන්දයෙන් වැළකිලා සිටිනවා, ජන්ද 04 ක්. කෙසේ නමුත්, රීති ප්‍රකාරව මෙම යෝජනාව සභා සම්මත වෙන්නේ නැහැ. මොකද, මේ වේලාවේ සභාවේ ගණ පූරණය පවා නැහැ. ගරු හිටපු විපක්ෂ නායකතුමා, මේ කාරණාව මම විමසුවා ගරු ලේකම්තුමාගෙනුත්. මොකද, මම යළි සභාවෙනුත් ඇහුවේ ඒකයි, ඇහුන්කන් දෙනවද කියලා. මට හැඟිච්ච දේ ගරු ලේකම්තුමාගෙනුත් විමසා සිටියා, නිවැරදි ද කියලා. නිවැරදි නිසාවෙන් තමයි ඉදිරිපත් කරන්නේ. එම නිසා 60(2) රීති ප්‍රකාරව මෙම යෝජනාව අහෝසි වන අතර, -

# කල් තැබීම
## ADJOURNMENT

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

*"12 (1) රීති ප්‍රකාරව දැන් මම මෙම සභාව දැන් කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 03.14 ට, 2013 අගෝස්තු මස 06 වන දින පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*Sitting, accordingly adjourned at 03.14 p.m till 9.30 a.m. on 06.08.2013.*